# ප්‍රජාශක්ති

## 2022 දෙසැම්බර් කලාපය

කාන්තා, ළමා කටයුතු හා සමාජ  සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

24/4

කාසල් වීදිය

කොළඹ 08

# ප්‍රජාශක්ති 2022 දෙසැම්බර් කලාපය


## උපදේශකත්වය

ටී.ඒ. රණසිංහ

අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඩබ්ලිව්. ජී.පී.වේරවැල්ල

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## සංස්කරණය

පී.ඒ. චිත්‍රා ජයසිංහ

පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

සී.කේ.ඩබ්ලිව්. අල්විස්

පුහුණු හා පර්යේෂණ නිලධාරි

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## පිටකවරය

එන්.එම්.එම්. පියුමි කෝසලා වීරසූරිය

## ප්‍රකාශනය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

24/4, කාසල් වීදිය

කොළඹ 08

# පටුන


පිටු අංක

01. විපර්යකාරක වැඩසටහනේ ආරම්භය, විකාශනය හා වර්තමාන තත්වය. 2-8
පී.ඒ.චිත්‍රා ජයසිංහ

02. අධ්‍යාපනය, දැනුම හා විඥ්ඥානය පිබිදවීම. 09-15
සුභාසිනී දිනුෂා අල්ගම

03. ආන්තික ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා නීතිය පිළිබඳ දැනුම ගළපා ගැනීමේ වැදගත්කම. 16-18
ඩී.ඒ.පී.දාස්වත්ත

04. ශ්‍රී ලංකාවේ පවත්නා වත්මන් ආර්ථික අර්බුදය හමුවේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය. 19-27
එස්.එම්.යූ.බී. සමරකෝන්

05. ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අභියෝග හමුවේ කුඩා පරිමාන ව්‍යවසායකයා. 28-30
ජී.ජී.එස්. බණ්ඩාර

06. ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ගයෙන් ඩොලර් හොයන බංගලාදේශයේ දුප්පතුන්. 31-33
කපිල ධර්මප්‍රිය

07. තායිලන්තයේ ග්‍රාමසංවර්ධන උපායමාර්ග. 34-38
සුභානි පියසිංහ

08. සැම පවුලකටම සුව පහසු නිවාසයක්. 39-50
එස්.බී.එන්. මල්ෂානි ආනන්ද

09. ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණවල ප්‍රතිවිපාක. 51-53
කේ.එම්.ජී. සමරසේන

10. සෞභාග්‍යමත් රටක් උදෙසා වැඩිහිටි ප්‍රජාව සමඟ අත්වැල් බැඳ ගැනීම. 54-57
එච්.එම්. ප්‍රියානි දයාරත්න.

11. ආයෙත් ගමට. 58- 60
කේ.ඩබ්ලිව්. අයිරාංගනි

12. තිරසාර සංවර්ධනයක් සඳහා පරිසරය සුරැකීමේ අවශ්‍යතාවය. 61-65
නිරෝෂා විජේවර්ධන

13. ජාතික ප්‍රතිපත්තිය හා සංවර්ධනය. 66-69
යමුනා කුමාරි

14. තිරසර සංවර්ධන අභිමතාර්ථ. 70-72
තිලක් ගංගොඩ

15. ව්‍යාපෘති යෝජනාවක් ලියමුද. 73-78
ප්‍රදීප් ලංකාපෙල

16. දිළිඳුකම දුරලීමේ අභියෝගය. 79-82
එන්.එස්.බී. ඒකනායක

17. ලක්දිව දේව ඇදහිලි හා විශ්වාස රටේ සංවර්ධනය සඳහා බලපෑම. 83-85
එච්.එම්.ජී.කේ. නවරත්න

18. සෞභාග්‍යමත් රටක් සඳහා අධ්‍යාපනයේ වැගත්කම. 86-88
පී.බී.ඩී.වැත්තෑව

19. ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය, ව්‍යාප්තිය හා වර්තමාන ක්‍රියාකාරිත්වය. 89-95
එච්.බී.අයි. ඒ. චන්ද්‍රසිරි

20. දරු දැරියනගෙ කුස ගින්දර. 96
ඒ.එන්.විතානගේ

21. සාරධර්ම තුළින් සමාජ යහපැවැත්ම තහවුරු කරමු. 97-99
සී.කේ.ඩබ්ලිව්. අල්විස්

22. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයේ පසුබිම, තිවුරතාව සහ ප්‍රතිඵල. 100-108
ඒ.එම්.එස්. අතපත්තු

# 01. විපර්යකාරක වැඩසටහනේ ආරම්භය, විකාශනය හා වර්තමාන තත්වය.

*පී.ඒ. චිත්‍රා ජයසිංහ*
*පුහුණු හා පර්යේෂණ නිලධාරි*
*M.A (Sociology)*

ශ්‍රී ලංකාවේ අතීතයේ සිටම සංවර්ධන න්‍යාය පත්‍රයේ දිළිඳුකම අවමකරලීම සඳහා ඉහලම ප්‍රමුඛත්වය ලබා දී ඇත. මෙම පසුබිම තුළ විපර්යකාරක වැඩසටහන් සහ ඒ තුළින් ගොඩනැගුණු සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය පිළිබඳව අවධානය යොමු කිරීම අතිශය කාලෝචිත වන්නේ දිළිඳු ප්‍රජාව පමණක්ම ඉලක්ක කර ගනිමින් දිළිඳුකම පිටුදැකීමේ අරමුණින් රජය විසින් හඳුන්වා දෙන ලද ප්‍රථම සහභාගිත්ව සංවර්ධන වැඩසටහන විපර්යකාරක වැඩසටහන වන හෙයිනි.

සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ජනතාව අතරට පත්කොට ක්‍රියාත්මක කරන ලද විපර්යකාරක වැඩසටහන වූ කලී යථාර්ථයෙන්ම දිළිඳුකම දුරලීම සඳහා වූ සහභාගිත්ව සංවර්ධන වැඩසටහනකි. විශේෂයෙන්ම දිළිඳු ප්‍රජාව දැනුවත් කිරීමේ ක්‍රියාවලියක් තුළින් සවිබල ගැන්වීම සඳහා වූ සමාජ සජීවීකරණ උපාය මාර්ගයකි. දශක හතරකට ආසන්න කාලයක් තුළ සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදකයින් හා සංවර්ධනවේදීන් විසින් විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවර්ධන වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා විපර්යකාරක වැඩසටහනෙහි සංකල්ප හා ක්‍රමවේදය යොදාගන්නා ලද්දේ එහි ඇති සුවිශේෂී ලක්ෂණ හේතුවෙනි.

විපර්යකාරක වැඩසටහනෙහි ආරම්භය, විකාශනය හා වර්තමාන තත්වය පිළිබඳව සැකෙවින් සළකා බලන කල ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් 1978 වර්ෂයේදී ආරම්භකරන ලද කාර්ය බද්ධ ග්‍රාම සංවර්ධන පුහුණු හා පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රතිපලයක් වශයෙන් ගොඩනැගුණු ග්‍රාම සංවර්ධන වැඩසටහන විපර්යකාරක වැඩසටහන නමින් හැඳින්විනි.

ශ්‍රී ලංකාවේ යටත්විජිත ආර්ථිකය තුළ ගොඩනැගුණු අසමතුළිත සංවර්ධන පරිසරය තුළ දේශීය පාලක පක්ෂය විසින් අනුගමනය කල වැඩසටහන් තුළ වුවද දිළිඳු ජනතාවගේ ජීවන තත්වයේ ප්‍රබල වෙනසක් ඇතිකිරීමට සමත් නොවූ අතර ග්‍රාමීය නාගරික ආදායම් පරතරයද ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවතුනි. විරැකියාව තරුණ අසහනය වැනි හේතූන් නිසා පැන නගින ලද තරුණ කැරැල්ලද හේතු කොට ගෙන අළුත් සංවර්ධන නැඹුරුවක අවශ්‍යතාවය 1970 දශකය තුළ ගොඩනැගෙමින් පැවතුනි.

විපර්යකාරක වැඩසටහන පදනම් වූ කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාවලිය ආරම්භයට බලපෑ දේශීය හේතූන් එසේ වුවද එවකට ගෝලීය සංවර්ධන ප්‍රවාහය තුළ ජනිත වූ නව සංවර්ධන ප්‍රවනතා අමතක කල නොහැක. 1970 දී ශ්‍රී ලංකා රජය ජර්මනියේ කොන්රාඩ් ඇඩිනෝර් පදනම සමඟ ඇතිකරගන්නා ලද ගිවිසුම විපර්යකාරක වැඩසටහන මෙරට ආරම්භවීමට බලපෑ ප්‍රධාන හේතුවක් ලෙස විශ්ලේශකයෝ හඳුන්වති. මෙම ගිවිසුමේ ප්‍රතිපලයක් වශයෙන් දියත් වූ ග්‍රාම සංවර්ධන සමිති නිලධාරීන් පුහුණුව 1977 දී ඇගයීමට ලක්කරන ලද අතර එයින් පෙනී ගියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා එම පුහුණුව අපොහොසත් වූ බවයි.1977 දී ඩී.ඩී.එස්.රත්නවීර මහතා විසින් ඉදිරිපත්කර

තිබූ ග්‍රාම සංවර්ධනය හා පුහුණුවේ අතීත එලඹුම් යන වාර්ථාවෙන්ද සාම්ප්‍රධායික ග්‍රාම සංවර්ධනයේ හා පුහුණු ප්‍රවේශයේ දුර්වලතා පෙන්වා දී තිබුනි. එසේම 1974 වර්ෂයේද ආසියා පැසිපික් සංවර්ධන ආයතනය ග්‍රාම සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රියාකාරී කටයුතු වල නිරත විශේෂඥයින් පිරිසක් එක්කොට දකුණු ආසියාවේ එවකට පැවති ග්‍රාම සංවර්ධන ප්‍රවේශයන් සාකච්ඡාවට භාජනය කරන ලදී. එහිදී අවසාන නිගමනය වූයේ දකුණු ආසියාවේ සංවර්ධනය උදෙසා නව ග්‍රාම සංවර්ධන ප්‍රවේශයක අවශ්‍යතාවයයි. මෙම විශේෂඥයින් කණ්ඩායමට ආචාර්ය මහිදූර් හක්, ආචාර්ය අන්සූර් රහමන් (බංගලිදේශය) ආචාර්ය නිරන්ජන් මේතා (ඉන්දියාව) ආචාර්ය පොන්න විග්නරාජා සහ ජී.වී.එස් ද සිල්වා (ශ්‍රී ලංකාව) යන විද්වතුන්ද ඇතුලත් විය. ග්‍රාම සංවර්ධනය සඳහා නව ප්‍රවේශයන් සොයා යන ගමනේදී දකුණු ආසියානු සමාජ විද්‍යාඥයින්ට සමගාමීව ඩැක් හැමර්සල් පදනම විසින් 1975 දී තවත් සංවර්ධනයක් පිළිබඳ අදහස ඉදිරිපත් කරන ලදී. එමගින් ග්‍රාම සංවර්ධනය සඳහා නව මානයක අවශ්‍යතාවය සහ නව සංවර්ධන ප්‍රවේශයක්ද, නව ක්‍රමවේදයක්ද අවශ්‍ය බව අවධාරණය කරන ලදී. එසේම 1978 වර්ෂය වන විට ඉන්දියාවේ හා බංගලිදේශයේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර අත්දැකීම් ලබා තිබූ උගතුන් කිහිපදෙනෙකු ශ්‍රී ලංකාවේ ග්‍රාමසංවර්ධනයේ නව දිශානතියක් පිළිබඳ උනන්දු වීම මහත් වාසියක් විය.

මෙම පසුබිම තුළ ජර්මනියේ කොන්රාඩ් ඇඩ්නෝර් පදනම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය ග්‍රාමසංවර්ධන පර්යේෂණ මණ්ඩලය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමග කරන ලද සාකච්ඡාවන්ගේ ප්‍රථිපලයක් වශයෙන් ග්‍රාමසංවර්ධනය පිළිබඳ කාර්ය බද්ධ පර්යේෂණ ක්‍රියාදාමය ආරම්භ කිරීමට සැළසුම් කරන ලදී. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අදාල පරිපාලන කටයුතු භාරගත් අතර කොන්රාඩ් ඇඩ්නෝර් පදනම සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය මූල්‍ය පහසුකම් හා සම්පත්දායක සේවය සපයන ලදී.

ඒ අනුව මෙම පර්යේෂණ කාර්යය සඳහා සුදුසු පර්යේෂණ කණ්ඩායමක් හඳුනාගත් අතර එයින් පහලොස් දෙනෙකු රාජ්‍ය නිලධාරීන් වූහ. මාධ්‍ය වේදීන් එක් අයෙකු හා ස්වේච්ඡා ක්‍රියාකාරීන් එක් අයෙක්ද ඒ පිරිසට අයත් වූහ.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනයේ ජාත්‍යන්තර උපදේශකවරුන් මූලික පුහුණුකරු කණ්ඩායමේ සම්පත්දායක මණ්ඩලය ලෙස කටයුතු කල අතර පුහුණු කටයුතු පිළිබඳ විමර්ශණය හා ඇගයීම පර්යේෂණ මණ්ඩලය විසින් සිදු කරන ලදී. මෙම පර්යේෂණ මණ්ඩලය රාජ්‍ය පරිපාලන, කර්මාන්ත, සෞඛ්‍ය යන අමාත්‍යාංශවල ලේකම්වරුන් සමග තවත් විද්වතුන් කණ්ඩායමකින් සමන්විත විය. මහචාර්ය නන්දදාස කෝදාගොඩ, ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු, වෛද්‍ය තිලක් ගුණසිංහ, ලාල් විජේපාල ආදී විද්වතුන් ඒ අතර වූහ.

මූලික පර්යේෂණ කණ්ඩායමේ පුහුණු කාලය මාස 15 ක් විය. ඒ සඳහා ශ්‍රී ලංකාවේ පළාත් හතරකින් එකිනෙකට වෙනස් වූ ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත ගම්මාන හතරක් හඳුනාගෙන එම ගම්මානවල පදිංචි වී පර්යේෂණ කටයුතු සිදු කරන ලදී.

- මුහුද ආසන්නයේ ජීවත්වන ජනතාව පදනම්කරගත් වැලිගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මිරිස්ස ගම්මානය.
- පොල් වගාව ආශ්‍රිත ජන කොටසක් ජීවත්වන මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැටිතොටමුල්ල.

- රබර් වගාව ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ජනතාව පදිංචි අවිස්සාවේල්ල ප්‍රා කොට්ඨාශයේ පින්නවල.
- සුළු අපනයන භෝග වගාව පදනම් කරගත් ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ජන කොටසක් ජීවත්වන උඩු නුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මාත්ගමුව.

මෙම පර්යේෂණ කණ්ඩායම් අදාල ගම්මානයන්හි උත්පේරක මැදිහත්වීමකින් යුතුව පර්යේෂණ කාර්යයෙහි නිරත වෙමින් හෙලිකරගත් කරුණු ජනතාව සමග සාකච්ඡා කරමින් හා විග්‍රහ කරගනිමින් සංවර්ධනයේ බාධාවන් බිඳහෙලීමට ගතයුතු ක්‍රියාමාර්ග ජනතාව තුළින්ම හඳුනාගැනීමේ කාර්යයෙහි නිරත වූහ. එසේම ඉහළ පහළ සිරස් සබඳතාවල අවාසිදායක තත්වය තේරුම් ගත් ඉලක්ක පිරිස් සමාන ජනකොටස් සමගින් තිරස් සබඳතා ඇතිකරගනිමින් සාමූහික උත්සාහයේ අර්ථවත් බව තුළින් ගොඩනගා ගන්නා සංවිධානාත්මක ගමන් මගක් වෙත යොමු කරනු ලබයි. මෙම පර්යේෂණාත්මක ක්‍රියාවලිය තුළ හඳුනාගත් විපර්යකාරක ක්‍රමවේදයේ විශේෂත්වය වන්නේ විමර්ෂණය විග්‍රහය හා යථාර්තය හඳුනා ගැනීම යන සියළු කරුණු ක්‍රියාවලියක් බවට පත්කරලීමයි. පර්යේෂකයෙකු නැතහොත් උත්ප්‍රේරක මැදිහත්කරුවෙක් ගැඹුරු විමර්ෂණ ක්‍රියාවලියකට පෙළගැසෙන මෙම අධ්‍යයන ක්‍රියාවලිය පුද්ගලයාගේ දැනුවත් වීම, විඤ්ඤානය පිබිදවීම නැතහොත් ජනශක්තිකරණය ලෙස හැඳින්විනි. විපර්යකාරක වැඩසටහන තුළ අවධාරනය කෙරෙන මෙම යටපත් වූ විභව ශක්තීන් උද්දීපනය 1990 දශකයේදී සමාජ සජීවිකරණය ලෙස හැඳින්වින.

විපර්යකාරක වැඩසටහන තුළ විග්‍රහවන මෙම පුළුල් කථිකාව ස්වශක්තිය හා සහභාගිත්වය පදනම් කරගත් සමාජ ආර්ථික, සංස්කෘතික සංවර්ධනයක් කරා පුද්ගලයා හා සමාජය පොළඹවනු ලබයි. කුඩා කණ්ඩායමෙන් ආරම්භවන මෙම සංවිධාන ව්‍යුහය තීරණ ගැනීමේ, ක්‍රියාත්මක කිරීමේ හා මෙහෙයුම් ඇගයුම් ක්‍රියාවලියේ යාන්ත්‍රනය ලෙස ක්‍රියාත්මක කෙරේ. මෙම සාධනීය ලක්ෂණ හේතුකොට ගෙන දිළිඳුකම පිටුදැකීම අරමුණුකරගත් වැඩසටහන් අතර විපර්යකාරක වැඩසටහන සුවිශේෂත්වයක් ලබයි.

**විපර්යකාරක වැඩසටහනේ විකාශනය.**

විපර්යකාරක වැඩසටහන මේ වන විට වසර 44 ක කාලයක් තිස්සේ ක්‍රියාත්මකව පවතී. මෙම කාලය තුළ විපර්යකාරක වැඩසටහනෙහි විකාශනය සම්බන්ධයෙන් අධ්‍යයන කිහිපයක් සිදුකර ඇති අතර අවසන් වරට කරන ලද අධ්‍යයනය වන්නේ ආචාර්ය ටියුඩර් සිල්වා ඇතුළු කණ්ඩායම විසින් කරන ලද අධ්‍යයනයකි. මීට පෙර විපර්යකාරක වැඩසටහන පිළිබඳ මූලික පර්යේෂණ කණ්ඩායමේ පර්යේෂකයෙකු වන මොණිකා රුවන්පතිරන මහත්මිය විසින්ද අනතුරුව මූලික පර්යේෂක විල්ප්‍රඩ් කරුණාරත්න මහතා විසින්ද වැඩසටහන පිළිබඳව අධ්‍යයනයන්හි නිරත වූ බව වාර්තා වේ.

මීට පෙර විස්තර කරන ලද පරිදි විපර්යකාරක වැඩසටහනෙහි ආරම්භක අවධිය එනම් 1978 – 1984 අවධිය පර්යේෂණාත්මක අවධිය ලෙස පර්යේෂකයෝ හඳුනා ගනිති. ග්‍රාමීය සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීම අරඹයා වැදගත්වන සාධනීය ලක්ෂණ ගණනාවක් හඳුනාගනු ලැබුවද වැඩසටහනේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඇතැම් බාධාවන් කිහිපයක් සිදුවිය. මූලික පුහුණුකරුවන්ට අමතරව වරින් වර කිහිපවතාවක් පුහුණුකරුවන් බඳවා ගැනීම හා පුහුණු කිරීම සිදුකලද එම පිරිස් වරින් වර ඉවත්ව යාම සතුටුදායක තත්වයක් නොවීය. පුහුණුකරන ලද නිලධාරීන් සංඛ්‍යාව 157 දෙනෙකු වුවද ඉතිරි වූ සංඛ්‍යාව 86 දෙනෙක් පමණක් බව සඳහන් වේ. කේන්ද්‍රීය ගම අවට තවත් ගම්මාන පහක් ඉලක්ක කර ගනිමින් ගම් වලල්ලක් ලෙස මෙම කාලය තුළ වැඩසටහන ව්‍යාප්ත කෙරිනි.

විපර්යකාරක වැඩසටහනෙහි විකාශය සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට ක්‍රි.ව 1985 සිට 1989 කාල පරාසය ඉතා වැදගත් වේ. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කළමණාකාරීත්වය හා මූලික පර්යේෂණ කණ්ඩායමේ ඇතැම් පුහුණුකරුවන් අතර ඇතිවූ ගැටලු සහගත තත්වය එහි ව්‍යාප්තිය කෙරෙහි කිසියම් බලපෑමක් සිදු කිරීමට සමත් විය. විපර්යකාරක ක්‍රමවේදය වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙනයාම සඳහා මූලික පුහුණුකරුවන් කිහිපදෙනෙකු විසින් පීඩා ආයතනය (පාරමී සහභාගිත්ව පර්යේෂණ ආයතනය) පිහිටුවාගත් අතර තවත් මූලික පුහුණුකරුවකු විසින් 1985 දී තෝලංගමුව මානව සම්පත් මධ්‍යස්ථානය ගොඩනගා ගන්නා ලදී. එසේම වරින්වර බඳවාගෙන පුහුණු කරන ලද පුහුණුකරුවන් ලෙස සේවය කල ග්‍රාමසංවර්ධන නිලධාරීන් 57 දෙනෙකු අදාල දෙපාර්තමේන්තුව විසින් ඉවත්කර ගැනීම ක්ෂේත්‍රයේ කටයුතු දුර්වල කරන්නක් විය.1989 වන විට ඇතිවූ සමාජ නොසන්සුන්තාවයද වැඩසටහනෙහි ව්‍යාප්තිය කෙරෙහි බලපවත්වන ලද කරුණක් විය. එසේ වුවද 1987 වන විට දිවයිනේ දිස්ත්‍රික් 13 ක කාර්යස්ථාන (ගම් වළලු) 73ක වැඩසටහන ව්‍යාප්තව පැවති බව වාර්ථා වෙයි. එසේම ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති සඳහා විපර්යකාරක වැඩසටහන අනුදත් සමාජ සජීවීකරණ ක්‍රමවේදය බද්ධකර ගැනීම ආරම්භ වූයේද මෙම කාල පරිච්ඡේදය තුළදීය.

විපර්යකාරක වැඩසටහන පිළිබඳව අධ්‍යයනය කල විද්වත්හු 1990 - 1995 කාලපරාසය වැඩසටහනෙහි සංවර්ධන අවධිය ලෙස හඳුනාගනිති.

1980 දශකයේ අග භාගය වන විට වැඩසටහන කෙරෙහි බලපෑම්කල අහිතකර හා හිතකර සාධක කෙරෙහි අවධානය යොමුකල ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කළමනාකාරීත්වය අහිතකර සාධක පාලනය කර ගැනීමටත් හිතකර සාධක වැඩසටහනේ උන්නතිය සඳහා යොදා ගැනීමටත් උත්සුක වූ බව පෙනේ. එසේම රජයේ සංවර්ධන ක්‍රියාදාමයට දායකවන අයුරින් ආයතනයේ සංවිධාන ව්‍යුහය හා කාර්යයන් ගලපා ගත් බව විද්‍යමාන වේ.

1991 වර්ෂයේ ජනවාරි මස වනවිට විපර්යකාරක වැඩසටහන දිස්ත්‍රික් 11 ක උප දිසාපති කොට්ඨාශ 62 ක ක්‍රියාත්මකව පැවතුනි. ඒ සඳහා සීඩා ජාත්‍යන්තර ආයතනය හා කෙයාර් ආයතනය යන විදේශීය ආයතන මගින් මූල්‍යාධාර සපයන ලදී. ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, මහනුවර, නුවර එළිය, බදුල්ල, කෑගල්ල හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක සඳහා සීඩා ආයතනයද, අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික්ක සඳහා කෙයාර් ආයතනයද මූල්‍ය සහාය ලබා දෙන ලදී.

1990 දශකය ආරම්භයේදීම මෙතෙක් වැඩසටහන හා පවත්වාගෙන ආ ස්වරූපය වෙනසකට භාජනය කරමින් ගම් වළලු ක්‍රමය වෙනුවට කඩිනම් ව්‍යාප්තිය අරමුණු කරගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පදනම් කරගත් ස්වේච්ඡා සේවක ආකෘතිය හඳුන්වා දෙන ලදී. මෙම වැඩපිළිවෙල යටතේ ප්‍රාදේශීය මට්ටමින් හඳුනාගත් විපර්යකාරකයින්/ ස්වේච්ඡා සේවකයින් සඳහා අදියරගත පුහුණුව ලබාදී එකවර අදාළ ගම්මානයන්හි වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම ක්‍රමය දිස්ත්‍රික් 6ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20ක ක්‍රියාත්මක කරන ලදී. වැඩසටහනෙහි කඩිනම් ව්‍යාප්තිය සඳහා ආයතනය මැදිහත්වීමට තවත් හේතුවක් වූයේ රජයේ ජාතික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කල ජනසවිය වැඩසටහන තුළ සමාජ සජීවිකරණ ක්‍රමවේදය උපායමාර්ගය ලෙස යොදා ගැනීමයි. 1991 දී ආරම්භ කළ ජනසවිය භාරකාර අරමුදලේ ක්‍රමවේදය වූයේද සමාජ සජීවිකරණයයි. විපර්යකාරක වැඩසටහන පර්යේෂණ මට්ටම ඉක්මවාගිය පුළුල් ව්‍යාප්තිය සඳහා අවධානය යොමුකල කාලපරිච්ඡේදයක් ලෙස මෙම අවධිය හැඳින්විය හැකි වේ.

ස්වේච්ඡා සේවක ආකෘතිය යටතේ පුහුණුව ලැබූ ස්වේච්ඡා සේවක සංඛ්‍යාව 500 දක්වා ඉහළ නැගින. සාධනය කළයුතු ඉලක්කයට අවතීර්ණ වීමට තරම් ප්‍රමානවත් කාලයක් නොමැති වීමත් වැඩසටහනෙහි සජීවිකරණ ක්‍රියාදාමයේ ගුණාත්මකභාවය හීනවීමට හේතු වූ බව පසුකාලීන ඇගයුම්කරුවන් විසින් වාර්තාකර ඇත. එසේ වුවත් 1995 දක්වා ඇති වූ මෙම ව්‍යාප්තිය ශ්‍රී ලංකාවේ ග්‍රාම සංවර්ධන ගමන්මග සරු කිරීම සඳහා ලබා දුන් ඉහළ දායකත්වයක් ලෙස අගය කළ යුතු වෙයි.

1992 වර්ෂයේ සිට විපර්යකාරක වැඩසටහන යටතේ පුළුල් ප්‍රජා මූල සංවිධාන පද්ධතියක් ගොඩනැංවීම ආරම්භ වෙමින් පැවතින. කුඩා නිෂ්පාදන කණ්ඩායම එම සංවිධාන ව්‍යුහයේ ප්‍රාථමික සංවිධානය වූ අතර කුඩා කණ්ඩායම් එක්වීමෙන් ගොඩනැගෙන ද්විතීය සංවිධානය ග්‍රාමීය මට්ටමේ සංවිධානය ලෙස කුඩා නිෂ්පාදන කණ්ඩායමේ සංවර්ධන ක්‍රියාවලිය දිගු කාලීනව පවත්වාගෙන යාම සඳහා බෙහෙවින් ඉවහල් වූ බවට නිදසුන් විපර්යකාරක වැඩසටහන තුළ සුළභ වේ. එසේම මෙම ද්විතීය සංවිධාන ප්‍රාදේශීය මට්ටමේදී තෘතීක සංවිධාන ලෙස ගොඩනැගෙමින් පැවතින. සාම්ප්‍රධායික ගැමි නායකත්වය ඉක්මවා අඩු ආදායම්ලාභී ජන කොටස් තුල ධනාත්මක ආකල්ප ගොඩනැංවීමට මෙම සංවිධාන රටාව ඉවහල් විය.

1995 සිට 2001 කාල පරාසයන් විපර්යකාරක වැඩසටහන තුළ ගොඩනැගුණු සංවිධාන තලය පුළුල් වීම තව තවත් ව්‍යාප්තවන අයුරු දැකගත හැකි විය. සාමාජික දැනුවත් වීම හා අත්දැකීම් වලින් පොහොසත් වීම තුළ පුළුල් සංවිධාන ගොඩනැංවීම ස්වභාවික වුවද 1998 වර්ෂය වන විට සීඩා ආයතනය විසින් ලබා දෙන මූල්‍යාධාර අවසන් විමට නියමිතව ඇති බැවින් අඛන්ඩ සංවර්ධන ක්‍රියාවලියක් සඳහා ශක්තිමත් සංවිධාන ජාලයක වැදගත්කම වැඩසටහනේ පුහුණු කරුවන්ට මෙන්ම කළමනාකාරිත්වයට අවබෝධ විය. මේ නිසා පුහුණුකරුවන් මෙන්ම සමායෝජකවරුන්ද වැඩසටහනේ පැවැත්ම තහවුරු කරලීම අරමුණු කරගනිමින් මධ්‍ය සංවිධාන/ ප්‍රාදේශීය සංවිධාන ගොඩනගන්නට උනන්දු වූ බව පෙනේ. මෙම තෘතීක සංවිධාන වැඩසටහන ක්‍රියාත්මක වූ කාර්යස්ථානවල බල ප්‍රදේශයට අනුකූලව ගොඩනැගුනි. ඇතැම් ප්‍රාදේශීය සංවිධාන යම් යම් ප්‍රාදේශිය කොට්ඨාශයන් ආවරණය කරන අතර ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංවිධාන දෙකක් හෝ තුනක් මගින් ආවරණය කරනු ලබයි. එසේම ඇතැම් ප්‍රාදේශීය සංවිධාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකක් හෝ තුනක් හෝ වැඩි ගණනක ක්‍රියාත්මකව පවතී. ( උදා : හබරාදූව සහභාගත්ව සංවර්ධන පදනම, වැලිගම ප්‍රජා ශක්ති සංවර්ධන අරමුදල, රඹෑව ප්‍රජා ශක්ති සහභාගිත්ව සංවර්ධන පදනම, රිදීගම ආසිරි මානව සංවර්ධන පදනම) බොහෝ සංවිධාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් දහයක්, පහළොවක් හෝ විස්සක් පමණ ආවරණය කරනු ලබයි. බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජා ශක්ති සංවිධාන ප්‍රජා ශක්ති කළාපීය සංවිධාන ලෙස හැඳින්වේ. මෙම සංවිධානයන්හි අඩු ආදායම්ලාභී සාමාජික පිරිස් තම නිෂ්පාදන, අලෙවි හා පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර සාමාජික ප්‍රජාවගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පද්දතියත් ලෙස ක්‍රියා කරනු ලබයි. ඒ අනුව 1996 පසු විපර්යකාරක වැඩසටහන මෙතෙක් පැමිණි ගමන් මග වෙනස් ස්වරූපයක් ගැනීම ආරම්භ වූයේ සියලු ප්‍රාදේශිය සංවිධාන සූක්ෂම මූල්‍ය ආයතන පද්දතියක් බවට පත්වීම හේතුවෙනි. ඒ වන විට සුළු පරිමාන මූල්‍ය ක්‍රියාවලිය දිළිඳුකම පිටු දැකීමේ ප්‍රබල උපාය මාර්ගයක් ලෙස ජනප්‍රිය වෙමින් පැවතිනි. සාමාජික ඉතුරුම්, පොදු අරමුදල, කුඩා පරිමාන මූල්‍ය පහසුකම් සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ අත්දැකීම් විපර්යකාරක කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය තුළ ගොඩනැගී පැවතුනි. එසේම දකුණු ආසියානු රටවල පැවති ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් පිළිබඳව අවධානය යොමුව තිබුණු අතර ජනසවිය වැඩසටහන තුළ ලැබූ අත්දැකීම් සම්මත බැංකු ක්‍රමය තුළ දිළිඳු ප්‍රජාවට ලගා වීමට ඇති දුෂ්කරතා පිළිඹිබු කරන්නක් විය. මෙම කරුණු දළිඳු ප්‍රජාවට හිතකර සුළු පරිමාන මූල්‍ය ආයතන පද්දතියක් බිහිවීමට හේතු සාධක සපයන ලදී. 1998 වන විට ප්‍රාදේශිය මට්ටමේ සංවිධාන (මධ්‍ය

සංවිධාන) 57 ක් ගොඩ නැගී තිබුණි. එම සංවිධාන තුළ ග්‍රාමීය මට්ටමේ සංවිධාන 697 ක් හා කුඩා කන්ඩායම් 6918 ඇතුළත්ව ඇත.

**ප්‍රජාශක්ති මහා සංගමය ගොඩනැගීම.**

විපර්යකාරක වැඩසටහන යටතේ ගොඩනැගුණු ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජා මූල සංවිධාන ඒකාබද්ධ කෙරෙන මුදුන් මට්ටමේ සංවිධානය ප්‍රජා ශක්ති මහා සංගමය වේ. 1997 අගෝස්තු මස ආරම්භ කළ මෙම සංවිධානයේ මූලික අරමුණ වූයේ ප්‍රජාශක්ති සංවිධාන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා කළමනාකරණ, ආයතනික හා මූල්‍ය ශක්තිය වර්ධනය කිරීමයි. සම්පත්, දැනුම හා අත්දැකීම් හුවමාරුව, විපර්යකාරක ක්‍රමවේදය ප්‍රචලිත කිරීම, සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය යොදා ගැනීමට පෙළඹවීම ප්‍රජාශක්ති මහා සංගමයේ සෙසු අරමුණු විය.

සීඩා ජාත්‍යන්තර ආයතනයේ මූල්‍ය අනුග්‍රහය අවසාන වීමත් සමග ප්‍රජාශක්ති මහා සංගමය ආරම්භ කරන ලද්දේ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ මග පෙන්වීමෙන් හා සීඩා ආයතනයේ ආශිර්වාදයෙනි.

ප්‍රජාශක්ති මහා සංගමයේ අරමුණු සපුරා ගැනීම සඳහා පසුගිය කාලය තුල මූලික වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි.

- ආයතනික සංවර්ධනය සඳහා සහාය වීම.
- පුහුණුව සඳහා සහාය වීම.
- චක්‍රීය අරමුදල් වර්ධනය සඳහා සහාය වීම.
- ඇහයුම් මෙහෙයුම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

ඒ අතර ප්‍රධාන තැනක් ගන්නා ලදී. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සහාය නොඅඩුව ලැබීම එම වැඩසටහන් සාර්ථක වීමට බෙහෙවින් ඉවහල් විය.

**විපර්යකාරක වැඩසටහනෙහි වත්මන් තත්වය.**

විපර්යකාරක වැඩසටහන යටතේ ගොඩනැගුණු ප්‍රජාශක්ති ප්‍රජා මූල සංවිධාන සියල්ල 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරිමේ හා අධීක්ෂණය කිරීමේ) පණත යටතේ සමාජ සේවා සංවිධානයක් ලෙස හෝ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ ජාතික ලේකම් කාර්යාලයේ ලියා පදිංචිය ලබා ඇත.

වැඩසටහනෙහි සමස්ථ අරමුණ වන දිළිඳුකම අවම කිරීම සඳහා ස්වශක්තිය හා සහභාගිත්වය පදනම් කරගත් සංවර්ධන ක්‍රියාවලියක් ගොඩනැංවිම පිණිස ඉලක්ක ප්‍රජාව සවිබල ගැන්වීම උදෙසා ප්‍රජා ශක්ති සංවිධාන විසින් මේ වන විට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් රාශියකි.

දුප්පතුන් සවිබල ගැන්විමට නම් ඔවුන් මුහුණදෙන සමාජ ආර්ථික යථාර්තයන් පිළිබඳව ගැඹුරින් දැනුවත් වීම අනිවාර්ය වේ. විපර්යකාරක වැඩසටහන තුළ අවධාරණය කෙරෙන සාමූහිකත්වය, එකිනෙකාට ගරු කිරීම, නායකත්වයට හුරු කිරීම , අසාධාරණත්වයට විරුද්ධව නැගී සිටීම, අයිතිවාසිකම් සඳහා ඉදිරිපත් වීම හා දිනා ගැනීම, එකිනෙකාගේ අභිවෘද්ධිය වෙනුවෙන් කැපවීම, අභිමානය ගෞරවය හා සමාජ තත්වයේ යහපත් වෙනසක් ඇතිවීම වැනි ගුණාංග ප්‍රජා ශක්ති සංවිධාන දිනාගත් සමාජමය වෙනස්කම් අතර ප්‍රධාන වේ. ඉතිරි කිරීම් වර්ධනය, නව සම්පත්

යොදා ගනිමින් ආයෝජනය හා ආදායම් උත්පාදන ව්‍යාපෘති ඇරඹීම හා පවත්වාගෙන යාම, නිෂ්පාදනය මෙන්ම වෙළෙඳ පොළ හා අලෙවි කටයුතු සංවිධානය, නව තාක්ෂණය ගලපා ගැනීම, සෞඛ්‍ය හා අධ්‍යාපනික වැඩසටහන් යනාදිය සාමාජික ප්‍රජාව තුළ ආර්ථික චර්යාවේ වෙනසක් තුළින් ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා අනුගමනය කරන ක්‍රියාකාරකම් අතර ප්‍රධාන වේ. මෙහිදී සාමාජික සංවිධාන විසින් මූලිකත්වය දී ඇති ප්‍රජා මූලික මූල්‍ය ක්‍රියාවලිය ප්‍රධාන තැනක් ගනී. පොලීකරුවාගෙන් මෙන්ම වාණිජ බැංකු වලින් බැහැර වූ මූල්‍ය ක්‍රියාවලියක අවශ්‍යතාවය මෙන්ම එම ක්‍රියාවලිය විධිමත්ව පවත්වාගෙන යාමේ හැකියාවද අගය කල හැකි වෙයි. මෙම සංවිධාන සියල්ල 2016 අංක 6 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ ලියාපදිංචි කර ඇත. ප්‍රජාශක්ති සංවිධානයන්හි වැදගත් සංදිස්ථානයක් බවට පත්ව ඇති මෙම මූල්‍ය සංවිධානවල අනාගත පැවැත්ම අරඹයා ඒවා විධිමත් කළ යුතුව ඇත.

කාර්යබද්ධ පර්යේෂණ ක්‍රමවේදයක් ඔස්සේ ගොඩනැගුණු විපර්යකාරක වැඩසටහන මේ වන විට විධිමත් ආයතන පද්ධතියක් ලෙස විද්‍යමාන වේ. ආධාරක ආයතන මගින් ලබාදෙන මූල්‍යාධාර අවසාන වීමෙන් පසු එම සංවිධාන ගමන්මගකට අවතීර්න වී ඇත. මේ සියලු සංවිධාන සම්පූර්ණ ප්‍රශස්ත තත්වයකට පත්ව නැත. ඇතැම් සංවිධාන ඉතාම ශක්තිමත් සංවිධාන වන අතර ඇතැම් සංවිධාන දුර්වල මට්ටමක පවතී. ඉතාම ශක්තිමත් සංවිධාන කිහිපයක් විපර්යකාරක පර්යේෂණාගාර ලෙස හැඳින්වීමට තරම් වටිනා සංවිධාන ලෙස ක්‍රියාත්මකව පැවතීම ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට මෙන්ම වැඩසටහනටද ගෞරවයකි. එක හා සමාන තත්වයක නොවුවත් මේ සියලු සංවිධාන විපර්යකාරක වැඩසටහනෙහි ව්‍යාප්තිය සම්බන්ධයෙන් කර ඇති කාර්යභාරය සුවිශාල වේ.

**සංවර්ධන ක්ෂේත්‍රය තුළ කරන ලද බලපෑම.**

විපර්යකාරක වැඩසටහන ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් සංවර්ධන ක්ෂේත්‍රය තුළ කරන ලද කාර්යයන් කෙරෙහි සැළකියයුතු බලපෑමක් ඇති කරන ලද වැඩසටහනකි. ඒකාබද්ධ ග්‍රාමසංවර්ධන වැඩසටහන, ජනසවිය වැඩසටහන, ජාතික සංවර්ධන භාරකාර අරමුදල, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉසුරු වැනි වැඩසටහන් හා සමෘද්ධි වැඩසටහන කෙරෙහි විපර්යකාරක වැඩසටහනේ බලපෑම දක්නට පුළුවන. විපර්යකාරක වැඩසටහනෙහි මෙන්ම යථෝක්ත වැඩසටහන්වල ප්‍රථිපල වශයෙන් කුඩා කණ්ඩායම් මාධ්‍යකොට ගත් ග්‍රාමීය සංවිධාන, ග්‍රාමීය මූල්‍ය ආයතන, ඒකාබද්ධ සංවිධාන වැනි ආයතන රාශියක් ග්‍රාමීය ජන සමාජය තුළ බිහිවී ඇත. රාජ්‍ය නොවන සංවිධාන විශාල සංඛ්‍යාවක් විපර්යකාරක ක්‍රමවේදය ඔස්සේ සංවර්ධන ක්‍රියාකාරීන් දහස් ගණනක් පුහුණුව ලබා ඇත.

# 02. අධ්‍යාපනය, දැනුම හා විඥ්ඥානය පිබිදීම - ප්‍රජා සංවර්ධනය උදෙසා දැනුම ලබාදීමේ ක්‍රමවේදය ලෙස සජීවීකරණය (සහභාගීත්ව සංවර්ධනය) භාවිතයේ වලංගු භාවය

සුභාසිනී දිනූෂා අල්ගම
පුහුණු හා පර්යේෂණ නිලධාරි

අතීතයේ පටන් මිනිසා සාමූහිකව ජීවත් වීමෙන් ඔවුන්ගේ දියුණුව සලසා ගන්නා ලදී. එලෙස සාමූහිකව මිනිසුන්ගේ සංවර්ධනය වීම පුරාතනයේ සිට පැවත එන්නක් වුවත් **ප්‍රජා සංවර්ධනය** ලෙස පළමුව ප්‍රසිද්ධියට පත් වූයේ 1948 වර්ෂයේ එංගලන්තයේ කේම්බ්‍රිජ් හී දී පවත්වන ලද සමුළුවක දිය. අනතුරුව 1958 වර්ෂයේදී ජාත්‍යන්තර පරිපාලන ආයතනය මගින් **"ප්‍රජා සංවර්ධන මාර්ගෝපදේශය"** නමින් පළ කරන ලද ලේඛනයේ **"ප්‍රජා සංවර්ධනය යනු ජාතික රාජ්‍යයන් විසින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට මඟ පෑදීම"** ලෙස අර්ථ ගන්වා තිබේ. මෙම මගපෑදීමේ ක්‍රියාවලිය සජීවීකරණය ලෙස සරලව හඳුන්වා දිය හැක. ප්‍රජාව සමූහයක් ලෙස තමාට මුහුණ දීමට ඇති ගැටලු ප්‍රාදේශීය සම්පත් කෙරෙහි විශ්වාසය තබා විසඳා ගැනීමට හා ඒ අනුව ක්‍රියාත්මක වෙමින් එය සමාජ ක්‍රියාවලියක් වශයෙන් හැඩ ගසා ගත හැකි ක්‍රම ශිල්පයක් ලෙස මෙය හඳුනා ගත හැකිය. මිනිසුන්ට තම ගැටලු විසඳා ගැනීමට අවස්ථාව (දැනුම) සලසා දුන් කළ ඔවුන් විසින් ම කල්පවත්නා ප්‍රතිඵලදායක විසඳුම් ඔවුන්ම සොයා ගනී. එනිසා ස්වෝත්සාහය යන තර්කය මේ තුල ගැබ්ව ඇත. මෙහි දී භෞතික වශයෙන් සපයන දේ පමණක් නොව ප්‍රජාවගේ ගැටලු හඳුනාගැනීම, විසඳුම් තීරණය කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල බුක්ති විදීම මෙන්ම දිගුකාලීනව පවත්වාගෙන යෑම යන සෑම අංශයක් සඳහාම ඔවුන්ගේ සහභාගීත්වය ලබාගැනීම (අවදි කිරීම) කෙරෙහි ප්‍රජාව යොමු කළ යුතුය.

තවද **"ප්‍රජාවගේ ආර්ථික සමාජයීය හා සංස්කෘතික තත්ත්වයන් දියුණු කරලීම සඳහා මිනිසුන්ගේ උත්සාහය රාජ්‍ය ආයතන මගින් ගනු ලබන ප්‍රයත්නයක් සමග ඒකාබද්ධ කිරීම"** ප්‍රජා සංවර්ධනය ලෙස ආර්ථික හා සමාජීය සාමාජික මණ්ඩලය විසින් නිර්වචනය කර ඇත. මෙම නිර්වචනයට අනුව ප්‍රජා සංවර්ධනය පිළිබඳ අපට එළඹිය හැකි නිගමනය වන්නේ ජනතාවක්, ජාතියක් දියුණු කිරීම උදෙසා මිනිසුන් උපයෝගී කර ගැනීමට ඇති හැකියාව හා එහි අවශ්‍යතාවයයි. මෙම කාර්යයේ දී ප්‍රධාන වශයෙන් පහත කරුණු දෙක කෙරෙහි විශ්වාසය තබා කටයුතු කළයුතු වේ.

- තමන්ගේම ශක්තිය **(ස්ව ශක්තිය)** කෙරෙහි විශ්වාසය තබා සිය ජීවන මට්ටම නංවා ලීමට ජනතාවගේ සහභාගීත්වය ලබා ගැනීම.
- ස්වෝත්සාහය හා අන්‍යෝන්‍ය **(සහභාගිත්වය)** දිරි ගැන්වීමට හේතු වන පරිදි තාක්ෂණික හා අනෙකුත් සේවාවන් සම්පාදනය කිරීම හා සැලසුම් කිරීම.

මින් අපට තේරුම් ගත හැකි වන්නේ ප්‍රජා සංවර්ධනය උදෙසා ප්‍රධාන වශයෙන් ජනතාවගේ සහභාගීත්වය මෙන්ම තනි උත්සාහයන් (ස්වශක්තිය) ඉතාම වැදගත් බවයි. ඒ අනුව එක් එක් පුද්ගලයින් සඳහා අවශ්‍ය සහය ලබා දීම නැතහොත් ප්‍රජාවේ දියුණුව උදෙසා ඔවුන්ගේ ප්‍රයත්නයන් බද්ද කර ගැනීම සිදුකල යුතු බවයි.

මෙම ක්‍රියාවලියේ දී **පුද්ගලයින්ගේ සංවර්ධනය සිදුවීම ඉබේ සිදුවන කාර්යයක් නොවේ**. ඒ සඳහා ප්‍රජාව දැනුවත් වීම අත්‍යවශ්‍ය කරුණකි. මෙහිදී දැනුවත් වීම ලෙස හුදු අධ්‍යාපනයක් ලබාදීම අදහස් නොකරමු. මෙම දැනුවත් වීම විඥ්ඥානය පිබිද වීම නැත හොත් සජීවිකරණය වීම ලෙසින් සහභාගීත්ව සංවර්ධනයේ දී පුළුල් අදහසක් කැටි කොට හඳුන්වාදී ඇත. එසේම මෙම තත්ත්වය ළඟා කර ගැනීම සරල වූවක් නොවන බව සිහිපත් කරමු. එබැවින් මෙම දැනුවත් වීම, දැනුවත් කිරීම කුමක්ද? යන්න පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ප්‍රජා සංවර්ධනයේ දී අප වෙත පැවැතීම අත්‍යවශ්‍ය වේ.

**දැනුම් යුගය - වර්ථමාන සංවර්ධනයේ ගමන්මග.**

නූතන සමාජය දැනුම පදනම් කරගත් සමාජයකි. සන්නිවේදනයේ දියුණුව සමගම දැනුම හැම මොහොතකම ප්‍රසාරණය වෙමින් තිබේ. වර්තමානයේ දියුණුවේ ප්‍රධානම කාර්යභාරය සිදු කරනු ලබන්නේ දැනුම යි. සිවුපා සතෙකු ලෙස සිටි මානවයා දැනුම් යුගය දක්වා වූ සංවර්ධනයේ මේ දක්වා පැමිණි ගමන් මඟ සොයා බලන ඔබට මේ බව මනාව තහවුරු කර ගත හැක. සිවුපා සත්ත්වයෙක් ලෙස සිටි වානරයා ඔහුගේ දෑත් නිදහස් වීමෙන් පසු ඇති කරගන්නා ලද ක්‍රියාකාරීත්වය සමඟ ක්‍රමිකව වර්ධනය වූ බුද්ධියේ අනුහසින් යුග ගණන් පසුකරමින් වර්තමානයේ සීඝ්‍රයෙන් වර්ධනය වන්නා වූ දැනුම් යුගය දක්වා වර්ධනය වී පැමිණ ඇත. අතීතයේ පටන් පැමිනි මේ ගමන්මගේ දැනුම් යුගයේ සිටින ඔබට දැනුම දිනෙන් දින ඉතා සීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පවතින ආකාරය හඳුනා ගැනීමට හැකිය. එසේ නම් වර්ථමානයේ සංවර්ධනය පිළිබඳ කතා කිරීමේ දී දැනුම යන්න ඉතා වැදගත් කරුණක් බව ඔබට මනාව පැහැදිලිවේ.

**දැනුම ලබාදීම/ ලබා ගැනීම.**



එසේනම් ප්‍රජා සංවර්ධනයට ප්‍රවේශවීමට ප්‍රථම දැනුම යනු කුමක්ද?, යන්න පැහැදිලි කරගැනීමට අපට සිදු වේ. අධ්‍යාපනයේ දී සිදු වන්නේ දැනුම ලබාදීම ලෙස සැලකුවහොත් දැනුම ලබාදීමට අධ්‍යාපනය භාවිතා කිරීම සිදුවන බව අපට පැහැදිළි වේ. මෙලෙස අපට දැනුම ලබා දෙන අධ්‍යාපනය විධිමත්, අවිධිමත්, නොවිධිමත් ලෙස වර්ග කර ඇත. මේ අනුව අපට දැනුම ලබා ගන්නා ක්‍රම රාශියක් ඇති බව වටහා හැක. වධිමත් ක්‍රමවේදයකට අනුව ක්‍රියාත්මක වන පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය ආදියේ ලබන දැනුම විධිමත් අධ්‍යාපන ක්‍රමය ලෙසත්, අත්දැකීම් හා වටපිටාවෙන් ලබන්නා වූ දැනුම අවිධිමත් අධ්‍යාපනය ලෙසත්, විධිමත් නොවන නමුත් නිශ්චිත අරමුණකින් යුතුව දැනුමක් ලබාදීමට සංවිධානය වන පුහුණු වැඩසටහන් ආදිය නොවිධිමත් අධ්‍යාපනය ලෙසත් හඳුනා ගත හැකි වන අතර මේ සියලූම ක්‍රම තුළින් දැනුම ලබාදිය (ලබාගත) හැක. නමුත් නූතන අධ්‍යාපන මනෝ විද්‍යාඥයන්ගේ අදහස අනුව දැනුම ලබා දීමේදී මේ ක්‍රම තුළින් ඒ ඒ පුද්ගලයන්ගේ මනස තුළ දැනුම ගොඩනැඟෙන්නේ විවිධාකාරයෙන් බවත්, එම නිසා සියලුම දෙනාට එක සමාන වූ අධ්‍යාපන ක්‍රමයක් සුදුසු නොවන බව තහවුරු කර ඇත.

**දැනුම යනුවෙන් කුමක් අදහස් වේද?**

**"වාස්තවික ලෝකය හා එහි නියාමන නියම මිනිසාගේ මනස තුළ අරමුණු සහගතවත් සංවර්ධනාත්මකවත් පරාවර්තනය වීම දැනුම නම් වේ"** මෙම අදහසට අනුව ප්‍රකෘතිය (මිනිසා ද ඇතුලත් ස්වභාදහම) මත බලපා ඒ මගින් ලබාගන්නා අවබෝධය දැනුම ලෙස කෙටියෙන් හඳුන්වා දිය හැක. එසේ නම් දැනුමේ ආරම්භය වන්නේ වාස්තවික ලෝකය හෙවත් සොබා දහමයි.

මෙම අදහසට අනුව සතුන් ද තමා ඇතුළත් වාස්තවික ලෝකය තුළින් දැනුම නො ලබන්නේ ද?. මේ ඔබට පැන නගින පැනයි. ඔව්... වාස්තවික ලෝකයේ සමහර දේ සතුන් තුල ද පරාවර්තනයන් සිදුකෙරේ. සතුන් ද යම් යම් දේ දකී. ශබ්ද අසයි. ස්පර්ශ කරයි. යම් යම් දේ වෙන්කොට හඳුනා ගනී. එහෙත් සතුන් පංචේන්ද්‍රයන් හරහා ලබා ගන්නා හැඟීම් සංවේදන දැනුම ලෙස නොසලකයි. මන්ද ඒවා අරමුණු සහගත නොවන බැවිණි. සතුන් සොබා දහමේ හරයන් වටහා නොගනී. නමුත් මිනිසා වාස්තවික ලෝකයේ පෙනුම පමණක් නොව ස්වභාව දහමේ හරයන්, නියමයන් ද වටහා ගනී. එසේ ලබාගන්නා වටහාගැනීම පරපුරෙන් පරපුරටත්, එකම පරපුර තුළත්, මිනිස් මොළය තුළත් සංවර්ධනාත්මක හා අරමුණු සහගත වර්ධනය සිදු වේ. ඒ අනුව "දැනුම" යන්නේ සැබෑම අර්ථය පවතින්නේ මිනිසා තුළ බව ඔබට වැටහෙනු ඇත.

**මේ "දැනුම" යන්න සැබෑම ආර්ථයෙන් මිනිසා තුළ ගොඩනැගෙන්නේ කෙසේද?**

අහම්බයක් නොවන **"දැනුම"** අප තුළ ගොඩනැඟෙන්නේ එක්තරා අනුපිළිවලකටය. එය මිනිසා තුළ නිරායාසයෙන් සිදු වුවද මනස තුළ දැනුම ගොඩනැඟෙන්නේ එක්තරා රටාවකට හා ක්‍රමයකට අනුවය.

❖ **ජීවමාන සංජානනය**

ජීවමාන සංජානනය යනු ප්‍රකෘතිය හා එහි පවත්නා දේ පංචේන්ද්‍රියන් හරහා ලබා ගන්නා දේ මිනිස් මොළය තුළ පිළිබිඹු වීමයි. නැතහොත් පංචේන්ද්‍රයට හසුවන දේ හි සරල හා මතුපිට හඳුනා ගැනීමට ලක් කර ගැනීමයි.

❖ **සංවේදනා**

මේ ලෙස ප්‍රකෘති තත්ත්වයන් පංචේන්ද්‍රයට හසු කර ගැනීම මොළය තුල පිළිබිඹු වීම සංවේදනා ලෙස හඳුන්වයි. මේ සංවේදනා නම් වූ සරල හඳුනාගැනීම පුද්ගලයන් දැනටමත් ලබාදී ඇති දැනුමේ ප්‍රමාණය මත වෙනස් වේ. එය මෙසේ විග්‍රහ කළ හැක.

යම් ගසක් දකින පුද්ගලයෙක් තුළ ඒ ගස පිළිබඳ වැඩිදුර අධ්‍යයනයට ලක් කිරීමට පෙර ඔහුගේ මනසේ පිළිබිඹු වන්නේ ගසේ සරල මතුපිට ලක්ෂණයි. නමුත් උද්භිත විද්‍යාඥයෙකුට එම ගස දුටු කල ඒ පිළිබඳ පෙර පුද්ගලයාට වඩා වැඩි ලක්ෂණ ප්‍රමාණයන් සංජානනය කරගනී.

අප තුළ මෙලෙස ඇති කරන සංජානන තුළින් මිනිස් මොළය අත් කරගන්නා සංවේදනා මගින් දැනුමේ ඊළඟ අදියර වන සංකල්පනා ගොඩනැගීම සිදුවේ.

❖ **සංකල්පනා**

සංකල්පනා යනු පෙර අදියර තුළින් ලබාගත් දැනුම මත ඒ ඒ වස්තූන් පිළිබඳ මනස තුළ පරාවර්තනය වන්නා වූ පොදු ලක්ෂණ වේ. එය ගස්, පලතුරු, එළවළු, පොත් ආදී ලෙස සංකල්පන්නා හඳුනා ගැනීම් සිදු වේ. එලෙස මනසින් සංකල්ප හටගත් පමණින් පූර්ණ දැනුමක් අප තුළ ඇති වූවා යැයි කිව නොහැක. ඕනෑම දෙයක් පිළිබඳව

වඩා අවබෝධයක්, දැනුමක් ලැබීම උදෙසා මනස තුළ ඊළඟ ක්‍රියාකාරීත්වය ඇරඹීම අත්‍යවශ්‍ය වේ. එනම් ප්‍රජානනය නම් අදියරය වෙත පිවිසිය යුතුයි.

❖ ප්‍රජානනය

ප්‍රජානනය යනුවෙන් කුමක් අදහස්වේ ද?. එය සරලව තේරුම් ගත හැක්කේ අධ්‍යයනය ලෙසයි. යම් දෙයක් පිළිබඳව වැඩිදුර අවබෝධය සඳහා අප සිදුකරන අධ්‍යයන ඉන් අදහස් කෙරේ. ඒ සඳහා තර්ක ඥානය අවශ්‍ය වේ. එපමණක් නොව එසේ වීමට නම් පංචේන්ද්‍රයන් ගේ හැකියා ඉක්මවා යන, තාර්ක ඥානය ඉක්මවා යන, විද්‍යාත්මක වූ හැකියාවක් ද තිබිය යුතුවේ.

දැකීමේදී, ඇසීමේදී, ගඳ සුවඳ ආදීය දැනීමේ දී  මේ සියලු දේ ග්‍රහණය කර ගැනීමේ හැකියාවක් අපට නැත. ඈත දුර තිබෙන දෙයක් මෙන්ම කුඩාම අංශුවක ව්‍යුහයන් අපට අපේ පියවි ඇසින් බැලීමට නොහැක. අපගේ මිනිස් කණට ඇසෙන්නේ ඩෙසිබල් 20- 2200 අතර පවතින පරාසයක ශබ්ද පමණි. උකුස්සා මිනිසාගේ පෙනීමේ සීමාව ඉක්මවා දුර දැකීමේ හැකියාව ඇත. එසේම විවිධ සතුන්ට මිනිස් පංචේන්ද්‍රයන් ඉක්මවා ඇසීම, දැකීම, ගඳ සුවඳ දැනීම ආදී හැකියාවන් පවතී. නමුත් සතුන්ට මිනිසාට මෙන් තර්ක කළ හැකි දියුණු මොළයක් නොමැති බැවින් එම හැකියාවෙන් ඵලක් නැත. මිනිසාගේ පංචේන්ද්‍රියන් ගේ හැකියාව සීමා සහිත වුවද එකී සීමා අභිබවා යා හැකි විශේෂ ඉන්ද්‍රිය වන්නේ මිනිස් මොළයයි. සීමිත හැකියාවන් සහිත පංචේන්ද්‍රියන්ගෙන් අප ලබා ගන්නා ප්‍රාථමික දැනුම වන ජීවමාන සංජානනයෙන් ඇති කරනා සංවේදනා මගින් වස්තූන්ගේ සියලු ලක්ෂණ පරාවර්තනය නොකරන බැවින් අප පංචේන්ද්‍රයන් තුළ ලබා ගන්නා දැනුම **අසම්පූර්ණ** එකක් බව මානව විද්‍යාඥයින් තහවුරු කරයි. එසේම එම දැනුම නිවැරදි නැති දුර්වල එකක් වන අතර මෙය වෙනස් කරගත හැකි වන්නේ **තර්කනය** මගින් හා පංචේන්ද්‍රියන් මගින් ලබා ගත නොහැකි ලක්ෂණ හඳුනා ගැනීම තුළිනි. එසේ නම් අප තුළ දැනුම ගොඩනැගෙන්නේ ඉන්ද්‍රයන් මගින් ලබා ගන්නා සරල දැනුම (ඉන්ද්‍රය ගෝචර දැනුම) හා තාර්කික දැනුම එකතු වීමෙනි.

එසේ නම් දැන් අපි විග්‍රහ කරනා **"දැනුම" සම්පූර්ණ ද?**

පුද්ගල (ප්‍රජා)  සංවර්ධනය උදෙසා මෙම දැනුමේ තවත් පියවර වූ නිර්මාණශීලී චින්තනයේ අවශ්‍යතාවය ඉතා ප්‍රබල වෙයි. මිනිසුන් නිර්මාණශීලී වන්නේ ඔවුන් සතු වන තර්කන හැකියාව මතයි. ඒ මත ඔවුන්ගේ දියුණුව, සමාජයේ දියුණුව රඳා පවතී. අප රටේ වර්තමාන අධ්‍යාපනය රටාව තුලින් මෙවැනි ප්‍රජාවක් බිහි කර ගැනීම කොතෙක් දුරට සාර්ථක වේ ද?. පාසැල උසස් අධ්‍යාපන ආයතන, විවිධ පුහුණු වැඩසටහන් ආදී සියලුම අධ්‍යාපන ක්‍රම ඔස්සේ ලබාගන්නා දැනුම මෙම අවස්ථාව සම්පූර්ණ වන, සාර්ථකව දැනුම ලබා දීමට? ඉටුකිරීමට දක්වන දායකත්වය කෙසේවේද?. දිනෙන් දින දිළිඳුකම සංවර්ධනය වන ප්‍රජාවගේ පවතින දැනුම මත ගොඩ නැගෙන සමාජ ප්‍රශ්න දෙස බලන කල දැනුමේ සියලු අදියර සම්පූර්ණ වන ඥාන සම්පාදනයක් පවතින අධ්‍යාපන පරිසරය තුළින් ලබා දීම ඉතා අසීරු කටයුත්තක් වී ඇති බව තහවුරු කෙරේ.

තර්කයට ඉඩ නොතබන, නිර්මාණ ශීලීත්වයට ඉඩ නොලැබෙන පාසැල් අධ්‍යාපනය මෙන්ම අනෙකුත් අධ්‍යාපන මධ්‍යස්ථාන මගින් ද කටපාඩම් කිරීම තුළින් විභාග සමත් කර ගන්නා සම්ප්‍රධායික අධ්‍යාපන සංස්කෘතියක් නිර්මාණය කර ඇත. මෙම සම්ප්‍රධායික අධ්‍යාපනය දිගින් දිගටම තර්ක ඥානයට ඉඩ නොතබා විභාග මානසිකත්වයෙන් කටයුතු කරන පුද්ගලයින් සමාජයට එකතු කරමින් තිබේ. එවන් සම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයකින් බිහිවන පුද්ගලයන් වෙතින් පුද්ගල සංවර්ධනයක් හෝ ප්‍රජා සංවර්ධනයක් සිදු වෙතැයි අපේක්ෂා කළ හැකි ද?. ඉන් සිදු වන්නේ පවතින සම්ප්‍රධායික දිළිඳුබව සංවර්ධනය වන්නා වූ සමාජ සැකැස්මක් පවත්වාගෙන යාමට ඉතා සුදුසු පසුබිමක් ඇති කිරීමයි. මේ නිසා වර්තමානයේ බිහිවන සංවර්ධන ව්‍යාපෘති සියල්ල අරමුණු ගත ප්‍රජා සංවර්ධනය

කරා ලගා නොකරන, දිළිඳුබව සංවර්ධනය කරන්නා වූ ව්‍යාපෘති බවට පත් වී ඇති බව දිළිඳුකම පිළිබඳ ඇති සංඛ්‍යා දත්ත තහවුරු කරමින් තිබේ.

මෙම වට පිටාව තුළ දිගින් දිගටම ප්‍රජාව තම අවශ්‍යතා හෝ අවට ලෝකයේ සිදුවන දේ ප්‍රශ්න නොකරන, තර්ක නොකරන අතර ප්‍රජා සංවර්ධනය උදෙසා අවශ්‍ය වන්නා වූ නිර්මාණශීලී දැනුමේ පවතින රික්තය තව තවත් වර්ධනය වෙමින් පවතී. ඒ අනුව වර්තමාන දැනුම පිළිබඳ මානව විද්‍යාඥයින් විසින් ඉදිරිපත්කරන ලද දැනුම ගොඩනැගෙන්නේ ඉන්ද්‍රියන් මගින් ලබා ගන්නා සරල දැනුම (ඉන්ද්‍රිය ගෝචර දැනුම) හා තාර්කික දැනුම එකතු වීමෙන් යන්න අදහස තවදුරටත් තහවුරු කරමින් තිබේ. මන්ද?, තර්කයක් නොමැති තැනැත්තා, නිර්මාණශීලීත්වයක් නැති තැනැත්තා තමා අවට ලෝකයේ සිදුවන දේ ප්‍රශ්න නොකරන අතර ජීවත් වන ලෝකය වෙනස් කිරීමට නොව තම දියුණුව පවා ඇතිකර ගැනීමට නොසිතන බැවිනි.

ප්‍රජා සංවර්ධනයේදී නැතහොත් ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකයින්ගේ අවශ්‍යතාවය විය යුත්තේ මේ පවතින රටාව ඉක්මවා යා හැකි නිර්මාණශීලී ප්‍රජාවක් ගොඩනැංවීමයි. ඒ සඳහා ඔවුන් තම වටපිටාව පංචේන්ද්‍රියන්ගෙන් ග්‍රහණය කරගන්නා වාස්තවික ලෝකය නැතහොත් ජීවමාන සංජානනය තුල සරල මතුපිට හඳුනාගැනීම් සංවේදනය කරගත යුතු අතර ඒ මත පිහිටා සංකල්පනාව ගොඩනගා ගත යුතු වේ. මෙම සංකල්පනා වඩා අවබෝධ කර ගැනීමෙන් මිනිස් මනසේ ප්‍රජානනය කරගැනීම සිදු විය යුතුයි. මෙලෙස පංචේන්ද්‍රිය ගෝචර දැනුම, තර්කය දැනුම හා මුසුව නිර්මාණශීලී චින්තනයක් මිනිස් මනසේ හට ගනීද ඒ මත පිහිටා ප්‍රජාව සංවර්ධනය සිදු කිරීමට නැතහොත් ප්‍රජාව දැනුවත් කිරීම සිදු කළ හැක.

අප ආයතනය (ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය) ප්‍රජා සංවර්ධනය නැතහොත් ප්‍රජාව සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය ලෙස සිදුකෙරෙන්නේ වර්තමානයේ මානව විද්‍යාඥයින් විග්‍රහ කරන්නාවූ මෙම ප්‍රජානනය දක්වා වූ දැනුමේ අදියර දක්වා ප්‍රජාව දැනුවත් වීමට අවශ්‍ය පහසුකම් සැලසීමයි. සජීවීකරණ වැඩපිළිවෙල මගින් ප්‍රජාවගේ ස්වශක්තිය සහ සහභාගිත්වය ඇති කිරීම තුළ සිදු වන්නේ දැනුමේ මෙම පියවරයන් වෙත ප්‍රජාව තනි තනිව හා සාමූහිකව ලගාවීමට පහසුකම් සැලසීමයි. නැතහොත් ප්‍රජාවගේ විඥ්ඥානය පිබිදවීමයි.

**විඥ්ඥානය පිබිදවීම**



නූතන අධ්‍යාපන මනෝ විද්‍යාඥයින්ගේ අදහස සියලුම දෙනාට එක සමාන වූ පන්ති කාමර අධ්‍යාපනයක් ලබාදීම සුදුසු නොවන බවයි. එසේම විවිධ වූ පෞරුෂත්වයන්ට විවිධ විභව ශක්තීන් ඇති බව පෙන්වා දෙති. අප ආයතනය ද මෙම කරුණ බොහෝ කලක සිට තහවුරු කරගෙන කටයුතු කරන ලද අතර දැනුම (විඥ්ඥානය පිබිදවීම) ලබා දෙන්නා වූ සජීවීකරණ ක්‍රියාවලිය තුළ පුද්ගලයින් වෙන්වෙන්ව හඳුනා ගැනීම තුළ සිදු කෙරේ. මින් පැහැදිලි වන්නේ නූතන අධ්‍යාපන මනෝ විද්‍යාඥයන් පෙන්වා දෙනු ලබන මෙම කරුණ කෙරේ අවධානය යොමුකරමින් කටයුතු කළ බව නොවන්නේ ද?. එසේම එක් කරුණක් සංජානනය කර ගත නොහැකි පුද්ගලයන් වෙනත් කරුණක් ඉතා පහසුවෙන් සංජානනය කරගනු ලබයි. මෙම මනෝවිද්‍යාත්මක කරුණ සනාත කරමින් සජීවීකරණ කාර්යයේදී පුද්ගල විභව ශක්තීන් මතුකර ගැනීම උදෙසා පුද්ගල කේන්ද්‍රීය පුහුණුවක් වූ සහභාගිත්ව පුහුණු ක්‍රමවේදය අනුගමනය කරයි. මේ ඔස්සේ පුද්ගල විඥ්ඥානය පිබිද වීම නැතහොත් අධ්‍යාපන මනෝවිද්‍යාඥයින්ගේ විග්‍රහයට අනුව දැනුම, සංජානනය, සංවේදනය,

සංකල්පනා, ප්‍රජානනය ඉක්මවා නිර්මාණශීලී චින්තනය දක්වාම පුද්ගලයා දැනුවත් කිරීම සිදුකෙරේ. මෙය සම්ප්‍රදායික අධ්‍යාපනය තුළින් ලබා දෙන්නා වූ දැනුම ඉක්මවූ ඥාන සම්පාදනයකි. මේ තුළ ජීවී හෝ අජීවී ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට භාවිතා කරන මූලධර්ම පුද්ගල විභවතාවයන් නැතහොත් ස්වශක්තිය මතුකර ගැනීම සඳහා නැතහොත් මානවයා සඳහා භාවිතා කිරීම ඵලදායී නොවන බවත් අතීතයේ සිටම මානවයා යනු සැමවිටම ප්‍රශ්නය විසඳන්නෙක් වූ බවත් ඔවුන් සැමවිටම බාධක ජය ගැනීමට අවශ්‍ය ක්‍රමවේද හඳුනා ගැනීමට හා විසඳුම් සොයා ගැනීමට පසුබට නොවන බවත් තහවුරු කර ඇත. එබැවින් මේ සඳහා ප්‍රජාව පෙළඹවීම සජීවිකරණ ක්‍රියාවලියේ දී සිදු කෙරේ. විඥ්ඥානය ලැබීම නැතහොත් ප්‍රජානනය ලැබීම ආරම්භ කරන්නේ තම පරිසරය ඇසුරින් වන අතර ඉන් ලබන තොරතුරු දත්ත පදනම්කර ගනිමින් ගොඩනගා ගන්නා තර්කය ඇසුරින් එදිනෙදා දිවි පෙවෙත තුළ විවිධ ලෙස විඥ්ඥානය (ප්‍රජානනය) ලබාගැනීමට හුරු කිරීම සජීවීකරණය කිරීම තුළින් සිදු කෙරේ.

**සජීවීකරණය (සහභාගිත්ව සංවර්ධනය) භාවිතයේ වලංගු භාවය.**

සජීවිකරණයේ දී (සහභාගිත්ව සංවර්ධනයේ දී) සිදුවන්නේ මෙම විඥ්ඥානය පිබිදවීම, ප්‍රජානනය නැතහොත් පවත්නා තත්ත්වයන් විග්‍රහ කරගනිමින් එක් එක් ගැටලු සඳහා නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීමයි. එනම් ප්‍රජාවට තම ප්‍රශ්නය ගැටලු හඳුනා ගැනීමට, විසඳුම් යෝජනා කිරීමට, සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා ඒ මත ප්‍රතිලාභ ලබා ගැනීමට හා තිරසරව පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම සම්පාදනයයි. මෙහිදී මේ හැම අවස්ථාවක් සඳහාම ප්‍රජාව තම ශක්තිය මත පිහිටා තමා ම විසඳුම් සොයා ගැනීමට ඇති හැකියාව විඥ්ඥානය පිබිද වීම තුලින් ලබන බවට ඇති කර ගන්නා විශ්වාසය මත සජීවීකරණය ක්‍රමවේදය ක්‍රියාත්මක කෙරේ. සත්‍ය ලෙසම සජීවීකරණය වූ ප්‍රජාවක් සිටින්නේ නම් ඔවුන්ගේ ශක්තියෙන් තම ප්‍රශ්ණ ගැටලු ජයගැනීම සත්‍ය ලෙසම සිදු වන්නකි. ඒ අනුව විඥානය පිබිද වීම සජීවිකරණයේ (සහභාගිත්ව සංවර්ධනයේ) පදනමයි. වර්තමානය වනවිට විඥ්ඥානය පිබිදවීම සඳහා පහසුකම් සපයන්නා තුළ ඇති හැකියාව, පුහුණුව, කැපවීම වැනි ගුණාංග රැසක් ඒ කෙරෙහි බලපෑම් කරමින් පවතී. එසේ නම් සජීවිකරණයේ වලංගු භාවය නැතහොත් සහභාගිත්ව සංවර්ධනයේ වලංගුභාවය වෙත ඇඟිල්ල දිගුකරන ඔබට වර්තමාන දැනුම් යුගයේ අධ්‍යාපන මනෝවිද්‍යාඥයින් විග්‍රහ කරන දැනුම ගැන කුමක් පැවසිය හැකිද?... ඔවුන්ට අනුව දැනුම ලබාගන්නා පියවරයන් (ප්‍රජානනය දක්වා වූ පියවරයන්) පිළිබඳ කුමක් කිව හැකි ද?.. මේ කියන්නා වූ දැනුමේ වලංගුභාවය අහෝසි වී ඇත් ද?. එසේ නොවන්නේ නම් ප්‍රජානනය ඉක්මවා යන්නාවූ විඥ්ඥානය පුබුදු කිරීමේ ක්‍රමවේදය පදනම් කරගන්නා වූ සජීවීකරණය නැතහොත් සහභාගීත්ව සංවර්ධනයේ වලංගුභාවය ගැන ඔබට කුමක් කිව හැකි ද?. ප්‍රජා සංවර්ධනය උදෙසා ප්‍රජාව දැනුම්වත් කරන්නා වූ මෙම ක්‍රමවේදය භාවිතය පිළිබඳ ඔබට කිව හැක්කේ කුමක්ද?. නව දැනුම් යුගයේ බිහිවන පුද්ගලයාට (නව පරපුරට) නව තාක්ෂණය භාවිතයේ දී පවා කුමනාකාරයේ කරුණු හැදෑරුවද තම කාර්යයන් පිළිබඳ ප්‍රජානනය දක්වා වූ දැනුමේ පියවරයන් වෙත ලගාවීම අවලංගු වන කරුනක්ද?... එලෙස විඥනය ලබාගැනීම ඔවුන්ගේ සාර්ථකත්වයට (සංවර්ධනයට) හේතුවක් මිස අදාල නොවන්නක් වන්නේ කෙසේද?. නව පරපුරට පවා විවිධාකාර ඉසවු ඔස්සේ ඥාන සම්පාදනයට (දැනුම ලබා දීමට) භාවිත කල හැකි වන වන සජීවීකරණය (විඥ්ඥානය පිබිදවීම) යල්පැන ගිය ක්‍රමවේදයක් බවට පත්වන්නේ කවදාද?.. කෙසේද?...

එසේනම් ප්‍රජාව සංවර්ධනය කරා ගෙනයාමට දැනුවත් කරන ක්‍රම වේදය ලෙස සජීවීකරණය (විඥ්ඥානය පිබිදවීම) යල්පැන ගිය ක්‍රමවේදයක් බව ඔබ විසින් සඳහන් කරන්නේ මන්දැයි සිතා බැලිය යුතු නොවන්නේ ද?. සිතන්න එසේ යල් පැන ගිය ක්‍රමවේදයක් බවට පත් වී ඇත්නම් ඒ කවදා කෙසේ සිදු වී ඇත් ද?. නැත හොත් අවලංගුවීමට පත්වන්නේ කවදා, කුමන, නව ක්‍රමවේදයක් පදනම් කර ගනිමින්ද?.. සිතන්න නැවත නැවත් සිතන්න ප්‍රජාව විඥ්ඥානය කරන්නා වූ සජීවීකරණ ක්‍රමවේදය අවලංගු වී ඇත්තේ එය භාවිතා කරන්නා වූ අපගේ දැනුම හා

එහි භාවිතයේ පවතී නොදැනුවත් භාවයද?. නැතහොත් ප්‍රජා සංවර්ධනයේ පදනම ලෙස සලකන සජීවීකරණ ක්‍රමවේදයේ (සහභාගීත්ව සංවර්ධනයේ) පවතින, නැත හොත් විඥ්ඥානය පිබිදවීමේ පවතින අවලංගුභාවය ද? යන වග.

**මූලාශ්‍ර**


- අන්තර්ජාලය
(https://leftlibrary.net/archives/4950 /
https://vk.com/@-184822871-knowladge /
https://www.facebook.com/ceylonlibrarian/posts
- ඩයිනිස් ඒ.පී., පල්ලේගෙදර සිරිල් - සමාජ සජීවීකරණය -සංකල්ප, ක්‍රමවේදය, භාවිතය, අභියෝග, සහ පුහුණු අත්වැල -2011
- ශ්‍රී ලංකා පදනම් ආයතන - සහභාගිත්ව පුහුණු අත්පොත- -1994
- ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යාස කටයුතු සඳහා - ප්‍රජා සංවර්ධනය පුහුණු අත්පොත කොන්රාඩ් - ආඩිනවුර් පදනමේ අනුග්‍රහයෙන් 1978
- ස්ටැන්ලි ගජනායක, ජයා ගජනායක - ප්‍රජාව සවිබලකරණය - ප්‍රජා ව්‍යාපෘති සඳහා සහභාගීත්ව අත්පොත. 1995
- පෙරේරා අයි. රණසිංහ - පුහුණු ක්‍රමවේදය -හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය-1996-
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - විපර්යකාරක පුහුණු ක්‍රමවේදය _ සමෘද්ධි යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය- 1999
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය -නව සංවර්ධන ප්‍රවේශය -1992
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - ග්‍රාමසංවර්ධනය හා සමාජ සජීවීකරණය -2010
- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - විපර්යකාරක කයීය බද්ධ පුහුණුව -අත් දැකීම _ 2000
- ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය - පුහුණුකරු පුහුණුව- අත්දැකීම - 2000

# 03. ආන්තික ප්‍රජාව සවිබලගැන්වීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා නීතිය පිළිබඳ දැනුම ගළපා ගැනීමේ වැදගත්කම.

ආචාර්ය, ඩී.ඒ.පී.දාස්වත්ත
පුහුණු හා පර්යේෂණ නිලධාරි
*PhD. (Micro Enterprise)*

රටක සංවර්ධන ක්‍රියාවලිය තුළ ආන්තීකරණයට පත් ප්‍රජාව සවිබල ගැන්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. මෙම ප්‍රජාව ආර්ථික, සමාජ, දේශපාලන, පාරිසරික හා නීතිමය වශයෙන් බල ගැන්වීම කාලීන අවශ්‍යතාවයක් වන අතර නීතිමය බලගැන්වීම කෙරෙහි මෙම ලිපිය තුළ අවධානය යොමු කෙරේ. ශ්‍රී ලංකාවේ ආන්තික ප්‍රජා කණ්ඩායම් අතර කාන්තාවන් සහ ගැහැණු ළමුන් සුවිශේෂී වේ. වර්තමාන සමාජය තුළ සීඝ්‍රයෙන් වර්ධනය වන භෞතික සංවර්ධනය අප සාක්ෂාත් කරගෙන ඇත්තේ මනුෂ්‍ය ජීවිත වලින් මනුෂ්‍ය ගරුත්වය හා වටිනාකම්ද ඈත් කරමිනි. මෙම තත්ත්වය යටතේ දරුණු පීඩාවන් අත්විදින්නේ කාන්තාවන් හා දරුවන්ය. කාන්තාවන්ට හා දරුවන්ට එරෙහි හිංසා ක්‍රියා හා ඒවා සිදුවන අවස්ථානුගත තත්ත්වවල ස්වභාවය සංකීර්ණ වී ඇති අතරම එම දරුණු හිංසනයන්ගෙන් කාන්තාවන්ට හා දරුවන්ට අත්කර දෙන ප්‍රතිඵලද බොහෝ සංකීර්ණ වී ඇත. එම නිසා "කාන්තාව" අපගේ මව, ඔබගේ බිරිඳ, සොයුරිය හෝ දියණිය මිනිසාගේ අසංවේදිතා හෙවත් කෲරත්වයට ගොදුරුවීම වැළැක්වීමට බහුවිධ ආරක්ෂාව පිළිබඳ ක්‍රමෝපායන් සැළසුම් කළ යුතුව ඇත.

කාන්තා හා ගැහැණු දරු හිංසනයට එරෙහිව ප්‍රතිචාර දැක්වීමේදී වැඩිම වගකීම පැවරෙන්නේ නීතියට හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන වලටය. නීතිය ක්‍රියාත්මක කරන නිලධරයන් වගකීමෙන් හා අවබෝධයෙන් ක්‍රියා කිරීමට නම් ඔවුන්ගේ දැනුම හා ශක්‍යතාව නගාසිටුවිය යුතුව ඇත. එසේම සමාජයක් වශයෙන් වගකිව යුතු සෑම ජනකොට්ඨාශයක්ම නීතිය පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කළ යුතුය. නීතියේ බලය සමාජයෙන් ගිළිහී ගිය විට එවන් සමාජයක් අරාජික තත්ත්වයකට පත් වී මිනිස් ජීවිත අනාරක්ෂිත වේ. එම නිසා නීතියේ බලය සුරැකීම ශිෂ්ට සම්පන්න සමාජයක මිනිසත් බව අගය කරන සෑම මනුෂ්‍යයෙකුගේම වගකීමකි යුතුකමකි.

කාන්තාවන් හා ගැහැණු ළමුන් සම්බන්ධව මහත්මා ගාන්ධි මෙලෙස ප්‍රකාශ කර ඇත. "ගැහැණිය අහිංසාවේ ජීවමාන පිළිබිඹුවයි. අහිංසාව යනු අසීමිත ප්‍රේමයයි. එයින් අදහස් වන්නේ දුක්වේදනා දැරීමේ ලා ඇති අසීමිත හැකියාවයි. මිනිසාගේ මව වූ ගැහැණිය මිස මේ හැකියාව ඉතා ඉහළම ප්‍රමාණයෙන් පෙන්වා දෙන්නේ කවරෙක්ද? බිළිඳා දස මසක් කුසෙහි දරා පෝෂණය කරමින් එයින් හට ගැනෙන දුක්වේදනාවෙන් සතුට ලබමින් ඇය මේ හැකියාව ප්‍රකාශ කරයි. ප්‍රසූත වේදනාවන් පරදා ලිය හැකි වෙනත් වේදනාවක් තිබේද? උපත ලබාදීමේ ප්‍රීතියේදී ඇය මේ වේදනාව අමතක කර දමයි. යළිදු තම දරුවා දිනෙන් දින වැඩෙනු දකිනු වස් දිනපතා දුක්වේදනා උසුලන්නේ කවරෙක්ද? ඒ ආදරය මුළු මහත් මිනිස් සංහතියටම පතුරවාලන්නට ඇයට ඉඩ සළසන්න. එවිට මිනිසාගේ මව ලෙසත්, ඔහුගේ නිර්මාතෘ ලෙසත්, ඔහුගේ නිහඬ නායිකාව ලෙසත් මිනිසා සමඟ ඇයට හිමි ප්‍රෞඩ ස්ථානයේ ඇය සිටිනවා ඇත. සාමය නැමති අමාව අවශ්‍යව සිටින කලහකාරි ලෝකයට සාමයේ කලාව ඉගැන්වීමේ කාර්යය ඇයට පැවරී ඇත."

“නීතිය නොදැනීම නිදහසට හේතුවක් නොවේ.” යැයි ලතින් කියමනක් තිබේ. රටක ජීවත් වන සියලු පුරවැසියන් තම රටේ නීතිය පිළිබඳ දැනුවත්ව සිටිය යුතුයි යන්න මින් අදහස් කරයි. මේ තත්ත්වය යටතේ ළමයින්ට හා කාන්තාවන්ට අදාළ නීති සම්බන්ධව ජනතාව හා සේවා සපයන්නන් දැන සිටිය යුතුය.

ශ්‍රී ලංකාවේ කාන්තා හා ගැහැණු දරුවන් හිංසනයෙන් ආරක්ෂා කිරීම සඳහා අදාළ නීති පුළුල් කර ඇත. නමුත් බොහෝ කාන්තාවන් හා ගැහැණු දරුවන් අතර මේ පිළිබඳ දැනුවත්භාවයක් නොමැත. නමුත් නීතිය සම්බන්ධයෙන් බලගැන්වීම කාලින අවශ්‍යතාවයකි. කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට එරෙහිව සිදු කෙරෙන හිංසාකාරි ක්‍රියා තව දුරටත් හුදු අපරාධ වරදවල් පමණක් නොවේ. ඒවා දේශීය නීතිය මෙන්ම අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන්හි පිළිගෙන ඇති කාන්තා අයිතිවාසිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීමද සංයුක්ත කරයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කාන්තාවන්ට සිදුවන හිංසනය ශ්‍රී ලංකාව හා ලෝකය පුරාම තීව්‍ර හා උග්‍ර ලෙස ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. සෑම සමාජ ස්ථරයකටම අයත් කාන්තාවන්ට සහ දරුවන්ට බලපෑමක් ඇති කරන මෙම හිංසන ක්‍රියා විවිධ ස්වරූපයන් ගන්නා අතර පුද්ගල සහ සමාජ මට්ටමින් බරපතල ප්‍රතිඵල ජනිත කරමින් නව සංකීර්ණතා ඇති කරයි.

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය නිර්වචනය කරන අන්දමට කාන්තාව යනුවෙන් අදහස් කරන්නේ වැඩිහිටි ස්ත්‍රියකි. පවුලක් තුළ කාන්තාවගේ කාර්යභාරය විවිධාකාර වේ. පවුලක් තුළ ඇය වගකීම් දරන්නා වූ ප්‍රධාන පදවි හතරක් පැහැදිළිව හඳුනාගත හැකිය. (මව, බිරිඳ, දියණිය, සහෝදරිය) කාන්තාව හුදකළාව ජීවත්වන කෙනෙකු නොව ඇය නිරන්තරවම පවුලක හා ප්‍රජාවක කොටස්කාරියකි. ඇය පවුල හා ප්‍රජාව කෙරෙහි ඇති කරන බලපෑම හා සමානව පවුල හා ප්‍රජාව විසින් කාන්තාව වෙතද හිතකර හෝ අහිතකර ලෙස බලපෑමක් ඇති කරනු ලැබේ. නූතන කාන්තාව පවුලට ආර්ථිකයට දායකත්වයක් ලබාදීම සඳහා රැකියාවක ආදායම් උත්පාදන මාර්ගයක නියළීම, සහ සමාජමය වශයෙන් විවිධ තනතුරු සහ වගකීම් දරමින් නූතන සමාජය තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

මේ තුළ විවිධාකාරයෙන් කාන්තාවන්ට සිදු වන්නා වූ වෙනස් ලෙස සැළකීම තුරන් කිරීම සඳහා 1979 දී ස්ත්‍රීන්ට ඒරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය, කාන්තාවන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා කැපවූ නීතිමය බැඳීමක් ඇති පළමු අන්තර්ජාතීය සම්මුතිය වේ (සීඩෝ සම්මුතිය). මානව අයිතිවාසිකම් අහිමි වූ පුද්ගලයින්ට සීඩෝ කමිටුවට අදාළ පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී.

කාන්තාවන්ට සමාජය තුළ සිදු වන්නා වූ විවිධ කායික හා මානසික හිංසනයන් ( පවුල තුළ සිදු වන, ප්‍රජාව තුළ සිදු වන, රජය මඟින් සිදු කරන) තුරන් කිරීම උදෙසා කාන්තාවන්ට එරෙහි හිංසනය තුරන් කර ගැනීමේ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය (DEVAW ) 1993 ප්‍රකාශයට පත්කර ඇත.

1948 ප්‍රකාශයට පත්කර ඇති මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය අනුව පුරුෂයින්ගේ හා කාන්තාවන්ගේ සමාන අයිතිවාසිකම් පිළිගෙන ඇත.

1966 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියට අනුව සියලුම තැනැත්තෝ නීතිය ඉදිරියේ එක සමාන වන බවත් පෙන්වා ඇත.

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට හා ළමයිනට අදාළ නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු ආයතන පහත පරිදි හඳුනාගත හැකිය.

- ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය (ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව, ළමා ලේකම් කාර්යාලය)
- කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව - 1994 (කාන්තාවන් හා දරුවන් ලිංගික සූරා කෑමෙන් වැලැක්වීම, ගෘහස්ථ හිංසනයන්ගෙන් හා රාජකාරි ස්ථාන වල සිදුවන හිංසනයන්ගෙන් බේරා ගැනීමට කාන්තාව දැනුවත් කිරීම
- කාන්තා පැමිණිලි මධ්‍යස්ථානය
- ළමා හා කාන්තා අපයෝජනය වැළැක්වීම පිළිබඳ කාර්යාංශය (කාන්තාවන්ට හා ළමයිනට එරෙහි අපරාධ විමර්ශනය, පොලිස් ස්ථාන විසින් ගනු ලබන ක්‍රියා මාර්ග සොයා බැලීම හා අධීක්ෂණය, අපරාධ වැළැක්වීම සඳහා මහජනයා දැනුවත් කිරීම
- ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය1978 (ශ්‍රී ලංකාවේ කාන්තාවන් බල ගැන්වීම)
- පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව
- විශේෂ පොලිස් විමර්ශන ඒකකය
- කාන්තා හා ළමා කටයුතු අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

සංවර්ධන ක්‍රියාදාමය තුළ ආන්තීකරණයට පත් ප්‍රජාව (විශේෂයෙන් කාන්තාවන් හා ගැහැණු ළමුන් ) සවිබල ගැන්වීමේදී ඔවුනට අභියෝගාත්මක බලපෑම් එල්ල වීමට හේතුකාරක වන නීතිය පිළිබඳ අඩු දැනුම නැතිනම් නීතිය නොදන්නාකම නැමති ගැටළුවට විසඳුම් පිණිස ඔවුනට නීතිය ඉදිරියේ නොබියව පෙනී සිටීමට හැකිවන පරිදි බල ගැන්වීමේ ක්‍රියාවලියක් දියත් කිරීම වගකිව යුතු පාර්ශවයන්ගේ සමාජ වගකීමක් වන්නේය.

# 04. ශ්‍රී ලංකාවේ පවත්නා වත්මන් ආර්ථික අර්බුදය හමුවේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය.

එස්.එම්.යූ.බී. සමරකෝන්
පුහුණු හා පර්යේෂණ නිලධාරි
*Bcom (Special)*

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් 2022 වසරේ ජූලි-අගෝස්තු මාසවල ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන්නට යෙදුණි. මෙහි ප්‍රධාන අපේක්ෂාව වූයේ වර්තමානයේ අප රට මුහුණ දී ඇති ආර්ථික අර්බුධය හමුවේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වයට කර ඇති බලපෑම කෙබඳුදැයි විග්‍රහ කර බැලීමයි.

ඒ අනුව අප පර්යේෂක කණ්ඩායම විසින් මෙම අධ්‍යයනය සඳහා මහනුවර, මාතලේ, කෑගල්ල යන දිස්ත්‍රික්කවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් අතරින් ගම්මාන 19 ක් තෝරා එක් ගම්මානයකින් පර්යේෂකයාගේ පහසුව හා කැමැත්ත මත මෙන්ම අධ්‍යයනය සඳහා වඩා සුදුසු යැයි හැඟී ගියා වූ අහඹු ලෙස තෝරාගත් ප්‍රතිලාභී පවුල් 10 බැගින් පවුල් **190 ක්** නියැදිය වශයෙන් තෝරාගන්නා ලදි. ඒ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1-ගංගොඩ, කිරිමැටිය වත්ත, 171-ගෝවින්දල, අරඹේගම-නැගෙනහිර, 168-ඌරාපොළ, අමුණුපුර, 172-පඬරල්දෙණිය, 184- පහළ යටිගම්මන, ඇඹිල්මීගම උතුර, ඇඹිල්මීගම දකුණ, 205-කඩුගන්නාව නගරය, 159-මල්ගම්මන යන වසම්ද, කඩවත්සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩපේරාදෙණිය වසමද, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්ගමන්දෙණිය වසමද, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුරුද්දෙණිය වසමද, කෑගල්ල දිස්ත්‍රික්කයේ 75 B-මාරුක්වතුර, 11-පිටියේගම, බෙම්පිමුල්ල වසමද, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොඹගස්දෙණිය වසමද නියෝජනය වන පරිදි නියැදි පවුල් තෝරාගන්නා ලදි.

ඒ අනුව මෙම අධ්‍යයනය සිදුකිරීමේ ප්‍රමුඛ අරමුණ වූයේ වර්තමාන ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද සමෘද්ධිලාභී පවුල් වල වර්තමාන ජීවන තත්වය හඳුනා ගැනීමයි. එසේම අනාගත ආර්ථික හා සමාජ අභියෝගවලට සාර්ථකව මුහුණ දීම සඳහා ඔවුන්ට සූදානම් වීමට ඉඩ හැරීමත් ඒ සඳහා මානසික සූදානමක් ඇතිකරලීමත් මෙම පර්යේෂණ කාර්යයේ ද්විතියික අරමුණ විය.

තවද මෙම අධ්‍යයන කාර්යය කරගෙන යාමේදී අප කණ්ඩායමට පවත්නා ආර්ථික හා සමාජීය වටපිටාව හමුවේ විවිධ අපහසුතා හා සීමාකම් (Limitations) වලට අවනත වීමට ද සිදු වූ බව කිව යුතුය. එහිදී ඉන්ධන හිඟය හා බැදුණු ප්‍රවාහන අපහසුතා විශේෂයෙන් සඳහන් කල යුතුය. නියැදියේ ඒ ඒ පවුල් වෙනුවෙන් වෙන වෙනම සිදු කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයන උපයෝගි කරගනිමින් අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා ගැනීමට යොමු විය. එසේම ලබා ගන්නා ලද එම තොරතුරු එම අවස්ථාවන්හිදීම හරස් පරීක්ෂාවට ලක් කරමින් එම දත්ත වල වලංගුභාවය තහවුරු කරගන්නා ලදි. පවුලේ ආදායම හා වියදම පිළිබඳව ලිඛිත වාර්තා ප්‍රතිලාභීන් සතු නොවීමෙන් ඒ හා සම්බන්ධ දත්ත

ප්‍රතිලාභින්ගේ ස්මරණය තුළින් ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් වැය කිරීමට සිදු විය. සමෘද්ධි වැනි ආධාර ඉදිරියේදී අහිමිවේය යන හැඟීම නිසා නිවැරදිව ඒවා හෙළි නොකරන අවස්ථා ද විය.

ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන දිළිඳුකම පිටුදැකීමේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන සමෘද්ධි වැඩසටහනයි. දකුණු ආසියානු කලාපයේ රටක ක්‍රියාත්මක වඩාත්ම පුළුල් සමාජ ආරක්ෂණ වැඩසටහන ලෙසට ද මෙය සැලකේ. **1995 අංක 20 දරණ සමෘද්ධි පණත** සම්මත වීමෙන් පසු එම වර්ෂයේ ජූනි මාසයේ දී මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ අතර සමෘද්ධි වැඩසටහනේ පරිපාලන හා කළමනාකරණ කාර්යයන් මෙහෙයවීම සඳහා සමෘද්ධි අධිකාරිය නමින් නව අධිකාරියක් ද ස්ථාපිත කෙරිණ. සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමග එතෙක් පැවති ජනසවිය, පාසැල් ළමයින් සඳහා වූ දිවා ආහාර වැඩසටන, ආහාර මුද්දර ක්‍රමය යන සුබසාධන වැඩසටහන් ද අහෝසි විය.

2013 වර්ෂයේ සම්මත කල දිවිනැගුම පනත මගින් එතෙක් ක්‍රියාත්ක වූ සමෘද්ධි අධිකාරිය, දිවිනැගුම දෙපාර්තමේන්තුව නමින් පරිවර්තනය කර ඒ සඳහා රජයේ දෙපාර්තමේන්තු ගත පරිපාලනයක් ස්ථාපිත කළේය. **2017 අංක 02 දරණ දිවිනැගුම සංශෝධිත පනත** මගින් දිවිනැගුම දෙපාර්තමේන්තුවේ නම නැවතත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය කරන ලදි. ප්‍රජාවගේ ආදායම් උත්පාදනය ඉහල නැංවීම, පරිසර හිතකාමී ජීවන රටාවක් ඇතිකිරීමට ජනතාව උනන්දු කරවීම, ඉතිරිකිරීමේ පුරුද්ද වර්ධනය කිරීම, සහය සේවා සම්බන්ධීකරණ කටයුතු ආදිය පවත්වාගෙන යාම මෙහි මූලික කාර්යයන් වේ. රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය තුළින් දිළිඳුබව තුරන් කිරීම හා දිළිඳු ජනතාවගේ ජීවන තත්වය වර්ධනය සඳහා ප්‍රජා මට්ටමේ පුළුල් ජාලයක් ගොඩනැංවීම ආදිය ඔස්සේ අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ සංවර්ධනයක් ඇතිකරලීම සමෘද්ධි වැඩසටහනේ අරමුණයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුව පවුලේ ඒක පුද්ගල මාසික ආදායම රුපියල් 6000.00 වඩා අඩුනම් ඔහු සමෘද්ධි ආධාර දීමනා ලැබීමට සුදුසු අයෙකු ලෙස පිළිගනී. ඒ අනුව වර්තමානය වන විට අප රටේ පවුල් **ලක්ෂ 18 ක** පුද්ගලයින් **ලක්ෂ 90** ක් පමණ සමෘද්ධිලාභීන් වන අතර මේ යටතට 2021 කැබිනට් මණ්ඩල තීරණ අනුව අළුතින් සහන ලබාදීමට හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 05 ද ඇතුලත් වේ. ඒ අනුව මෙවර වසර හතකට පසු යළිත් සමෘද්ධි දීමනා වැඩිකර ඇති අතර වසරකට **රුපියල් කෝටි 6500** ක් පමණ අතිවිශාල මුදලක් ජාතික ආදායමෙන් මේ සඳහා වැය කරන බව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යය ෂෙහාන් සේමසිංහ මහතා පවසයි. (අමාත්‍යාංශ වෙබ් පිටුව)

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 වාර්ෂික වාර්තාව දක්වා ඇති පරිදි **නිල දරිද්‍රතා රේඛාවට** අනුව ජනගහන දරිද්‍රතා දර්ශකය 1995/1996 වසරවල පැවැති 28.8 % ක සිට 2019 වසරේදී 3.2% දක්වා අඩු වී ඇත. 2012/2013 වර්ෂ වල ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත භාවිතයෙන් නිල දරිද්‍රතා රේඛාව මෑතකාලීනව යාවත්කාලීන කිරීමත් සමග 2019 වසරේ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනය 14.3% ක් බව පෙන්වයි. ඒ අනුව දරිද්‍රතා රේඛාවට පහළින් පුද්ගලයින් මිලියන 3.04 ක් ජීවත් වේ. 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව දළ වශයෙන් ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුගෙන් එක් අයෙකු දරිද්‍රතාවයට අදාළ බහුවිධ මානයට අනුව (Multidimensional poor) දුප්පත් වේ. මෙය ග්‍රාමීය අංශයේ 16.6% ක් හා වතු අංශයේ 51.3% ක් බව පෙන්වා දෙයි. ( ශ්‍රී ලංකා මහබැංකු වාර්ෂික වාර්තාව 2021,පිටුව 130)

මෙහි ප්‍රතිඵලයක් ලෙස රටේ ජනතාව තම මූලික අවශ්‍යතා අවම මට්ටමකින්වත් සපුරා ගැනීමේ දැඩි සටනක නියැලි සිටින අතර ප්‍රවාහනය, අධ්‍යාපනය, සෞඛ්‍යය, බලශක්තිය යන පොදු සේවා කඩාවැටෙමින් පවතී. ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියල ශීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීම හේතු කොටගෙන ආර්ථිකය මුහුණ දී සිටින ගෙවුම්ශේෂ **(Balance of Payments)** හිගය හමුවේ දේශීය නිෂ්පාදනය කඩාවැටී ඉතා අධික උද්ධමනයකට ජනතාව මුහුණ දී සිටී.

මෙය විශේෂයෙන් පහල හා මධ්‍යම ආදායම් ලබන කාණ්ඩයට දැඩි ලෙස බලපා ඇති අතර ආර්ථික හා සමාජ කාර්යයන් සඳහා අවශ්‍ය වියදම් දරාගැනීමට නොහැකි වී දෛනික කටයුතු කරගෙන යාම සඳහා විශාල අරගලයකට මුහුණදීමට ඔවුනට සිදු වී ඇත.

අප රටේ සංවර්ධනය අරභයා දශක ගණනාවක් තිස්සේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක වුවත්, අප රට වර්තමානයේ මුහුණ දී ඇති තත්වය ඉතා කණගාටුදායකය. ලෝකයේ පිහිටි අති රමණීය දිවයිනක්වූද, ස්වභාවික සම්පත් අනූන හා පාරිසරික සෞන්දර්යයෙන් පිරුණා වූද, වටිනා සාගර සම්පතක් හා දර්ශනීය මුහුදු වෙරළක් මෙන්ම දක්ෂ මානව සම්පතක් සතු වූ නමුත් මෙවන් ඉරණමක් අප රටට උදා වූයේ ඇයිද? යන්න අප අපගෙන්ම ඇසිය යුතු පැනයකි. මේ වන විට වර්තමාන ලෝකයේ බංකොලොත් රටක් බවට අපරට පත් වී හමාරය. මේ සඳහා අප සියලුදෙනා අඩු වැඩි වශයෙන් වගකිව යුතු අතර මෙයට අනාගතයෙන් වන්දි ගෙවීමට සිදු වී ඇත්තේ අපේ අහිංසක දරු පරපුරටය. මෙවන් වටපිටාවක ප්‍රධාන වශයෙන් නැතිබැරි දුප්පතුන් හෙවත් අඩු ආදායම්ලාභීන් මෙකී අවාසිදායක පරිසරයෙන් බැටකමින් සිටී.

නිදහස ලබා අවුරුදු 74ක් ගත වුවත් අප රටට බලාපොරොත්තු වූ සංවර්ධනය ළඟාකර ගැනීමට නොහැකිවී ඇත. විවිධ රජයන් විශාල මුදලක් වියදම් කර විවිධ ව්‍යාපෘති ආරම්භ කලත් ඒවායෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත නොහැකි නිසා අප රට විශාල පසුබෑමකට ලක් වී ගැඹුරු අගාධයක් දෙසට තල්ලු වෙමින් තිබේ. ඒ අනුව වර්තමානයේ රටේ පොදු ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් වත් සපුරා ලීමට නොහැකිව බංකලොත් රටක් බවට පත් වී තිබේ.

මෙවන් තත්වයක් හමුවේ අඩු ආදායම්ලාභී දුප්පතුනට තම ජීවන මාර්ග අහිමි වීමෙන් පවුලේ දෛනික අවශ්‍යතා සපුරාගත නොහැකිව බංකොලොත් භාවයට පත් වී ඇති අතර අනාගත අරමුණු ඉටුකර ගැනීම පිළිබද අපේක්ෂා භංගත්වයට පත් වී ඇත. මේ තත්වය හමුවේ ඔවුන්ගේ පවුලේ වර්තමාන තත්වය විග්‍රහ කර ගැනීමත් ඔවුන් මුහුණ දෙන ආර්ථික, සමාජ, සංස්කෘතික ආදී අභියෝග වලට මුහුණදෙන ආකාරය හා ඉදිරි අරමුණු ඉටුකරගැනීම සඳහා වර්තමානයේ සූදානම් වීම පිළිබද ගැඹුරින් විමසා බැලීම මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු විය.

මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමයක් වන **සිද්ධි අධ්‍යයන ක්‍රමය** උපයෝගී කර ගනිමින් සිදුකරන ලදි. සිද්ධි අධ්‍යයනයක් යනු සැබෑ ලෝකයේ සමාජ සන්දර්භයක් තුළ යම් සිද්ධියක් (හෝ සිද්ධීන්) පිළිබඳ ගැඹුරු සවිස්තරාත්මක පර්යේෂණයකි. සාමාන්‍යයෙන් සිද්ධි අධ්‍යයනයකට ඕනෑම පුද්ගලයෙක්, එක් කණ්ඩායමක්, සංවිධානයක්, සිදුවීමක්, විශ්වාස පද්ධතියක් හෝ ක්‍රියාවක් ඉස්මතු කළ හැකි ය. **ජෝන් ගෙරිං** සිද්ධි අධ්‍යයන ප්‍රවේශය නිර්වචනය කරන්නේ “එකම ඒකක හෝ අවස්ථා හෝ විශාල ජනගහණයක් අවබෝධ කර ගැනීම සඳහා තනි ඒකකයක් හෝ කුඩා ඒකක

සංඛ්‍යාවක්(අවස්ථා) පිළිබඳ දැඩි අධ්‍යයනක්" වශයෙනි. බොහෝ ලක්ෂණ/නිරීක්ෂණ ඇතුළත්ව තිබීම හොඳ සිද්ධි අධ්‍යයනයක ලක්ෂණයක් ලෙස එහි තවදුරටත් අවධානය කර තිබේ. ලක්ෂණ ගණනාවක් භාවිතා කරමින් "ජීවන තත්ත්වය" යන්න ඇගයීමට ලක් කරනු ලබන හෙයින් මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස සිද්ධි අධ්‍යයන ක්‍රමය උපයෝගි කර ගැනීම ඉහළ යෝග්‍යතාවයකින් හා අදාළභාවයකින් යුක්ත ය.

රැකියාවේ ගුණාත්මකභාවය සහ තිරසරබව, ආර්ථික විෂමතාවය, දරිද්‍රතා මට්ටම, අත්‍යවශ්‍යය භාණ්ඩ සඳහා දැරිය හැකි මිල, අවශ්‍යතා මිලදී ගැනිමට ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට අවශ්‍යය. වැඩ කරන කාලය, සෞඛ්‍ය සේවය සඳහා ප්‍රවේශය සහ එහි ගුණාත්මකභාවය, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා ලබා ගැනිමේ හැකියාව, සාක්ෂරතා අනුපාතය, ආයු අපේක්ෂාව, රෝග ඇතිවීම, භාණ්ඩ හා සේවාවවල පිරිවැය, යටිතල පහසුකම් සඳහා ඇති ප්‍රවේශය, පොදු ප්‍රවාහනයේ ගුණාත්මකභාවය, දැරිය හැකි මිල, උද්ධමන අනුපාතය, ජාතික ආර්ථික වර්ධනය, ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය, නිදහස, පාරිසරික තත්ත්වය, දේශගුණය හා ආරක්ෂාව ඇතුළු ලක්ෂණ ගණනාවක් භාවිතා කරමින් ජීවන තත්ත්වය ඇගයීමට ලක් කරනු ලබයි.

එසේම ජීවන තත්ත්වය යනු පුද්ගලයෙකුට සමාජයකට හෝ ස්ථානයකට අදාළ වන ආදායම් මට්ටම, සැප පහසුකම් හා සේවා මට්ටමයි. ජීවන තත්ත්වය අදාළ වන්නේ එය පුද්ගලයකුගේ යහපත් ජීවන මට්ටමට දායක වන බව සලකනු ලබන බැවිනි. ජීවන තත්ත්වය සාමාන්‍යයන් ආර්ථික, සමාජීය, දේශපාලනික හා පාරිසරික කාරණා වැනි පුද්ගලික කාරණාවලින් බැහැර ප්‍රමිතින් ගැන සැලකිලිමත් වේ. ජාත්‍යන්තර නීතියේ "ප්‍රමාණවත් ජීවන මට්ටමක්" ප්‍රථමවරට මානව හිමිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනයේ විස්තර කර ඇති අතර ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳව ජාත්‍යන්තර සම්මුතියේ එය තවදුරටත් විග්‍රහ කර ඇත. ලෝකයේ ජීවත් විය යුතු ස්ථානය ඇගයීමේදී හෝ ආර්ථික ප්‍රතිපත්තියේ සාර්ථකත්වය තක්සේරු කිරිමේදි ජීවන තත්වය පිළිබඳව සාධකය සලකා බැලේ.

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ඇතිව තිබෙන අයහපත් ආර්ථික තත්ත්වය සමෘද්ධි ප්‍රතිලාභී ගෘහ ඒකකයේ ජීවන තත්ත්වයට කුමන බලපෑමක් සිදු කර තිබේ දැයි නිශ්චිතවම හඳුනා ගැනීම සඳහා පහත අවස්ථා දෙකට අදාළ දත්ත සොයා ගැනීමට මෙම අධ්‍යයනය  ක්‍රමය තුළ විශේෂ අවධානයක් යොමු කෙරිණි.

1. ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ඇතිව තිබෙන අයහපත් ආර්ථික තත්ත්වය හට ගැනීමට පෙර (2021ට පෙර) සමෘද්ධි ප්‍රතිලාභි පවුල් ඒකක තුළ පැවති ජීවන තත්ත්වයේ ස්වභාවය කෙබඳු ද?

2. ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ ඇතිව තිබෙන අයහපත් ආර්ථික තත්ත්වය මගින් ප්‍රතිලාභි පවුල් ඒකකයේ ජීවන තත්ත්වයේ ඇතිව තිබෙන වෙනස්කම්වල ස්වභාවය කෙබඳු ද?

ඉහත  අවස්ථාවන් දෙකෙහි තත්ත්වය පහත සඳහන් විචල්‍යයන් ඔස්සේ හඳුනා ගැනීමට ගෘහ ඒකක පාදක කරගත් අධ්‍යයන කරා යොමු විය. අනතුරුව ඒවායේ වෙනස්කම් සංසන්දනාත්මකව විශ්ලේෂණය කොට සමස්ත බලපෑම පිළිබඳව තක්සේරුවකට එළඹුණි.

එම විචලායයන් වූයේ,

- ආදායමේ ඇති වී තිබෙන වෙනස්කම් හඳුනා ගැනීම
- නිෂ්පාදන ප්‍රමාණයේ ඇති වී තිබෙන වෙනස්කම් හඳුනා ගැනීම
- ජීවනෝපාය, වත්කම් හා යෙදවුම්වල වෙනස්කම් හඳුනා ගැනීම
- වෙළෙඳපොල සබඳතාවල ඇති වී තිබෙන වෙනස්කම් හඳුනා ගැනීම
- රැකියා නියුක්ත අවස්ථාවන්හි වෙනස්කම් හඳුනා ගැනීම
- මුදල් ඉතුරුම් හා ණයගැති භාවය තුළ සිදු වී තිබෙන ධනාත්මක හා ඍණාත්මක වෙනස්කම් හඳුනා ගැනීම
- සෞඛ්‍ය, පෝෂණය හා සනිපාරක්ෂක තත්ත්වයන්වල ඇතිව තිබෙන වෙනස්කම් හඳුනා ගැනීම
- සමාජ සබඳතාවල වෙනස්කම් හඳුනා ගැනීම

අධ්‍යයනය අවසානයේ අප විසින් යම් යම් නිගමනවලට එළඹී අතර පවත්නා අර්බුධයට ධනාත්මකව මුහුණදීම සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සුදානම හා නව යෝජනාද ඉදිරිපත් කරන්නට යෙදුණි. ඒවා අතර පහත සඳහන් කරුණු වඩා වැදගත් යැයි සඳහන් කළ හැකිය.

1. සමෘද්ධි වැඩසටහන තුළ අඛණ්ඩ පසු විපරමක් නොවන නිසා ඔවුන් ලබා ගනු ලබන ණය නියමිත කාර්යය වෙනුවෙන් යොදවනවාද යන්න පිළිබඳ ගැටළු මතුවේ. ස්වයං රැකියා සඳහා ණය ලබා ගත්තත් ඔවුන් බොහෝ දෙනෙක් නව ස්වයං රැකියා ආරම්භ කර නොතිබුණි. එම මුදල ඔවුන්ගේ වෙනත් පරිභෝජන අවශ්‍යතාවයන් වෙනුවෙන් යොදවා තිබු බව දක්නට තිබුණි.
2. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අනු පවුල් සමෘද්ධි ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ම සිටීම. සමෘද්ධි ප්‍රතිලාභීන් වැඩිපුර අධ්‍යාපනය නොලද පිරිසක් නිසා ඔවුන්ද සමෘද්ධි ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ඔවුන්ගේ යැපුම් මානසිකත්වය තවදුරටත් වර්ධනය වී සිටින බවක් හඳුනාගත හැකිය
3. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අඩු අධ්‍යාපන මට්ටමක් තිබෙන නිසා ඔවුන් ගේ සමහර දරුවන් අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා පමණක් අධ්‍යාපනයට යොමු වීම. මේ නිසා ඔවුනටද කාලීනව සුදුසු රැකියාවක් කිරීමට ඇති හැකියාව නැති වී යනු ලැබේ.
4. සමෘද්ධි ප්‍රතිලාභීන් දිරිගැන්වීමේ අරමුණින් රජය විසින් ලබා දෙන්නා වූ සහනාධාරයෙන් නිසි ප්‍රයෝජන නොලැබීම. සමෘද්ධි ප්‍රතිලාභීන් ණය ලබා ගැනීමෙන් අනතුරුව එම ණය වාරික පියවීම සඳහා සමෘද්ධි සහනාධාරය කැප කිරීම.
5. සමෘද්ධි ප්‍රතිලාභීන්හට සමෘද්ධිය පිළිබඳ වැටහීමක් නොතිබීම
6. ගෘහ මූලිකයාගේ ආදායමෙන් පමණක් යැපීමට තීරණය කිරීම. නිවාස වල සිටින බහුතරයක් කාන්තාවන් ස්වයං රැකියාවලට යොමු නොවීම.
7. නිවාසවල බහුතරයක් කාන්තාවන් විරැකියාවෙන් පසුවීම. අමුණුපුර වසම තුළ ස්වයං රැකියාවල නියැලී නොසිටින කාන්තාවන් කිහිප දෙනකු කිසිම අරමුණකින් තොරව නිවසටම වී කල් ගෙවීම. මොවුන් දරුවන් හා ස්වාමියාගෙන් යැපෙමින් ජීවත් වේ.

8. පවුලේ වියදම් කළමනාකරණය කර ගැනීමට යොමු වී ඇති අතර අත්‍යවශ්‍ය වියදම් පවා අවම මට්ටමකින් සිදු වේ. මංගල සහ අවමංගල්‍ය කටයුතු අවම අවශ්‍යතාවයන් ඉටු වන පරිදි සිදු කිරීමට පෙළඹීමක ඇත.

9. ගෑස් ලිප් සහ ගෑස් ටැංකි සමෘද්ධි ප්‍රතිලාභීන් සතුව තිබුණ ද ඒවා වසර තුනකින් පමණ පරිභෝජනය කර නැත. දර මගින් ආහාර පිසගනී. ගෑස් වලින් ඉවත් වීම ඔවුනට ගැටලුවක් නොවෙයි.
(ගෙවත්තෙහි වගා කිරීම, මස්, මාළු, කිරි, බිත්තර වැනි ආහාර ද්‍රව්‍ය පරිභෝජනය සීමා කිරීම)

10. සමෘද්ධි ප්‍රතිලාභීන් ලබාගත් ණය ආපසු ගෙවා ගත නොහැකි තත්ත්වයකට පත්වී ණය උගුලේ හිර වී ඇති අතර ඒ තුළ මානසික පීඩනය ඉහළ ගොස් ඇත.

11. සමෘද්ධි ප්‍රතිලාභීන් ලබා ගන්නා ආහාරවල පෝෂණ මට්ටම පෙරට වඩා පහළ ගොස් ඇති බව අනාවරණය විය. මෙයට හේතුව ලෙස එළවළු, මස්, මාළු, කිරි, බිත්තර මිල ඉහළ යාම බලපා ඇත. එය අනාගතයේ දී සෞඛ්‍යය ගැටලු ඇතිවීමට හේතු වේ.

12. අධ්‍යාපන කටයුතුවල කඩාවැටීමක් දක්නට ලැබෙන අතර ඒ සඳහා පොත් පත් මිල ඉහළ යාම, ආහාර වල පෝෂණ මට්ටම පහළ යාම, පුද්ගලික පන්ති සඳහා යොමු කිරීමට මුදල් නොමැතිකම බලපා ඇත. තවද මාර්ගගත ක්‍රමයට ඉගෙනීමට පහසුකම් ළඟාකර ගත නොහැකි වීම නිසා ළමුන් මානසික බිද වැටීමකට ලක්ව ඇත. පාසල් අධ්‍යාපනය අවසාන කළ තරුණ තරුණියන් නිකරුණේ කාලය ගතකරන අතර ඔවුන් ඉච්ඡාභංගත්වයට පත්ව සිටින බව පෙනේ.

13. ආර්ථිකය බිඳවැටීම හමුවේ සොරකම, සූදුව වැනි සමාජ අපචාර ක්‍රියා ඉහළ ගොස් ඇති බව පෙනී යයි.

14. සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභ බෙදා දීම කෙරේ ප්‍රමුඛතාවයක් යොමු කලද සවිබලගැන්වීම කෙරෙහි සැබෑ උත්සහයක් දරා නොමැත.

15. පවතින ඉන්ධන අර්බුදය හා භාණ්ඩවල මිල ඉහළ යාම නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල වශයෙන් කඩා වැටීමක් සිදු වූ අතර ඒවායේ නිරත වූ ශ්‍රමිකයන්ගේ රැකියා විශාල වශයෙන් නැතිවී යාම.

16. ඉන්ධන හා බලශක්තිය හිඟවීම නිසා ප්‍රවාහන අපහසුව හා (තෙල් පෝලිම් වලට යාමට සිදුවීම නිසා) දෛනික කාර්යයන් අඩාලවීම නිසා මුදල් ඉපයීමට තිබූ අවස්ථාව ගිලිහී යාම.

17. ප්‍රෝටීන් බහුල ආහාර පරිභෝජනය අඩු වීම (මස්, කිරි, බිත්තර). මේ නිසා විවිධ ඌනතා හා සංකූලතා ඇති වීම හා ආහාර මිල ඉහළ යාම නිසා පෝෂ්‍යදායී ආහාර ලබා ගැනීමට නොහැකිවූ නිසා කුඩා දරුවන් හා රෝගීන්ගේ පෝෂණ මට්ටම අඩුවීම.

18. පොහොර හා කෘෂි රසායනික හිඟතාවය නිසා ගොවිතැනින් ඈත්වීම හා ගොවිබිම් ප්‍රමාණයේ වපසරිය අඩුවීම නිසා සත්ව හානි වෙනදාට වඩා වැඩි වීම.

19. අදායම් උත්පාදනය පහළයාම හා පවුලේ වියදම් දැරීමේ අපහසුව නිසා පවුලේ ආරවුල් හා ගැටුම් ඉහළ යාම හා ආතතිය ඉහල යාම හා අපේක්ෂාභංගත්වය.

20. ආර්ථික හා සමාජීය ප්‍රශ්ණ හමුවේ සොර සතුරු උවදුර ඉහළ යාම.
21. කොරෝනා වසංගතය හා වර්තමාන ආර්ථික අර්බුධය හේතුවෙන් ආදායම් අඩුවීම, වියදම් වැඩිවීම හා උද්ධමනය තුළ ආහාර ගැනීමේ රටාව, භාණ්ඩ මිලදී ගැනීම හා පරිභෝජනය කිරිමේ රටාව, ආකල්ප, හැසිරීම් හා සිතුම් පැතුම් ඇතුළු සමස්ත ජීවන රටාවම වෙනස් වී ඇත.
22. ගම තුළ බෙදා හදා ගැනීම, සහජීවනය වර්ධනය වී ඇත.
23. දෙමාපියන්ගේ රැකියා අහිමි වීමත් සමඟ කඩාවැටුණු පවුලේ ආර්ථිකය ගොඩනැගීම සඳහා ශක්තියක් බවට පත්වෙමින් දරුවන් තම අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය ආදායම් ඉපයීම ට යොමු වී ඇත.

## 4.2 යෝජනා

1. ස්වයං රැකියාවක් කිරීමේ අරමුණ ඇතිව සමෘද්ධි ප්‍රතිලාභීන් ණය ලබා ගත්තත්, ඇතැමුන් ස්වයං රැකියාවක් ආරම්භ කර නොතිබිණි. ඒ වෙනුවට වෙනත් පරිභෝජන හා අවශේෂ කාරණා සඳහා එම මුදල වැය කර තිබුණි. ප්‍රතිලාභීන් අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කර ඇතිද යන්න පසුවිපරමක් හරහා සොයා බැලිය යුතුය.
2. අනු පවුල් තවත් සමෘද්ධි ප්‍රතිලාභීන් පවුලක් නොවීමට අවශ්‍ය කටයුතු සැලසීම හා ඔවුන් දිරි ගැන්වීම සඳහා උපදෙස් ලබා දීම, ව්‍යවසායකත්වයට නැඹුරු කිරීම වැනි ක්‍රියාමාර්ගවලට යොමුවීම.
3. රජයේ අරමුණ වූ සමෘද්ධි ප්‍රතිලාභීන් දිරිගැන්වීමේ අරමුණ ඇතිව ලබා දෙන්නා වූ ප්‍රතිලාභය ඔවුන් විසින්ම ලබා ගන්නා ණය වාරික පියවීම සඳහා යොදා ගැනීම. සමෘද්ධි ණය ලබාදීමට පෙර ණය ගෙවීමට හැකි ද යන්න සොයා බලා ණය ලබාදීම. නැතිනම් සිදුවනුයේ දිගුකාලීනව සමෘද්ධි ප්‍රතිලාභීන් නිර්මාණය වීම පමණි.
4. රජය මගින් ගනු ලබන සමහර තීන්දු තීරණ සියලුම සමෘද්ධි ප්‍රතිලාභීන්ට උචිත නොවීම. මේ නිසා සමෘද්ධි ප්‍රතිලාභීන් වෙන් වෙන් වශයෙන් ගෙන අධ්‍යයනය කළ යුතුය. එම වගකීම වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි වෙත පැවරිය යුතුය.
5. ශ්‍රම බලකායට අයත් පිරිස නිසි මාර්ගෝපදේශනයට යොමුකර නව රැකියා සඳහා යොමු කළ යුතුය.
6. අධ්‍යාපන ලබමින් සිටින පිරිස කුඩා අවධියේ සිටම කිසියම් තෝරාගත් වෘත්තියමය පුහුණුවකට යොමු කිරීම හා භාෂා දැනුම ලබාදීම.( තොරතුරු තාක්ෂණය, වඩුවැඩ, වාහන අලුත්වැඩියාව)

7. සියලු සමාජ ස්ථර වර්තමාන සමාජ ආර්ථික පසුබෑමේ ප්‍රතිඵල යම් යම් ප්‍රමාණයන්ගෙන් භුක්ති විඳිමින් සිටී. එම සමාජ ස්ථර එකක් මත එකක් රඳා පවතී. එනම් එක් සමාජ ස්ථරයක් අන්‍යෝන්‍ය

වශයෙන් අනෙක් සමාජ ස්ථරය හා බැඳී පවතී. එම සමාජ ස්ථරයේ පහළ කොටස සමෘද්ධි ප්‍රතිලාභීන් නියෝජනය කරන අතර ඔවුනට සිදුවන බලපෑමේ තීව්‍රතාවය වැඩි ය. එම නිසා සමාජ ස්ථර මුහුණ දෙන අභියෝගයන් ට හුදෙකලාව විසඳුම් සෙවීම නොකර ජාතික මට්ටමින් පොදු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

8. ප්‍රතිලාභීන් ස්වයං රැකියා වලට යොමු කිරීම ඒ සඳහා යෝග්‍ය වැඩපිළිවෙළ එම වසම් මට්ටමින් සකස් කිරීම.
9. විකල්ප බලශක්ති ක්‍රම ( පුනර්ජනනීය) ප්‍රවේශ වලට අඩු ආදායම්ලාභීන් වෙත හඳුන්වා දීම.
10. ගෙවත්ත නිසි ලෙස කළමනාකරණය කර වගා සඳහා යොදා ගැනීම.
11. විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා වෘත්තිය පුහුණු ඇති කිරීම හෝ එවැනි ආයතනයක් වෙත ඔවුන් යොමු කිරිමට මඟ පෙන්විය යුතුය.
12. කුඩා දරුවන්ගේ මාර්ගගත අධ්‍යාපන කටයුතු සඳහා වෙනම මධ්‍යස්ථානයක් හෝ පහසුකම් සැපයීම.
13. අඩු ආදායම්ලාභින්ට යම් රක්ෂණ ක්‍රමයකට දායක කිරීම තුළින් ඔවුන්ගේ සෞඛ්‍ය සඳහා යම් උපකාරයක් කිරිම.
14. ආබාධිතයන් සඳහා වෘත්තිය පුහුණුවක් ඇති කිරීම.
15. ස්වයං රැකියාලාභීන්ගේ නිෂ්පාදිත භාණ්ඩ අලෙවි කර ගැනීම සඳහා නව වෙළෙඳපොළ අවස්ථාවන් හඳුන්වා දීම.(සමෘද්ධි පොළ වැනි)
16. වියදම් අවම කර ගනිමින් ස්වයං රැකියා පවත්වාගෙන යාම හා අලෙවි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ස්වයංරැකියාලාභීන් ඒකාබද්ධ කිරිමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරිම. (උදා - ඒ හරහා අමුද්‍රව්‍ය ගෙන ඒම, නිෂ්පාදන අලෙවිය සඳහා රැගෙන යාම, පරිභෝජන භාණ්ඩ එක ස්ථානයකින් තොග මිලට ගැනීම හා රැගෙන ඒම වැනි කාර්යයන් එක වාහනයකින් සිදු කර ගත හැකිවීම මඟින් ප්‍රවාහන වියදම අඩු කර ගත හැකි වේ.)
17. කන්නයකට පමණක් එල හටගන්නා කොස්, දෙල්, පොළොස් වැනි ආහාර වසර පුරාම පර්භෝජනය කිරිම සඳහා ආහාර කල් තබාගැනීමේ ක්‍රම පිළිබඳව නව තාක්ෂණික දැනුම ලබා දීම.
18. ආහාර වියදම් අවම කර ගැනීම හා තම පවුලට වස විෂෙන් තොර ආහාර ගෙවත්තෙන් ලබා ගැනීමත් සඳහා දැනට සිදු කරගෙන යන ගෙවතු වගාව තවදුරටත් දිරිමත් කිරීම සඳහා බීජ, පැල වර්ග හා දැනුම ලබාදීම.
19. ගෙවත්තෙන් නිසි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා සහ ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස කාබනික පොහොර නිෂ්පාදන සඳහා යොමු කිරිම හා ඒ පිළබඳව දැනුම ලබා දීම.

20. මිල අධික වීම නිසා සත්ව ආහාර පරිභෝජනය නොකළත් ප්‍රෝටීන්, විටමින්, ඛණිජ ලවණ බහුල ශාකමය ආහාර ගෙවත්තේ වගා කිරීම සඳහා දිරිමත් කිරිම හා එවැනි ආහාර ගැනීමේ වැදගත්කම හා අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කිරිම. (පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක් හරහා)

21. ණය බරින් මුදවා ගැනීමට කඩිනම් ක්‍රමවේදයක් සැකසිය යුතු ය. රන් භාණ්ඩ උකස්, ණය, සමෘද්ධි හා වෙනත් ණය වීම් නිසා සමෘද්ධි දීමනාව එයට හිලව් වන අතර රන් භාණ්ඩ සින්න වීම් සිදු වෙමින් පවති.
22. ආර්ථික, දේශපාලන, සමාජ වටපිටාව ගැන දැණුවත් කිරීමේ විධිමත් යාන්ත්‍රණයක අවශ්‍යතාවය පැන නැගී ඇත.
23. සමෘද්ධි වැඩසටහනේ ප්‍රතිලාභ ලබාදෙන විට එක් එක් පවුල් මූලික කරගත් (ඉලක්ක කරගත්) වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කිරීම.(කෙටි, මධ්‍යම, දිගු ලෙස)

# 05. ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික අභියෝග හමුවේ කුඩා පරිමාන ව්‍යවසායකයා.

ජී.ජී.එස් බණ්ඩාර
පුහුණු හා පර්යේෂණ නිලධාරි
*BSc. Hospitality Management (Special)*

2019 වර්ෂයේ සිට වසර දෙකකට අධික කාලයක් ලෝකය පුරා පැතිරී ගිය කොරෝනා උවදුරෙන් පසු ඇති වූ ලෝකය වෙලාගත් ආර්ථික අර්බුදයත්, 2021 අවසානයේ සිට ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික අර්බුදයත්, රුසියා, යුක්‍රේන, යුද්ධ තත්වයත් හේතුකොට ගෙන ශ්‍රී ලංකාව ගැටලු රැසකට මුහුණ පාමින් සිටි. ශ්‍රී ලංකාවේ වසරක පමණ කලක සිට පැන නැගී ඇති ආර්ථික හා දේශපාලන අර්බුදය සියළුම ක්ෂේත්‍ර සඳහා විවිධ අයුරින් අහිතකර ලෙස බලපෑම් කරමින් සිටී.



ඒ අතර ව්‍යාපාරික ක්ෂේත්‍රය ප්‍රමුඛවන අතර, මේ අතරින් කුඩා පරිමාන ව්‍යවසායකයා සුවිශේෂි ගැටලු රාශියකට මුහුණ දෙමින් ඇත. මෙහිදී මෙම තත්වයට රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම, අප රටේ දේශපාලනික වටපිටාව, සංස්කෘතික, සමාජමය, කාරනා ආදියේ බලපෑම ඉතා විශාල ලෙස කුඩා පරිමාන ව්‍යවසායකත්වයට හිතකර නොවන අයුරින් බලපාන බව පෙනීයයි. සුළු පරිමාන ව්‍යවසායකයින් සාපේක්ෂව මුහුණ දෙන අභියෝග රැසකි. ඒ ***අතර ප්‍රාග්ධනය හිගකම, තරඟකාරි ආනයන ආදේශන නොමැතිකම, නගරයෙන් ඈත්වත්ම යටිතල පහසුකම් අවමවීම, ව්‍යාපාර සඳහා නිසි සැලැස්මක් නොමැතිකම, ගෝලීය ප්‍රවනතා පිළිබඳ අවබෝධය අඩුකම*** ආදිය ප්‍රධාන වේ.

ඉහත අභියෝග වලට අමතරව ශ්‍රී ලංකාවේ සුළු පරිමාන ව්‍යවසායකයා රටේ පවතින අර්බුධකාරී තත්වය නිසා සුවිශේෂි ගැටලු රාශියකට මුහුණදේ. ඒ අතර, පාරිභෝගික ඉල්ලුම අඩුවීම නිසා අලෙවිය අඩුවීම, අමුද්‍රව්‍ය ඇතුළු යෙදවුම්වල මිල ඉහළ යාම, බැංකු ණය පොලී අනුපාත ඉහළ යාම, ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා, සේවක වැටුප් දීමනා ඉහළ යාම, ඛනිජ තෙල් මිල ඉහළ යාම හා ඛනිජ තෙල් හිගය, ප්‍රවාහන වියදම් ඉහළ යාම, විදුලි බලය ඇනහිටීම හා විදුලිබල ගාස්තු ඉහළයාම, ජල ගාස්තු ඉහළ යාම, වෙළෙඳපොළ තුල යන්ත්‍ර හා උපකරණවල හිගතාවය, අමුද්‍රව්‍ය හිඟකම, ආදී අභියෝග රැසකට මුහුණ දෙමින් සිටි.

මෙවැනි තත්වයක් තුළ වර්තමාන ශ්‍රී ලංකාවේ වැඩකරන ජනගහනයෙන් ඉතා අඩු ප්‍රතිශතයක් ව්‍යවසායකයන් ලෙස ව්‍යාපාරික ක්ෂේත්‍රයට පිවිසෙන අතර, උදාහරණ ලෙස වර්තමාන ශ්‍රී ලංකාවේ වැඩකරන ජනගහනයෙන් 2.8% ක් පමණ වන අතර, මුලු ජනගහනය හා ගණන් බැලීමේදී එය 230000 ක් පමණ සංඛ්‍යාවක් ව්‍යවසායකයන් වන අතර, ඇමෙරිකා එක්සත් ජනපදය පිළිබඳ සැලකුවිට මෙම සංඛ්‍යාව 16% ක පමණ අගයක් ගනී. 2021 වර්ෂය පිළිබඳව සැලකුවිට වැඩකරන ජනතාවගේ ඉහළම ව්‍යවසායකත්ව ප්‍රතිශතය මෙය වේ. මේ පිළිබඳව සැළකුවිට අප රටේ ව්‍යවසායක සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව මෙන්ම සංඛ්‍යාත්මකව ද ඉතා පහළ අගයක්

ගනී. මෙම තත්වය රටේ නිෂ්පාදනය අඩුවීමට දැඩි ලෙස බලපාන අතර මෙවැනි තත්වයක් ඇතිවීමට විවිධ හේතු බලපානු ලබයි. ඒ අතර,

01. ව්‍යවසායකයින් සමාජීය වශයෙන් ඉහළ පිළිගැනීමට ලක් නොවීම සඳහන් කළ හැකිය. සාපේක්ෂව බොහෝවිට මෙම තත්වය ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි අතර, ඉහළ යැයි සම්මත රැකියා සමාජය තුළ ඇතිවීම මත, ඒ සඳහා යොමුවීමට තරුණ ප්‍රජාව වැඩි නැඹුරුවක් දක්වන අතර තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම කෙරේ අඩු නැඹුරුවක් දක්වයි.

02. ශ්‍රී ලංකාවේ ව්‍යවසායික ප්‍රජාව සාපේක්ෂව ආරක්ෂාකාරි නොවීම. බොහෝවිට ලංකාවේ ව්‍යවසායකයින් බිඳ වැටීමට ඇති අවස්ථා අධිකවීම ද, ව්‍යවසායකයින් ක්ෂේත්‍රයට පිවිසීම පහළ වැටීමට හේතු වී ඇත.

03.බලය සඳහා ඇති අධික ආශාවද, ව්‍යවසායකත්වය සඳහා බලපෑම් ඇති කරයි. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය තුළද මෙවැනි තත්වයක් රෝපනය වී ඇති අතර මෙවැනි තත්වයක් ව්‍යවසායකත්වයක් බිහිවීමට සෘජුවම බලපායි.

04. ශ්‍රී ලාංකේය පුද්ගලයා, පවුල, සහ සමාජය තුල ව්‍යවසායකත්වය පිළිබද ඇති නොසැලකිල්ල. මෙයද, සාම්ප්‍රධායික සමාජය තුළම පවතින්නකි. අලුත් දෙයක් ආරම්භ කිරීමට හෝ සිතීමට සැළකිලිමත් වීමක් පවුල තුළ හෝ සමාජය තුළ ගොඩනැගී ඇත්තේ ඉතා අඩුවෙනි. මේ නිසා මෙවැනි තත්වයක් ඇතිවී තිබේ.

05.ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාව තුළ ව්‍යවසායකත්වය කෙරේ සුභවාදී ආකල්ප ගොඩනැගී නොතිබීම. (antipathy among younger generation)

තවද ලංකාව තුල මෙම ව්‍යවසායකත්ව එලඹුම අඩුවීමට බලපාන ප්‍රධාන හේතුන් කිහිපයක් මෙලෙස සඳහන් කල හැකි අතර, ඒ අනුව,

01. දරුවන් කුඩා කාලයේ සිටම වැඩිහිටියන්ගෙන් යැපීමට හුරුකිරීම හෙවත් depend syndrome මෙවැනි තත්වයන් සංස්කෘතිමය වශයෙන්ම අප රට තුළ තිබෙන නිසා මෙය දරුවන් අලුත් දේවල් කිරීමට හුරු නොවීමට බලපායි . එදිනෙදා පවුලේ කටයුතු වලදී දරුවන් සමග දෙමාපියන්, වැඩිහිටියන් , ගුරුවරුන්, කටයුතු කරන ආකාරය මෙහිදී සෘජු ලෙසම බලපාන අතර දරුවන් සමග අපගේ හැසිරීම තුළ දරුවන්ගේ මනස තුළ සිදු වන්නේ කුමක්ද ? යන්න පිළිබඳව නැවත සිතා බැලීම වටින්නේය.

02.අවදානම ගැනීමට මැලිවීම.

ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ දරුවන් අවධානම ගැනීමට සූදානම් කිරීමේ ක්‍රමයක් නොමැතිකම හා ඒ සම්බන්ධව සමාජය තුල ඇති අනවබෝධය.

03. අවධානම අඩු පරිසරය අවධානම දැරීමට මෙන්ම අභියෝග ගැනීමට හුරුකරයි.

අපේ සමාජය තුළ අවධානම ඉහළය. මෙවැනි තත්වයක් තුළ අවධානම් දරාගෙන ව්‍යවසායන් බිහිවීමට පරිසරය සූදානම් නොකරයි. වර්ථමාන අනාගත අවධානම්කාරි පරිසරය එම තත්වයට සාක්ෂි දරයි.

04. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ බොහෝ කරුණු සිද්ධාන්ත මත පදනම් වී ඇතත් self confidence සඳහා යොමු කරන පරිසරයක් නොමැතිකම.

05.පුද්ගල මානසිකත්වයෙන් ඇතිකරනු ලබන බලපෑම. මෙයද ව්‍යවසායකත්වය කෙරේ සෘජු ලෙසම බලපෑම් කරන අතර ව්‍යවසායකත්වය කෙරේ ධනාත්මකව බලපෑම් කළහැකි මානසිකත්වයක් ගොඩනැගීමේ පරිසරයක් රට තුළ ක්‍රියාත්මක නොවේ.

05. ප්‍රතිපත්ති සම්පාදකයින් ගේ අනම්‍යවූ බලපෑම. මේ සඳහා නීති අණ පනත් සැකසීමේදී මෙම තත්වය සෘජු ලෙසම බලපායි.

මෙවැනි තත්වයක් තුළ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා කරන යෝජනා පහත පරිදි ඉදිරිපත් කළ හැක.

01. සමාජය තුළ ව්‍යවසායකත්වය කෙරෙහි ධනාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම.

02. ව්‍යවසායකත්වය පිළිබඳව පාසැල්, විශ්වවිද්‍යාල, සහ ආයතන තුල සාධනීය ලෙස ඉගෙනුම් ක්‍රමය වෙනස් කිරීම.

03. නිර්මාණාත්මක අයුරින් අවධානම දැරීම සඳහා ළමුන්, ප්‍රජාව තුල හුරුව ඇති කිරීම.

04. ව්‍යවසායකත්වය සඳහා හිතකර සැලසුම් හා ප්‍රතිපත්ති නිර්මාණය කිරීම.

මේ අනුව බැලීමේදී ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය නඟාසිටුවීම සඳහා බොහෝ දේ සිදුකළ යුතුව ඇත.

# 06. ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ගයෙන් ඩොලර් හොයන බංගලාදේශයේ දුප්පතුන්.

කපිල ධර්මප්‍රිය
සංවර්ධන නිලධාරි
*BSc. Busness Adm. (special)*

"අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සේවා සැලසීම" ක්ෂුද්‍ර මූල්‍ය උපාය මාර්ගය ලෙස ලෝක බැංකුවට අනුබද්ධ ආයතනයක් වන දිළින්දන්හට සහයෝගය දැක්වීමේ උපදේශාත්මක සමූහය (CGAP) විසින් නිර්වචනය කර ඇත. සමාජයේ අනෙකුත් අයවළුන්ට මෙන්ම දිළිඳු සහ අඩු ආදායම්ලාභීන්ටද සිය ජීවිතය සමාජ හා ආර්ථික වශයෙන් පවත්වා ගෙන යාමේදී විවිධ මූල්‍ය අවශ්‍යතාවන්ට මුහුණ දීමට සිදුවේ. විවිධ හේතූන් මත එනම් ප්‍රමාණවත් ඇපකර නොමැතිකම, පිහිටීමේ දුරස්ථභාවය, සංකීර්ණ ක්‍රියාවලි, අඩු අධ්‍යාපන මට්ටම වැනි තත්වයන් හමුවේ රටක ක්‍රියාත්මක වන විධිමත් බැංකු හා මූල්‍ය පද්ධතිය මගින් දිළිඳු සහ අඩු ආදායම්ලාභීන් අපහරණය වීමක් සිදුව ඇත. උද්ගතව ඇති මෙවැනි තත්වයක් හමුවේ දිළිඳු සහ අඩු ආදායම්ලාභීන්ගේ මූල්‍ය අවශ්‍යතා උචිත පරිදි සැපිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික සහ සාමාජීය තත්වය ඉහළ දැමීමටත්, අනාගත ආයෝජන සක්‍රිය කිරීමත් තුළින් ජීවනෝපායන් සංවර්ධනය කිරීමත් හරහා ඔවුන් දිළිඳු සහ අඩු ආදායම් තත්වයෙන් මුදවා ගැනීම මගින් ඔවුන්ගේ සක්‍රිය දායකත්වය රටක ආර්ථික සංවර්ධනයට දායක කරගැනීමේ අපේක්ෂාවෙන් "ක්ෂුද්‍ර මූල්‍ය" ආර්ථික සංවර්ධන උපාය මාර්ගය අද ලොව තුළ වඩාත් ජනප්‍රියව ඇත. අද ලෝකය තුළ රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ වලින් විවිධ මාදිලි ඔස්සේ ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් සිය පාරිභෝගිකයන් වෙත සැපයීමක් දක්නට ඇත. ඒ යටතේ මූල්‍ය සේවා මෙන්ම මූල්‍ය නොවන සේවා සැපයීමක් ප්‍රධාන වශයෙන් දක්නට ඇත. ණය, ඉතුරුම්, රක්ෂණ හා මුදල් හුවමාරු සේවා ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලික බහුලවම දැකිය හැකි මූල්‍ය සේවාවන් අතර වේ. සමාජ සේවා, උපදේශන සේවාවන්, ළමා අධ්‍යාපන සේවා, ව්‍යාපාර සංවර්ධන සේවාවන් යනාදිය මූල්‍ය නොවන සේවාවන් අතර හඳුනාගත හැකිය.

සිය රටට අනන්‍ය වූ සංවර්ධන මාවතක ගමන් කරමින් පසුගිය දශකයක පමණ කාලයක සිට 6% ක පමණ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගයක් පවත්වා ගනිමින් සිටින දකුණු ආසියානු රටක් වන බංගලාදේශයේ විශාල ලෙස රාජ්‍ය නොවන සංවිධාන ජාලයක් මගින් විවිධාකාර ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. විනාශකාරී ස්වභාවික විපත් හා ඇති වූ යුධ ගැටුම් වලින් අනතුරුව ග්‍රාමීය ජන ජීවිතය ගොඩ නැගීම අරමුණු කරගනිමින් බංගලාදේශය තුළ සක්‍රීය වූ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරකම් මෙයට ප්‍රභලම හේතු සාධකය විය.

මේ ආකාරයට බංගලාදේශය පදනම් කරගනිමින් වර්තමාන සේවක සංඛ්‍යාව 97742 ක් වූ සේවක සංඛ්‍යාව අතින් ලොව විශාලම රාජ්‍ය නොවන සංවිධානය වන ප්‍රජාවන් හරහා සම්පත් ගොඩනැගීම (Building Resources Across Communities) (BRAC) ආයතනය බිහි විය. මෙම රාජ්‍ය නොවන සංවිධානයේ ආරම්භය වූයේ 1971 වර්ෂයේ බංගලාදේශ විමුක්ති යුද්ධයෙන් පසුව නැවත පැමිණි යුධ සරණාගතයන්ට උපකාර කිරීම සඳහා ඇති වූ සහන පුනරුත්ථාපන ව්‍යාපෘතියකිනි. බංගලාදේශ පුනරුත්ථාපන අධාර කමිටුව ලෙස (Bangladesh Rehabilitation Asistance Committee) හැඳින් වූ මෙය පසුව බංගලාදේශ ග්‍රාමීය දියුණු කිරීමේ කමිටුව (Bangladesh Rural Advancement Committee) නමින් ක්‍රියාත්මක විය. වර්තතමානයේ ප්‍රජාවන් හරහා සම්පත් ගොඩනැගීම (brac)

නමින් ආසියානු, අප්‍රිකානු සහ දකුණු ඇමෙරිකානු රටවල් සමූහයක ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ආයතනය බංගලාදේශය තුළ සිටින දිළිඳු සහ අඩු ආදායම්ලාභී තරුණ ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රම සංක්‍රමණය සඳහා සිදුකරනු ලබන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන ඉතා ඵලදායී සුවිශේෂී වැඩසටහනකි. බංගලාදේශයේ ග්‍රාමීය දිළිඳුකම තුරන්කිරීමේ දී මෙන්ම එරට ආර්ථිකයට ශක්තිමත් විදේශ විනිමය සංචිතයකට උරුමකම් කීමටත් හැකියාවක් ලැබීමට හේතුන් ලෙස මෙවැනි වැඩසටහන් ඉවහල් වී ඇති බව ආර්ථික විශ්ලේශකයෝ පෙන්වා දී ඇත.

බංගලාදේශයේ වාර්ෂිකව මිලියන 2.2 ක තරුණ පිරිසක් ශ්‍රම බලකායට එකතු වේ. ශ්‍රම සංක්‍රමණය පිළිබඳ දැනුම නොමැතිකම සහ විධිමත් ලෙස සහතික කල කුසලතා නොමැතිකම වැනි තත්වයන් නිසා මෙම කණ්ඩායමේ, අභිලාෂයන් ඇත්තවුන්ට විදෙස් රැකියා සඳහා සංක්‍රමණයට ඇති අවස්ථා මගහැරී ඇත. එමෙන්ම මෙම පුද්ගලයන් විදෙස් රැකියා සඳහා සංක්‍රමණය වීමේදී ශ්‍රම සූරාකෑමට බෙහෙවින් ගොදුරු වේ. තවද සංක්‍රමණය සඳහා වන අධික පිරිවැය, සංක්‍රමණික සේවකයන්ට ගෙවන අඩු වැටුප් වැනි තත්වයන් විභව සංක්‍රමණික ශ්‍රමිකයන් මුහුණදෙන ප්‍රධාන අභියෝගයන් අතර වේ. සංක්‍රමණ අවස්ථා පිළිබඳ ඇති අඩු දැණුම හෝ තොරතුරු නොමැතිකම නිසා විභව සංක්‍රමණිකයන් අවිධිමත් මාර්ග වලට පෙළඹීමෙන් ඔවුන් මිනිස් ජාවාරම්, සූරාකෑම හෝ අපයෝජනයන්ට ලක්වීමේ අවස්ථාවන් බහුල වී ඇත.

බංගලාදේශය තුළ ගොඩනැගී ඇති මෙම තත්වය හොඳ අවස්තාවක් ලෙස හඳුනාගත් ප්‍රජාවන් හරහා සම්පත් ගොඩනැගීම (Building Resources Across Communities) (BRAC) ආයතනය විසින් වාර්ෂිකව රටේ ශ්‍රම බලකායට එකතුවන පිරිස තුළ සිටින විදෙස් සංක්‍රමණ ශ්‍රම සැපයීමේ අභිලාෂයෙන් යුතු දිළිඳු හෝ අඩු ආදායම්ලාභී තරුණ අයවළුන් ඉලක්ක කරගෙන ඉතා සාර්ථක ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන මගින් අවශ්‍ය සෑම අවස්ථාවකම ඉලක්ක කණ්ඩායම වෙත මූල්‍ය හා මූල්‍ය නොවන ක්ෂුද්‍ර මූල්‍ය සේවා සැපයීමක් සිදු වේ. මෙම වැඩසටහනේ ක්‍රියාකාරීත්වය තුළ ප්‍රධාන අවස්ථා තුනක් හඳුනා ගතහැකි වේ.

01.සංක්‍රමණයට පූර්වගාමීව

මෙහිදී සංක්‍රමණික තොරතුරු ලබාදීම හා ඒ පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, නිපුණතා සංවර්ධන පුහුණු වීම් ලබා දීම, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම, වීසා පරීක්ෂාව හා වෙනත් අවශ්‍ය සේවාවන් සැපයීම හරහා සංක්‍රමණිකයන්ට සහය වීම, උපදේශන වැඩසටහන් පැවැත්වීම ආදිය ඉටු කරනු ලැබේ.

02.සංක්‍රමණයට පසුව

ආරක්ෂිත හා සදාචාරාත්මක සංක්‍රමණයට අවස්ථාව ලබා දීම, යහපත් රැකියාවක් ලබාගැනීමට සහය වීම, තමන් උපයන මුදල පවුලේ අයවළුන් වෙත ලැබීමට සැලැස්වීමට අවශ්‍ය මුදල් හුවමාරු සේවා සැපයීම ප්‍රධාන වශයෙන් සිදුකරයි.

විශේෂයෙන්ම මෙම අවධියේදී මෙම විදෙස් ප්‍රේෂණ ලබාගන්නා සංක්‍රමණික ශ්‍රමිකයාගේ බිරිඳ හෝ පවුලේ අයවළුන් වෙත, ලැබෙන මුදල් කළමනාකරණය කරගැනීමට දැණුම ලබා දීමක් සිදුකරයි. ඒ යටතේ මූල්‍ය සාක්ෂරතාවය හා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ දැණුම ලබා දේ. ඒ අනුව විදෙස් ශ්‍රම සංක්‍රමණිකයාගේ බිරිඳ හෝ පවුලේ අයවළුන් යහපත් වියදම් රටාවකට හුරුවීමක් සිදු වේ. විශේෂයෙන්ම මෙහිදී ළමා මානව ප්‍රාග්ධන ආයෝජනයන්ට මූලිකත්වයක් හිමි වී ඇත. එහිදී ළමා අධ්‍යාපනය ඉංග්‍රීසි මාධ්‍යයෙන්, ව්‍යාප්තව ඇති ජාත්‍යන්තර පාසල් වෙතින් ලබාදීමට දෙමව්පියන් බහුලවම පෙළඹී ඇත.

03. ශ්‍රම සංක්‍රමණිකයා නැවත පැමිණීම

ආපසු පැමිණීමෙන් පසුද ඔවුන් නැවත සමාජගත කිරීමට අවශ්‍ය මූල්‍ය ආධාර, කුසලතා සංවර්ධන පුහුණු, ව්‍යවසායකත්ව පුහුණු, උපදේශන වැඩසටහන් ආදිය සිදු කරනු ලැබේ. මෙමගින් විදෙස් ශ්‍රම සංක්‍රමණිකයාගේ තිරසාර සමාජ ආර්ථික පැවැත්ම තහවුරු කිරීමක් සිදු කරයි.

ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේදී දිළිඳුභාවය පිටු දැකීම සඳහාත්, සේවා ව්‍යුක්තියට පිළියමක් වශයෙනුත් රාජ්‍ය අංශයට බරක් නොවූ මෙවැනි වැඩසටහන් අත්‍යාවශ්‍ය බව පෙනේ. ශ්‍රම සංක්‍රමණිකයා හා ඔහුගේ සමස්ථ පවුල කෙරෙහිම නැඹුරුවීමක් පැවතීම මෙම වැඩසටහනේ දක්නට ඇති සුවිශේෂී භාවය වේ. වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වන රාජ්‍යයක් ලෙස සිය විදේශ විනිමය සංචිතය ශක්තිමත් කිරීමට මෙවැනි වැඩසටහන් තුළින් මනා පිටුබලයක් ලැබී ඇති බවට හොඳම සාක්ෂියක් බවට බංග්ලාදේශය පත්ව ඇත. දකුණු ආසියානු රටක් වශයෙන් ශක්තිමත් විදේශ විනිමය සංචිතයක් ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 42 කට බංග්ලාදේශය හිමිකම් කියන අතර එයින් ඇරිකානු ඩොලර් බිලියන 16 ක් උපයා ඇත්තේ විදෙස් ශ්‍රම සංක්‍රමණිකයන් වීම විශේෂත්වයකි.

# 07. තායිලන්තයේ ග්‍රාම සංවර්ධන උපායමාර්ග.

සුභානි පියසිංහ
සංවර්ධන නිලධාරි
*M.A (Sociology)*

සංවර්ධන දර්ශක අනුව මෑතකාලයේ ශ්‍රී ලංකාවට වඩා සංවර්ධනයෙන් පසුබා සිටිය ද වර්තමානය වන විට අප රටට වඩා ඉහළ සංවර්ධනයක් අත්කරගෙන සිටින අග්නිදිග ආසියානු රටවල් අතර ඉහළම ස්ථානයක සිටින රාජ්‍යයක් ලෙස තායිලන්තය හඳුනාගත හැකිය. තායිලන්තය සංවර්ධනය කරා යන ගමනේදී ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම අවම කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි. ඒ සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේද හේතුවෙන් වර්තමාන තායිලන්තයේ ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

එහිදී තායිලන්තයේ ජනගහන හා ප්‍රජා සංවර්ධන සංගමය [**Population and Community Development Association** (PDA)] විසින් තායිලන්තයේ නන්ග්‍රොන්ග්, බුරිරාම්, විලාස් ලෝහිට්කුල් හි ක්‍රියාත්මක කරන ලද ප්‍රජා පාදක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය - Community Based Integrated Rural Development (CBIRD) මූලික කොටගෙන ක්‍රියාත්මක කරන ලද ග්‍රාම සංවර්ධන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වූ එක් වැඩසටහනක් වේ. PDA යනු 1974 දී Mechai Viravaidaya ගේ සභාපතිත්වයෙන් තවවායි Traitongyoo විසින් ආරම්භ කරන ලද ප්‍රජා මූලික රාජ්‍ය නොවන සංවිධානයකි. ග්‍රාමීය ප්‍රජාවන්ගේ සැබෑ ගැටළු හඳුනාගත් PDA සංගමය, ග්‍රාමීය ප්‍රජාවගේ ක්‍රියාකාරකම් තුළින් ආදායම් ඉහළ නැංවීම සඳහා ඔවුන්ගේ සහාය පිණිස ස්ථිර ප්‍රජා පාදක මධ්‍යස්ථානයක සැබෑ අවශ්‍යතාවය අවබෝධ කර ගන්නා ලදී. ඒ අනුව PDA විසින් නන්ග්‍රොන්ග් ප්‍රදේශයේ ප්‍රජාවන්ගේ වෙනස්වන අවශ්‍යතා තක්සේරු කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රජා පාදක ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානය - Community Based Integrated Rural Development (CBIRD) පිහිටුවීමට කටයුතු කරන ලදී.

1. බොහෝ ගම්වැසියන් බොහෝ විට පොලී මුදලාලිලාගෙන්, අධික පොලී අනුපාතවලට ණය ගැනීම.
2. සමහර ගොවීන් පොහොර හෝ වෙනත් කෘෂිකාර්මික යෙදවුම් සඳහා වසරකට සියයට 120-240 අතර පොලියට මුදල් ලබා ගැනීම.
3. ගම්වාසීන්ට අලෙවිකරණ කුසලතා සහ ව්‍යාපාර කළමනාකරණ කුසලතා නොමැති වීම.
4. ගංවතුර සහ නියඟය වැනි ස්වභාවික විපත් නිසා කෘෂිකාර්මික නිෂ්පාදනය අඩුවීම.
5. වෙළෙඳපොළ අවශ්‍යතා සහ ප්‍රවණතා සමීක්ෂණය කිරීමට සහ වෙළෙඳපොළට ගැළපෙන පරිදි හැඩගැසීමට ගම්වාසීන්ට හැකියාවක් නොමැති වීම.
6. පාරිසරික හායනය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ගුණාත්මකභාවය කෙරෙහි බලපෑම.
7. ග්‍රාමීය-නාගරික සංක්‍රමණය.
8. විශේෂයෙන්ම ළමා සෞඛ්‍ය සම්බන්ධයෙන් මූලික මහජන සෞඛ්‍ය පහසුකම් නොමැති වීම.
9. දෙමාපියන්ට වැඩිදුර අධ්‍යාපනය සඳහා මුදල් නොමැති බැවින් දරුවන්ට මූලික අධ්‍යාපනය පමණක් ලබාදීම.
10. සමුපකාර කළමනාකරණය දුර්වල වීම.

යනාදිය ඔවුන් විසින් හඳුනාගත් ගැටළු අතර ප්‍රමුඛ වන අතර ඒ සඳහා සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

**සංවර්ධන උපාය මාර්ග ( Development Strategy )**


- ස්වයං උපකාර සංවර්ධන ක්‍රියා පටිපාටි සහ කණ්ඩායම් සහයෝගීතාවය (Self-help development procedures and group cooperation)
- කණ්ඩායම් සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම (Promote group cooperation)
- පොහොර බැංකුව (Fertilizer Bank)
- සහල් බැංකුව (Rice Bank)
- සාධාරණ මිල ගබඩා (Fair prices store)
- උප දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන ක්‍රමය (Sub district cooperative development method)

**ස්වයං උපකාර සංවර්ධන ක්‍රියා පටිපාටි සහ කණ්ඩායම් සහයෝගීතාවය (Self-help development procedures and group cooperation).**

මෙම ක්‍රමය යටතේ CBIRD කෘෂිකාර්මික නිෂ්පාදන සහ ගෘහ කර්මාන්ත සඳහා වෙළෙඳපොළවල් පිහිටුවීමේ අතරමැදියෙකු ලෙස ක්‍රියා කරනු ලබයි. එහිදී, ගම්වාසීන්ට ඔවුන්ගේ පාරම්පරික කුසලතා සහ ශිල්ප භාවිතා කරමින් තම ආදායම වැඩි කර ගැනීමට හැකි වේ. CBIRD කළමනාකරණය, සාකච්ඡා සහ අරමුදල් වැනි ක්ෂේත්‍රවල පුහුණුව සඳහා සහාය වේ. ගම්වැසියන් අත්විඳින ඕනෑම ගැටළුවක් විසඳීම සඳහා CBIRD මධ්‍යස්ථානය පදනම් කරගත් ක්ෂේත්‍ර සහායකයෙකු සෑම ව්‍යාපෘතියකටම වෙන් කරනු ලැබේ. තවද, අඩු පොලී ණය ක්‍රමයක් මඟින් ව්‍යාපාර ආරම්භ කිරීම හා පුළුල් කරගැනීම සඳහා අරමුදල් සපයා ගැනීම සඳහා ගම්වාසීන්ට සහාය වේ. මෙය සිදු කිරීමෙන් ගම්වැසියන් ඔවුන්ගේ ව්‍යාපෘතියේ හිමිකාරිත්වය ලබා ගන්නා අතර නව කළමනාකරණ සහ ව්‍යාපාර කුසලතා ඉගෙන ගැනීමට හැකියාවක් ලැබේ. නිෂ්පාදනය, බිත්තර සඳහා තාරාවන් හා කුකුළන් ඇති කිරීම, ඌරන් ඇති කිරීම, සේද රෙදි වියීම, එළවළු වගා කිරීම, රස කැවිලි සෑදීම සහ මස් සඳහා කුකුළන් ඇති කිරීම වැනි ව්‍යාපාර සඳහා මෙලෙස CBIRD උපකාර කර ඇත.

## Promote organizational plan

### (ප්‍රවර්ධනයකරන ලද ආයතනික සැලැස්ම)





**කණ්ඩායම් සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම (Promote group cooperation)..**

CBIRD විසින් කණ්ඩායම් පිහිටුවීමට ගම්වැසියන් දිරිමත් කරන අතර එමඟින් ඔවුන්ගේ මිලදී ගැනීමේ හැකියාව වැඩි වන අතර CBIRD විසින් සපයනු ලබන උපකාරක පුහුණුවෙන් වඩා හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට ඔවුන්ට හැකි වේ. මෙවැනි කණ්ඩායම් පිහිටුවීමේදී වැදගත්ම සාධකය වන්නේ ගමට තම ක්‍රියාකාරකම් ව්‍යාප්ත කළ හැකි ශක්තිමත් ග්‍රාමීය අරමුදල් පදනමක් ගොඩනගා ගැනීමට හැකිවීම, එම ක්‍රියාකාරකම් තවදුරටත් ගම්මාන දක්වා ව්‍යාප්ත කළ හැකි වීම හා ගම්වාසීන්ගේ ප්‍රධාන ගැටලුවක් වන ඉහළ පොලී අනුපාත ඇති මුදලාලිලාට ණය වීම අවම කර ගැනීමට හැකියාව ලැබීමයි.

**පොහොර බැංකුව (Fertilizer Bank).**

මෙම ප්‍රදේශයේ වී වගාව සඳහා පොහොර ලබාගැනීමේදී සෑම පොහොර මිටියක් සඳහාම සහල් ලීටර් 320 බැගින් වෙළෙන්දාට ගෙවිය යුතු වූ අතර CBIRD ක්‍රමය භාවිතා කිරීමෙන් පසු පොහොර මිටියකට ගෙවිය යුතු වූයේ සහල් ලීටර් 220ක් පමණකි. ගම්වාසීන්ට තම අතිරික්ත වී තම ග්‍රාමීය කණ්ඩායම් අරමුදල පිහිටුවීම සඳහා යොදා ගන්නා ලෙසට CBIRD විසින් උපදෙස් ලබා දී ඇති අතර ඔවුන්ගේ අරමුදලට අතිරේකව වී ලීටර් 40ක් ආපසු ලබාදෙනු ලබන අතර තවත් පොහොර මලු 100 ක් ලබා දෙනු ලැබේ. අරමුදල ස්ථාපිත කිරීමෙන් පසු ගම්වාසීන්ට CBIRD වෙතින් පොහොර මිලදී ගත හැක්කේ මල්ලකට වී ලීටර් 180 කට පමණක් වන අතර එය වෙළෙන්දාට වඩා ලීටර් 140 කින් අඩු වේ.




**සහල් බැංකුව (Rice Bank).**

වී වගාව ආරම්භයේ දී සාමාන්‍යයෙන් වී ගොවීන් වගා කිරීම සඳහා බීජ වී වෙළෙන්දාගෙන් ණයට ලබාගනු ලබන අතර මේ ණය ගෙවන විට ඔවුන් ණයට ගත් වී ප්‍රමාණය මෙන් දෙගුණයක් ආපසු ගෙවිය යුතුවේ. මෙම ඉහළ පොලී අනුපාත අඩු කිරීම සඳහා CBIRD විසින් ණය ගැනීමේ ක්‍රමයක් ස්ථාපිත කරන ලද අතර එමගින් ගොවීන් ඔවුන් ණයට ගත් මල්ලකට වී මලු 1.5 ක් ආපසු ගෙවන ලදී. එවිට, CBIRD ඔවුන්ගේ ගමේ අරමුදල වැඩි කර ගැනීම සඳහා මෙම අමතර අර්ධ මල්ල ගමේ වී බැංකුවට ලබා දෙයි.

**සාධාරණ මිල ගබඩා (Fair prices store).**

ගැමියන්ට සාධාරණ මිලට භාණ්ඩ සඳහා ප්‍රවේශය ලබා දීම සහ වෙනත් ආදායම් මාර්ගයක් සැපයීම සඳහා, CBIRD සාධාරණ මිල ගබඩා පිහිටුවීමට මගපෙන්වීම් සිදුකළ අතර බාට් (තායිලන්ත මුදල්) 100 බැගින් කොටස් නියම කරන ලදී, ගම්වැසියන් ගබඩාව සඳහා කොටස් සංවර්ධනය කිරීමට සහ මිලදී ගැනීමට තම මුදල් ආයෝජනය කරන ලද අතර පසුව ගම්වැසියන් ඔවුන්ගේ වගකීම සහ හිමිකාරිත්වය අනුව ගබඩාවේ නිෂ්පාදන විකිණීමට හවුල් වේ. සෑම වසරකම අවසානයේ ලාභ කොටස් හිමියන් අතර බෙදී යයි.

**උප දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන ක්‍රමය (Sub district cooperative development method).**

ගම පදනම් කරගත් ක්‍රියාකාරකම්වල කලක් වැඩ කිරීමෙන් පසු, උප දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාකාරකම් තවදුරටත් පුළුල් කිරීමේ හැකියාවක් ඇති බව හා එය සිදුකිරීම අවශ්‍ය බවට PDA තීරණය කර ඇති අතර මෙය උප දිස්ත්‍රික් සමූපකාර ක්‍රමයේ ආරම්භය විය. මෙම ක්‍රමය ඔස්සේ ව්‍යාපාර සංවර්ධනය කිරීමේදී ඒවා සුදුසු පරිදි ස්ථාපිත කිරීම සඳහා PDA විසින් රජයෙන් මෙන්ම අනෙකුත් ව්‍යාපාර වලින්ද සහාය ඇතිව ග්‍රාමීය මට්ටමින් ව්‍යාපාර

කළමනාකරණය කිරීමට සහ සංවර්ධනය කිරීමට විශිෂ්ට හැකියාවක් පෙන්නුම් කළ ගම්වැසියන් මෙම නව සංවර්ධන වැඩසටහන සඳහා සම්බන්ධ කර ගන්නා ලදී. පසුව පිහිටුවන ලද ව්‍යාපාර ගම්වැසියන් තම ව්‍යාපාරයේ පාලනය තබා ගැනීම සහතික කිරීම සඳහා උප දිස්ත්‍රික්කයේ සමුපකාර ලෙස ලියාපදිංචි කරන ලදී. මෙම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ උප දිස්ත්‍රික්ක 13 ම සමුපකාර පිහිටුවා ගත් අතර ගම්වැසියන්ට තම ව්‍යාපාර තවදුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා මහෝපකාරී වී ඇත.

වැඩසටහනේ බලපෑම

1. ග්‍රාමීය පදිංචිකරුවන්ට ව්‍යාපාර පවත්වාගෙන යාමේ දැනුම සහ පළපුරුද්ද මෙන්ම පරිපාලනය, කළමනාකරණය සහ අලෙවිකරණ කුසලතා ලබා ගැනීමට ඉඩ සලසයි.

2. ග්‍රාමීය පදිංචිකරුවන්ට ව්‍යාපාර හිමිකාරිත්වය හෝ ව්‍යාපාරයක කොටස්කරුවන් වීමට අවස්ථාව ලබා දීම හා ඔවුන්ගේ හැකියාවන් ඔවුන්ගේම ප්‍රයෝජනය සඳහා උපරිම ලෙස භාවිතා කිරීමට ඉඩ සලසයි.

3. ග්‍රාමීය-නාගරික සංක්‍රමණය අවම කිරීම සහ ඔවුන්ගේම කලාපයේ සිටින ග්‍රාමීය පදිංචිකරුවන් සඳහා රැකියා සහ වෘත්තීය අවස්ථා වැඩිදියුණු කිරීම.

4. පවුල් ඒකකයට එකට ජීවත් වීමට ඉඩ සලසන අතර එමඟින් පවුල සහ ප්‍රජා වටිනාකම් යන දෙකම ශක්තිමත් වේ.

6. ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාපාර සහ සමුපකාර පිහිටුවීමෙන් පසුව, බැංකොක් සිට නැවත සංක්‍රමණය වීම හේතුවෙන් මෙම ප්‍රදේශවල ජනගහනය වැඩි වේ. මෙමගින් කෘෂිකාර්මික නිෂ්පාදකයින්ට විකිණීම සඳහා විශාල ගැනුම්කරුවන් සංඛ්‍යාවක් ලබා දෙන අතර එමඟින් ඔවුන්ගේ ආදායම වැඩි වන අතර ප්‍රජාවේ සාමාන්‍ය ආර්ථිකය වැඩිදියුණු වේ.

# 08. සෑම පවුලකටම සුව පහසු නිවාසයක් : කොළඹ නගරය කේන්ද්‍රව ඉදිකර ඇති මහල් නිවාසවල නැවත පදිංචිකළ ප්‍රජාව ආශ්‍රයෙන්.

එස්.බී.එන්.මල්ෂානි ආනන්ද
සංවර්ධන නිලධාරී
*M.A (Sociology)*

**හැඳින්වීම**

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ නව රජයේ ප්‍රතිපත්ති රාමුව හරහා අවධානය යොමු කර ඇත. මෙම ප්‍රතිපත්ති රාමුව දස ප්‍රතිපදාවන් ගෙන් යුක්ත වන අතර ප්‍රධාන අරමුණු හතරක් (04) පදනම් කරගනිමින් විග්‍රහ කර ඇත. ප්‍රතිපත්ති රාමුවෙහි හතරවන (04) පරිච්ඡේදය "ඵලදායි පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්" ලෙස නම් කර ඇත. ඒ යටතේ සෑම පවුලකටම සුවපහසු නිවාසයක් යනුවෙන් ශ්‍රී ලාංකීය ජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීමට අදාළව ප්‍රධාන ක්‍රමෝපායන් හතරක් ඉදිරිපත් කර ඇත. එහි පළමුවෙන්ම සඳහන් වන්නේ නිවාස අවශ්‍යතාව සපුරාලීම සඳහා මහල් නිවාස යෝජනා ක්‍රමය දියත් කිරීම යනුවෙනි. ඒ යටතේ ප්‍රධාන වශයෙන්ම, පැරණි මහල් නිවාස නව මහල් නිවාස මගින් ප්‍රතිස්ථාපනය කිරීම, අවතැන්වූවන් සහ පැල්පත්වාසීන් සඳහා පහසුකම් සහිත නාගරික නිවාස යෝජනා ක්‍රම හරහා නිවාස ලබාදීම සහ කුලී පදනම මත තාවකාලිකව නේවාසික තත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සාධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත.

ඒ අනුව නාගරික අවවරප්‍රසාදිත නැතිනම් කොළඹ නගරය ආශ්‍රිතව ජීවත්වන අඩු ආදායම්ලාභී, මුඩුක්කු පැල්පත්වාසී ජනතාව පිළිබඳ හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. නාගරික මහල් නිවාසවල ආරම්භයේ සිට මේ වන විට පවතින තත්වය හඳුනා ගැනීමටත්, නව ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව අරමුණු ජය ගැනීමට මහල් නිවාස ආශ්‍රිතව පවතින ගැටලු හඳුනා ගැනීමටත් මෙහිදී බලාපොරොත්තු වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරිකරණයත් සමඟ මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ නාගරික මුඩුක්කු හා පැල්පත්වාසී ජනගහනයේ ප්‍රසාරණය වීමයි. මුඩුක්කු හා පැල්පත්වාසී ජනගහනය ප්‍රසාරණය වීම ශ්‍රී ලංකාවේ අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව කොළඹ නගරයේ ඉහළ අගයක් ගන්නා බව හඳුනාගත හැකිය. එයට මූලික හේතුව ප්‍රධාන වාණිජ නගරය කොළඹ වීමයි. කොළඹ වෙසෙන මුළු ජනගහනයෙන් අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ජන සංඛ්‍යාව 59% කි. ඒ අතුරින් 71% මුඩුක්කු ද පැල්පත් 12% දක්නට ලැබේ (ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, වාර්ෂික වාර්තාව,2015).

නාගරික අවවරප්‍රසාදිත ප්‍රජාවන් නැවත පදිංචි කරවීම පසුගිය දශක කිහිපය පුරා සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධනය සම්බන්ධයෙන් සැලකිල්ලට භාජනය වූ කාරණාවක් වී තිබේ. අවුරුදු 30 ක අභ්‍යන්තර ගැටුම්වලින් පසු මේ වන විට ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් කොළඹ ආශ්‍රිතව සීඝ්‍ර යටිතල පහසුකම් දියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ යටතේ මහා මාර්ග පද්ධති දියුණු කිරීම්, නගර අලංකරණය, කර්මාන්ත ශාලා ඉදිකිරීම් වැනි සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වේ. මෙම සංවර්ධන ව්‍යාපෘති අතර කොළඹ නගරය තුළ ඉහළ වාණිජ වටිනාකම්කින් යුත් ඉඩම් හා පාරිසරික වශයෙන් ඉතා සංවේදී කලාප ආශ්‍රිතව ජීවත්වන අඩු

ආදායම්ලාභී ජනතාව ඒ ඒ ප්‍රදේශවලම හෝ යාබද ප්‍රදේශවල නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ආරම්භ කරන ලදී. මුඩුක්කු හා පැල්පත්වාසි අඩු ආදායම්ලාභී ජනකොටස් මුඩුක්කු හා පැල්පත්වලින් ඉවත් කොට එම ප්‍රදේශවලම ගොඩනැගූ මහල් නිවාසවල පදිංචි කරවීමේ ව්‍යාපෘති ආරම්භය 2001 වසරේ ජනසතු කළ සහස්‍රපුර නිවාස ව්‍යාපෘතිය හරහා ආරම්භ විය (ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, වාර්ෂික වාර්තාව,2013).

බටහිර සමාජවල පළමු හා දෙවන ලෝක යුද සමය තුළ මෙම පැල්පත් මුඩුක්කු ගැටලුව වර්ධනය වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1930 සිට යුරෝපා හා ඇමෙරිකා එක්සත් ජනපදය තුළ පොදු නිවාස ව්‍යාපෘතිය රජයේ මැදිහත්වීම මත ආරම්භය සිදු වූ අතර පසුව මෙය ක්‍රමානුකූලව ආසියානු කලාපයට සංක්‍රමණය විය. (කාංචනා,2(0)15). ශ්‍රී ලංකාව තුළ මහල් නිවාස ආශ්‍රිතව නැවත පදිංචි කිරීමට දීර්ඝ ඉතිහාසයක් නොමැත. මේ නිසා අද වන විටත් විවිධ විද්වතුන් නැවත පදිංචිකිරීම ආශ්‍රිතව පවතින යහපත් අයහපත් ගුණාංග පිළිබඳ අධ්‍යයන සිදුකරමින් සිටි.

2007 න් පසු ශ්‍රී ලංකා රජය විසින් සැලසුම් කළ මහල් නිවාස ව්‍යාපෘතිය යටතේ පැල්පත් හා මුඩුක්කුවාසි පවුල් 68,812 පමණ පිරිසක් පදිංචි කරවීමට ඉලක්ක කළේය. ඔවුහු වතු ජනාවාස 1,614 ක ජීවත් වූ පිරිසක් වූ අතර මොවුන් නිවාස සංකීර්ණ 14 ක පදිංචි කිරීමට යෝජිත විය (ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වාර්ෂික වාර්තාව,2013). මේ යටතේ මිහිඳු මාවත නිවාස යෝජනා ක්‍රමය, සමගිපුර නිවාස යෝජනා ක්‍රමය, සුරියමල්පුර නිවාස යෝජනා ක්‍රමය, සිරිමාපුර නිවාස යෝජනා ක්‍රමය, සිරිසර උයන නිවාස යෝජනා ක්‍රමය, මිහිඳුසෙන්පුර නිවාස යෝජනා ක්‍රමය, ලෙස විවිධ වූ නම් වලින් මහල් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ජනසතු කර ඇත.

නාගරික සංවර්ධනය හරහා ආර්ථිකය සංවර්ධනය කිරීමට නම් දේශීය, විදේශීය ආයෝජනයන් ගෙන්වා ගත හැකි ස්ථානය වනුයේ නගරයයි. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වාණිජ නගරයවන කොළඹ සංවර්ධනය කිරීමටනම් මුඩුක්කු හා පැල්පත්වාසී ප්‍රජාවන් සඳහා ස්ථිර විසඳුමක් ලබාදීම අනිවාර්ය වේ. මෙය මහල් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම හරහා ලබාගත හැකිද යන්න පිළිබඳව අවධානය යොමුවී ඇත.

**මුඩුක්කු හා පැල්පත්වාසී ප්‍රජාවන් හඳුනා ගැනිම.**

අඩු ආදායම්ලාභී ප්‍රජාව නැතිනම් මුඩුක්කු පැල්පත්වාසීන් ලෙස සඳහන් කළ සැණින් ඔවුන් පිළිබඳ විද්‍යාමානවන චිත්‍ර රූපය නම්, රස්තියාදුකාර, සමාජ විරෝධී රැකියා කරන, ගණිකාවන්, මැරයන්, පාතාල කණ්ඩායම් නියෝජනය කරන සාමාජිකයින් සිටින නිවාස සමූහයක් ලෙසය. නමුත් එය එලෙසම විවේචනය කිරීම සාධාරණ නොවේ. ඔවුන්ද සාමාන්‍ය ප්‍රජාව වේ. නමුත් ඔවුන් ප්‍රධාන සමාජයෙන් ඈත් කොට උප සංස්කෘතියක් සහිත ප්‍රජාවක් ලෙස සිතීමට සාමාන්‍ය ප්‍රජාව හුරුව ඇත. එය සම්පූර්ණයෙන්ම වැරදි මතයක් ද නොවේ. ඔවුනටම වෙන්වූ උප සංස්කෘතියක්ද හඳුනාගත හැකිය. එය ඔවුන්ගේ ආර්ථිකය, සමාජය, අධ්‍යාපනය, සෞඛ්‍ය යන අංශ කෙරෙහි අවධානය යොමු කිරීමේ දී හඳුනාගත හැකිය.

මුඩුක්කු සහ පැල්පත් යන්න නිරන්තරයෙන්ම එකට භාවිතා වන බව පෙනේ. මෙම මුඩුක්කු සහ පැල්පත්වාසීන් අඩු ආදායම් නිවාස හිමියන් ලෙසද හැඳින්වේ. එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනයක් වන UN HABITAT දක්වන පරිදි මුඩුක්කු යනු නගරයක දුර්වල ප්‍රදේශයක් වන අතර ඒවායෙහි බාල තත්ත්වයේ නිවාස සහ පැල්පත් මෙන්ම නිවාස අයිතිය නොමැති වීම ආදී ලක්ෂණ සහිතය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව ලොව පුරා බිලියන එකක ජනගහනයක් මුඩුක්කුවල ජීවත් වේ (UN HABITAT,2014). එමෙන්ම 2030 වන විට එම ප්‍රමාණය බිලියන දෙකක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පැල්පත් යන්න සලකා බැලූ විට ඉවතලන

අමුද්‍රව්‍යවලින් සකසාගත් දිළිඳු නිවාසවල දිළිඳු ජනයා වාසය කරන ස්ථාන ලෙස හඳුනාගත හැක. බොහෝ විට මෙම පැල්පත් තැනීමට යොදා ගන්නා අමුද්‍රව්‍යය අතර තුනී ලෑලි, වානේ තහඩු සහ ප්ලාස්ටික් තහඩු දැකිය හැක. මෙම පැල්පත් නිවාස බොහෝ විට නගර පර්යන්තයේ ගොඩනගන අතර ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් වලින් යුක්ත නොවේ.

මුඩුක්කු හා පැල්පත් වාසීන් නාගරික දිළින්දන් අඩු වරප්‍රසාද සහිත ප්‍රජාව ලෙස හඳුනාගත හැක. නමුත් සමහර අවස්ථාවල අධ්‍යාපනය අතින් සාර්ථක වූ පිරිස ද මෙම ප්‍රජාව අතර හඳුනාගත හැක. නාගරික සමාජය සමඟ කිට්ටු සම්බන්ධතා පැවැත්වීමට හැකි නිසා සමහර අය මෙම නිවෙස්වල ජීවත්වේ. මෙම ප්‍රජාව තුළ දෛනික ආදායම් උපයන පිරිසක් ජීවත් වේ. එමෙන්ම නාගරික අවිධිමත් අංශයට අයත් රැකියා කරන කණ්ඩායමක්, ඉතුරු කිරීම සිදු නොකරන, වීදි වෙළෙඳාම, ස්වයං රැකියා, රියදුරන්, ත්‍රීරෝද රථ හිමියන්, නගර සභාවල සුළු සේවකයන් මෙම අවිධිමත් අංශය නියෝජනය කරනු ලබයි.

එමෙන්ම පොදු ජල කරාම, පොදු වැසිකිළි භාවිතය, ජලය විදුලිය අඩු ප්‍රජාවක් ලෙස හඳුනා ගත හැක. පාරිසරික වශයෙන් අපිරිසිදු පරිසරයක් ප්‍රදර්ශනය වේ. මෙහි බහුතරයක් පිරිස ගමෙන් නගරයට සංක්‍රමණය වූ පිරිසක් වන අතරම නාගරික තරගකාරී ආර්ථිකය හා සම්බන්ධ වීමට ඔවුන්ට සෘජුවම අවස්ථාවක් නොලැබේ. පුහුණු රැකියා ශ්‍රමයක් නොමැති නිසා අඩු ආදායම් සහිත සුළු රැකියා කරන පිරිසක් ලෙස හඳුනා ගත හැක. නමුත් මෙම ප්‍රජාවන් නාගරික ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය ප්‍රජාවන් වේ. නගර පිරිසිදු කරන්නන්, සුළු සේවකයන්, නාටාමින් ලෙස ක්‍රියා කරන පිරිසක් මේ පරිසරය තුළින් හඳුනා ගත හැක.

නාගරික බහුතරයක් සැපවත් ජීවිත ගත කරන අතර මේ මුඩුක්කු ප්‍රජාවන් ඔවුනට විරුද්ධව ක්‍රියා කිරීම නිසා ඒ ප්‍රජාවන් අතර ඇති නැති පරතරය නිර්මාණය වී ඇත. මේ නිසාම සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වීමට වැඩි ඉඩ කඩක් ඇත. නාගරික සමාජයෙන් බහිෂ්කරණය වීම හරහාම ඔවුන් තවදුරටත් නාගරික සමාජයෙන් ඈත්ව සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වී ඇත. මේ පිරිස සමාජයේම අතුරු නිර්මාණයක් ලෙස හඳුනාගත හැකිවේ. එමෙන්ම නගරය විසින් අත්හරින ලද පිරිසක් ලෙස ද හඳුනා ගත හැකිය.

**කොළඹ නගරය තුළ අවවරප්‍රසාදිත ජනගහනයේ සීඝ්‍ර වර්ධනය හා නිවාස ප්‍රශ්නය.**

කොළඹ නගරය තුළ නිවාස ප්‍රශ්නය කෙරෙහි බලපෑ ඇති ප්‍රධානතම කරුණ වන්නේ සීඝ්‍රයෙන් ඉහළ යන ජනගහනයට සාපේක්ෂව නිවාස ඉදිකිරීම් ඉහළ නොයෑමයි. ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්ක සමඟ බලන කළ කොළඹ දිස්ත්‍රික්කයේ මහා පරිමාණ කර්මාන්ත බහුලව ක්‍රියාත්මකවන හෙයින් රට වටින්ම මෙම දිස්ත්‍රික්කයට සංක්‍රමණිකයන් ඇදී ඒම ද, ජනගහනයේ වයස් ව්‍යුහයට අනුව තරුණ කොටස්වල දායකත්වය ඉහළ යෑම නිසා අළුත් කුටුම්බයන් සකස් වීම ද හේතුවෙන් සීඝ්‍ර ජනගහන වර්ධනයක් මෙහි දැකිය හැකි ය. ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් සපුරා දීමක් ලෙස හිසට සෙවණක් තනා දීමට කොළඹ දිස්ත්‍රික්කය තුළ සම්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නිවාස ප්‍රශ්නය මතුව තිබේ. 2012 වසරේ කොළඹ දිස්තික්කයේ ජනගහනය 2,324,300 ක් වූ අතර නාගරික ජනගහනය 1,802.900 විය ඉන් 64.3% ක ප්‍රමාණයක් වයස අවුරුදු 15 - 50 අතර පිරිස යි. ජනගහනයෙන් මෙම වයස් කාණ්ඩයට අයත් පිරිස කොළඹ නගරයේ අනාගත නිවාස ඉල්ලුම තීරණය කරන වැදගත් සාධකයකි. කොළඹ දිස්ත්‍රික්කයේ නිවාස තදබදයට තවත් එක් හේතුවක් වන්නේ ජනගනත්වයේ ඉහළ යාමයි. 2018 දී ශ්‍රී ලංකාවේ වර්ග කිලෝ මීටරයක් (1km$^2$) තුළ පදිංචි ජන සංඛ්‍යාව 3,608 ක් වූ අතර එය 2019 දී 3,621 ක් විය. ජනඝනත්වය දිස්ත්‍රික්ක

අනුව ද වෙනස් වන අතර වැඩිම ජනඝනත්වයක් පවතින්නේ කොළඹ දිස්ත්‍රික්කයේය (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020).

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වාර්ෂික වාර්තාව (2015) ට අනුව කොළඹ වෙසෙන මුළු ජනගහනයෙන් අඩු පහසුකම් ජනාවාසවල ජීවත්වන ජන සංඛ්‍යාව 59% කි. ඒ අතුරින් 71% මුඩුක්කු ද පැල්පත් 12% දක්නට ලැබේ.

**නැවත පදිංචි කිරීම යනු කුමක්ද.**

රටකින් රටකට හෝ රටක් තුළ හෝ විවිධ හේතු මුල් කරගෙන කිසියම් ජන කොට්ඨාශයක් ඔවුන්ගේ මුල් පදිංචි ස්ථානයේ සිට තවත් ස්ථානයකට පදිංචි වීම හෝ පදිංචි කරවීම සරලව නැවත පදිංචි කිරීම ලෙස හඳුනාගත හැකිය. මෙම නැවත පදිංචි කිරීම ප්‍රධාන ලෙස කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය. ස්වෙච්ඡානුගත නැවත පදිංචි කිරීම සහ ස්වෙච්ඡානුගත නොවන නැවත පදිංචි කිරීම ලෙස වර්ග කළ හැකිය.

ස්වෙච්ඡානුගත නැවත පදිංචි කිරීම පුද්ගල කැමැත්ත මත සිදුවන නැවත පදිංචි කිරීමකි. අධ්‍යාපනය, රැකියාව යන කටයුතු පදනම් කර ගනිමින් සිදුවෙන පදිංචි වීම ස්වෙච්ඡානුගත නැවත පදිංචි කිරීමක් ලෙස හඳුනාගත හැකිය. ස්වෙච්ඡානුගත නොවන නැවත පදිංචිකිරිම නැතිනම් ප්‍රේරිත නැවත පදිංචිකිරීම පුද්ගල කැමැත්තකින් තොරව බාහිර පර්ශවයන්ගේ මැදිහත් වීමෙන් හෝ බලහත්කාරයෙන් වෙනත් ප්‍රදේශයක නැවත පදිංචි කිරිම නැතිනම් මුල් වාස භූමියෙන් ඈත් කොට වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම ස්වෙච්ඡානුගත නොවන නැවත පදිංචි කිරීම ලෙස හඳුනාගත හැක (වන්නිනායක,2017). ප්‍රජාව ස්වෙච්ඡානුගත නොවන නැවත පදිංචි කිරීමට බලපාන මූලික සාධක කිහිපයක් හඳුනාගත හැක. එනම් යුද්ධය, විප්ලව, ස්වභාවික විපත් හා සංවර්ධන ව්‍යාපෘති යන කරුණු මුල්කර ගනිමින් පුද්ගලයින් නැවත පදිංචි කරවීම ශ්‍රී ලංකාව තුළින් ද හඳුනාගත හැක. උදාහරණ ලෙස ජල ව්‍යාපෘති, මහවැලි සංවර්ධන ව්‍යාපෘති, විදුලි බලාගාර, බල ශක්ති ව්‍යාපෘති, නාගරික යටිතල පහසුකම් ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති, මාර්ග සංවර්ධන ව්‍යාපෘති, මුඩුක්කු පැල්පත් නිවාස සංවර්ධන ව්‍යාපෘති ආදිය ස්වෙච්ඡානුගත නොවන ලෙස ප්‍රජාව නැවත පදිංචි කරවීමට හේතූන් ලෙස හඳුනා ගත හැකිය.

**ශ්‍රී ලංකාවේ නාගරික නැවත පදිංචි කිරීම.**

ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධනය ජාතික වැඩසටහනක් ලෙසින් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 1979 දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී. එම ආයතනය මගින් ග්‍රාමීය නිවාස ව්‍යාපෘති මෙන්ම මහා පරිමාණයේ නිවාස සංකීර්ණ ඉදිකිරීම දක්වා තම සේවාවන් ව්‍යාප්ත කරනු ලැබීය. 1976 වර්ෂයේ දී පළමුවරට පවත්වන්නට යෙදුණ ලෝක ජනාවාස සමුළුවත් සමඟ නිවාස ක්ෂේත්‍රයේ ඇතිවූ නව ප්‍රවණතාවයන්ටද අවධානය යොමු කරමින් 1978 දී පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික පැල්පත් ප්‍රදේශවල අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ දායකත්වය ලබාගනිමින් ඒවා වැඩිදියුණු කිරීමේ ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ලැබීය. (ගනේපොල,2004). එසේම මෙම කාලවකවානුවේදී නිවාස ක්ෂේත්‍රයේ දැකගත හැකි විශේෂ ලක්ෂණයක් වූයේ රජය ඉහළ හා මධ්‍යම පාන්තික ආදායම් කාණ්ඩවල නිවාස අවශ්‍යතාවයන් සඳහා පෞද්ගලික අංශය දිරිමත් කරමින් නිවාස කටයුතු පුළුල් කළ ද, නාගරික පැල්පත් වාසීන්, වතු කම්කරුවන්, ධීවරයින් වැනි විශේෂ අඩු ආදායම්ලාභී කාණ්ඩවල ජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපයාදීම සඳහා විකල්ප නිවාස සංවර්ධන ක්‍රමවේද හඳුන්වාදෙමින් ඒ සඳහා සෘජුව මැදිහත්වීමත්ය (ගනේපොල,2004).

කොළඹ නගරයේ අඩු ආදායම්ලාභී ප්‍රජාවට නිවාස පහසුකම් සැපයීමේ අරමුණින් යුක්තව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කෙරෙහි අවධානය යොමුකිරීමේදී 1960 දශකයේදී පමණ රජය මහල් නිවාස ව්‍යාපෘතීන් දියත්කළ

අතර ඒවා කුලී පදනම මත පවරා දෙන ලදී. මෙම වැඩසටහන් 1970 කාල සීමාවේදී තවදුරටත් පුළුල් කරන ලද අතර එමගින් බස්නාහිර පළාතේ නාගරික ජනතාවට වඩාත් ඵලදායී ප්‍රතිලාභ අත්පත් විය (Hosing Development in Sri Lanka,1971-1981). නිවාස, ආර්ථික වර්ධනය ප්‍රසාරණයට හා ජනතාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට භාවිත කළ හැකිය යන ඒකාග්‍ර ප්‍රකාශනය මත පදනම්ව 1977 දී නිවාස දශ ලක්ෂයේ වැඩසටහන දියත් කරන ලද අතර එමඟින් පෞද්ගලික නිවාස අයිතිය ඉහළ නැංවීම අරමුණු කරන ලදී. වැඩසටහනේ යාන්ත්‍රණය තුළ ස්වයං ආධාර යටතේ ග්‍රාමීය හා නාගරික නිවාස 50,000 ක්ද, සෘජු ඉදිකිරීම් යටතේ නාගරික නිවාස 36000 ක්ද, ණය පහසුකම් යටතේ නාගරික නිවාස 14,000 ක්ද ඉදිකිරීමට පියවර ගන්නා ලදී. 1981 වර්ෂයේදී මෙම වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට හැකිවිය. නිවාස දශ ලක්ෂයේ වැඩසටහන යටතේ නාගරික නිවාස උප සැලැස්මක්ද දියත් කරන ලදී. නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කළ මෙම නාගරික නිවාස උප සැලැස්මේ "නව ගම්ගොඩ සංකල්පය" යටතේ ඉඩම් බැංකුවක් පිහිටවුන ලද අතර එමඟින් නාගරික පහළ ආදායම්ලාභී ජන කණ්ඩායම්වලට වැඩි වශයෙන් මුඩුක්කු හා පැල්පත්වාසීන්ට ඉඩම් ලබාදීම අභිප්‍රාය විය. මෙම වැඩසටහන කොළඹ නගරය තුළ සාර්ථක වූ නිවාස යෝජනා ක්‍රමයක් ලෙසට හැඳිනගත හැකිය. නමුත් දේපළ සංවර්ධනයත් සමඟ නිවාස ගොඩනැගීමෙහි ලා රජය නිරත වූයේ 1983 කාලවකවානුවෙන් පසුවය. එහිදී ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකිවන ලෙස මූලික නිවාස යෝජනා ක්‍රම 2ක් හඳුන්වා දෙනු ලැබීය. එනම් තට්ටු නිවාස යෝජනා ක්‍රමය හා ආධාර සහිත අත්තම් නිවාස යෝජනා ක්‍රමය ලෙසය.

තට්ටු නිවාස යෝජනා ක්‍රමය යටතේ ඇති කළ ප්‍රධාන නිවාස යෝජනා ක්‍රමය ලෙසට මාලිගාවත්ත මහල් නිවාස යෝජනා ක්‍රමය නම් දරන අතර වර්ග අඩි 490 ක් වන නිවාස ඒකකයන් මේ යටතේ ඉදිකරන ලදී. මෙහි නිවසක කුලී පිරිවැය ජනතාවට දරාගත නොහැකි විය. ආධාර සහිත අත්තම් නිවාස යෝජනා ක්‍රමය සාපේක්ෂ වශයෙන් සාර්ථක ආධාර ලත් අත්තම් නිවාස යෝජනා ක්‍රමයක් විය. මෙම නිවාස අර්ධ නාගරික ප්‍රදේශවල ඉදිකරන ලද අතර වත්තල ප්‍රදේශයේ "හේකිත්තේ" සාපේක්ෂ වශයෙන් සාර්ථක ආධාර ලත් නිවාස ඒකක 45 කින් යුත් අත්තම් නිවාස යෝජනා ක්‍රමයකි (ජොකිම්, 1976).

නිවාස සංවර්ධන අධිකාරිය මගින් කොළඹ අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වූ පවුල් 15,000 කට වැඩි සංඛ්‍යාවක් සඳහා නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර එමගින් අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ට යටිතල පහසුකම් සමඟ මූල්‍යමය හා තාක්ෂණික ආධාර ලබාදීම මගින් ඔවුන්ගේ නිවාසවල හා ජීවත්වන පරිසරයේ තත්ත්වය ඉහළ නැංවීමට හැකියාවක් ලැබිණ. සමස්තයක් ලෙස 1980 දශකයෙන් පසුකාලීනව රජය හා පෞද්ගලික අංශයන්ගේ හවුල්කාරීත්වය තුළින් නිවාස සංවර්ධන කාර්යභාරය දියත්විය. නමුත් නාගරික අඩුපහසුකම් සහිත ජනාවාසවල වටිනා ඉඩම් නාගරික සංවර්ධන කටයුතු සඳහා නිදහස්කර ගැනීමට නොහැකි වූ අවස්ථාවලදී රජය ඒ සඳහා සෘජුවම මැදිහත්විය (Keerthisinghe,2014). නැවතත් 1990 දී රජය විසින් කොළඹ ජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා මහල් නිවාස ඉදිකිරීමේ ප්‍රයත්නයක් ගෙන ඇති නමුත් එය එතරම් සාර්ථකත්වයක් අත් කරගෙන නොමැත. 1996 වර්ෂයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු ආදායම්ලාභී කාණ්ඩ සඳහා නාගරික නැවත පදිංචිකිරීමේ නිවාස වැඩසටහන (Urban Relocation Housing Program) සහ මධ්‍යම ආදායම්ලාභී කාණ්ඩ ඉලක්කකරගත් විකුණුමට පෙර නිවාස (Pre-Sale Housing) යනුවෙන් සමාන්තර වැඩසටහන් දෙකක් ආරම්භ කරන ලදී. 1996 දී ඉස්තාන්බූල් නුවර පැවති දෙවන ලෝක ජනාවාස සමුළුවේදී ප්‍රකාශයට පත්කර ඇති පරිදි තිරසාර නිවාස සහ මානව ජනාවාස සංවර්ධනය කිරීම කෙරෙහි රජය විසින් විශේෂ අවධානයක් යොමුකරමින් නිවාස ව්‍යාපෘතිය දියත් කරන ලදී.

තිරසර පුරවර වැඩසටහන යටතේ ඉදිකරනු ලැබූ පළමු නිවාස ව්‍යාපෘතිය ලෙසට වනාතමුල්ලේ සහසපුර නිවාස ව්‍යාපෘතිය නම් දරයි. ඇමරිකානු ඩොලර් මිලියන 13,600කට වැඩි වටිනාකමකින් යුත් සින්නක්කර නිවාස අයිතිය ලබාදීමෙන් තිරසර පුරවර වැඩසටහනේ නිවාස අයිතිය පුළුල් කරනු ලැබූ අතර එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස සංවර්ධන වැඩසටහනේ 21 වන න්‍යාය පත්‍රයට පූර්ණ වශයෙන්ම අනුකූලවන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී (Peiris,2006).

මෑත වකවානුවේදී නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර ඒ යටතේ අඩුපහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන පුද්ගලයින් විකල්ප මහල් නිවාසවල පදිංචි කරවීම සිදුකරනු ලැබේ. කොළඹ නගරයේ නාගරික කලාප 47 ක් පිහිටි අඩු පහසුකම් සහිත ජනාවාස 1,614 ක පමණ වෙසෙන 68,812 ක් පමණ වූ පවුල් සඳහා මේ යටතේ මහල් නිවාස සැපයීම සිදුකිරීමට නියමිතයි (ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වාර්ෂික වාර්තාව,2013).

**නාගරික නැවත පදිංචි කිරීමට පෙර තත්වය.**

අඩු ආදායම්ලාභී ප්‍රජාව නැතිනම් මුඩුක්කු පැල්පත්වාසීන් නැවත පදිංචි කිරීමට පෙර ඔවුන්ගේ ආර්ථිකය, සමාජය, අධ්‍යාපනය, සෞඛ්‍ය යන අංශ කෙරෙහි අවධානය යොමු කිරීමේ දී හඳුනා ගත් තත්ත්වය මත ඔවුන් ඒ හරහා යහපත් හා අයහපත් ප්‍රතිඵල අත්විඳි ප්‍රජාවක් ලෙස හඳුනා ගත හැක .

ආර්ථික තත්වය දෙස අවධානය යොමු කිරීමේදී මුඩුක්කු තුළ  සිටින බහුතරයක් ප්‍රජාව ස්ථිර රැකියා නොකරන,  වීදි වෙළඳාම වැනි එදිනෙදා ආදායම් උපයා ගන්නා පිරිසක් ලෙස හඳුනාගත හැක. නමුත් දුම්රිය අධිකාරිය හා වෙනත් රාජ්‍ය ආයතනවල මාසික වේතනය ලබන සුළු සේවකයන් ද මෙම ප්‍රදේශ තුළ ජීවත් වේ. ඔවුන්ට මුඩුක්කු හා පැල්පත් තුළ ජීවත් වීමේදී දැඩි ජීවන බරක් නොතිබුණි. එදිනෙදා ජීවත්වීමට අවශ්‍ය  මුදල් උපයා ගැනීම ප්‍රමාණවත් විය. සමහරක් පිරිස තම නිවස තුළම විවිධ වෙළඳාම් කටයුතු කරන පිරිසක් ලෙස හඳුනාගත හැකිය. ඇඳුම් වෙළඳාම, සිල්ලර කඩ, උදෑසන ආහාර අලෙවිසැල්, තම නිවස තුළම පවත්වාගෙන යෑමෙන් අමතර ආදායමක් උපයන පිරිසක්ද විය. විශාල භූමි ප්‍රමාණයක මෙම නිවාස පැතිර ඇති නිසා සමාජ විරෝධී ක්‍රියාවන් බහුල ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැක. මත්ද්‍රව්‍ය වෙළෙඳාම, නිෂ්පාදනය, හෙරොයින් අලෙවිය හා භාවිතා කරන්නන් මෙන් ම ආර්ථික අතින් ශක්තිමත් පිරිසක් ද හඳුනාගත හැකි විය.

අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී බහුතරයක් පිරිස නිසි අධ්‍යාපනය ක් නොලැබූ පිරිසක් ලෙස හඳුනා ගත හැක. තම දරුවන් අධ්‍යාපනයට යොමුකිරීමට බහුතරයක් පිරිස පෙළඹී ඇත. අධ්‍යාපනය හීන වීම මත සමාජයේ පිළිගත් රැකියාවක් කිරීමට ඔවුනට අවස්ථාව හිමි වී නොමැත. සුළු සේවකයන්, නාට්ටාමි, වීදි වෙළඳුන් වැනි විවිධ වෘත්තීන්වලින් එදිනෙදා ආදායම උපයා ගන්නා පිරිසක් හඳුනා ගත හැක. අධ්‍යාපනයට යොමු නොවීමටත් විවිධ කරුණු බලපානු ලබයි. කොළඹ නාගරික පාසල් වලින් මෙම ප්‍රදේශවල දරුවන් පාසලට නොගැනීම, අධ්‍යාපනය සඳහා වියදම් කිරීමට ප්‍රමාණවත් මුදල් නො තිබීම, අධ්‍යාපනය හැදෑරීමට සුදුසු සමාජ වටපිටාවක් මේ පරිසරය තුළ නොවීම වැනි කරුණු හඳුනා ගත හැක.

සෞඛ්‍යය අංශය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පාරිසරික වශයෙන් අපිරිසිදු පරිසරයක් මෙම නිවාස අවට දැක ගත හැකි විය. මෙම පැල්පත් මුඩුක්කු බහුතරයක් ඉදිවී ඇත්තේ කැලිකසල ගොඩ ගසන ප්‍රදේශ වලය. එමෙන්ම මෙම නිවාස පහත් බිම්වල පිහිටා තිබීම නිසා නිතර ගංවතුර තත්ත්වයන්ට මුහුණ දේ. නිසි කාණු පද්ධතියක් නොතිබීම, ජලය අක්‍රමවත් ලෙස බැහැර කිරීම, ජලය බැහැර කිරීමට සුදුසු ස්ථාන නොතිබීම නිසා නිතර දුර්ගන්දය

සහිත ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැක. පොදු වැසිකිළි භාවිතය, පොදු ජල නල පහසුකම් භාවිතා කරන පිරිසක් ලෙස හඳුනා ගත හැක. ගංගා දෙපස ඇලවල් දෙපස සිටීම නිසා නිතර මැසි මදුරු කරදර විවිධ ලෙඩ රෝග බහුල ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැක.

පෝෂණය පිළිබඳව කරුණු විමසීමේදී ආහාර අවශ්‍යතාවය සියල්ලන්ටම පොදුය, මෙම නිවාස වල ආදායම් තත්ත්වය මත පෝෂණ තත්ත්වය තීරණය වේ. ආදායම අඩු නම් ආහාර සඳහා වියදම් කරන ප්‍රමාණය අඩුය. පාරිසරික වටපිටාව අපිරිසිදු නිසා ආහාරවල ගුණාත්මක බවේ අඩුවක් තිබිය හැකිය. මැසි මදුරු කරදර බහුල වීම මීට මූලික හේතුව වේ.

බහු සංස්කෘතික ප්‍රවණතාවක් පැල්පත් හා මුඩුක්කු ප්‍රජාවන් තුළ හඳුනාගත හැක. කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස සංස්කෘතික සම්මිශ්‍රණය හඳුනා ගත හැක. එමෙන්ම විවිධ ජනවර්ග එකතුවක් ලෙසත් මෙම ප්‍රදේශ හඳුනා ගත හැක, දෙමළ, සිංහල, මුස්ලිම් හා අන්‍ය ආගමිකයන්ගේ එකතුවකි. එම නිසා විවිධ සංස්කෘතියක අංගයන් මෙම පරිසරය තුළින් හඳුනාගත හැක. ඇඳුම් විලාසිතාවන් ද විවිධාකාර වේ.

සමාජ සහයෝගය පිළිබඳ අවධානය යොමු කිරීමේදී අනිකුත් ප්‍රදේශයන්ට වඩා සාමාජීක වශයෙන් පුද්ගලයන් ඒකරාශීවීමක් හඳුනාගත හැක. විශාල භූමියක නමුත් ළඟ ළඟ පිහිටි නිවාසවල ජීවත් වූ පිරිසක් නිසා සහයෝගය අතින් ඔවුන් එකමුතු කණ්ඩායමක් වේ. එක හා සමාන සමාජයක ජීවත් වීම, අධ්‍යාපන, රැකියා වැනි සාධක වලින් ඔවුන් සියලු දෙනාම පොදුවේ. විවිධ ප්‍රදේශවලින් පැමිණි පුද්ගලයන් නිසාත් අන්‍යෝන්‍ය සහයෝගය ඉතා ඉහළ වේ.

විවිධාකාර ගැටළු පැවතියා වුවත් ප්‍රධාන සමාජයෙන් ඈත් වුවත් ඔවුන් මෙම ප්‍රදේශ වලින් බැහැරව නොයන්නේ නගරාශ්‍රිතව ජීවත් වීමට තිබෙන උවමනාව නිසාත්, කුමන හෝ රැකියාවක් කිරීමට අවස්ථාව හිමි වන නිසාත් යටිතල පහසුකම් ග්‍රාමීය ප්‍රදේශයන්ට වඩා දියුණු වීම නිසාත්ය, නමුත් ඔවුන් කිසිදු විටෙක මුඩුක්කු පරිසරයක් තුළ ජීවත් වන බව සමාජයට පෙන්වීමට කැමැත්තක් නොදක්වන බව හඳුනා ගැනීමට හැක. පෞද්ගලික ආයතනවල සේවය කරන පිරිස, උසස් රැකියා වල සේවය කරන පිරිස තුළ මෙවන් අදහස් පවතින බව හඳුනා ගත හැක .මෙම සමාජ පරිසරය ඉවත්ව යාමට අවශ්‍ය වුවත් ඒ සඳහා අවශ්‍ය කරන මුදල්, භූමිය වැනි සාධක ඔවුන්ට නොතිබීම නිසා තවදුරටත් ඒ තුළම සිටීමට ඔවුන්ට සිදුවී ඇත. එමෙන්ම දීර්ඝ කාලයක් සිටි පරිසරයෙන් ඈත් වීමට ද ඔවුන් කැමැත්තක් නොදක්වයි.

**මහල් නිවාසවල පදිංචි වීමෙන් පසු තත්වය.**

නාගරික සංවර්ධනය හරහා ආර්ථික සංවර්ධනය කිරීමට නම් දේශීය විදේශීය ආයෝජනයන් ගෙන්වා ගත හැකි ස්ථානය වනුයේ නගරයයි. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වාණිජ නගරයවන කොළඹ සංවර්ධනය කිරීමට නම් පැල්පත් හා මුඩුක්කුවාසී ප්‍රජාව සඳහා ස්ථිර විසඳුමක් ලබාදීම අනිවාර්ය වෙයි. ඒ හරහා එම පැල්පත් හා මුඩුක්කු ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීමට අවස්ථාවක් ලැබෙනවා පමණක් නොව නගරය අලංකරණය කිරීමට ද හැකියාවක් ලැබේ. මහල් නිවාස ව්‍යාපෘති ක්‍රමය පිළිබඳව අවධානය වැඩි වශයෙන් යොමු වන්නේ 2009 කාල වකවානුව තුළය. එනම් දශක තුනක් පැවති යුදමය තත්වය අවසානයේය. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නාගරික සංවර්ධන අමාත්‍යාංශ යටතේ සිදු වුවත් එය 2009 න් පසු ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගෙන නාගරික සංවර්ධන ක්‍රියාවලින් සිදු කරනු ලබයි. එයට ප්‍රධානම හේතුව ලෙස පැල්පත් හා මුඩුක්කුවාසීන් එම ප්‍රදේශවලින් ඉවත් කිරීමට මිලිටරි බලය උපයෝගී කර ගැනීම සඳහාය. නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ලෙස නම්කොට කොළඹ නගරය ලෝක නගරයක් ලෙසට පත්

කිරීමට පැවති ආණ්ඩුව උත්සාහ ගෙන ඇත. ලෝක නගරය ආර්ථිකය සංවර්ධනය, ආකර්ෂණය හා වරප්‍රසාද වැඩි නගර වේ. සංවර්ධිත රටවල ලෝක නගර බහුලව වුවත් මිලියන නගර බහුලව පවතින්නේ ආසියාව තුළය. එනම් ජනගහනය වැඩි නගරයන්ය. එනිසාම නාගරික ගැටලු රාශියක් ආසියාතික රටවලින් වාර්තා වේ.

මහල් නිවාස ව්‍යාපෘති වල ඇගයුම, නැතිනම් ප්‍රජාව නැවත පදිංචි කිරීමෙන් අනතුරුව ඇතිවුණු තත්වය හා අභියෝගයන් ගැටලු හඳුනා ගැනීම වැදගත් වේ. මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රමය ලංකාව වැනි රටකට අලුත් ව්‍යාපෘති ක්‍රමයකි. තවමත් මෙහි යථා ස්වරූපය හඳුනා ගැනීමට හැකියාවක් ලැබී නැත. තවමත් මහල් නිවාස හරහා සිදු වන තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කරමින් පවතී.

මහල් නිවාසයේ භෞතික තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී, මහල් නිවසක් වර්ග අඩි 450 ක් වන අතර එය නිදන කාමර දෙකක්, මුළුතැන්ගේ, විසිත්ත කාමරය, නාන කාමරයක් සහ සඳලුතලේ කින් සමන්විත වේ. සෑම නිවසක්ම එක හා සමාන විය, නිවාස බෙදා දීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබයි. සංවර්ධිත ව්‍යාපාර හරහා සිදු කරනු ලබන ව්‍යාපෘති තුළදී යහපත් ගුණාංග අයහපත් ගුණාංග රාශියක් හඳුනා ගැනීමට හැක. මහල් නිවාසවල නැවත පදිංචි කිරීමේ දී ප්‍රජාව අත්විඳින යහපත් තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී කරුණු කිහිපයක් හඳුනා ගත හැක .

01. ප්‍රතිලාභ අත් විඳින ප්‍රජා කණ්ඩායම් දෙකක් සිටී.

ආර්ථික අතින් දුෂ්කර පිරිසට තම ආර්ථිකයට ගැලපෙන ලෙස නිවස තෝරා ගැනීම වෙනුවට සමාන නිවසක් හිමි වීම, අපිළිවෙල, අපිරිසිදු, විදුලිය රහිත නිවාස වෙනුවට පිරිසිදු හිත කර නිවසක් හිමි වීම. නිවාස හිමි සතුටු ජනතාවක් බවට පත් වීම, එමෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවෙන් හිමි වූ නිවාස වෙනුවට මහල් නිවාසයෙන් තමාටම කියා නිවසක් හිමි වීම, සේවය තිබෙන තුරු පමණක් දුම්රිය දෙපාර්තමේන්තුවේ හිමිවූ නිවාසවල සිටීමට අයිතිය තිබීම. නමුත් මහල් නිවාස හරහා තමාටම කියා නිවසක් හිමි වීම.

02. සමාජයෙන් පිළිගැනීමක් ලැබීම.

මුඩුක්කු පැල්පත්වාසීන් ලෙස ප්‍රධාන සමාජයෙන් වෙන් වෙනවා වෙනුවට තිබූ මට්ටමට වඩා උසස් මට්ටමක් මේ හරහා හිමි වී තිබිණි. මෙහිදී තමාටම කියා නිවසක් හිමිවීම, පෙර තිබූ අපිළිවෙළ අපිරිසිදු නිවසට වඩා යහපත් ස්ථානයක් වීම, පොල්අතු, විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් සාදා තිබූ නිවසට වඩා සැප පහසුව අතින් හා ආරක්ෂාව අතින් යහපත් නිවසක් වීම.

03. අධ්‍යාපනය සඳහා යොමුවීමේ ප්‍රවණතාව.

මෙම නිවාස තුළදී ළමුන් අධ්‍යාපනයට යොමුවන අවස්ථා වැඩිවීම. මෙහිදී පාඩම් කිරීමට සුදුසු වටපිටාවක් තිබීම, වර්ෂාව නිසා බාධා වීම හෝ නිතර ගංවතුර තත්ත්වයන්ට මුහුණ දීමට සිදු නොවීම, පොත් පත් ලිපි ද්‍රව්‍ය පිළිවෙළකට තබා ගැනීමට අවස්ථාව හිමිවීම, පාසල් තුළට මුඩුක්කුවක ළමයෙකු පැමිණෙනවා වෙනුවට මහල් නිවාසයක සිට පැමිණෙනවා යැයි පැවසීම සතුටු කරුණක් වීම, වැනි හේතු නිසා ළමුන් අධ්‍යාපනය සඳහා යොමුවීමේ ප්‍රවණතාවක් ඇති බව හඳුනා ගත හැක.

04. පිරිසිදු ආහාර ලබාගැනීමට අවස්ථාව හිමිවීම.

පෝෂණය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පාරිසරික වටපිටාව පිරිසිදු කිරීම නිසා මැසි මදුරුවන්ගෙන් ආරක්ෂා වීමට හැකි වීම හා පිරිසිදුව ආහාර පිසීමට අවස්ථාව හිමිවීම වැනි තත්ත්වයන් හඳුනා ගත හැක.

මුඩුක්කු පැල්පත් තුළ ජීවත් වනවාට වඩා මේ පරිසරය හිතකර මට්ටමක පැවතුණි. නමුත් මෙම මහල් නිවාස පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමේ දී මෙම සංකල්පය අසාර්ථක තත්ත්වයන් පිළිබඳ වැඩිපුර කරුණු ඉදිරිපත් වේ .

01. වන්දි ගෙවීමක් නො කිරීම, බලහත්කාරයෙන් පදිංචි කිරීම.

ප්‍රේරිත පදිංචි කිරීමක් කිරීම නිසා තමන් සිටි ඉඩම වෙනුවට කිසිදු වන්දියක් හිමි වූයේ නැත, මෙම නැවත පදිංචි කිරීමට ලක් වූ පිරිසෙන් 20% පමණ ඉඩම් ඔප්පු තිබුණි, නමුත් ඔවුන්ට ද වන්දියක් ලබා දීමක් සිදු නොකරන ලදී.

02. නිවාස තමන් සතු කර ගැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදු වීම.

මෙම නිවාස පුද්ගලයන්ට හිමි වන්නේ ලක්ෂ දහයක් ගෙවීමෙන් අනතුරුවය, පළමුව රුපියල් පනස් දාහක් දීමත් නිවාසයට පදිංචියට එන විට නැවත පනස්දාහක් දීමත් කළ යුතු වේ. ඉතුරු ලක්ෂ නමය වාරික වශයෙන් ගෙවිය යුතුය, එය අවුරුදු විස්සක් තිහක් අතර කාලයක් විය හැක. ස්ථිර නිවාස හා ස්ථිර ඉඩම් හිමි වුවත් ඔවුන් ද මෙම මුදල ගෙවීම අනිවාර්ය වේ, නිවසේ අනන්‍යතාවය ලැබෙන තුරු මහල් නිවාස රජය සතු වේ. එය මානසික පීඩනයක් බව පදිංචිකරුවන් ගේ අදහස විය.

03. නිවාස ලබාගැනීමට ලැබුණු නිර්ණායක.

එකම පැල්පතක, එකම මුඩුක්කුවක පවුල් දෙක තුනක් සිටියත් වෙන වෙනම විදුලි බිල්, වතුර බිල් තිබීම, වෙනම දොරකින් නිවාසයට ඇතුල් වීමට තිබිය යුතුය, නැතිනම් නිවාසය හිමි වන්නේ ඒ සියලු දෙනාට එක නිවසක් ලෙසටය, වෙන වෙනම නිවාසවල සිටියත් ඉහත සියලු බිල්පත් ඉදිරිපත් කළ යුතු වේ.

04. නිවාස අයිතිය පිළිබඳ ගැටලුව.

නිවාස සඳහා ගෙවිය යුතු මුදල ගෙවූ පසු අවසානයේ නිවසේ හිමිකම ලැබේ. නමුත් නිවසේ හිමිකම ලබා ගැනීමට වසර විස්සක් හෝ තිහක් බලාගෙන සිටීමට සිදුවීම. රජය මෙයින් බලාපොරොත්තු වූයේ මහල් නිවාස සඳහා ප්‍රජාවේ සහභාගිත්වය මෙය හරහා ලබා ගැනීමටය. තම අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි අවස්ථාවක දී නිවාසයක් ලබා ගැනීමට නොහැකි වීම. රැකියා කිරීම පිණිස කොළඹට පැමිණි පිරිසට තම අනන්‍යතාවය ඔප්පු කිරීමට හැකියාවක් නොතිබීම.

05. නිවාස ලැබිය යුතු හා නොලැබිය යුතු සියලු දෙනාට එක හා සමාන නිවාස හිමිවීම.

68000 ක් පමණ පිරිස සිටියත් මේ නිවාස ලැබිය යුතු පිරිස සිටින්නේ 20000 ක් පමණි, ඉතුරු 40000 නිවෙස් සහිත පිරිසක් උවත් ඔවුන්ටත් මෙම කුඩා නිවසේම සිටීමට සිදු වි ඇත. ඒ හරහා ඔවුන් ද මුඩුක්කු හා පැල්පත්වාසීන් බවට පත් කර ඇත, මුඩුක්කු හා පැල්පත් පරිසර තුළ වුවත් පිළිවෙලකට නිවාස තනා ගත් පිරිසක් ද සිටි අතර ඔවුන්ට ද අවසානයේ මෙම මහල් නිවාස වලට පැමිණීමට සිදුවී ඇත.

06. සමාජ සම්බන්ධතා රටාව වෙනස් වීම.

සමාජ සම්බන්ධතා රටාව වෙනස් වීම කෙරෙහි අවධානය යොමු කිරීමේදී මුල් පරිසරයේදී තමා අවට සිටි ප්‍රජාව නෑදෑ හිතමිත්‍රාදීන් මහල් නිවාසවල නැවත පදිංචි කිරීමේ දී එකම ස්ථානයක පදිංචි නොකර විවිධ වූ ස්ථානයන් හි පදිංචි කිරීම සිදුවේ. මේ නිසා තමන්ගෙ මුල් භූමියේ තිබූ සබඳතාවයන් නැවත පදිංචි කිරීමේ දී වෙනසකට ලක් වී ඇත.

07. අර්ථ සාධනය.

අර්ථ සාධනය අතින් ගත් කල නැවත පදිංචි කර වූ පවුල් අතර පැවතියේ තෘප්තිකර ආකල්පයක් බව පෙනේ. නැවත පදිංචි කිරීමෙන් පසු තමන්ගේ භෞතික ගුණාත්මක බව ඉහළ ගිය බව සඳහන් කළහ. නැවත පදිංචි කරන ලද බහුතරයකගේ ආදායම් තත්වය ඉහළ ගොස් තිබුනද සුළුතරයකට තම ජීවිකාව අහිමි වී තිබුණි. ජීවිකාව අහිමි වීම කෙරෙහි මූලික වශයෙන් බලපා ඇත්තේ මුල් පදිංචියට වඩා දුරින් පිහිටි නිවාස සංකීර්ණවලට යාමට සිදු වීමයි.

08. ජීවන වියදම.

ආදායම ඉහළ ගියද නැවත පදිංචි කරවීම නිසා තම වියදම්වල අඩුවීමක් නොමැති බව බහුතර මත විය. ප්‍රජා අදහස් අනුව ගත්කල විදුලිය සහ ජල බිල්පත් වැඩිවීම, ප්‍රවාහන ගාස්තු ඉහල යාම වැනි හේතු නිසා. ඔවුන්ගේ වියදම ඉහළ ගොස් තිබේ. තම මුල් පදිංචි ස්ථානයේ දී තම නිවස අසලින් ඇදුනු ප්‍රධාන විදුලි රැහැනෙන් නීති විරෝධී ලෙස විදුලි සැපයුම් ලබා ගත් පවුල් ද එමෙන්ම නගර සභාවෙන් සපයන ලද පොදු ජල කරාමයෙන් ජලය ලබාගත් පවුල් ද විශාල වශයෙන් මෙම නැවත පදිංචි කර වූවන් අතර සිටි. එවැනි පිරිසට ජල හා විදුලි බිල්පත් ගෙවීම මෙතෙක් කල් නො වූ වියදමකි.

09. දේශපාලන බලය.

සිංහපුර පළමු අදියරේ පදිංචිකරුවන් බහුතරයක් වනාතමුල්ලේම පිහිටි 54 වත්තේ ගෙනවුත් පදිංචි කර වූ අයයි. දෙවන අදියරේ පදිංචිකරුවන් බහුතරයක් ටොරින්ටන් හි පිහිටි 187 වත්තෙන් පැමිණි අයයි. 54 වත්තේ විසූ අයට ඔවුන්ගේ මුල් නිවස අහිමි වී ඇත්තේ සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ අනුදැනුමකින් තොරව නොවුනත් ඔවුන් තමාට ලැබුණු නියෝග නොසලකා හැරීම නිසා අවසානයේ දී රජය විසින් හමුදාව සහ වෙනත් නිලධාරීන් යොදවා බලහත්කාරයෙන් එම පදිංචිකරුවන් ඔවුන්ගේ නිවාස වලින් නෙරපා දමා ඇත. 187 වත්තෙන් නෙරපනු ලදුව සිංහපුර දෙවන අදියර පැමිණි සිටින පවුල් මුහුණ දී ඇත්තේ නිහඬ සහ වඩාත් සූක්ෂම ආකාරයේ දේශපාලන ප්‍රචණ්ඩත්වයකටය. ඔවුන්ගේ අවතැන්වීම බැලූ බැල්මට සාමකාමීව සිදු වූවක් සේ පෙනෙන්නේ සාකච්ඡා මාර්ගයෙන් ටොරින්ටන් හි එම නව නිවාස ගොඩනඟා දෙන බවට යම් යම් එකඟතා සහ පොරොන්දු මත සිදු වූවක් නිසයි. නමුත් අවසානයේ රජය විසින් දෙන ලද පොරොන්දු කඩ කිරීම නිසාත් වෙන යාමට තැනක් නොමැති නිසාත් මෙම පදිංචිකරුවන්ට සිදුවී ඇත්තේ වනාතමුල්ලේ තනන ලද සිංහපුර නිවාස සංකීර්ණයේ පදිංචි වීමටයි.

10. සමාජ තත්වය.

178 වත්තෙන් පැමිණි පිරිස ඉන් වඩාත් නොසතුටට පත් පිරිසයි. මන්දයත් මෙම ක්‍රියාවලින් නිසා ඔවුන්ට ටොරින්ටන් වැනි සමාජ පිළිගැනීමක් සහිත ප්‍රදේශයක සිට වනාතමුල්ල වැනි සමාජ පිළිගැනීමක් රහිත ප්‍රදේශයකට පැමිණීමට සිදු වීම ඔවුනට මහත් සමාජ අවහිරයක් මෙන්ම මානසික වදයක් ද වීම.

11. ආකල්ප.

වෙනත් ප්‍රදේශවලින් ගෙනැවිත් වනාතමුල්ලේ පදිංචි කරන්නන් හට ඇති ප්‍රධානම ගැටලුවක් වන්නේ යථෝක්ත සෘණාත්මක ආකල්පයයි. වනාතමුල්ල පිළිබඳව පවත්නා ආකල්ප අද වන විට එම ප්‍රදේශයට ආදේශ කිරීම අසාධාරණ බව හා නොගැලපෙන බව එම කලාප භාරව කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්, ආගමික සිද්ධස්ථානවල පූජකයන් සහ ප්‍රදේශවාසීන් බහුතරයකගේ මතය වේ. විශේෂයෙන් තරුණ පිරිස් එම මතය වෙනස් කිරීමේ අවශ්‍යතාවය ගැන කතා කළහ.

11.මත් ද්‍රව්‍ය

අද වන විට මහල් නිවාස හමුවේ පවත්නා බරපතලම ගැටලුවක් වනුයේ මත් ද්‍රව්‍ය සහ ඒ හා බැඳුණු රණ්ඩුසරුවල්, අසභ්‍ය වචන හුවමාරුව, ඝෝෂාව, සොරකම් කිරීම වැනි ගැටලුය. මේ ප්‍රදේශවල මුල් කාලීනව සිටි ප්‍රජාව දන්වා සිටින්නේ මෙවැනි කරදරකාරී කටයුතුවල නියැළෙන්නේ මුඩුක්කු වැසියන් බවයි.

12. ප්‍රජාවේ එකමුතුකම

මත්ද්‍රව්‍ය වැනි ගැටලුවලට පොලිසිය මැදිහත් වීම අවම වීම සහ ප්‍රජාවේ සාමාජිකයන් අතර එකමුතුවක් නොමැති වීම යන කරුණු දරුණු ලෙස බලපායි. පොලිසිය කැඳවා කිසියම් අයෙකුට දඬුවම් කිරීම හෝ අවවාද කිරීම නිසා පැමිණිල්ල කළ පුද්ගලයාට අවදානමට ලක් වීමට සිදු වේ. මහල් නිවාසවල සිටින ප්‍රජාව අතර සහයෝගී බවක් නොමැති වීම නිසා පුද්ගලයින් එකිනෙකාට උදව් කර ගැනීමෙන් ඈත්ව සිටී.

13. හැඟීම

ප්‍රජාවක් ලෙස ගත් කල සිංහපුරවාසින් මුහුණදෙන දරුනුතම අභියෝගයක් ලෙස හඳුනා ගත්තේ පුද්ගලයින් අතර සත්‍ය වශයෙන්ම තමා එම ප්‍රජාවට අයත්ය යන හැඟීම වර්ධනය වී නොතිබීමයි. තට්ටු නිවාස ජීවිතය, තම නිවස තුළම වැසිකිළිය සහ ජල කරාම ඇති ජීවන රටාව, නිවසක් හිමි වීම නිසා තමා වෙනදාට වඩා මහන්සිවී ජීවිතය ගොඩනගා ගත යුතු බවට ඇති බලාපොරොත්තු සහ අපේක්ෂාවන්, තම අසල්වැසියන්ට වඩා තමා දියුණු විය යුතු බවට ඇති තරඟකාරිත්වය වැනි කරුණු මේ කෙරෙහි බලපා ඇති බව පෙනේ.

14. දරුවන්ගේ අධ්‍යාපනය

සෑම පවුලකම අරමුණ වී ඇත්තේ තම දරුවන්හට හොඳින් උගන්වා ඔවුන්ට යහපත් අනාගතයක් සකසා දීමයි. බොහෝ දෙමාපියන් වනාතමුල්ලේ සිදුවන බවට ප්‍රකට අපචාරී කටයුතුවලින් තම දරුවන් මුදා ගැනීමේ අරමුණින් ඔවුනට කිසිදු ප්‍රජා කටයුත්තකට සහභාගී වීමට හෝ අවම වශයෙන් සම වයසේ දරුවන් සමඟ සෙල්ලම් කිරීමට අවකාශය ලබා දෙන්නේ නැත. මේ නිසා තරුණ කොටස් අතරින් පැන නගින දේශපාලන හෝ ප්‍රජා නායකත්වයකගේ අඩුව දැනටමත් ඉස්මතු වෙමින් පවතී. මෙම ආකල්ප සහ ක්‍රියා කලාප පුද්ගලයින් හෝ පවුල වශයෙන් ඔහුගේ අනාගතය පිළිබඳව ධනාත්මක බලාපොරොත්තු ජනනය කලද තමා ප්‍රජාවට අයත් යන බව පිළිබඳ හැඟීමකින් තොරව ගොඩනැගෙන අනාගත පරපුරෙහි ඉදිරි ගමන පිළිබඳ ඇති වන්නේ නොසන්සුන් බියකි.

තවත් ප්‍රධානම හේතුවක් ලෙසට මෙම ව්‍යාපෘති ඉංජිනේරු තාක්ෂණ නිර්මාණ ශිල්පීන් විසින් සිදු කලත් සමාජ අංශය තුළ දී මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී ඇත. එයට මූලිකම හේතුව ලෙස සමාජ ඉංජිනේරු තාක්ෂණය යොදාගෙන නොමැති වීම හරහා මිනිසුන්ගේ, නැතිනම් ප්‍රජාවගේ නැවත පදිංචි කිරීමේදි මුල් නිවාසවල පිහිටීම පිළිබඳ සැලකිල්ලට නොගැනීම මූලිකම හේතුව ලෙස හඳුනා ගත හැක. මේ අනුව ඉහත සඳහන් ආකාරයට මහල් නිවාස වල යහපත් හා අයහපත් අංශයන් හඳුනා ගත හැක. “රට හදන සෞභාග්‍යයේ දැක්ම” නව රජයේ ප්‍රතිපත්ති රාමුව තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී අවවරප්‍රසාදිත නැතිනම් කොළඹ නගරය ආශ්‍රිතව ජීවත්වන අඩු ආදායම්ලාභී, මුඩුක්කු පැල්පත්වාසී ජනතාව නැවත පදිංචි කරීම් ආශ්‍රිතව මුහුණපාන ගැටලු නිරාකරණය කිරීම තුළින් ඔවුන්ගේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කළ හැකිවේ.

**යෝජනා**

01. නැවත පදිංචි කිරීම වැනි සංවර්ධිත සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී සමාජ ඉංජිනේරු තාක්ෂණය ලබා ගත යුතුය. එවිට මානුෂීය වශයෙන් තීරණ ගැනීමට හැකියාව හිමි වේ.

02. නැවත පදිංචි කිරීමට ලක්වන ප්‍රජාව ගේ අදහස් හා කරුණු විමසීමක් කළ යුතුය. ප්‍රජාවගේ ගැටලු ඔවුන් හොඳාකාරවම දන්නා නිසා ඊට අවශ්‍ය කරන පිළියම් ප්‍රජාව ගෙන්ම දැනගත හැක.

03. සුලු ව්‍යාපාරිකයන්ට හා අනෙකුත් රැකියා පිළිබඳව අධ්‍යයනයක් යොමු කොට මහල් නිවාස ඉදිකිරීමේදී පහත මහල ඒ සඳහා වෙන් කිරීම යෝග්‍ය වේ.

04. මිනිසුන් පීඩාවට පත් නොකර නැවත පදිංචි කිරීම ආරම්භ කළ යුතුයි. එම ප්‍රජාවගේ ඔප්පු සහිත ඉඩම් සඳහා වන්දි ගෙවීම සිදු කළ යුතුය.

05. ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථාන මහල් ගොඩනැගිලි සංකීර්ණ තුළම ඉදි කළ යුතුය.

06. මිනිසුන් නැවත පදිංචි කිරීමේ දී මුල් බිම්වල පදිංචි වී සිටි ආකාරය අනුවම නැවත පදිංචි කිරීමක් කළ යුතුය.

07. තරුණ ප්‍රජාව ගේ විරැකියාව අවම කිරීමට මහල් නිවාස ආශ්‍රිත රැකියා සඳහා තරුණ ප්‍රජාව සහභාගි කරවා ගැනීම කළ යුතුය.

08. මීට අමතර සංවර්ධිත රටවල් නැවත පදිංචි කිරීම් ආශ්‍රිතව ගනු ලබන තීන්දු තීරණ ශ්‍රී ලංකාව තුළ නැවත පදිංචි කිරීම් ආශ්‍රිතව යොදාගත හැකිද යන්න විමසා බැලීම.

09. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින විදුලිය බිඳවැටීම, ගෑස් අර්බුදය හමුවේ දැඩිව පීඩාවට පත්ව ඇති පිරිසක් ලෙස මොවුන් හඳුනා ගත හැක. එම ගැටලුව සඳහා ඉකමනින් විසඳුම් ලබා දිය යුතු වේ.

# 09. ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණවල ප්‍රතිවිපාක.

කේ.එම්.ජී.සමරසේන
පුහුණු හා පර්යේෂණ නිලධාරි
*Bcom. (Special)*

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සලකා බලන කළ 1972, 1975 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ වැදගත්වේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොටස් දෙකකි. ඉඩම් ප්‍රතිසංස්කරණ සහ කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ වශයෙනි. ඉඩම් ප්‍රතිසංස්කරණ මෙන්ම කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ එකට සිදුවිය යුතුයි.

ඉඩම් ප්‍රතිසංස්කරණ යන්නට ඉඩම් අත්පත්කරගැනීම, ඒවා කොටස් වශයෙන් බෙදාදීම, ඒවායේ භුක්ති ක්‍රම වෙනස්කිරීම, ඉඩම් කැබලි නැවත ඒකාබද්ධ කිරීම, ඉඩම් අයිතිය සම්බන්ධ නීතිරීති වෙනස් කිරීම යනාදියයි. කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ යනු කෘෂිකාර්මික නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම, යෙදවුම් අංශයෙන් ප්‍රතිසංස්කරණය, මිල ප්‍රතිපත්ති ආරම්භ කිරීම, ගබඩා සහ අලෙවි පහසුකම් ප්‍රසාරණයවීම යනාදියයි. ඉඩම් ප්‍රතිසංස්කරණ රැඩිකල් වෙනස්වීමක් ලෙස හඳුන්වයි. රැඩිකල් වෙනස්වීමක් යනු නිතිරීති ඉක්මනින් ක්‍රියාවට නන්වා දැඩි පරිවර්තනයක් ඇතිකරණ විප්ලවීය ස්වභාවයක් පවතිනවා යන්නයි.

ඉඩම් ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව සලකා බැලීමේදී ලංකාවේ මුළු ඉඩම්වලින් අක්කර 50000 ප්‍රමාණයක් පමණක් රජයේ අයිතිය යටතේ පැවැතිනි. මෙකල තුන්වන ලෝකයේ සෑම රටකම පාහේ රාජ්‍ය අංශයේ ආර්ථික කටයුතුවල ප්‍රගතියක් පෙන්නුම් කරමින් පැවතුනි. මෙයට සාපේක්ෂ ලෙස බැලුවහොත් රාජ්‍ය අංශයේ ඉඩම් අයිතිය ඉතා පහළ අගයක් ගනී. මුළු ඉඩම්වලින් 22% ක් තේ,රබර්,පොල්ය. 15% ක් කුඹුරු වන අතර 8 % ක් පමණ අතිරේක භෝග වගාවන් ය. බොහොමයක් ඉඩම් දේශීය සහ විදේශිය පෞද්ගලික අංශය සතුවිය. රන් පවුම් සමාගම් ලෙස විදේශීය සමාගම් පාලනය කළ ඉඩම් වැදගත් කොටසක් විය. ඉංග්‍රීසීන් විසින් මෙම වතු ගොඩනගාගත්තේ වරින් වර ගෙනඑන ලද මුඩුබිම් පනත් මගින් ය. විහාර දේවාලගම් පනත් යටතේ රැස්කරගත් ඉඩම් කැබලි ආශ්‍රයෙන්ය. මේ අනුව ගම්වල නිෂ්පාදන සාධකයක් වන භූමිය හිඟ සම්පතක් විය.

කුඹුරු ඉඩම් සැලකුවහොත් අක්කර දහයට වැඩි ඒක පුද්ගල ඉඩම් ඇත්තේ මුළු කුඹුරු ඉඩම් වලින් 10% ක් පමණී. බොහෝමයක් කුඹුරු අක්කර දෙකටත් අඩු සීමාව යටතේ විය. 1971 ඇති වූ කැරැල්ල මෙම ඉඩම් පිළිබඳ විෂමතාවයන් පදනම් කරගෙන බිහිවූවායැයි සිතිය හැක.

**ඉඩම් ප්‍රතිසංස්කරණ වල අරමුණු.**

1.ශ්‍රී ලංකා ජන සමාජයේ පවතින ආර්ථික සමාජ විෂමතාවයන් පාලනය කිරිම පන්ති විෂමතාවය ඇතිවන්නේ සම්පත් බෙදීයාමේ විෂමතාවය මතයි.

2.කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිකර ගැනීම. එනම් කෘෂිකාර්මික ප්‍රතිසංස්කරණ, කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිකර ගැනීමට බාධාකාරී වූයේ එකම පුද්ගලයකුට විශාල ඉඩම් ප්‍රමාණයක් පැවතීමත් ඒවා එතරම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා නොගැනීමත් නිසාය.

3. සේවා නියුක්ති අවස්ථාවන් වැඩිකර ගැනීම.

4. විදේශීය සමාගම් හා ඒ ආශ්‍රයෙන් අධිරාජ්‍යවාදී රටවලින් ආර්ථිකයට කරන බලපෑම අඩුකිරීම.

5. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික ප්‍රශ්නය වන ඉඩම් හිඟයට පිළියම් යෙදීම.

6. කෘෂිකාර්මික විවිධාංගීකරණයක් ඇති කිරීම.

7. ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතුවලට සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ඇති කිරීමට සමූපකාර මූලධර්මයක් ඇතුළත් කිරීම.

- ඉහත අරමුණු ආශ්‍රයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණවල ප්‍රතිවිපාක දෙස අවධානය යොමු කිරීමේ දි මෙවැනි තත්ත්වයකට මුහුණ දිමට සිදුව ඇත. එනම් 1972 ඉඩම් පනත යටතේ දේශීය පෞද්ගලික අංශය සතු ඉඩම්වලින් අක්කර 563411ක් අත්පත්කර ගැනීම. ගොඩ ඉඩම්වලින් එක් අයෙකුට උපරිම අක්කර 50ක් ද මඩ ඉඩම්වලින් උපරිම අක්කර 25ක් වශයෙන් තබාගත හැකිවිය.

- 1975 දී සමාගම් 180 සතුව තිබූ වතු සියල්ල ජනසතු කළේය. ඉඩම් ප්‍රතිසංස්කරණ වශයෙන් සැලකූවිට අත්පත් කර ගැනීම හොඳික් සාර්ථක වී ඇත. නමුත් ඉඩම් ප්‍රතිසංස්කරණවල අරමුණු සැලකිල්ලට ගැනිමේ දී ඒවා මුළුමනින්ම අසාර්ථක වී ඇත.

- එක් අයෙකුට තබාගත හැකි උපරිම සීමාව ගොඩ අක්කර 50ක් සහ මඩ අක්කර 25ක් වැනි ඉහළ අගයක් නිසා පන්ති විෂමතාවය අඩුකිරීමට මෙම ප්‍රමාණය ඉවහල් වූයේ නැත. එනම් එක් අයෙකුට තබාගත හැකි සිමාව ඉහළ අගයක් ගැනීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුවූයේ නැත. මෙය එක් අයෙකුට අයත් ප්‍රමාණය අක්කර 10 සහ 05 වශයෙන් තිබුනේනම් රජයට අයත්වන ප්‍රමාණය වැඩිය.

- පවරාගත් ඉඩම්වලින් පුද්ගලයන්ට බෙදාදෙනු ලැබුවේ අක්කර 150000 ක් පමණි. ඉඩම් සියල්ල රාජ්‍ය වැවිලි සංස්ථාවට, ජනවසම ආදියට පවරන ලදී. තවත් ඉඩම් පොල් රබර්, ආයතනවලට ද බෙදාදුණි. මේනිසා රටේ පංති විෂමතාවය අඩු කිරීමට ඉඩම් ප්‍රතිසංස්කරණ බලපෑවේ නැත.

- දෙවන අරමුණ සලකා බැලුවහොත් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන ඊට ඉහත තිබූ මට්ටමටත් වඩා පහළ බැසීමක් සිදුවිය. තේ,රබර්,පොල් වතුවල නිෂ්පාදනය පැවති තත්ත්වය තව දුරටත් පහළ බැසිය. එයට හේතුව ක්ෂණිකව කළමනාකරණය වෙනස්වීම මත කළමනාකරණය දුර්වලවීමයි. සේවා නියුක්ති අරමුණු අපේක්ෂිත පරිදි ඉටුවූයේ නැත. මීට හේතුව රැකියා සැපයීමට තරම් අත්පත් කරගත් ඉඩම් ජනතාවට බෙදා දුන්නේ නැත. රාජ්‍ය අනුග්‍රහය යටතේ තිබූ සමූහ ගොවිපොළවල් ආදිය ඵලදායී කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ නොවූ නිසා රැකියා අවස්ථා පුළුල් නොවීය.

- විදේශීය සමාගම්වල බලපෑම පාලනය කිරීම තවත් අරමුණක් වුවත්, මෙහිදි ඔවුන් සතු ඉඩම් පවරාගැනීමේදී වන්දි ගෙවීමට සිදුවිය. මෙහිදි දේශීය සම්පත් විශාල වශයෙන් විදේශගත විය. අයිතිය වෙනස් වුවත් තේ,පොල්,රබර් මිල සම්බන්ධ ඔවුන්ගේ බලපෑම තවදුරටත් පැවතුණි.

- ඉඩම් හිඟයට ප්‍රමාණවත් විසඳුමක් නොලැබුණි. එයට හේතුව බෙදාදුන් ඉඩම් ප්‍රමාණය අඩුවීමයි. විකල්ප වශයෙන් සමූහ ගොවිපොළවල් ජනාවාස කොමිසම ක්‍රියාත්මක කළත් ඒවා අද අසාර්ථක වී ඇත. විවිධාංගීකරණය සිදුවිය යුතු වුවත් එය අසාර්ථක වූයේ ඒ සඳහා ආයෝජනය කිරීමට ප්‍රමාණවත් සම්පත් නොතිබීමයි. ඒ සඳහා අවශ්‍ය ආයෝජන ඉඩම් ප්‍රතිසංස්කරණ නිසා ඉතිරි වන විදේශ විනිමයෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කළත් විදේශ විනිමය ප්‍රමාණවත් නොවීය.

- සමූපාකාර ක්‍රමය සහ සාමූහිකව ජීවත් වීමේ පදනම අසාර්ථක විය. එයට හේතුව කුල භේදය, පංති භේදය ක්‍රියාත්මක වීමයි .මේ නිසා ජනාවාස කොමිෂම යටතේ ආරම්භ කරණ ලද ව්‍යාපාර අසාර්ථක විය. සමහර පුද්ගලයන් සමූහ ගොවිපොළවල්වල ජීවත්වීම ප්‍රතික්ෂේප කර තිබේ. මෙලෙස අනෙකුත් ප්‍රතිසංස්කරණ මෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ අසාර්ථක වූයේ මේවා ක්‍රියාත්මක කළේ පංති විෂමතාවය පවතින සමාජයක වීමය. ධනවාදී ආර්ථික රටාවක් තුළ ක්‍රියාත්මක කරණ මෙවැනි රැඩිකල් ප්‍රතිපත්ති අසාර්ථක වන්නේ ඒවා ක්‍රියාත්මක කිරීමේදී ධනවාදී කොටස් විසින් වැඩි වාසියක් අත්කර ගැනීමට උත්සාහ ගැනීමයි. මෙයට නිදසුනක් ලෙස ඉඩම් කැබලි වශයෙන් ඉඩම් නොමැති පවුල් වලට බෙදා දීමෙන් ඒවා පවත්වාගෙන යැමට අපහසුවීමෙන් ධනපති පංති වෙත උකස් කිරීම හෝ අලෙවි කිරීම සිදුව තිබේ.

# 10. සෞභාග්‍යමත් රටක් උදෙසා වැඩිහිටි ප්‍රජාව සමඟ අත්වැල් බැඳ ගැනීම.

එච්.එම්.ප්‍රියානි දයාරත්න
සංවර්ධන නිලධාරි
*B.A (Genaral)*

තරුණ ජනගහණයේ වැඩි වීමට වඩා ඉතා වැඩි වේගයකින් අවුරුදු 60ට වැඩි අයගේ සංඛ්‍යාව වර්ධනය වීමේ ප්‍රවනතාවයක් ලොව පුරා දක්නට ලැබෙන බව විශ්ලේෂකයන්ගේ අදහස වේ. ඉතා වේගයෙන් වයස්ගත වන ජනගහනය වාසය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටි. ජනගහනයෙන් 19% ක් වසර 2030 වන විට වයස්ගත කාණ්ඩයට අයත් වන බව සමීක්ෂණ වාර්තාවලින් අනාවරණය වී තිබේ. 2000 වර්ෂයේදි වයස අවුරුදු 60ක් ඉක්ම වූ ජනගහනය 9.2%ක් වූ අතර එය වසර 2500 වන විට එම සංඛ්‍යාව 30%ක් වන බව ලෝක සංවිධාන ඇස්තමේන්තු කර ඇත. මේ වනවිට වයස අවුරුදු 60 ඉක්මවූ වැඩිම වැඩිහිටි පිරිසක් සිටින්නේ යුරෝපයේ ය. ඉතා වේගයෙන් වයස්ගත වන ජනගහනය වාසය කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටි. ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත් වීම අතින් ආසියාවේ තුන්වන ස්ථානයට පත්ව ඇත.

මෙසේ ආයුෂ වැඩිවීම ලෙස විශේෂයෙන් දැකිය හැකි හේතුවක් වන්නේ උපතේදී ආයු අපේක්ෂාව ක්‍රමානුකූලව වැඩිවීමයි. එමෙන්ම වර්තමානය වන විට ජනතාව තමන්ගේ ශාරිරික සෞඛ්‍ය යහපත්ව පවත්වා ගැනීම සම්බන්ධයෙන් දක්වන අවධානය උසස් මට්ටමක පැවතීම ද මේ සම්බන්ධව බලපාන ප්‍රධාන කරුණකි. කෙසේ වෙතත් වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය ඉහළ යාමට බලපාන ප්‍රධානම සාධකය ලෙස පිළි ගනුයේ රටේ උපත් අනුපාතිකය පහළ බැසීම යි. මේ අනුව මෙරට ජනගහන සමතුලිතතාවය බිඳ වැටි තරුණ ජනගහනයට සාපේක්ෂව වැඩිහිටි ජනගහනයේ ඉහළ යාමක් පවති. එහි ප්‍රථිඵලයක් ලෙස සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ වැඩ කරන ජනතාවගේ කැපි පෙනෙන පහළ යාමක්ද තිබේ.

සමාජ විද්‍යාඥයින්ගේ අදහස නම් ශ්‍රී ලංකාවේ වයස්ගත වීමේ ක්‍රියාවලියේ විශේෂ වෙනසක් සිදු වීමට අප සමාජ පසුබිම බලපා ඇත. එනම් අතීතයේ අප ප්‍රජාව සමූහයක්, කණ්ඩායමක්, පවුලක් ලෙස රොද බැදගෙන ජීවත් විය. පවුල් ඒකකය තුළ පුද්ගල සබඳතා විශාල ලෙසපැවති අතර කාර්යයන් කිරීමේදි වැඩිහිටි අණට අනුව ගුරුහරුකම් මැද එම කාර්යයන් නිමා විය. එනම් පැවති විස්තෘත පවුල් සම්ප්‍රධායෙන් මිදී එය කෙමෙන් අතුරුදහන්ව න්‍යෂ්ටික පවුල් තුළ මව්පිය දූ දරු සබඳතා කාර්යය කොටස්වල වෙනස්වීම මේ සඳහා ප්‍රධාන ලෙස බලපා තිබේ.

රටක වැඩිහිටි ජනගහනය ඉහළ යාම හේතුවෙන් අදාළ රටවල් වලට විවිධ අභියෝග සඳහා මුහුණ දීමට සිදු වේ. සංවර්ධිත රටවල ජනගහනය වියපත් වීම සිදු වූයේ සමාජ ආර්ථීක දියුණුවත් සමගිනි. ඔවුන් ඒවාට මුහුණු දීමට අවශ්‍ය වැඩසටහන් මෙන්ම සැලසුම් ද ක්‍රමානුකූලව සකසන ලදි. නමුත් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල වියපත් වීම සිදු වන්නේ සමාජ ආර්ථික දියුණුවකින් තොරව ය.

එමෙන්ම කෙටි කාලයක් තුළ වියපත් වීමක් සිදු නොවේ. එම නිසා වියපත් වීම සංවර්ධනය වෙමින් පවත්නා රටවල සමාජ ආර්ථීක ගැටලු ඇති කරයි. රටක වියපත් ජනතාව සිටින විට ඔවුන් රැකබලා ගැනීමට සිදු වේ. වියපත් ජනතාව බලා ගැනීම සමාජයේ ප්‍රධාන කාර්යය භාර්යයක් සේම සාරධර්මයක් ද වේ. එමෙන්ම රජයේ වගකීමක් ද

විය. පවුල්වල යැපෙන්නන් ප්‍රමාණය වැඩි වේ. එවිට රජයට වැඩිහිටියන් වෙනුවෙන් උපකාර අධාර කිරිමට සිදු වේ. ඔවුන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ සහ සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහා වන වියදම් රජය විසින් දරණු ලබයි. ඒවා ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරිමට තිබෙන සිමා සහිත ප්‍රතිපාදන වලින් සපුරනු ලැබේ. එසේ වුවත් ඒවා අනිවාර්යයයෙන්ම කළ යුතු ය. සෞඛ්‍ය සම්පන්න ජනගහනයක් පවත්වා ගෙන යාම සෑම රජයකම වගකිමක් වි ඇත.

රටේ වැඩිහිටි ජනගහනය ඉහළයාමත් සමඟම ශ්‍රම වෙළෙඳපොළේ ඉල්ලුම සපුරා ලීමට අවශ්‍ය ශ්‍රම බලකායේ ඌණතාවයක් ඇති වීම ට ද රජයට බලපාන තවත් අභියෝගයක් වේ. එනම් ඔවුන්ගේ කායිකව හා මානසික නිරෝගි බව සුරැකීම, ඔවුන්ට රැකවරණය ලබා දීම, ආර්ථික හා සමාජීය වශයෙන් වැඩිහිටියන් සවිමත් කිරීම මෙන්ම ඔවුන්ගෙන් රටේ ආර්ථිකය ට යම් ඵලදායි බවක් ලබා ගැනීමට ක්‍රම සම්පාදන කළ යුතු ය.

වැඩිහිටි අයිතිවාසිකම් මෙන්ම සුබසාධන පිළිබඳව එක්සත් ජාතින්ගේ අවධානය නිරන්තරයෙන් යොමු වේ. මේ පිළිබඳව Vienna International Plan Of Action On Ageing එළි දැක්වූයේ එහිදි ය. 1991 දී එක්සත් ජාතින්ගේ මහ මණ්ඩලයේ වැඩිහිටි අයිතිවාසිකම් 18ක් වෙන වෙනම සඳහන් කරමින් වැඩිහිටියන් පිළිබඳව එක්සත් ජාතින්ගේ ප්‍රතිපත්ති ඇතුළත් යෝජනා සම්මත කර ගන්නා ලදි. 1999 එය ප්‍රකාශයට පත්කරනු ලැබුයේ වැඩිහිටි දිනය ලෙසය. සෑම වසරකම **ඔක්තෝබර් 01** දින ලෝක වැඩිහිටි දිනය ලෙස පත්කර ඇත. ශ්‍රී ලංකාවේද සෑම වසරකම ඒ දිනයේදි විශේෂ වැසටහන් ක්‍රියාත්මක කරනුයේ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන වලද අනුග්‍රහයෙනි.

වර්තමානයේ බොහෝ විට රැකියා ස්ථාන වල වයස් සීමාව මත රාජකාරි කටයුතු පැවරීම, විශ්‍රාම යෑම වැනි කරුණු තිරණය කිරීම මත නිවරදි තීරණ ගැනිමට අපහසු වේ. වයස් ගත වුවද කාර්යක්ෂමව රාජකාරි කළ හැකි විශාල ශ්‍රම බලකායක් සෑම වර්ෂයකදීම රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ට අහිමි වේ.

ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් සඳහා විවිධ සුහසාධන කටයුතු මෙන්ම ක්‍රියාවලියන් පෙන්වා දී ඇත.

*ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පතක් ලබා දීම

එමගින් වැඩිහිටියන්ට සහන රැසක් ලැබේ. රාජ්‍ය ආයතන, බැංකු, රෝහල් හා වෙනත් පොදු ස්ථාන වලට පැමිණෙන වැඩිහිටියන් සඳහා ලබා දෙන්නේ මහත් ප්‍රමුඛතාවයකි.

* වැඩිහිටි සමිති ක්‍රියාත්මක කිරිම.

ගම් මට්ටමින් ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටු හෙවත් වැඩිහිටි සමිති ක්‍රියාත්මක කරන අතර මේ තුලින් ඒ ප්‍රදේශ වල සම වයස් අය අතර දැන හඳුනා ගැනීමට සහ අන්‍යෝන්‍ය ආධාර උපකාර සඳහා උදා වන්නේ හොඳ අවස්ථාකි. ඔවුන් සාමුහිකව කටයුතු කිරීම තම අදහස් අනෙකා සමඟ හුවමාරු කර ගැනීම මෙන්ම ආගමික කටයුතු සහ වන්දනා, විනෝද චාරිකා වැනි ක්‍රියාකාරකම් තුලින් තම තමන්ගේ හැකියා දක්ෂතා කල කී දැ නැවත ආවර්ජනය කිරිම සඳහා විවිධ ප්‍රසංග පැවැත්වීම වැනි දේවල් තුලින් ඔවුන්ගේ පාලුව හා තනිකම වියැකී අධ්‍යාත්මික සැහැල්ලුවෙන් ප්‍රජාවට සැදැ සමය ගත කිරිමට මහෝපකාරි වේ.

* රාජ්‍ය ඔසුසැල් වලින් වට්ටම් ලබා දීම

ප්‍රජාවට 5% ක වට්ටමක් ලබා දී ඇත.

* ජීවනෝපාය සංවර්ධනය

නිෂ්පාදන කාර්යයට දායක වීමට කැමති අයට රජය හා පෞද්ගලික අංශ සඳහා පුහුණුව හා සේවය කිරීමට අවස්ථාව ඇත. එනම් බතික් කර්මාන්තය, හණ කර්මාන්තය, කැටයම් කර්මාන්තය, කෘෂිකර්මාන්තය වැනි තවත් බොහෝ කර්මාන්ත රැසකට අවශ්‍ය සංවර්ධන පුහුණුව ලබා දීම රජය විසින් සිදු කරයි.

* දීමනා ලබා දීම

වැඩිහිටි දීමනා, රක්ෂණ හා වැඩිහිටි ආධාර ආදිය ලබා දේ.

* වැඩිහිටි නිවාස

මෙම නිවාස ඉදිකිරීම් සඳහා පෞද්ගලික අංශයට ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමට රජය අවසර ලබා දී ඇත. එතුලින් එම නිවාස වල සිටින ජනයාට යහපත් හා ආරක්ෂකාරී ලෙස ජීවත් විය හැක.

මෙවැනි බොහෝ වැඩසටහන් ශ්‍රී ලංකාව තුල වැඩිහිටියන් සඳහා ක්‍රියාත්මක වේ. නමුත් මෙමඟින් රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක කර ගැනීම තුලින් අනාගතයට යහපත් ප්‍රතිචාර ලැබිය හැක. වැඩිහිටි ජනහයනයක් සිටින රටක ආර්ථික හා සංවර්ධන භූමිකා බවට පත්කර ගැනීම සඳහා විදිමත් සැලසුම් සහගත වැඩපිලිවෙලවල් සෑම රටකම තිබිය යුතු වේ.

සංවර්ධිත රටවල් තුල වියපත් ජනතාව එරටට බරක් නොකර ගෙන ඔවුන් රටේ ආර්ථික සංවර්ධනයේ හවුල් කරුවන් ලෙස සම්බන්ධකරගනී. වැඩිහිටි ජනගහනය ඉහල යෑම නිසා උදා වී තිබෙන සමාජ ආර්ථික අර්බුදවලට මුහුණ දිමට සුදුසු උපාය මාර්ග මෙන්ම භෞතික හා මූල්‍ය සම්පත් යෙදවීම කාලින අවශ්‍යතාවයකි.

රටක පවතින ශ්‍රමික ගැටළුව විසදීම සඳහා වඩා සුදුසු විකල්පයක් ලෙස විශ්‍රාමික සම්පත නැවත ආර්ථික ක්‍රියාවලියට යොමු කර ගැනීම ඵලදායි වනු ඇත. නිර්මාණශිලිත්වයෙන් පිරිපුන් වර්තමාන පරම්පරාව වැඩිහිටි පරම්පරාවත් සමග බද්ධ වීම මගින් යහපත් සමාජයක් මෙන්ම ආකල්ප හා සාරධර්ම වල වර්ධනයක් ඇති වනවා මෙන්ම තරුණ පරම්පරාව තුල මාතෘ භූමියට ඇති බැදීමද වර්ධනය වනු ඇත.

විශ්‍රාම ගැනීමෙන් පසු විවිධ සමිති සමාගම් පිහිටුවා ගනිමින් තව දුරටත් මාතෘ භූමියට සේවය කරන විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ද සිටීම අගය කළ යුතුය.

වැඩිහිටි ජනගහනය ඉහළ යෑම පාලනය කිරීමේ හැකියාව ඉතා අල්ප වන අතර එය සමබර කිරීම සඳහා නිසි පියවර නොගත හොත් එය ආර්ථික වර්ධනය සඳහා අහිතකර බලපෑම් සිදු කරන බව දැකිය හැක. මේ සඳහා සමස්ථ ඵලදායිතාව ඉහල නැංවීම මෙන්ම ශ්‍රම බලකායට වැඩිහිටි සහය ලබා ගැනීම සිදු කල යුතුය.

වැඩිහිටියන් ආර්ථිකයට සම්බන්ධ කර ගැනිම සඳහා සුභ සාධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදි වැඩිහිටි ස්ත්‍රීන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරිම වැදගත් වේ. පුරුෂයින්ට වඩා වසර 10ක් පමණ කාන්තාවන්ගේ ආයු අපේක්ෂාව ඉහල මට්ටමක පවතී.

කාන්තාවගේ ආරක්ෂාවට මෙන්ම ආර්ථිකයට ගැටලුකාරි තත්වයක් උදා වේ. කාන්තා ජනගහනයේ වැඩි ප්‍රතිශතයක් පුරුෂ පක්ෂයට සාපේක්ෂව ආර්ථික වශයෙන් ශක්තිමත් නොවේ.

ඒ අනුව අවධානම් තත්වයක් හමුවේ ස්ත්‍රී යැපෙන්නන් ඉලක්ක කර ගත් ඉදිරි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම කාලීන අවශ්‍යතාවයකි. වැඩිහිටි පරම්පරාව සුරක්ෂිතව හා ගෞරවාන්විතයෙන් රැක බලා ගැනීමේ වැදගත්කම පිළිබඳ මෙරට තරුණ ප්‍රජාව දැනුවත් බවක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය. වැඩිහිටියන්ගේ අත්දැකීම්, ආකල්ප, බුද්ධියෙන් හා හැසිරීමෙන් සමාජයට බොහෝ දෑ ඉගෙන ගත හැකිය. ඒ වගේම සැදෑ සමය ගෙවන මෙම පිරිස රටට වැඩදායි වටිනා සම්පතක් ලෙස සළකා ඔවුන්ට එම කාලය ප්‍රීතිමත්ව ගත කිරිමට අවශ්‍ය පසුබිම සලසා දීම අප සැමගේ යුතුකමක් මෙන්ම වගකීමකි. පවුලේ පළමු ගුරුවරයා සමාජානුයෝජකයා වැඩිහිටියා වීමෙන් සමාජයේ යහපත් ආකල්ප සාරධර්ම පිරි ළමා පරපුරක් උදා කර ගැනීමට හේතු වේ.

එමෙන්ම අප ශ්‍රීලංකාවේ වැදගත්ම අංගයක් වන සංස්කෘතිය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කරන්නේ මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ය. එමෙන්ම ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකර්මාන්තයට මොවුන්ගෙන් විශාල දායකත්වයක් ලැබේ.

ඒ අනුව බලන විට විවිධ අංශයන්හි පරිපූර්න වැඩිහිටියන්ගෙන් ලබා ගත හැකි දැනුම, ආකල්ප, කුසලතා රටෙහි ආර්ථික, දේශපාලන, සමාජයීය හා සංස්කෘතික වශයෙන් සෞභාග්‍යමත් රටක් ගොඩනැගිමෙහිලා ඉදිරි තරුණ පරම්පරාව සඳහා මහත් පිටුවහලක් වනු ඇත. “වැඩිහිටියන් රටට බරක් නොව සම්පතකි”

# 11. ආයෙත් ගමට.........

කේ.ඩබ්ලිව්. අයිරාංගනී
සංවර්ධන නිලධාරි
*B.A Statistics (Special)*

රටක ජනතාවගේ ජීවන රටාව උසස් තත්ත්වයකින් ගත කිරීමට හැකි වන පරිදි ආදායම් තත්ත්වය ඉහළ නැංවීම රටෙහි ආර්ථික සංවර්ධනය වේ. එය ග්‍රාමීයවත්, නාගරිකවත් එකම ආකාරයකින් සිදු විය යුත්තකි. ජන සමාජයක පැවැත්මට අවශ්‍ය සියලුම ආර්ථික, සාමාජික, සංස්කෘතික යටිතල පහසුකම් එම යුගයට සරිලන පරිදි සැපයීම සංවර්ධන ක්‍රියාදාමය වේ. ශ්‍රී ලංකාව විශාල ග්‍රාමීය ප්‍රදේශයක් සහිත රටකි. මෙහි ආර්ථිකය යැපුම් කෘෂිකර්මාන්තය පදනම් කර ගෙන අතීතයේ සිට පැවත ආවකි. නමුත් 1978 වර්ෂයේ ගෙන එන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පසුව මෙරට ඇති කරන ලද විවෘත ආර්ථික සංකල්පයත් සමඟ එම යැපුම් ආර්ථිකය වෙනස් වන්නට විය. ඒ වෙනුවට ආනයනික ආර්ථියක් වටා ඒකරාශී වීමට මෙරට ජනයා හුරු විය.

කෘෂිකර්මාන්තය අමතක කර දමමින් නගරයට සේන්දු වන්නටත්, නාගරික පරිසරය තුළ ජීවත් වෙමින්, නාගරික ජීවන රටාවට හුරු වන්නටත් පටන් ගැණිනි. තවද ගමෙහි ඇති සම්පත් ප්‍රයෝජනයට නොගෙන, ඒවා විනාශ වී යාමට ඉඩ සලසන්නට විය. හොඳින් අස්වැදුනු කුඹුරු පුරන් කුඹුරු වන්නටත්, සරුසාරෙට වැවුණු කොරටුව, ලඳු කැලෑවක් බවට පත්වන්නටත් විය. නාගරික තට්ටු නිවාස සංකීර්ණවල ජීවත් වෙමින්, සාප්පු සංකීර්ණ, දරුවන්ට ජාත්‍යන්තර පාසල් හෝ ප්‍රධාන පෙලේ ජාතික පාසල් සඳහා ඇතිවූ තරගය හා ක්ෂණික ආහාර වේල් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය අංගයන් බවට පත්වන්නට විය. ගමෙහි ඉපදී ගමෙහි හැදී වැඩී ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාලයට ගොස් රජයේ හෝ සමාගමක රැකියාවක් ලැබූ පුද්ගලයා නාගරික පරිසරයට ආකර්ශනය වූ අය විස්තෘත පවුලෙන් දුරස් වන්නට විය. ඇති වූ නව න්‍යෂ්ටික පවුල් ඒකක මගින් මහනගර සහ සුළු නගර ජනාකීර්ණ වන්නට විය. මේ නව මධ්‍යම පාංතික සමාජය ගම දෙස බැළුවේ ඉතාමත් හීන මානයකිනි. එමෙන්ම අඩු තසේරුවක් ගමට ලබා දී ක්‍රියා කලේ ය.

මේ නිසා ග්‍රාමීයව පැවති කෘෂිකර්මාන්තය, සශ්‍රීකත්වය, යැපුම් ආර්ථිකය බිඳවැටීම ලංකාවේ සමස්ත ආර්ථික බිඳවැටීමට මරුපහරක් වන්නට විය. නිදසුනක් ලෙස කපු වගාවේ අවසාන ප්‍රථිඵලය විය යුත්තේ මෙරටෙහිම ඇඟලුම් ක්ෂේත්‍රයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමයි. නමුත් එලෙස අවශ්‍ය කපු නිෂ්පාදනය ග්‍රාමීයව සිදු නොවුන හෙයින් එම අවශ්‍යතාවය සපුරා ගැනීමට විකල්ප ක්‍රම සොයන්නට සිදුවිය. ඒ ආකාරයටම ජනතාවට අවශ්‍ය අනෙකුත් පරිභෝජන භාණ්ඩ සපයා ගැනීමට ද එම භාණ්ඩ ආනයනය කරන්නට විය. ඔරුවල වානේ කර්මාන්ත ශාලාව, තුල්හිරිය, පූගොඩ කර්මාන්ත ශාලා වැසී යන්නටත් මෙය හේතුවක් වන්නට විය. රුපියලකවත් විදේශ ණයක් නැතිව සිටි මේ රට විවෘත ආර්ථිකයේ නැගීම සහ යැපුම් කෘෂිකර්මාන්තයේ බිඳවැටීමත් සමඟ ඇති වූ හිඩැස පිරවීමට විදේශ ණය කරා යොමු වන්නට විය. විදේශ ණය මත පදනම් වූ අධි පරිභෝජන රටාව තුළ දේශීය සහ ග්‍රාමීය නිෂ්පාදනවලට දුන් වටිනාකම ඉතා අඩු විය. පසුගිය දශක දෙක තුළ අතිවිශාල මෝටර් වාහන ප්‍රමාණයක් මෙරට මාර්ගවලට එකතු විය. ප්‍රධාන නගරවලට සීමා වී තිබූ සුපිරි වෙළෙඳසැල් ග්‍රාමීය හා අර්ධ නාගරික කලාපවලටද විතැන් වූ අතර ඒවා විදේශීය භාණ්ඩවලින් පිරී ගියේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස සුළු ව්‍යාපාර, ග්‍රාමීය නිෂ්පාදන කර්මාන්ත මෙන්ම කෘෂිකාර්මික

නිෂ්පාදන අංශයන් ද පිරිහීමට ලක්විය. මේ නිසා ග්‍රාමීය සමාජය මුහුණ දුන් ආර්ථික පරිහානිය මත ගොඩනැගුනු සමාජ පන්ති පරතරය නිසා ගම හුදෙකලා වීම සිදුවිය.

තවද ග්‍රාමීය ව පැවති සරල ජීවන රටාව ද ක්‍රමයෙන් ඉවත් වෙමින් නාගරික පරිසරයේ ඇතැම් අංගයන් සඟ බැඳෙන්නට ග්‍රාමීය ජනයා ද හුරු වන්නට විය. දර ලිප වෙනුවට ගෑස් ලිප භාවිත කරනන්ට පටන් ගැනීම නිසා පහසුවෙන් පරිසරයෙන් සොයාගත් දර දිරාපත්වන්නට ඉඩ හැර ඩොලර් පුළුස්සා තම ආහාර වේල සකසා ගන්නට ඔවුන් හුරු විය. පහසුම රැකියාව ත්‍රිරොද රථ රැකියාව කර ගන්නට ග්‍රාමීය තරුණයා යොමුවීම නිසා කිසිදු ඍජු නිෂ්පාදන දායකත්වයක් ලබානොදෙන තරුණයන්ගෙන් මහාමාර්ග පිරී ගියේය. ලක්ෂ දහයකට ආසන්න පිරිසක් ත්‍රිරෝද රථ රැකියාවේ නිරත වීම නිසා ද ග්‍රාමීය කෘෂිකර්මාන්තය සහ ප්‍රාථමික නිෂ්පාදන කර්මාන්ත බිඳවැටෙන්නට විය. මේ ආදී විවිධ අංශ ඔස්සේ ජනයා නවීකරණයට හුරුවීමත් සමඟ සරු සාර කෙත්වතු පුරන් කුඹුරු වන්නට විය. ගමෙන් නගරයට ඉහල සංක්‍රමණයක් සිදු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගම දැනුම සහ බුද්ධිය අහිමි වීමේ ඛේදවාචකයට මුහුණ දෙමින් සිටී. මේ නිසා නගරය තුළ පහසුකම් ගොඩනැගීම සිදුකරනු ලැබුවත් ඊට සමාන්තර අවධානයක් ගමට ලබා නොදීම නිසා රටේ ආර්ථිකයට අවශ්‍ය අවම පහසුකම් ටිකවත් ග්‍රාමීය ව නොලැබී යන්නට විය. මෙහි ප්‍රතිඵලය වූයේ ගම නාගරිකයාගේ ගොදුරුබිම බවට පත්වීමයි.

සංවර්ධනය වෙමින් පැවති රටක් ලෙස සහ අධික විදේශ ණය බර හේතුවෙන් මෙන්ම වැරදි දේශපාලන හා ආර්ථික කළමණාකරණය හේතුවෙන් පරිහානියට යමින් පැවති ශ්‍රී ලංකාව 2020 වර්ෂයේ මෙරට ඇති වූ කොවිඩ්-19 වසංගතය නිසා සමාජ සහ ආර්ථිකය පරිහානියේ අන්තයටම යන්නට විය. මාස ගණන් රට වසා තැබීම, වෛරසය පැතිරීම නිසා අපනයන සඳහා වන නිෂ්පාදන කර්මාන්ත සම්පූර්ණයෙන් ම වැසී යාම නිසා විදේශ විනිමය උපයා ගැනීම නොහැකි වීමත් සමඟ නාගරික කෘත්‍රිම පරිභෝජන රටාව පවත්වාගෙන යාම තව දුරටත් කළනොහැකි වන්නට විය. රැකියා සහ ආදායම් අහිමිවීම නිසා අතරමං වූ සහ ඉච්ඡාභංගත්වයට පත් වූ ස්වභාවයකට පත්ව ඇත. විශේෂයෙන් නාගරික ප්‍රදර්ශනාත්මක පරිභෝජන රටාව පාදක අභිමානය අභියෝගයට ලක්වීම නිසා සහ මුල්කාලීනව ගම කෙරෙහි පැවති පහත් ආකල්ප හේතුවෙන් ඇති වී ඇති මානසික නොගැලපීම හේතුවෙන් අතරමංව ඇත. කෙසේ වෙතත් විකල්පය වී ඇත්තේ සියල්ල පසෙක තබා සුපුරුදු ගම වෙත නැවතත් (Back to Village) හැරෙන්නටයි.

කෝවිඩ්-19 වසංගතය නිසා පිරිහුණු මෙරට සමාජ, ආර්ථික අරාජිකත්වය නව මානයකට ගෙනයමින් දේශපාලන අරාජිකත්වයක් නිර්මාණය කර ඇත. එහිම දිගුවක් ලෙස ඇතිවෙමින් පවතින සංස්කෘතික කඩාවැටීම මිනිස් සෝදාපාළුවට ලක් කරමින් සිටී. මෙහි ප්‍රතිඵලයක් ලෙස වර්මානයේ ඇති වී තිබෙන ආර්ථික තත්ත්වය නාගරික ජනයාට මරු පහරක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. අවශ්‍ය අවම මූලික අවශ්‍යතා සපුරා ගැනීම වුවද ඉතාමත් අසීරු කටයුත්තක් වී ඇත. මුදල් තිබුණද පවතින භාණ්ඩ හා සේවා හිගය සාමාන්‍ය ජීවන රටාව පෙරලා දැමීමට හේතු වී ඇත. නමුත් ග්‍රාමීය ජනතාව නැවත පැරණි ජන ජීවිතයට හුරු වෙමින් තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට උත්සාහ දරයි. දර ලිප භාවිතය, තම නිවස අයත් බිම් කොටසේ හෝ වගා බිම් ඇති කිරීම මඟින් ඔවුන් මෙම ආර්ථික අභියෝගයට මුහුණ දෙමින් සිටී.

මීට සමගාමීව රජය මගින්ද යම් ආකාරයක දිශානතීන් ඉදිරිපත් කරමින් සිටී. ළඟම පාසලට දරුවා යොමු කිරීමටත්, තම කාර්යාලය පදිංචි ස්ථානයෙන් දුරබැහැර නම් ළඟම කාර්යාලයට අනුයුක්ත කිරීමටත්, නිවසේ සිට වැඩ කිරීමටත්, හැකි සෑම අයෙකුටම වගා කරන ලෙසත්, රජයේ සේවකයන් සිකුරාදා දින නිවසේ සිට කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ලෙසටත් උපදෙස් දීම මේ වනවිට රජය විසින් සිදුකර ඇත.

පසුගිය දශක කිහිපයක සිට දේශපාලන වශයෙන් බලය ලබා ගැනීමට, කිසිදු සොයා බැලීමකින් තොරව රාජ්‍ය අංශයේ සේවයට ඉතා විශාල පිරිසක් බඳවාගැනීම සිදු වූ අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය වියදම් ඉහළ යාම මෙන් ම ග්‍රාමීය හා පෞද්ගලික අංශයේ නිෂ්පාදනයට ශ්‍රමය හිගවීම අර්බුධ නිර්මාණය කිරීමට හේතු වී ඇත. තවද ඔවුන් විසින් ගොඩනගා ගන්නා මානසික පරතරය තුළ තව දුරටත් සම්ප්‍රධායික කෘෂිකර්මාන්තයේ හෝ අනෙකුත් ප්‍රාථමික නිෂ්පාදන කර්මාන්තයන්ගේ නොයෙදීමේ ප්‍රතිඵලයක් ලෙස ද ග්‍රාමීය ආර්ථිකය බිඳ වැටීමට තුඩු දී ඇත. එමෙන්ම ග්‍රාමීයව සිටි ප්‍රාථමික නිෂ්පාදකයා අමතක කර, පූර්ණ නාගරීකරණයට යොමු වී ආනයන ආර්ථිකය මතම විශ්වාසය ලබමින් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආනයනික නිෂ්පාදන මත ජීවන ක්‍රමය පවත්වාගෙන යාම තුළ ගොඩනැගුනු ආදායම් විෂමතා හේතුවෙන් සමස්ථ රටේ ම දරිද්‍රතා මට්ටම ඉහළ ගොස් ඇත.

ජනසවිය සහ සමෘද්ධි ව්‍යාපාරය මෙන්ම සහභාගීත්ව ග්‍රාමීය එළඹුම් පත ක්‍රියාත්මක වූ ගැමිදිරිය වැනි වැඩසටහන් හරහා ග්‍රාමීය සංවර්ධනයට විශාල උත්සාහයක් දරා ඇත. මාර්ග, පානීය ජලය, විදුලිය සහ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන්ද පසුගිය වකවානුවේ රජයන් අවධානය යොමුකර ඇත. එහෙත් බොහෝ පිරිසක් නගරය වෙත සංක්‍රමණය වීම නිසා පාළු වූ ගමට නව පුනර්ජීවයක් ලැබෙමින් පවතී. විශේෂයෙන් නගරය හැර දා යලි ගමට ඒම හෝ තම දෙවන නවාතැන ලෙස ගම තෝරාගැනීම සම්බන්ධයෙන් උනන්දුව දක්වන පිරිස වැඩි වී ඇත. නගරය වෙත සංක්‍රමණය වීමට සූදානම්ව සිටි අය එම අදහස නැවත විමසීමට ලක් කරමින් සිටී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගමට ඇති ඉල්ලුම සහ අවධානය ඉහළ ගොස් ඇත. එනිසා අප මෙම අවස්ථාව මීට දශක කිහිපයකට පෙර තිබූ ඒ ස්වංපෝෂිත ගම යලි නිර්මාණය කිරීමට කටයුතු කළයුතු ය. එහිදී මෙම ආර්ථික අර්බුදයෙන් බැට කන මේ රටේ ජනතාව නැවත ග්‍රාමීය පරිසරයට හුරු කරවීමට සහ එහි ඇති අවස්ථාවන් සහ වැදගත්කම පිළිබඳ කතිකාවතක් ඇතිකළ යුතු ය. එහි දී මෙතෙක් ප්‍රමුඛතාව දුන් නාගරික සංවර්ධනයට සමගාමී යටිතල පහසුකම් සහ අනෙකුත් සමාජ ආර්ථික සංවර්ධන පෙළඹවීම් සහ දායකත්වයන් ගම වෙත ප්‍රධානය කළ යුතු ය. එමගින් වඩාත් ඵලදායි ධරණීය සංවර්ධනයක් දිගුකාලීනව පවත්වාගෙන යාමට අවස්ථාව උදාවනු ඇත.

# 12. තිරසාර සංවර්ධනයක් සඳහා පරිසරය සුරැකීමේ අවශ්‍යතාවය.

*නිරෝෂා විජේවර්ධන*
*සංවර්ධන නිලධාරි*
*B.A (General)*

ලෝකයේ සෑම රටකම ඇතිව තිබූ පාරිසරික ගැටළු හේතුවෙන් ලොව දියුණු රටවල් 1960 දශකයේ සිට පරිසරය කෙරෙහි දැඩි අවධානයකින් හා උනන්දුවකින් කටයුතු කළහ. මේ සඳහා පරිසරවේදීන් මෙන්ම සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් ද මැදිහත් විය. 1970 ඇමරිකාවේ දී ප්‍රථම වරට "මිහිතල දිනය" සමරන ලද්දේ පරිසරය කෙරෙහි ඇති වූ අවධානයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

1972 ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය පවත්වන්නට යෙදිනි. (UNCHE) මෙය මිහිතල දිනයට නූතන පරිසර සංරක්ෂණ ව්‍යාපාරයේ සංධිෂ්ඨානයක් විය. මානව පරිසරයේ හා ස්වභාවික සම්පත් වල ඇති වී තිබූ දැඩි හායනය පිළිබඳව පරිසරය හා පරිසර සම්පත් සුරක්ෂිත කිරීම උදෙසා ක්‍රියා කිරීමට කොමිෂමක් පත් කර ගැනීම සඳහා යෝජනාවක් 1983 දෙසැම්බර් මාසයේ දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමේ දී සම්මත කර ජගත් කොමිෂම පත්කර ගන්නා අතර එහි ප්‍රධාන අරමුණ වූයේ 2000 හා ඉන් ඉදිරියට සංවර්ධනය අත්කර ගැනීම සඳහා වූ දිගු කාලීන පාරිසරික උපාය මාර්ගය සඳහා යෝජනාය.

21 වන සියවස සඳහා වූ න්‍යායපත්‍රය අපේ පොදු අනාගතයට හා තිරසාර සංවර්ධනයට මඟ පෙන්වන ප්‍රධාන සංකල්පයක් විය. ඒ අනුව 1987 සිට තිරසාර සංවර්ධනය උදෙසා වන දැක්ම වන්නේ අනාගත පරම්පරාවල අවශ්‍යතා සඳහා යොදා ගැනීමට බාධා නොවන අයුරින් වර්ථමාන අවශ්‍යතා සඳහා පරිසර සම්පත් භාවිතයට ගැනීමයි. ඒ අනුව තිරසාර සංවර්ධනයේ දී ආර්ථික, සමාජීය සමානාත්මතාව, පරිසර සංරක්ෂණය හා ආධ්‍යාත්මික සංවර්ධනය යන අංශ තුලනාත්මකව පවත්වා ගැනීම අපේක්ෂා කරන අතර, ඒ සඳහා සංවර්ධන ආකෘති සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ දී දියුණු රටවල් ඉදිරියට ගොස් ඇති අතර, දියුණු වෙමින් පවතින රටවල් ඒ සඳහා තව තවත් ප්‍රයත්න දැරිය යුතුය. තිරසාර සංවර්ධනයේ විශාලම අභියෝගය වන්නේ ගෝලීය උණුසුම හා දේශගුණික විපර්යාසයයි. 2000 වර්ෂයේ නව සහශ්‍ර උදාවත් සමග සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ 8 ක් ඉදිරිපත් කළ අතර, එහි ප්‍රධාන අභිමතාර්ථයක් ලෙස පරිසර සංරක්ෂණය හා තිරසාර සංවර්ධනය නම් කර තිබේ.

තිරසාර සංවර්ධනය (ධරණීය සංවර්ධනය) වශයෙන් සැළකෙන්නේ මූලිකවම පරිසරයේ පවත්නා සම්පත් වලින් උපරිම ප්‍රයෝජනය ගන්නා අතරම අනාගතය සඳහා ද ඒවා සුරැකීමයි. වර්තමානයේ සම්පත් ප්‍රයෝජනයට ගැනීම, ඒවා වර්ධනය කර ගැනීම මෙන්ම අනාගත පරපුරේ අවශ්‍යතාවයන් සඳහා ද එකී සම්පත් යම් ප්‍රමාණයකට ආරක්ෂා කිරීමයි. මේ අනුව තිරසාර සංවර්ධනය හා පරිසරය අතර මනා සම්බන්ධතාවයක් පවතින ආකාරය තිරසාර සංවර්ධනයේ මූලාරම්භය හා ක්‍රියාත්මකතාවය දෙස බැලීමේ දී මනාව පැහැදිළි වේ.

පරිසරය යන්න ද ඉතා පුළුල් අර්ථයක් සහිත මාතෘකාවකි. අප අවට පරිසරයේ පවතින ජීවී අජීවී සියලුම දේවල් පරිසරයට අයත් වේ. මිනිසුන්, සතුන්, ගස්වැල් සහිත ශාඛ පද්ධති ජීවී පරිසරයට අයත් වේ. අජීවී පරිසරයට අයත් වන්නේ කඳු, ගංගා, ජලය, පස වාතය වැනි පෘථිවිය මත පවතින භෞතික සියලුම දේවල්ය. එසේම පරිසරය යන්න අපට සාධක දෙකක් යටතේ හඳුනා ගැනීමට පුළුවන.

- ස්වභාවික පරිසරය.
- මිනිසා විසින් ගොඩනගා ගන්නා ලද පරිසරය.

කෙසේ වුවද මානවයා හා පරිසරය අතර ඇත්තේ ඉතා කිට්ටු සම්බන්ධතාවයකි. සත්‍ය වශයෙන්ම එය ගසට පොත්ත මෙන් පවතින්නකි. ගසට පොත්තත් පොත්තට ගසත් නැතිව බැරි වන්නා සේම මිනිසාට පරිසරයෙන් තොරව ජීවත් විය නොහැකිය.

නමුත් වර්තමානයේ තිරසාර සංවර්ධන සංකල්පයට එහා යමින් මානවයා පරිසරයට විවිධාකාරයේ බලපෑම් කරමින් පවතී. අසීමාන්විතව පරිසරයේ විවිධ සාධක ප්‍රයෝජනයට ගැනීම නිසා පෙරළා පරිසරය විසින් මානවයාට විවිධ බලපෑම් සිදු කිරීම ද ආරම්භ වී ඇත. ඒ නිසාම මිනිසාගේ ජීවන පැවැත්මට මෙය විශාල තර්ජනයක් වෙමින් පවතී. නමුත් මේවා බහුතරයක්ම සිදුවන්නේ මිනිසා විසින්ම සිතාමතාම සිදුකරනු ලබන ක්‍රියාකාරකම්ය ලෙසය. විශේෂයෙන් සංවර්ධිත යැයි සැළකෙන ඉහළ පෙලේ රටවල් අධික ලෙස කාර්මීකරණය වීම නිසා පරිසරය, වායුගෝලය මෙන්ම ජලය දූෂණය වීම සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. මෙහි ඵල විපාක ලොව සියලුම රටවල් (දුප්පත්, පොහොසත්) සියල්ලටම අත් විඳීමට සිදුව ඇත. ඒ නිසා සම්පත් සංරක්ෂණය මෙන්ම මිහිතලය සුරැකීමේ කාර්යභාරයේ වගකීම මේ සෑම රටකම ප්‍රමුඛතම කාර්යයක් විය යුතුය. ඒ සඳහා පහත සඳහන් සෑම අංශයක් පිළිබඳවම අවධානය යොමු කළ යුතුය.

➢ අපද්‍රව්‍ය ගැටළුව හා පාරිසරික ව්‍යසනය.

පරිසරයට දරා ගැනීමට නොහැකි මට්ටමට පරිසරය මත අපද්‍රව්‍ය මුදා හැරීම පරිසර දූෂණයයි. අධික ලෙස පරිභෝජනය හා අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා වර්තමානයේ ඉතා අහිතකර පාරිසරික බලපෑම් සිදුවෙමින් පවතී. කුණු ගොඩගැසීම නිසා ඒවා කුණු කඳු බවට පත්වී නාය යාම් වලට ලක්වීම, ඒ ආශ්‍රිතව මිනිස් ජීවිත, දේපළ පවා විනාශ වී විශාල ගැටළු ගණනාවක් මතුවීම, වායුගෝලය දූෂණය වීම, එය පුද්ගල සෞඛ්‍යයට අහිතකර ලෙස බලපෑම, සත්ව මරණ හා විශේෂිත සතුන් වඳවී යාමේ තර්ජනයට ලක්වීම ඉන් කිහිපයකි. අප විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය මොනවාදැයි අවබෝධය ලබා ගැනීම ඒවා නිසි ලෙස බැහැර කිරීම මෙහිලා මූලිකම කාර්යයකි.

ප්‍රධාන වශයෙන් අපද්‍රව්‍ය ඝණ, ද්‍රව, වායු වශයෙන් මූලිකවම හඳුනාගත හැකිය. ඝණ අපද්‍රව්‍ය දිරණ හා නොදිරණ වශයෙන් දෙකොටසකි. ප්ලාස්ටික්, පොලිතීන්, යෝගට් කෝප්ප වැනි දේවල් අප විසින් බැහැර කරන ඝන අපද්‍රව්‍ය වේ. ද්‍රව තත්වයේ පවතින අපද්‍රව්‍ය ලෙස අප ජලය හා රසායනික ද්‍රව්‍ය හඳුනාගත හැකිය. කාණු පද්ධති වලට ගංගා, ඇල දොල වලට ගෘහස්ථ මට්ටමෙන් හා කර්මාන්ත ආශ්‍රිතව බැහැර කරන අප ජලය නිසා ජලය විශාල වශයෙන්

දූෂණයට ලක්වේ. එසේම කර්මාන්තශාලා වලින් පිටකරන රසායනික ද්‍රව්‍ය නිසා ද ජලය දූෂණයට පත්වේ. වායුගෝලයට මුදාහරින අපද්‍රව්‍ය ලෙස වාහන වලින් පිටවන දුම කාබන්ඩයොක්සයිඩ් වායුව, කාබන් මොනොක්සයිඩ්, මීතේන් වැනි වායු වර්ග හඳුනාගත හැකි අතර මේවා මනා කළමනාකරණයකින් යුක්තව විධිමත් ලෙස බැහැර කිරීමට යොමු වීමෙන් පාරිසරික සමතුලිතභාවය රැකගත හැකි වේ.

- ජලය දූෂණය හා නාස්තිය.

පරිසර පද්ධති විනාශ කිරීම හා ජල දූෂණය හේතු කොටගෙන පිරිසිදු පානීය ජලය සැපයීම ගැටළුවක්ව පවතී. වාර්තා වලට අනුව ලොව පුරා සෑම දිනකම දළ වශයෙන් කසල ටොන් බිලියන 2.8 ක් පමණ ඇළ දොළ ගංගා වලට බැහැර කරනු ලැබේ. ලංකාවේ ප්‍රධාන ගංගා ද්‍රෝණි හා ජල මූලාශ්‍ර දූෂණය වෙමින් පවතී. විශේෂයෙන් කැළණි ගඟ, මහවැලි, කළු යන ගංගා ආශ්‍රිතව විශාල වශයෙන් අපද්‍රව්‍ය බැහැර කිරීම ශ්‍රී ලංකාවේ පානීය ජලය ගැටළුවට තවත් තර්ජනයක් වී ඇත. එසේම පරිභෝජන ක්‍රියාවලියේ දී ග්‍රාමීය මෙන්ම නාගරික වශයෙන් පානීය ජලය නාස්තිය සුළුපටු ලෙස තැකිය නොහැකිය.

- ඉන්ධන ක්ෂයවීම හා විකල්ප ප්‍රවේශ.

වත්මන් ලෝකයේ බලශක්ති අවශ්‍යතාවය සැපිරීම අභියෝගයක්ව පවතී. ඛණිජ තෙල් ප්‍රමාණය ක්ෂය වෙමින් පැවතීම බලශක්ති අර්බුධයක් දක්වා වර්ධනය වී තිබේ. මේ නිසා ආර්ථික හා සමාජීය වශයෙන් ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදුවේ. එබැවින් විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි රටවල සූර්යාලෝකය වර්ෂයේ සෑම දිනකම ලැබෙන ප්‍රභවයක් වශයෙන් එය බලශක්තියක් බවට පත් කිරීමට අවධානය යොමු කළ යුතුව ඇත. එසේම සුළං, ජෛව ඉන්ධන (Bio Fuel) වැනි ස්වභාවික බලශක්ති නිෂ්පාදනයට යොමුවීම වැදගත් වේ.

- වනාන්තර විනාශය.

මිනිසා විසින් හිතාමතාම තම අවශ්‍යතා සපුරා ගැනීම හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රසාරණය වීමත් සමග වනාන්තර විනාශය දිනෙන් දිනම වර්ධනය වෙමින් පවතී. සිංහරාජය ප්‍රමුඛ වනාන්තර මෙම තර්ජනයට ලක්වෙමින් පවතී. මේ නිසා පාංශු ඛාදනය ඉහළ යාම, ඒවා නිසා ගංගා නිම්න වල තැන්පත් වීම නිසා ගංවතුර වැනි තර්ජනවලට මුහුණ දීමට සිදුව ඇත. මධ්‍යම කඳුකරයේ වන විනාශය, එක් අතකින් වගා කටයුතු සඳහා භූමිය නිරාවරණය කිරීම, අනෙක් අතට දැව භාවිතය නිසා වන විනාශය පාංශු ඛාදනය සීඝ්‍ර වශයෙන් සිදුවේ.

- වායුගෝලය දූෂණය.

විවිධ මානව ක්‍රියාකාරකම් නිසා වායුගෝලයේ සල්ෆර් ඩයොක්සයිඩ්, කාබන් ඩයොක්සයිඩ්, කාබන් මොනොක්සයිඩ්, නයිට්‍රජන් වැනි අහිතකර වාතය එක්වීම නිසා වායුගෝලය දූෂණය වෙමින් පවතී. මේ නිසා ශ්වසන ආබාධ, ඇදුම රෝගය, පෙනහළු රෝග අඩු බර දරු උපත් සිදුවීම, පෙනහළු පිළිකා වැනි භයානක රෝගාබාධ වලට ගොදුරු වීමට සිදුව ඇත. මේ නිසා මියයන ජනගහනය ඉහළ යමින් පවතී. මෙරට වායු දූෂණය වන ප්‍රධානම සාධකය

වන්නේ වාහන දුමයි. වාහන භාවිතය එන්න එන්නම වර්ධනය වෙමින් පවතී. ඒ නිසා වායු දූෂණය පාලනය සඳහා ඵලදායී ක්‍රියාමාර්ගයක් පැවැතිය යුතු අතර, ඊට ජනතාවගේ පූර්ණ සහය ලබා ගැනීම ද අනිවාර්යය වේ.

ඉහත සියළුම කරුණු කාරණා විග්‍රහ කිරීමෙන් පෙනී යන්නේ තිරසාර සංවර්ධනයේ මූලිකම සංකල්පයන්ට ඔබ්බෙන් මිනිසා කටයුතු කිරීම නිසා විශාල ගැටළුවලට මුහුණ දීමට සිදුව ඇති බවයි. එනම් පවත්නා ස්වභාවික සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිතා නොකිරීම, ඒවා අසීමිතව පරිභෝජනය කිරීමට යාමෙන් පරිසරයට සිදුවන බලපෑම් ඉහළ යාමයි. අනාගත පරපුරට ඉතිරි නොකර අද පවත්නා ස්වභාවික සම්පත් අදම පරිභෝජනයට ගැනීමේ එල විපාක ඒ නිසා භුක්ති විඳිමින් පවතී. මේ තත්වය තවදුරටත් ඉදිරියට ගියහොත් මුලු ලෝකයම ව්‍යසනයකට පත්වීම වැළැක්විය නොහැකිය. එනිසා හෙට දවස ගැන සිතා අනාගත පරම්පරාව දෙස බලා තිරසාර සංවර්ධනයේ අරමුණු ඉෂ්ඨ කර ගැනීමට කාලය එළඹ ඇත.

"මා මියගිය දිනක මහ උත්සව පවත්වන්නයි, තොරන් ගහන්නයි කියලා මේ කැලේ තියෙන එකම එක ගහක්වත් කපන්න එපා. කොඩිවැල් එල්ලලා පරිසරය විනාශ කරන්නත් එපා. අපේ පරම්පරාවේ සිරිත් විදිහට මගේ අවසන් කටයුතු කරන්න. මට කරන ලොකුම ගෞරවය එයයි. මා වෙනුවෙන් හරි මේ වනයේ ගහකොළ කපන එක අපේ පරම්පරාවටම කරන ලොකු වැරැද්දකි."

මේ අපේ රටේ දඹානේ විසූ ආදිවාසී ගෝත්‍රික නායකයෙකු ලෙස හිටපු කිසාහාමිගේ ප්‍රකාශයකි. ඔහු කොතරම් පරිසරයට ඇලුම් කළාද, පරිසරය රැක ගැනීමට දායක වූවාද යන්න මෙම ශ්‍රේෂ්ඨ කියමනෙන් පැහැදිලි වේ. එසේම සරල සමබර දිවිපෙවෙතක් ගතකර සමාජයට ලබාදුන් ඒ ආදර්ශය අපි සියලුදෙනා අගය කළ යුතුය. භාවිතා කළ යුතුය.

මෙහි ආරම්භයක් ලෙස 2019 වර්ෂයේ දී සෞභාග්‍යයේ දැක්ම නම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දස වැදෑරුම් ප්‍රතිපත්ති අතරට "තිරසාර පරිසර ප්‍රතිපත්තියක්" යන්න ඇතුලත් කර තිබීම වැදගත්ය. ඒ අනුව 2022 වර්ෂයේ ජාතික දිනයට සමගාමීව පරිසර සංරක්ෂණ වැඩසටහනක් එක් දිනකට පමණක් සීමා නොකර වර්ෂය පුරා ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. මෙය රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන මූලික කරගෙන ක්‍රියාත්මක කිරීම එහි මුල් පියවරක් ලෙස අගය කළ යුතුය. නමුත් එය අඛණ්ඩව, නොනවත්වා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් පවතී.

රටක් වශයෙන් ස්වභාවික සම්පත් ශක්තීන් බවට පත් කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති භාවිතයට අවධානය යොමු කිරීම (සූර්යාලෝකය, සුළං), ගංගා ද්‍රෝණී ජල පෝෂක ප්‍රදේශ මෙන්ම ඇල, දොළ, වැව් ඉවුරු, පොකුණු ආදිය සංරක්ෂණය සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම, දෛනිකව එකතු වන කැළි කසළ ගොඩගසා කසළ කඳු නිර්මාණය කරනවාට වඩා කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

ඊට අමතරව පුරවැසියන් ලෙස ගෘහස්ත මට්ටමෙන් ක්‍රියාකාරකම් ආරම්භ කළ යුතුව ඇත. විදුලිය පිරිමැසීම, අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම, ඉන්ධන පිරිමසින කාර්යක්ෂම උපකරණ මිලදී ගැනීම, LED වැනි බල්බ භාවිතා කිරීම, ආයතන වලදී හැකිතාක් වායුසමීකරණ යන්ත්‍ර වෙනුවට විදුලි පංකා භාවිතයට ගැනීම, නිවසේ දිරායන ද්‍රව්‍ය

කොම්පෝස්ට් කර ගෙවතු වගාවට, මල් වගාවට යොදා ගැනීම, ඝණ අපද්‍රව්‍ය වෙන් කර පළාත් පාලන ආයතන වලට ලබාදීම, පොලිතීන් බෑග් වැනි දේවල් නැවත අඩුම වශයෙන් එක් වරක් හෝ පරිභෝජනයට ගැනීමට හැකි සෑම විටම ලන්ච් ෂීට් වෙනුවට ආහාර ඇසුරුම් භාවිතයට ගැනීම හා ජල පෝෂක ප්‍රදේශවල ගං ඉවුරුවල ගස් සිටුවීමෙන් දායක විය හැකිය.

මේ ආකාරයට පාලක පක්ෂය විසින් විවිධ වඩාත් යෝග්‍ය වැඩපිළිවෙල් සකස් කිරීමත්, ඒ සඳහා පුරවැසියන් සම්බන්ධ කර ගැනීම, විශේෂයෙන් පුරවැසියා දැනුවත් කිරීම, පාසැල් දරුවාගේ සිට වැඩිහිටියන් දක්වා සියලුදෙනාට පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව දැනුම ලබා දීම වැදගත්ය. පාසැල් දරුවන්ට පරිසර විෂය පිළිබඳ ඉගැන්වීම, වැඩිහිටියන් සඳහා මාධ්‍ය භාවිත කිරීම කළ හැකිය.

මෙසේ හරිත ජීවන චර්යාවක් ගොඩනගා ගනිමින් ස්වභාවික සම්පත් සුරක්ෂිත කෙරෙන තිරසාර සංවර්ධනයක අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම උදෙසා පාලක පක්ෂයේ මෙන්ම පුරවැසියන් වන අප සැමගේ ද වගකීමකි.

# 13. ජාතික ප්‍රතිපත්තිය හා සංවර්ධනය.

යමුනා කුමාරි
සංවර්ධන නිලධාරි
*M.A (Sociology)*

ඕනෑම රටක සංවර්ධනයේ තෝතැන්න නිර්මාණය කරන ප්‍රධාන සාධකය වන්නේ එරට ජාතික ප්‍රතිපත්තියයි. ආර්ථික හා සාමාජීය වශයෙන් රටක් ඉදිරියට යාමට නම් ජාතික ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුය.

ලොව සංවර්ධනයේ හිණිපෙත්තට ගමන් කළ ඇමරිකාව, ඉන්දියාව, එංගලන්තය, චීනය, රුසියාව යන රටවල් අදටත් මහා බලවතුන් ලෙස පිළිගනියි. එයට හේතුව වන්නේ එම රටවල් ආර්ථික සාමාජීය හා තාක්ෂණික වශයෙන් වේගයෙන් ඉදිරියට ගමන් කිරීමයි. එම රටවල් තම ජාතික ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. රටේ දේශපාලනය කුමන පක්ෂයක් නියෝජනය කළද එම පක්ෂය තම රටේ ජාතික ප්‍රතිපත්තිය කිසිසේත් තමන්ගේ පැවැත්ම සඳහා වෙනස් කිරීමට උත්සුක නොවෙති. තම රටට ආවේණික ජීවන පැවැත්ම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ජනතාව වෙනුවෙන් සැදී පැහැදී සිටිති.

නමුත් සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතික ප්‍රතිපත්තිය හුදු ලියවිල්ලක් මෙන්ම එය කඩදාසි කොළයට පමණක් සීමා වූවකි. නිදසුනක් ලෙස අප රට දැක්විය හැක. 1948 නිදහස ලබා වසර 74 ක කාලයක් ගෙවී ගියද මේ කාලය තුළ අප රටේ ජාතික ප්‍රතිපත්තිය හුදු ලියවිල්ලකට පමණක් සීමා වනු දක්නට ලැබිණි.

වරින්වර බලයට පැමිණෙන දේශපාලකයන් විසින් සිය මැතිවරණ ප්‍රකාශනවල ඔවුන් රට ගොඩනැගීම වෙනුවෙන් ඉදිරිපත් කරන ප්‍රතිපත්ති සමුදායක් ඇති අතර ජයග්‍රහණය ලබා බලයට පත්වූ විට ඒවා කොළ කැල්ලකට පමණක් සීමා වීම දක්නට ලැබේ. මෙවන් පසුබිමක් තුළ අපේ රටේ සංවර්ධනය ගැන කතා කිරීම අතිශයින්ම කණගාටුවට කරුණකි. බලයට පත් වූ විගස සිදුකරන්නේ පැවති රජයේ වැඩපිළිවෙළ මුළුමනින්ම වෙනස් කර තමන්ට අභිමත පරිදි රට ආර්ථික හා සාමාජීය වශයෙන් ඉදිරියට ගෙන යාමයි. මෙම තත්ත්වය නිවැරදි කිරීමට කිසිවකු ඉදිරිපත් නොවීම ද අපේ ම අවාසනාවකි. එහි අනිසි ප්‍රතිඵල අප අද මේ වන විට භුක්ති විඳිමින් සිටින අතර ඉදිරියට මේ තත්ත්වය තවත් වැඩි වනු නොඅනුමානය.

අප රටේ ජනතාවගේ ප්‍රධාන ආහාරය වන්නේ බත් වන අතර වී ගොවිතැන වෙනුවෙන් සිදුකරන ලද විතර තීන්දු තීරනවල ප්‍රතිඵල අද අපි භුක්ති විඳිමු. පැවති ඩොලර් හිඟය හමුවේ රසායනික පොහොර ගෙන්වීම මුළුමනින්ම නතර කොට ගොවියා කාබනික පොහොර භාවිතයට යොමු කළේය. මෙය කාලීන වශයෙන් හොඳ ක්‍රියාවලියක් වුවද මෙම නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී විවිධ අභියෝග දුෂ්කරතාවලට මුහුණ පෑමට ගොවියාට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස සහල් මිල වේගයෙන් ඉහළ ගිය අතර ජනතාවට මෙය ඉතාමත් අහිතකර ලෙස බලපෑවේය. මෙහි අනිසි ප්‍රතිඵලය වරින්වර විද්වතුන් පෙන්වා දීමට උත්සාහ කළ ද එහි ප්‍රතිඵලය වූයේ අදාළ ආයතන වල ඉහළ නිලධාරීන් එම තනතුර අද හැර යාමයි. ඔවුන් ඒවායින් ඉවත් කිරීමයි. කෘෂිකර්මය හා ග්‍රාමීය ජනතාවගේ ගැටළු හඳුනාගෙන

ජාතික ප්‍රතිපත්තිය නිසි ක්‍රමවේදයක් ඔස්සේ ගමන් කළා නම් ජනතාව මේ නිසා විශාල අර්බුදයකට පත් වන්නේ නැත.

තවද ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දුන්නා නම් වරින් වර වෙනස් වන කැබිනට් මණ්ඩලය එකිනෙක පටහැනි වන්නේ නැත. නිදසුනක් ලෙස එක් අවස්ථාවක බලයට පත්වූ ආණ්ඩුව විසින් අමාත්‍යාංශයක් නම් කරන ලද්දේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග වශයෙනි. මේ දෙක අතර කිසිදු සමානතාවයක් දක්නට නොලැබේ. එය ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දුර්වලතාවයකි. එකිනෙකට නොගැලපෙන අමාත්‍යාංශ එකිනෙකට නොගැලපෙන ආයතන අතරට යොමු කිරීම නිසා විශාල වශයෙන් ගැටළු නිර්මාණය වී තිබේ. එක්තරා අවස්ථාවකදී සිල් රෙදි බෙදීම විදුලි සංදේශ අමාත්‍යාංශය හරහා සිදු කරන ලදී. මෙවන් කටයුතු හා අනිසි වැඩපිළිවෙළ නිසා ඇතැම් රාජ්‍ය නිලධාරීන්ට බන්ධනාගාර ගත වීමට පවා සිදුවිය.

අප රටේ විශාල වශයෙන් දුම්රිය අනතුරු ගැන අසන්නට ලැබේ. ඇතැම් දුම්රිය නැවතුම් පොළවල්වල ආරක්ෂිත ගේට්ටු පවා ඉදිකර ඇත්තේ අනාරක්ෂිත ලෙසය. මේ නිසා ජීවිත කීයක් අප රටට අහිමි වූවා ද යන්න අප විසින් ම සිතා බැලිය යුතුය. දුම්රිය දෙපාර්තමේන්තුව අදාළ විදුලි සංඥා පිහිටුවීම සඳහා රුපියල් කෝටි 70 ක් වෙන්කර ඇතත් මේවා ක්‍රියාත්මක කරවීම පමා වන බව පෙනේ.

රටේ ආර්ථික, අධ්‍යාපන, සෞඛ්‍ය පමණක් නොව සංස්කෘතිය තවත් ජාතික ප්‍රතිපත්තියට අනුව හසුරුවනු ලබන්නේ නම් අපට මීට වඩා දියුණුවක් ලබාගත හැකිය. නමුත් චීනයේ සංගීතයට පවා ජාතික ප්‍රතිපත්තියක් ද තිබේ. එම ප්‍රතිපත්තිය උල්ලංඝනය කරමින් සංගීතය භාවිතා කිරීම හෝ නිර්මාණය කිරීම තහනම්ය. බැලූ බැල්මට මේ නිදහස සීමා කිරීමක් ලෙස පෙනී ගියද ඒ මගින් දේශීය සංගීතයේ අභිවර්ධනයට විශාල තල්ලුවක් ලැබී තිබේ. ඇමරිකාව, ජපානය වැනි රටවල් සිය ආර්ථිකය හසුරුවනු ලබන්නේ ද ජාතික ප්‍රතිපත්තියට අනුව ය. එය රටවල් දෙක කෙරෙහි ආර්ථික ප්‍රසාරණයට ශක්තියක් වී තිබේ.

වර්තමානය වන විට අප රටේ ගමනාගමනය විශාල වශයෙන් පරිවර්තනයකට ලක් වෙමින් පවතින බව පෙනේ. එනම් රටේ ඇතැම් ප්‍රදේශවල අධිවේගී මාර්ග ඉදි කිරීමයි. ලෝකයේ බොහෝ රටවල අධිවේගී මාර්ග බිහිවූයේ භාණ්ඩ සේවා හා නිෂ්පාදනය ඉහළ යාමත් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ උපක්‍රමයක් වශයෙනි. අප රටේ අධිවේගී මාර්ග ඉදි කිරීම සිදුවූයේ සැබැවින්ම එවැනි අවශ්‍යතාවයකටද යන්න ගැන අප සිතා බැලිය යුතුය. විශාල වශයෙන් විදේශීය රටවලින් ගලා එන කොමිස් කුට්ටි හමුවේ අප එයට නතු වී ඇති ආකාරය ඉතාම ඛේදජනකය. වර්තමාන ඩොලර් අර්බුදය හමුවේ මේ වන විට ඇතැම් අධිවේගී මාර්ග වල වැඩ තාවකාලිකව නතර කිරීමට සිදුව ඇත. ප්‍රශ්නය එය නොවේ. මෙයට වගකිව යුත්තේ කවුද ? ජනතාවද? නැතහොත් පාලකයෝ ද? යන්න ගැන අධ්‍යයනය කිරීම ඉතාමත් කාලෝචිත ක්‍රියාවකි.

ආර්ථිකයට. නව ඉදිකිරීම් වලට හා සංවර්ධන ක්‍රියාකාරකම් වලට අදාල චෝදනා පමණක් නොව සැක සංකා පවා ඇති වීමට හේතුව දේශපාලන ව්‍යාපාර බවට පත්ව ඇත. අප රටේ සිදු වූයේ ආණ්ඩුවෙන් ආණ්ඩුවට ජාතික ප්‍රතිපත්තිය වෙනස් කිරීමයි. එක ආණ්ඩුවකින් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන අතර තවත් ආණ්ඩුවක් සංවර්ධන ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරති. මේ නිසා සිදුව ඇත්තේ ආර්ථිකය හා සමාජය එක තැන පල් වීමයි.

ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන්දියාවේ ද ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් ක්‍රියාත්මක වුවද මොන පක්ෂයේ බලයට පැමිණියද එම රටේ ජාතික ප්‍රතිපත්තිය අඛණ්ඩව ඉදිරියට ගලා ඒම එම රටේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයයි. අප රටේද මෙම ප්‍රතිපත්තිය සැබැවින්ම ක්‍රියාත්මක කළ යුතුය.

අප රටේ ස්වාභාවික සම්පත් හා මානව සම්පත ගැන කතා කිරීමේ දී අප කිසිදු සම්පතකින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට උත්සුක නොවූ අතර එහි අනිසි ප්‍රතිඵලය වූයේ උගතුන් විශාල වශයෙන් රට අතහැර විදේශීය රටවල් කරා වේගයෙන් ඇදී යාමයි. වර්තමානයේ මේ තත්වය ඉතාමත් ප්‍රබල ආකාරයෙන් වැඩි වී ඇත. අප රටේ බුද්ධි ගලනය ගැන අප ඉතාමත් අනාදිමත් කාලයක සිට කතා කළ ද එයට විසඳුම් ඉදිරිපත් නොවීය. මෙසේ සිදු වූයේ ඇයි යන ප්‍රශ්නයට පිළිතුර වන්නේ දර්ශනයක් හා ප්‍රතිපත්තියක් නොවීම යන්නයි.

විවිධ අවස්ථාවලදී අප සිංගප්පූරුව ගැන කතා කළෙමු. තවත් අවස්ථාවක ආසියාවේ ආශ්චර්ය ගැන කතා කළ ද ඒවා හුදෙක් යථාර්ථවාදී නොවන ඉලක්ක බවට පත්විය.

පවතින තත්වය තුළ සියලු දෙනාම එකා මෙන් අත්වැල් බැඳ ගනිමින් නැගී සිටීමට අපූරු අවස්ථාවක් අපට උදා වී ඇත. බලය නිලය හමුවේ තම ප්‍රතිපත්ති පාවා නොදෙමින් රටේ සංවර්ධන ගමන් මග යළි ගොඩනැගීමේ කාර්යය ඉටු කළ යුතුව ඇත. නමුත් තවමත් සිදුවන්නේ තම තමන්ගේ පෞද්ගලික බලාපොරොත්තු හා අරමුණු උදෙසා ක්‍රියාත්මක වීමයි. ප්‍රධාන දේශපාලන ප්‍රවාහයක් එක වතාවකට පැමිණ කටයුතු කිරීම ඉතා වැදගත් කටයුත්තකි. සම්මුති වාදය යනු අපේ රටේ නිදහසින් පසු දේශපාලන චාරිකාවේ ප්‍රධාන සංධිස්ථානය ලෙස සැලකිය හැකිය. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරමින් නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම පමණක් නොව පොදු ආර්ථික දර්ශනයක් අනුව රට ගොඩනැගීමට අවස්ථාව ලැබී ඇත. එයින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට ක්‍රියාත්මක විය යුතුය.

ජාතික ප්‍රතිපත්තිය තුළ ගැඹුරු දර්ශනයක් තිබිය යුතු අතර එහි ස්ථාවර භාවයක් තිබිය යුතුය. යුද්ධය නිම වීමත් සමගම දිගුකාලීන ජාතික ප්‍රතිපත්තිය වන රට ගොඩනැගීම පසෙක තබා පුද්ගල හා පවුල් දේශපාලනය මත තීරණ ගනිමින් ක්‍රියාත්මක වීම තුළ ශ්‍රී ලංකාව ලභා කරගත හැකිව තිබූ දැවෙන ප්‍රශ්න රාශියකට විසඳුම් ලබා ගැනීමට හැකිව තිබූ අවස්ථාව මග හැරී ගියේය.

මෙවන් සමාජ ආර්ථික වටපිටාවක් තුළ අද අප රටට අවශ්‍ය කරන ජාතික ප්‍රතිපත්තිය කුමක්ද ? ඒවා කුමන ක්ෂේත්‍ර වල කුමන ආකාරයට සකස් කළ යුතුද? යන්න ගැන සමාජ කතිකාවතක් ගොඩ නැගිය යුතුය. මේ සඳහා සමාජයේ සෑම පාර්ශවයකගේම සහාය ලබා ගැනීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා පසුගිය වර්ෂ 6 හා 7 තුළ ස්ථාවර ප්‍රතිපත්ති මග ගමන් කළා නම් අප මේ වන විට මුහුණ පා සිටින දැවෙන ප්‍රශ්න මේ තරම් බැරෑරුම් නොවනු ඇත. නූතන ශ්‍රී ලාංකීය ජනතාව මුහුණ දෙන විවිධ ජනකොටස් අතර සංහිඳියාව ගොඩනැගීමේ විෂයෙහි අප අසමත් ව ඇත්තේ ඒ සඳහා සැමට පිළිගත හැකි සාධාරණ හා යුක්ති සහගත ප්‍රතිපත්තියක් නොමැති වීමයි.

ඉහත සඳහන් කරුණු අනුව සනාථ වන්නේ රටක සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් ඉතාමත් අවශ්‍ය වන අතර එය හුදෙක් ලියකියවිල්ලකට සීමා නොවන ක්‍රියාත්මක තලයේ තිබිය යුතු අතර ස්ථාවර එකක් විය යුතු බවයි. නමුත් එය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළයුතුය. එය රටක පැවැත්ම සනාථ කරන අතර එය ඉදිරියට යන්නෙත් එකතැන රඳා පවතින්නේ එහි පවතින තත්ත්වය මතය. මෙම තත්ත්වය අප රටේ ද නායකයන් නිරන්තරයෙන් සිහියේ තබා ගත යුතු අතර එසේ නොවනතාක් ජනතාවගේ දැවෙන ප්‍රශ්න වලට විසඳුම් ලැබීම පමාවනු ඒකාන්තය. මෙම තත්ත්වය හඳුනාගෙන කටයුතු කිරීම හා ක්‍රියාත්මක කිරීම පාලකයින්ගේ වගකීම බව පෙන්වා දීම වර්තමාන තත්ත්වය තුළ ඉතා කාලෝචිතය. මේ වන විට අප රටේ ජනතාව විවිධ අභියෝග හා දුෂ්කරතා වලට මුහුණපා සිටීම දක්නට ලැබේ. ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට ගැලපෙන ආකාරයට අපේ වර්ජන, අරගල බිහි

වීම නිරායාසයෙන්ම සිදු වනු ඇත. පවතින පීඩනය දරාගත නොහැකි වූ විට ජනතාව ඒකරාශී වීම නොවැළැක්විය හැකි බව අපට පූර්වාදර්ශ වලින්ම පෙනී ගොස් ඇත.

ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම තුළ රට ණය බරින් වෙලී ඇති බව අප රට අධ්‍යයනය කිරීමෙන් අපට පෙනී යන කරුණකි. සංවර්ධනය වන රටක් ලෙස අප රට ණය ලබාගත යුතු නමුත් මේ වන විට අප ණය ලබාගෙන ඇත්තේ අවශ්‍ය නොවන කටයුතු සඳහාය. නිදසුනක් ලෙස නෙළුම් කුළුණ පෙන්වා දිය හැක. හුදු තමන්ගේ පරමාර්ථ ඉටු කර ගැනීමට යාමේ ප්‍රතිඵලයක් ලෙස මෙය පෙන්වා දිය හැකි අතර මේ මගින් එකම ඩොලර් එකක් වත් අපට නොලැබෙන අතර විශාල වශයෙන් අප ලෝකය ඉදිරියේ ණය කාරයෙක් ලෙස තවදුරටත් ලේබල් ගැසෙනු ඒකාන්තය.

ඉහත සඳහන් කරුණු අනුව රටක සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්තිය එම රටේ මුදුන් මල්කඩ වන අතර එම ප්‍රතිපත්තිය නොමැතිතාක් රටක් ආර්ථික, සාමාජික හා දේශපාලනික වශයෙන් අපරාජිත තත්ත්වයකට පත්වනු නොඅනුමාන බව පෙන්වා දිය හැක.

# 14. තිරසාර සංවර්ධන අභිමතාර්ථ.

*තිලක් ගංගොඩ*
*සංවර්ධන නිලධාරි*
*B.A (General)*

2015 වර්ෂයේ නිව්යොක් නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහා රැස්වූ ලෝක නායකයින් 2000 වර්ෂයේදි හඳුන්වාදුන් සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සඳහා අනුප්‍රාප්තික අභිමතාර්ථ ලෙස තිරසාර සංවර්ධන අභිමතාර්ථ එළිදක්වන ලදි. ස්වකීය පරපුරේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අනාගත පරපුරට ඇති හැකියාව කැපනොකර අවශ්‍යතා සපුරා ගන්නා සංවර්ධනය තිරසාර සංවර්ධනයයි. තිරසාර සංවර්ධන අභිමතාර්ථ ව්‍යුහය දිළිඳුකම පිටුදැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම, සැමට සෞභාග්‍ය උදාකිරීම සඳහා වූ සැලැස්මකි. තිරසාර සංවර්ධන අභිමතාර්ථ ලෝකය ස්ථායි සංවර්ධන මාවතකට යොමු කිරීමට දායක වේ. ඒකාබද්ධ තිරසාර සංවර්ධන අභිමතාර්ථ තිරසාර සංවර්ධනය සඳහා ආර්ථික, සමාජයීය, පාරිසරික යන අංශ තුනම සමබරව පවත්වාගෙන යයි. මෙම අභිමතාර්ථ හා ඉලක්ක මානව සංහතියේ අභිවෘද්ධියට වැදගත් පුළුල් ප්‍රකාශයක් ආවරණය වන පියවර රැසකින් යුක්ත ක්ෂේත්‍ර 05ක් ඔස්සේ දැක්විය හැකිය.

**1. ජනතාව -** දිළිඳුකම හා සාගින්න අවම කිරිම, ගෞරවය, සමානාත්මතාව හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් තුළ මානව වර්ගයා තම කුසලතා සපුරා ගන්නා බව තහවුරු කිරිම.

2. **පෘථිවිය -** වත්මන් හා අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා සහාය විය හැකි වන පරිදි තිරසාර පරිභෝජන හරහා ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය සහ දේශගුණික විපර්යාස සඳහා පියවර ගනිමින් පෘථිවිය ගෞරවනීය ලෙස ආරක්ෂා කිරිම.

**3. සෞභාග්‍යය -** සියළුම මනුෂ්‍ය වර්ගයා සමෘද්ධිමත් හා තෘප්තිමත් ජීවිත භුක්ති විඳින බව හා ආර්ථික, සාමාජීය හා තාක්ෂණික ප්‍රගතිය ස්වභාව ධර්මයා සමඟ එකතුව සිදුවන බව තහවුරු කිරීම.

**4. සාමය -** බිය හා ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී සාධාරණ සියලු දෙනා එක් කරගත් සමාජයක් සඳහා ධෛර්ය ලබාදීම.

**5. හවුලේ කටයුතු -** මෙම අභිමතාර්ථ ක්‍රියාවට නැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට ගෝලීය සහයෝගිතාවය පදනම් කරගෙන දිළිඳුකම හා වඩාත් පීඩාවට ලක්වූ ජනතාව කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව තිරසාර සංවර්ධනය සඳහා බල පවත්වන ලද ගෝලීය හවුල්කරුවන්ගෙන් හා සියලු රටවලින් සියලු පාර්ශව කරුවන්ගෙන් හා සියලු ජනතාවගේ දායකත්වය ලබාගෙන ක්‍රියාත්මක වීම.

මේ අනුව තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17ක් ප්‍රකාශයට පත්කර ඇත. එක් එක් අභිමතාර්ථයක්ම විශේෂිත වූ ඉලක්ක කිහිපයකින් යුක්තය. මුළු ඉලක්ක ගණන 169කි.

තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17 පහත දැක්වේ.

**අභිමතාර්ථ 1 -** සියලුම ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරු කිරීම.

**අභිමතාර්ථ 2 -** කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා පෝෂණ වැඩිදියුණුව ලබා ගැනීම හා තිරසාර සංවර්ධන ප්‍රවර්ධනය.

**අභිමතාර්ථ 3 -** සෑම වයසක ම සියලු දෙනාට ම සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

**අභිමතාර්ථ 4 -** සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරා ම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරිම.

**අභිමතිර්ථ 5 -** ස්ත්‍රී - පුරුෂ සාමානාත්මතාව ලඟාකර ගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.

**අභිමතාර්ථ 6 -** සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගත හැකි බව හා තිරසාර කළමනාකරණය සහතික කිරිම.

**අභිමතාර්ථ 7-** දැරිය හැකි විශ්වාසනීය තිරසාර හා නවීන බලශක්ති ප්‍රවේශය සියලු දෙනා සඳහා තහවුරු කිරීම.

**අභිමතාර්ථ 8 -** සියලු දෙනා සඳහා කල්පවත්නා පූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායි රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරිම.

**අභිමතාර්ථ 9 -** ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම. පූර්ණ සහ තිරසාර කාර්මිකකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය.

**අභිමතාර්ථ 10 -** රටවල් ඇතුලත හා රටවල් අතර අසමානතාව අඩු කිරීම.

**අභිමතාර්ථ 11 -** නගර හා මානව ජනාවාස පූර්ණ ආරක්ෂිත ඔරොත්තු දෙන තිරසාර තත්වයට පත් කිරීම.

**අභිමතාර්ථ 12 -** පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම.

**අභිමතාර්ථ 13 -** දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහි ව හදිසි ක්‍රියාමාර්ග ගැනීම.

**අභිමතාර්ථ 14 -** තිරසාර සංවර්ධනය සඳහා සාගර මුහුදු සහ සාගර සම්පත් සුරක්ෂිතව කල්පවත්නා පරිදි භාවිතා කිරිම.

**අභිමතාර්ථ 15 -** ගොඩබිම් පරිසර පද්ධති තිරසාර ලෙස භාවිතා කිරිම, ප්‍රවර්ධනය කිරිම, ආරක්ෂා කිරිම, පිළිසකර කිරිම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරිම, කාන්තාරකරණය වැළැක්වීමට කටයුතු කිරිම, ඉඩම් අවභාවිතය නැවැත්විම හා පිළිසකර කිරිම, ජෛව විවිධත්වයට හානි කිරීම නතර කිරීම.

**අභිමතාර්ථ 16 -** තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුලත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරිම. සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායි වගකිමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරිම.

**අභිමතාර්ථ 17 -** තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගිතාව ක්‍රියාත්මක කළ හැකි විධික්‍රම පණගැන්වීම් හා ශක්තිමත් කිරිම.

බහුවිධ අන්තර් සම්බන්ධතා සහිතව තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඒකාබද්ධ ස්වභාවයකින් පැවතිම තිරසාර සංවර්ධනයේ විවිධාකාර පැතිකඩ සාක්ෂාත් කරගැනිමට ඉතා වැදගත් වේ. ඒ බැවින් තිරසාර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරිමේ දි ජාතික හා කලාපීය සැලැසුම් ප්‍රමුඛතා හා ප්‍රකාශනවලට ඒකාබද්ධ කිරිම අවශ්‍ය වේ. තිරසාර

සංවර්ධන අභිමතාර්ථ 17 ම ඉතා සම්බන්ධිත බැවින් එකිනෙකින් හුදකලාව ක්‍රියාත්මක කළ නොහැකිය. විවිධ අංශ ඒකාබද්ධවී කටයුතු කිරිම කළ යුතුවේ. ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරිම හා වාර්තා කිරිමේ දී අවශ්‍යතා හා ධාරිතාවන් සපුරාලීම ද අවශ්‍යවේ.

විවිධ මට්ටමේ රාජ්‍ය හා පාර්ශවකාර කණ්ඩායම් අතර ප්‍රමුඛතාව මත සහයෝගිතාව හා දායකත්ව පියවර ගැනිම ද අවශ්‍ය වනු ඇත. සියල්ලන්ගේ ජීවිත සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමට නම් සියලු මට්ටම්වලින් ගනු ලබන ප්‍රයත්නයන් සමස්ත තිරසාර සංවර්ධන අභිමතාර්ථ න්‍යාය පත්‍රය කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කළ යුතුව ඇත. තිරසාර සංවර්ධනය ශ්‍රී ලංකාවේ සාක්ෂාත් කර ගැනීමට 2017 අංක 19 පනතින් මුදල් අමාත්‍යංශයේ තිරසාර සංවර්ධන සභාව පිහිටුවා ඇත.

කෘෂිකර්ම අමාත්‍යංශය විසින් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ හඳුනාගත් ප්‍රධාන විශේෂිත ක්ෂේත්‍ර හා ඒ යටතේ ජය ගැනිමට අපේක්ෂිත තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණු නිදසුන් ලෙස කෙටියෙන් දක්වමි.

1.ආහාර සුරක්ෂිතතාව

2.යෙදවුම් කළමනාකරණය

3.ස්වභාවික සම්පත් කළමනාකරණය

4.නිති හා අණපනත් යාවත්කාලීන කිරීම

5.තරුණ හා කාන්තා සහභාගිත්වය

6.කෘෂිකාර්මික පර්යේෂණ හා තාක්ෂණ සංවර්ධනය

7.ගොවින් සවිබල ගැන්වීම

8.අලෙවිකරණය

9.රාජය හා පෞද්ගලික හවුල්කාරිත්වය

10.දැනුම කළමනාකරණය

11.වාරිමාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

12.ආයතනික සම්බන්ධීකරණ

13.පාරිභෝගික සෞඛ්‍ය හා තෘප්තිමත්භාවය

14.කෘෂිකර්මාන්තයේ සාම්ප්‍රදායික දැනුම හා ක්‍රියාකාරකම්

ඒ අනුව වත්මන් රජය විවිධ ආර්ථික ගැටළු හමුවේ තිරසාර සංවර්ධනය සමග අත්වැල් බැදගැනීමට උත්සාහ දරමින් සිටියි. තුරුලතා රැක ගැනීම, පිරිසිදු පානිය ජලය අනාගත පරපුර සඳහා උරුම කරදීම වැනි කාර්යයන් තුල සක්‍රීය දායකත්වයක් දරයි. වත්මන් ආර්ථික අර්බුදය හමුවේ බලාපොරොත්තු නොවූ ආකාරයේ භාණ්ඩ හා සේවාවල අඛණ්ඩ මිල ඉහල යාමේ (උද්ධමනය) ප්‍රතිඵලයක් ලෙස තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි බලපානු ඇත. නමුත් 2030 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමට වත්මන් රජය විවිධ ක්‍රියා මාර්ග ගැනීම අගය කළ යුත්තකි.

**මූලාශ්‍ර - ශ්‍රී ලංකා බැංකු වාර්තා හා ප්‍රකාශන, අන්තර් ජාලය**

# 15. ව්‍යාපෘති යෝජනාවක් ලියමුද?

ප්‍රදීප් ලංකාපෙල
සංවර්ධන නිලධාරි
B.B.Mgt (Acc.Special)

## ව්‍යාපෘති යෝජනාව ලිවීම

**ව්‍යාපෘති යෝජනාවක අවශ්‍යතාවය -** ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවිධාන බිහි වී ඇත. එම බිහි වී ඇති සංවිධානවල අරමුදල් ගොඩනැගී ඇත්තේ සංවිධානයට සම්බන්ධවන සාමාජිකයින්ගේ ඉතුරුම් හා අරමුදල් මඟින්ය. නමුත් එම සංවිධානයේ ගැටලු හා අරමුණු වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක වීම සඳහා එම අරමුදල් ප්‍රමාණවත් නැත. එම නිසා වෙනත් පාර්ශවයන්ගෙන් තම සංවිධානයේ අරමුණු කරා යාම සඳහා අරමුදල් සපයා ගත යුතුයි. ඒ සඳහා ව්‍යාපෘති යෝජනා පත්‍ර සකසා ඉල්ලීම කිරීමට සිදුවේ. ඒ නිසා විධිමත් ආකාරයට ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට සිදුවේ. ඒ සඳහා අවශ්‍ය දැනුම හා නිසි ආකාරයට ව්‍යාපෘති යෝජනා පත්‍රයක් සකස් කරන ආකාරය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීමට සංවිධාන ක්‍රියාකාරකයින්ට, ග්‍රාමීය නායකයින්ට, සංවර්ධන ක්ෂේත්‍රයේ සිටින නිලධාරින්ට ඉතා වැදගත් වේ.

**1. ව්‍යාපෘතියේ පසුබිම**

i. බල ප්‍රදේශය

ව්‍යාපෘති යෝජනාවක් ලිවීමේ දී එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන බල ප්‍රදේශය සඳහන් කළ යුතුය.

ii. මාර්ග සිතියම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශයට පැමිණෙන ආකාරය පිළිබඳ මාර්ග සිතියම හෝ ගූගල් සිතියම මෙහි ඇතුළත් කිරීම වැදගත්ය.

iii. ජන විකාශනය හා ජන සංයුතිය

මේ පිළිබඳව එක ඡේදයකින් විස්තර කර ඉදිරිපත් කිරීම කළ යුතුය

iv. ව්‍යාපෘති ගැටලුව

මෙම ව්‍යාපෘතියෙන් ඉටු කිරීමට බලාපොරොත්තු වන ගැටළුව මෙහිදී සඳහන් කිරීම වැදගත්ය. එසේම පවතින ගැටලුව නිසා ප්‍රජාවට හා ඒ ප්‍රදේශයට වන බලපෑමද විස්තර කිරීම වැදගත්ය.

**2. ව්‍යාපෘති නාමය**

ව්‍යාපෘතියේ පවතින ගැටලුව ආශ්‍රයෙන් ව්‍යාපෘතියට නමක් කෙටියෙන් ඇතුළත් කළ යුතුයි. එසේම එම නමින් ව්‍යාපෘතිය පිළිබඳ යම් අදහසක් ඇතුළත් වීම ඉතා වැදගත් කරුණකි.

**3. ව්‍යාපෘතියේ තාර්කිකත්වය**

තාර්කිකත්වය යටතේ ව්‍යාපෘතියෙන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් ඉතා පුළුල්ව හා ධනාත්මක ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම ඉතා වැදගත්ය.

**4. ව්‍යාපෘතියේ අභිමතාර්ථ**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් අප දීර්ඝකාලීනව ළඟා කරගැනීමට අපේක්ෂිත පුලුල් අරමුණය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විට අපි වැඩි අවධානයක් දිය යුත්තේ මෙම අංශ ඔස්සේ ප්‍රතිඵල ළඟා කර ගැනීමටයි.

**5. ව්‍යාපෘතිය මඟින් විසඳීමට යෝජිත ගැටලු**

ව්‍යාපෘතියක් මඟින් අප බලාපොරොත්තු වන්නේ ගැටලුවක් විසඳීමටයි. එනම් එම ගැටලුවට හේතු වූ සියලු කාරණා මෙහිදී හඳුනාගෙන ඒ සඳහා විසඳුම් දිය යුතුයි. එවිටයි එම ව්‍යාපෘතිය සාර්ථක වන්නේ ඒ හේතු සියල්ලම මෙහිදී හඳුනා ගැනීම වැදගත්ය.

**6. ව්‍යාපෘතිය මඟින් කිරීමට යෝජිත ක්‍රියාකාරකම්**

ව්‍යාපෘතියෙන් ඉටු කිරීමට බලාපොරොත්තු ක්‍රියාකාරකම් එකිනෙකට පිළිවෙලකට හඳුනාගැනීමත් කරගත යුතුයි. එම හඳුනාගත් ක්‍රියාකාරකම් අනුපිළිවෙලින් මෙහිදී සඳහන් කිරීම ඉතා වැදගත්ය.

ව්‍යාපෘතියට ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය තීරණය වන්නේ මෙම ක්‍රියාකාරකම් සඳහා ලැබෙන මුදල් මතය. ඒ නිසා ව්‍යාපෘතියක් ලිවීමේ දී ගැටලුවට අදාළ සෑම ක්‍රියාකාරකමක්ම හඳුනාගෙන එම ක්‍රියාකාරකම් සියල්ල මෙහිදී ඉදිරිපත් කිරීම ඉතාම වැදගත් වේ.

**7. ව්‍යාපෘතියේ සුවිශේෂි අරමුණු**

ව්‍යාපෘතියේ සුවිශේෂි අරමුණ හඳුනාගත යුතුයි. මෙහිදී එම සුවිශේෂි අරමුණ ව්‍යාපෘති යෝජනාවට ඇතුළත් කළ යුතුයි. ප්‍රධාන කරුණු 5 මඟින් සුවිශේෂි අරමුණ නිර්මාණය කරගත යුතුයි. මෙයට SMARTසංකල්පය ලෙස හඳුන්වයි.

**S - Specific - නිශ්චිත/ සුවිශේෂි බව**

**M - Miserable** - මැනිය හැකි බව

**A - Achievable** - ළඟා කරගත හැකි බව

**R - Result base** - ප්‍රතිඵල පාදක බව

**T - Time Bond** - කාලය විසින් සීමා කරන ලදි.

මෙම කරුණු 05 ඇතුළත් වන පරිදි සුවිශේෂි අරමුණ ලිවිය යුතුයි.

**8. ව්‍යාපෘතියේ කාල සීමාව**

සෑම ව්‍යාපෘතියකම සුවිශේෂි අරමුණක් ඇත. මෙම අරමුණ ළඟා කර ගැනීමට යන කාලය අරමුණෙන් අරමුණට වෙනස් වේ. මෙහිදී මෙම සුවිශේෂි අරමුණට යන කාලය සැලකිල්ලට ගත් විට ව්‍යාපෘතියට ගත වන කාලය නිර්ණය කර ගත හැකිය.

**9. ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්**

ගැටලුවක් හා පිළිතුරක් ඇති අයහපත් තත්වයකි. මෙම අයහපත් තත්වයට ඍජුවම හෝ වක්‍රව මුහුණ දෙන පුද්ගල සමූහයක් සිටිති. ව්‍යාපෘතිය මඟින් කෙරෙන්නේ මෙම අයහපත් තත්වයට පිළිතුරු සෙවීමයි. එහිදී මෙම ඉහත සඳහන් කළ ඍජු හා වක්‍ර ප්‍රතිලාභීන් සිටිති මෙම ඍජු හා වක්‍ර ප්‍රතිලාභීන් කවුද කියා හඳුනාගෙන ඉදිරිපත් කිරීම මෙහිදී කළ යුතුය.

**10. ව්‍යාපෘතියේ උපාය මාර්ග**

ව්‍යාපෘතියේ උපාය මාර්ග යනු ව්‍යාපෘතිය ක්‍රියාවට නන්වන අභිමථාර්තය කරා ගමන් ගන්නා ආකාරය දැක්වෙන සවිස්තරාත්මක විස්තර කිරීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආකාරය නැතහොත් ගමන් මාර්ග ව්‍යාපෘතියේ ඇති අභිමථාර්ථ වේ. උපාය මාර්ග කිහිපයක් තිබිය හැකිය. මේ සෑම උපාය මාර්ගයක්ම මෙහිදී සඳහන් කළ යුතුය.

**11. ප්‍රගති දර්ශක**

ව්‍යාපෘතියේ ප්‍රගතිය මැන ගැනීම සඳහා යොදා ගන්නා දර්ශක ප්‍රගති දර්ශක ලෙස හැඳින්වේ. අදාල ව්‍යාපෘතිය අපේක්ෂා කළ ප්‍රගතියට පැමිණ ඇද්දැයි පරීක්ෂා කිරීම සඳහා මෙම දර්ශක භාවිතා කරනු ලැබේ. ව්‍යාපෘති යෝජනාවට ප්‍රගති දර්ශක සාදා ඇතුළත් කිරීම ඉතා වැදගත්ය. ප්‍රගති දර්ශක ගොඩනඟා ගන්නේ සුවිශේෂි අරමුණු තුළිනි.

**12.** **ව්‍යාපෘතියේ ක්‍රියාත්මක යාන්ත්‍රණය**

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් රාශියක් ඇත. මෙම ක්‍රියාකාරකම් රාශිය එක් එක් ක්‍රියාකාරකමක් ක්‍රියාවට නන්වන්නේ කෙසේදැයි සියලු වැදගත් කරුණු ඇතුළත්ව කෙටියෙන් දැන්වීම මෙහිදී ඉදිරිපත් කළ යුතුය. පහත කරුණු මෙහිදී සඳහන් කිරීම කළ යුතුය. ක්‍රියාකාරකමට අවශ්‍ය වන කාලය, එයට සම්බන්ධ කර ගන්නා නිලධාරින්, ආයතන, මිලදී ගැනීම් කරගන්නා ආකාරය, ප්‍රසම්පාදන ක්‍රියාවලිය, යන්ත්‍රසූත්‍ර වල පිරිවිතර, තාක්ෂණික නිලධාරින් සහ ප්‍රතිලාභීන් පිළිබඳ සියලු විස්තර ඇතුළත් යන්ත්‍රයක් සකස් කර ඉදිරිපත් කළ යුතුය.

**13.** **ව්‍යාපෘතියේ මෙහෙයුම් යාන්ත්‍රණය**

ව්‍යාපෘතිය මෙහෙයවන ආකාරය පිළිබඳව යෝජනා පත්‍රයේ සඳහන් කිරීම ඉතාම වැදගත්ය. මෙහිදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී කෙසේද අධීක්ෂණය කරන්නේ කියා සඳහන් කළ යුතුය. එසේම ව්‍යාපෘතිය අවසන් වූ පසු අධීක්ෂණය කරන ආකාරයද සඳහන් කිරීම මෙහිදී කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය නිලධාරින් හා කමිටු පැහැදිලිව සඳහන් කිරීම වැදගත් වේ.

**14.** **පවත්වා ගැනීම හා නඩත්තුව**

ව්‍යාපෘතිය අවසන් වූ පසු එය දීර්ඝකාලීනව ප්‍රතිලාභ ලැබෙන පරිදි නඩත්තු කරගැනීම කල යුතුය. එම නඩත්තු කරන වැඩපිළිවෙල මෙහිදී සඳහන් කිරීම කළ යුතුය. ව්‍යාපෘතිය අනුමත කිරීම සඳහා මෙම නඩත්තු වැඩපිළිවෙල ඉතා තර්කානුකූලව ඉදිරිපත් කළ යුතුය.

**15.** **ව්‍යාපෘතිය මඟින් ස්ත්‍රී පුරුෂ අසමානාතාවයට කරන බලපෑම්.**

මූල්‍ය ආයතන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දීමේ දී මෙම ව්‍යාපෘතිය මඟින් කාරණාවන්ගේ සුභ සිද්ධිය සඳහා ලැබෙන දායකත්වය අධීක්ෂණය කර ප්‍රතිපාදන ලබා දීම සිදු කරයි. මෙහිදී කාන්තා දායකත්වය සෑම අංශ වලින්ම ඉටු වී තිබේද කියා අධීක්ෂණය කරනු ලබයි. ව්‍යාපෘතිය ලිවීමේ දී යෝජනාපත්‍රය තුළ කාන්තා සහභාගීත්වය විශේෂයෙන් සඳහන් කළ යුතුය.

**16.** **පරිසරය සුරැකීමට ව්‍යාපෘතියෙන් වන බලපෑම**

ව්‍යාපෘතිය ලිවීමේ දී මෙම ව්‍යාපෘතිය මඟින් පරිසරයට කිසිදු අහිතකර බලපෑමක් සිදු නොවන බවට පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීම කළ යුතුය. පරිසරයේ තිබෙන ශාක වලට, සතුන්ට හා ඛනිජ සම්පත් සඳහා මෙම ව්‍යාපෘතිය මගින් බලපෑමක් සිදු නොවන බවට විස්තර හා අදාළ ආයතන වලින් අනුමැතිය ලබා ගැනීම මෙම අවස්ථාවේ සඳහන් කළ යුතුය.

**17. ව්‍යාපෘතියේ තාර්කිකත්ව සටහන**

ව්‍යාපෘති යෝජනාවේ මෙම ව්‍යාපෘතියෙන් අදාල ගැටලු සඳහා ඉතා සාර්ථකව විසඳුම් ලබා දෙන බව තර්කානුකූලව විශ්ලේෂණාත්මක සඳහන් කළ යුතුය. ව්‍යාපෘති යෝජනාව කියවන්නට ව්‍යාපෘතියේ අභිමථාර්ත ඉටුවන ආකාරය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මැවිය යුතුය. එය ගැලීම් සටහනකින් පැහැදිලිව දක්වන්නේ නම් ඉතාම උචිතය.

**18. ව්‍යාපෘතියේ කාල රාමුව**

ව්‍යාපෘතියට අදාළ සියලු ක්‍රියාකාරකම් සඳහා යන කාලය වෙන වෙනම සටහන් කර ගැන්ට් සටහනක් මඟින් ඉදිරිපත් කළ යුතුයි. කාල රාමුවේ කාලය සටහන් කිරීමේ දී ව්‍යාපෘතිය සඳහා යන මුළු කාලය පදනම් කරගෙන සුදුසු ක්‍රමයක් යොදා ගත හැකිය. එය දින, සති, හෝ මාස වලින් පෙන්විය හැකිය.

**ගැන්ට් සටහන - Gant chart**

| අනු අංකය | ක්‍රියාකාරකම් | ජනවාරි | | | | පෙබරවාරි | | | | මාර්තු | | | | අප්‍රේල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| 1 | | | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | | | | | |

**19. ව්‍යාපෘතියේ වියදම් ඇස්තමේන්තුව සහ මූල්‍ය සැලැස්ම**

මෙහිදී ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සියලුම වියදම් අධ්‍යයනය කර මෙම මූල්‍ය සැලැස්ම හා වියදම් ඇස්තමේන්තුව දැක්විය යුතුය.

## වියදම් ඇස්තමේන්තුව

| අනු අංකය | ක්‍රියාකාරකම | ඒකකය | ඒකක මිල | මුලු වියදම | | ඉලක්ක | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කාර්තු 1 | | කාර්තු 2 | | කාර්තු 3 | | කාර්තු 4 | |
| | | | | පහසුකම් | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය |
| 1 | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | |

# 16. දිළිඳුකම දුරලීමේ අභියෝගය.

ආචාර්ය, එන්. එස්. බී. ඒකනායක
*සංවර්ධන නිලධාරී*
*PhD (Sociology)*

දිළිඳුකම තිරසාර සංවර්ධනය සහ මානව යහපැවැත්ම ළඟාකර ගැනිමට ඇති ප්‍රධාන බාධාවක් ලෙස සැළකේ. දිළිඳුබව අවම කිරීම සඳහා නිදහස් ශ්‍රී ලංකාවේ එතෙක් - මෙතෙක් බලයට පැමිණි විවිධ රජයන් විසින් විවිධ ක්‍රියාමර්ග අනුගමනය කර තිබෙන අතර, එහි ප්‍රතිඵල වශයෙන් පසුගිය දශක කිහිපය තුළ ජාතික මට්ටමෙන් දිළිඳුබව අවම වීමේ සැළකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

රට තුළ තවදුරටත් පවත්නා දිළිඳු ජන ප්‍රතිශතය අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සඳහා 2017 වර්ෂය දිළිඳුකම තුරන් කිරීමේ වර්ෂය ලෙස ප්‍රකාශයට පත්කරන ලදි. තිරසාර සංවර්ධන අභිමාර්ථ යටතේ වසර 2030 වන විට දිළිඳුකම සම්පූර්ණයෙන්ම පිටුදැකීමේ ඉලක්කය සාධනය කර ගැනීමට අවශ්‍ය වන ක්‍රියාමාර්ග බලගැන්වීම මෙහි අරමුණ වී තිබේ. වර්තමාන රජය විසින්ද මෙම වැඩපිළිවෙළ තවදුරටත් ශක්තිමත් ව පවත්වාගෙන යැමට සිය "සෞභාගයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ද විශේෂ අවධානයක් යොමුකර තිබේ. දිළිඳු පවුල්වල ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය එහි එක් ප්‍රධාන ක්‍රියාමර්ගයක් වන අතර අනෙක් ක්‍රියාමාර්ගය වන්නේ සමාජ ආරක්ෂණ ක්‍රම ශක්තිමත් කිරීම තුළින් දිළිඳු පවුල්වල සුභසාධනය ඉහළනැංවීම ය.


1996 වර්ෂයේදී, මෙරට සියයට 28.8ක් ලෙස පැවැති දිළිඳු ජන අනුපාතය 2013 වර්ෂයේදී සියයට 6.7 දක්වා අඩු වී තිබුණි. 2017 වර්ෂය වන විට තවදුරටත් එම අගය සියයට 4.1 දක්වා අඩුවී ඇත. එහෙත් ශ්‍රී ලංකාව තුළ මෙලෙස ජාතික මට්ටමෙන් දිළිඳු ජන අනුපාතය පහත වැටී තිබුණ ද, පළාත් හා දිස්ත්‍රික් මට්ටමෙන් මෙන්ම සමාජයේ විවිධ අංශවල දැකිය හැකි විෂමතා හේතුවෙන් රටේ ආර්ථික වර්ධනය මෙන්ම එම ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සැමට සාධාරණ ලෙස බෙදියැම තහවුරු කිරීම සඳහා වන රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග කඩිනම් කිරීමේ අවශ්‍යතාව දැඩිව මතුවී තිබේ.

දරිද්‍රතා මට්ටම දිස්ත්‍රික් මට්ටමෙන් සළකා බැලීමේදි අවම දරිද්‍රතා දර්ශකය වු කොළඹ දිස්ත්‍රික්කයේ දරිද්‍රතාව සියයට 0.9 සිට ඉහළම දරිද්‍රතා දර්ශකය වු මුලතිව් දිස්ත්‍රක්කයේ දරිද්‍රතාව සියයට 28.8ක් දක්වා පරාසයක පවති. දිළිඳු පුද්ගල සංඛ්‍යාව අනුව ගත්කළ මහනුවර දිස්ත්‍රික්කය සියයට 9.1ක්, රත්නපුර දිස්ත්‍රික්කය සියයට 8.6ක්, කෑගල්ල දිස්ත්‍රික්කය සියයට 7.2ක්, මඩකළපුව දිස්ත්‍රික්කය සියයට 7.2ක්, බදුල්ල දිස්ත්‍රික්කය සියයට 6.7ක්, ලෙස රටේ සමස්ථ දිළිඳු ජනගහණයෙන් වැඩි ප්‍රතිශතයකට හිමිකම් කියයි. පළාත් මට්ටමෙන් බැලීමේදි අවම දරිද්‍රතා මට්ටම වු සියයට 2.0 බස්නාහිර පළාතෙන් වාර්තා වි ඇති අතර ඌව පළාතෙන් සියයට 15ක් වු ඉහළම දරිද්‍රතා මට්ටම වාර්තා වී තිබේ.

**ජනගහණ දරිද්‍රතා දර්ශකය -අංශ අනුව**

| අංශය | 2002 | 2006/7 | 2009/10 | 2012/13 | 2016 |
|---|---|---|---|---|---|
| නාගරික | 7'9 | 6'7 | 5'3 | 2'1 | 1'9 |
| ග්‍රාමීය | 24'7 | 15'7 | 9'4 | 7'6 | 4'3 |
| වතු | 30'0 | 32'0 | 11'4 | 10'9 | 8'8 |
| ශ්‍රී ලංකාව | 22'7 | 15'2 | 8'9 | 6'7 | 4'1 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2017




ගෘහ ඒකක ආදායම් මත පදනම් වූ ගිනි සංගුණකය මගින් මනිනු ලබන ආදායම බෙදීයෑමේ විෂමතාවය පිළිබිඹු කරමින් නාගරික, ග්‍රාමීය හා වතු අංශවල ගිනි සංගුණකය පිළිවෙළින් 0.48, 0.44 හා 0.36 යන අගයන් හි පවති. 2016 වර්ෂයේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව රටේ ජනගහණයෙන් දිළිඳුම සියයට 20 සහ ධනවත්ම සියයට 20 ලබන ආදායම සමස්ත ආදායමෙන් පිළිවෙළින් සියයට 4.8ක් හා සියයට 50.8ක් වීම තුළින්

රට තුළ ආදායම බෙදීයෑමේ බරපතල බව පෙන්නුම් කෙරේ. ඉහත ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව නිල දරිද්‍රතා රේඛාවට (2016 වර්ෂය සඳහා එම අගය රු.4116 කි) පහළින් සිටින ජන සංඛ්‍යාව 843913 කි. දිළිඳු නොවන ජනතාවගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් මෙම නිල දරිද්‍රතා රේඛාවට ආසන්නයෙන්ම මදක් ඉහළින් සිටී. නිල දරිද්‍රතා රේඛාවේ අගය සියයට 10 කින් ඉහළ ගියහොත් ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 6.1ක් දක්වා ද, ඉහළ යන බවට ජන හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු කර තිබේ. මෙයින් ගම්‍ය වනුයේ මෙරට තුළ ඇතිවන ආර්ථික හා සමාජ කම්පන, ස්වභාවික විපත් වැනි හේතු නිසාවෙන් ජනහණයෙන් විශාල පිරිසක් නැවත දිළිඳු බවට ඇදවැටීමේ අවදානමක් ඇති බවයි.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳව ලෝක බැංකුව විසින් සිදුකර ඇති අධ්‍යයනයන්ට අනුව ඒ සඳහා හේතු වී ඇති සාධක කිහිපයක් පහත පරිදි පෙන්වාදිය හැකිය.

- තරුණයන් සඳහා ආදායම් ඉපැයුම් මාර්ග සීමිත වීම
- දුර බැහැර ප්‍රදේශවල ජීවත්වීම
- සමාජ ආධාරක වැඩසටහන් අකාර්යක්ෂම වීම
- කෘෂිකර්මාන්තයේ අඩු ඵලදායිතාවය
- යටිතල පහසුකම් දුර්වල වීම
- ප්‍රධාන ආදායම් මාර්ගය කෘෂිකර්මාන්තයට සම්බන්ධ වූ පවුල් ජීවත්වීම
- අධ්‍යාපන මට්ටමේ අඩුබව
- ශාරීරිකව දුර්වල වීම
- වියපත් වීම
- ඉඩම් සඳහා අයිතියක් නොමැති වීම
- මන්දපෝෂණය
- ගැටුම් නිසා අභ්‍යන්තරව අවතැන් වීම

එබැවින් ශ්‍රී ලංකාවේ අත්ත දරිද්‍රතා මට්ටම පහළ වැටී තිබුණ ද තිරසාර සාර්ව සහභාගි ආර්ථික වර්ධනයක් තුළින් දිළිඳුකම පිටුදැකීම සහතික කිරීම කෙරෙහි අභියෝග රැසක් මතුව තිබෙන බව මෙයින් පිළිබිඹු වේ. එම අභියෝග ජයගැනීම සඳහා රටේ ආදායම් නැවැත බෙදාහැරීමේ ප්‍රතිපත්ති දිළිඳු හිතවාදී වන පරිදි සැකසීම, දිළිඳු ගෘහ ඒකක සඳහා ආර්ථික අවස්ථා වර්ධනයට හා ඒවායේ තිරසර පැවැත්මට පියවර ගැනීම, විශේෂයෙන්ම කෘෂිකර්මය, මානව ප්‍රාග්ධනය, කාන්තාවන් සවිබල ගැන්වීම වැනි දිළින්දන්ට වඩා ඵලදායි ක්ෂේත්‍ර ප්‍රවර්ධනය මෙන්ම, ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය, උද්ධමනය පාලනය කිරීම වැනි ප්‍රමුඛ උපාය මාර්ග වෙත අවතිර්ණ වීමට සිදුවනු ඇත. එසේම දැනට ක්‍රියාත්මක සමෘද්ධි වැඩසටහන ඇතුලුව රාජ්‍ය අංශයේ වෙනත් සමාජ උපකාරක වැඩසටහන් වඩා හොඳින් ඉලක්කගත කිරීමේ අවශ්‍යතාවය ද මේ සමග පවතී. රජයේ මූල්‍ය ස්ථායිතාව පවත්වා ගෙන යමින් මෙම අභියෝගාත්මක කාර්යය ඉටුකිරීමට සියලු අංශවල ඵලදායිතාව නගාසිටුවීම සඳහා සැලසුම් සහගතව රජයට ඉදිරියේදී ක්‍රියා කිරීමට සිදුවනු ඇත.

<u>මූලාශ්‍ර</u>

ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2017, ශ්‍රී ලංකා මහ බැංකුව,කොළඹ, 2018.

ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තාව 2018, ශ්‍රී ලංකා මහ බැංකුව,කොළඹ, 2019.

World Bank ' 2015, Sri Lanka, A systematic Country Diagnostics, The Wold Bank Publication'

World Bank. Ending Extreme Poverty: Progress, but Uneven and Slowing (PDF)

. www.basis.wisc.edu/persistentpoverty papers.html, accessed July 2017.

https://www.cetri.be/The-World-Bank-and-its-new-Poverty?lang=fr.

*www.globalissues.org*. Causes of Poverty – Global Issues".

# 17. ලක්දිව දේව ඇදහිලි හා විශ්වාස රටේ සංවර්ධනය සඳහා බලපෑම.

එච්.එම්.ජී.කේ.නවරත්න
සංවර්ධන නිලධාරි
B.A Archaeology (Hons)

ලක්දිව දේව ඇදහිලි සංකල්පයේ මුලාරම්භය ආදීම වනචාරී මිනිසාගෙන් ආරම්භ වූ පුද පූජා චාරිත්‍රවල ආරම්භය දක්වාම දිවයන්නකි. මිනිසා දෙවියන් කෙරෙහි ඇති වූ ශ්‍රද්ධාව හා භක්තිය හා විශ්වාසය මත දෙවියන් ඇදහීමට හුරු පුරුදු වුයේ තම ජීවිතයට එදිනෙදා මුහුණදීමට සිදුවන දුෂ්කරතාවයන් තුළදී ඒවාට පිළිතුරු ලබා දෙමින්, නිරන්තරයෙන්ම තමා ළඟ දෙවියන් සිටින බව ලක්දිව සමාජයේ ජනතාව තුළ මුල්බැසගත් ප්‍රබල මතය නිසාය. භාරත අවධිය, බෞද්ධ ඉතිහාසයේ මුල් අවධිය, ප්‍රාග් බෞද්ධ අවධිය තුළත් දේව සංකල්පයේ සංවර්ධනයක් හා ව්‍යාප්තියක් දක්නට ලැබිණි.

ලක්දිව දේව සංකල්පය වර්ධනයවීමේ පසුකාලීන ප්‍රතිඵලයක් ලෙසට දෙවියන් කෙරෙහි චාරිත්‍රමය පූජෝපහාර කිරිමේ මූලික අරමුණින් දේවාල නිර්මාණය විය. සමාජ සංවර්ධනයත් සමඟ පසුකාලීනව ලක්දිව සෑම පළාතකටම හා සෑම නගරයකටම ආවේණික වූ දෙවිවරුන් මූලික කරගනිමින් දේවාල සීඝ්‍රව ව්‍යාප්ත විය.

දේව ඇදහිලි හා විශ්වාස පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එය රටේ සංවර්ධනයට කරනු ලබන යහපත් හා අයහපත් ලක්ෂණ පිළිබඳව විමර්ෂණය කිරිම මෙහිදි සිදු වේ. එය රටේ සංවර්ධනයට බාධාවක් නම් එසේ බාධාවක් වන්නට හේතු වූ සාධක කවරේදැයි විවේචනාත්මකව අධ්‍යයනය කිරීමට නියමිත ය. ලක්දිව මුල්බැසගත් දේව ඇදහිලි හා විශ්වාස රටේ සංවර්ධනයට සිදු කරන බලපෑම අධ්‍යයනය කරලීමේදී පහත එක් එක් කරුණු සැලකිල්ලට ගනිමින් ඒවා විවේචනාත්මකව අධ්‍යයනය කළ හැකි ය.

<u>යහපත් ප්‍රතිඵල</u>

- රටක් සංවර්ධනය කරා ළඟාවීමට අත්‍යාවශ්‍යය සාධකයක් ලෙසින් මුදල් හා තාක්ෂණය හැඳින්විය හැකි ය. ඕනෑම රටක් සංවර්ධනය කරා ලඟා වීමට ප්‍රබල බලපෑමක් දේව ඇදහිලි හා විශ්වාස ඇති නොකරයි. එම නිසා මෙමගින් ප්‍රබල බලපෑමක් ඇති නොවන බවට නිගමනය කළ හැකිය.
- රටක සංවර්ධනය කරා ලඟාවීමට සංචාරක ව්‍යාපාරය මහත් රුකුලක් වේ. නිදසුන් ලෙස ශ්‍රී දළදා මාළිගය, අලුත්නුවර දැඩිමුණ්ඩ දේවාලය, ඇම්බැක්ක දේවාලය, රත්නපුර සුමන සමන් දේවාලය හඳුනා ගත හැකි ය. මෙමගින් දෙස් විදෙස් සංචාරකයින් පැමිණීම නිසා රටේ සංවර්ධන කටයුතු සඳහා එම මුදල් වැය කළ හැකි ය.

- සමාජ සාරධර්ම ආරක්ෂා වීමට මහත් රුකුලක් වේ. එනම් අයහපත් ක්‍රියාවන්වලට පෙළඹීම මෙයින් වැළැක් වේ.
- දූෂණ වංචා වලින් තොර වීම.
- සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා වීම

## අයහපත් ප්‍රතිඵල

- රටක යම්කිසි මාර්ගයක්/ ගොඩනැගිල්ලක් රජය මැදැහත් වී රටේ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී රජයට අයත් ඉඩම් වපසරිය තුළ එම ග්‍රාමීය ජනතාවගේ සමාජීය ජීවිතය තුළ මුල් බැසගත් දේව විශ්වාසය සහිත දේවාලයක් ඉදි කර තිබුන ද, එම ස්ථානයේම රටේ ග්‍රාමීය මට්ටමින් සංවර්ධන ක්‍රියාදාමයක් ක්‍රියාත්මක වුවහොත් එම ස්ථානය කැඩීමට හා විනාශ කිරීමට එම ජනතාව අකමැති වේ. එම නිසා එම ප්‍රතිපත්තියට අනුව එය ක්‍රියාත්මක කිරිමට බාධා ඇති වේ.
- රට පුරා වර්ෂයකට සීඝ්‍රව දේවස්ථාන නිර්මාණ වන නිසා රට තුළ පවතින රාජ්‍ය භූමියේ ඉඩකඩ සීමා වීම.
- ජනගහනයේ සීඝ්‍ර වර්ධනය නිසා අවශ්‍යතා සංකීර්ණ වන නිසා රටේ සංවර්ධන කටයුතු වලට බාධා වීම.
- යම් කිසි ග්‍රාමයක් තුළ මහාමාර්ගයක් අසළ හෝ මධ්‍යයේ ආදීකාලයේ සිටම වන්දනාමාන කරන ලද බෝධි වෘක්ෂයක්, දේව ගෘහයක් පැවතුණහොත් එම ප්‍රදේශයේ ජනතාව මෙය ඉවත් කරලීමට අකමැති වේ. එම නිසා වාහන ගමනාගමනයට දුෂ්කරතා ඇති වීම. මෙයට නිදසුන් ලෙස
  දඹුල්ල - නාමල් උයන මාර්ගයේ රණව රජමහා විහාරයේ පැවති ඓතිහාසික ගල්කණුව මාර්ගයේ මධ්‍යයේ පිහිටි නිසා මාර්ගය පටු වන හෙයින් වාහන තදබදයක් ද දැක ගත හැකි ය.





- යම් කිසි රාජ්‍ය බෝධි වෘක්ෂ යනාදිය භූමිය තුළ සීඝ්‍රව ව්‍යාප්තව පවතින ලද හෙයින් එම භූමිය වර්තමානයේ ක්‍රියාත්මක වන ගෙවතු වගා වැනි සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. එම නිසා එමගින් රටට ලැබෙන ආදායම නැති වී ආර්ථික තත්වය ද බිඳ වැටීමට ලක් වේ.
- භූමිය ඵලදායි ලෙස යොදා ගැනීමට නොහැකි වීම.
- සාමූහිකත්වය හා සුහදතාවය නොමැති වී යාමද සිදුවේ. ඇතැම් පිරිස් දේව ඇදහිලි හා විශ්වාස තරයේ පිළිපදින අතරම නමුත් තව පිරිසක් මේවා නොසලකා හරී. මෙමඟින් සමාජ ගට්ටනයන් නිර්මාණය වී සාමූහිකත්වය හා සුහදතාවය නැති වී යාමට පුලුවන.
- ඉපැරණි කාලයේ සිටම ආදීතම මානවයන් විසින් විවිධ දේව වන්දනාමාන කිරීමට දේව ගෘහ, වෙහෙර විහාර, කෝවිල් වැනි ගොඩනැගිලි ඉදිකිරීමට විශාල මුදලක් හා පරිශ්‍රමයක් වැය වන බැවින් එමගින් රටේ

සංවර්ධන කටයුතු වලට එම මුදල් යෙදවීමට ඇති හැකියාව අඩු වීම සිදුවේ. වෙනත් සංවර්ධන කටයුතු කිරීමට ඇති මුදල් එමගින් අනවශ්‍යය පරිදි වියදම් වේ.

- යම් ස්ථානවල ආරක්ෂාව හා වන්දනාමාන කිරිම මෙන්ම සැදැහැවතුන් නැරඹීම සඳහා විශාල භූමි පරාසයක් වෙන් කරලීම හේතුවෙන් එම නිසා වෙනත් සංවර්ධන කටයුත්තක් කිරිමට නොහැකි වීම.
- ආදීකාලයේ සිටම පැවත එන මිත්‍යාමත නිසා විශාල මුදලක් වියදම් කරගනිමින් ඉතා දුර බැහැර සිටින වන්දනාකරුවන් පැමිණේ. මෙමගින් කාලය මෙන්ම මුදල ද ඉතාමත් විනාශයට පත් වේ. රටේ සංවර්ධන කටයුත්තකට යොමු විය හැකි කාලය හා මුදල් එමගින් විනාශ වී යයි.
- නූතන තාක්ෂණික ඥානය හා නව ශිෂ්ටාචාරයේ විවිධ පහසුකම් වන වෛද්‍ය විද්‍යාව වැනි පහසුකම් හැරදමා මිත්‍යාමත වෙත හඹා යාම.
- පරිසර විනාශයක් සිදු වීම.
- මිත්‍යා විශ්වාස වෙත අනවශ්‍යය අයුරින් හඹා යාම.

මෙම කරුණු අධ්‍යයනය කර ලක්දිව දේව විශ්වාස හා ඇදහිලි රටේ සංවර්ධනයට බාධාවක් බව විවේචනාත්මකව අධ්‍යයනය කළ හැකි ය. නමුත් අතලොස්සක් පමණ අදටත් දේව වන්දනාමාන කිරීමට පෙළඹී ඇති බව හඳුනා ගත හැකි ය.

# 18. සෞභාග්‍යමත් රටක් සඳහා අධ්‍යාපනයේ වැදගත්කම.

පී.බී.ඩී.වැත්තැව
සංවර්ධන නිලධාරි
*Bsc. (Busness Admin)*

**අධ්‍යාපනය යනු**

නූතනයේ වැඩිම වටිනාකමක් ලබා දෙන දේවල් අතර ප්‍රමුඛම දෙයක් බවට පත්වීමට අධ්‍යාපනයට හැකි වී ඇත. අධ්‍යාපනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය. එනම්

1. විධිමත් අධ්‍යාපනය
2. අවිධිමත් අධ්‍යාපනය

විධිමත් අධ්‍යාපනය යනු නිශ්චිත ඉලක්ක තබා ගෙන නිශ්චිත රාමුවක් යටතේ නිශ්චිත කාලයක් තුළ ලබා දෙනු ලබන අධ්‍යාපනයයි. නමුත් අවිධිමත් අධ්‍යාපනය යනු එහිම විරුද්ධ අධ්‍යාපන ක්‍රමයයි.

අධ්‍යාපනය යනු කුමක් ද? යන ප්‍රශ්නයට නූතනයේ දෙනු ලබන පිළිතුර වන්නේ

1. දැනුම
2. ආකල්ප
3. කුසලතා

වර්ධනය කිරිම සඳහා දෙනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයකි. දැනුම යනු න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම වේ. ආකල්ප යනු යම් දෙයක්, පුද්ගලයෙක්, ප්‍රශ්නයක්, විෂයක් පිළිබඳව සිතන, පතන, දකින ආකාරයයි. එයට අනුව සිතුවලි ක්‍රියාත්මක වන අතර ආකල්ප පුද්ගලයෙක්ගේ සාර්ථකත්වය සඳහා ප්‍රබල සේවාවක් සිදු කරනු ලබයි.

කුසලතා යනු පුද්ගලයෙකුට යම් අධ්‍යාපනයක් ලැබුණු පසුව යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරිමට ඇතිවන හැකියාවයි.

කුසලතා කොටස් දෙකකට දැක්විය හැකි ය.

1. මෘදු කුසලතා
2. දෘඩ කුසලතා

දෘඩ කුසලතා යනු යම් විෂයක් ඉගෙනීම සමඟින් එයින් අපේක්ෂිත කුසලතාවයන් ය. මෘදු කුසලතා යනු එදිනෙදා ජීවිතයේදී ඉතා හොඳින් කටයුතු කිරිමට උපකාරී වන විෂය සමගාමිත්වයට වඩා ජීවිතයට සමීප වන කුසලතාවයන් ය.

පුද්ගලයෙකුට දැනුම, ආකල්ප, කුසලතා ලබා දීම අධ්‍යාපනයේ ප්‍රමුඛ කාර්යය වේ. නමුත් අතීත අධ්‍යාපන ක්‍රමයට සාපේක්ෂව වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ මේවා ලබා දෙන ආකාරය වෙනස් කර ඇත. අතීතයේ තිබුණු සමාජයත්, තාක්ෂණයත්, ප්‍රශ්ණ වලට වඩා වර්තමානයේ පවතින තාක්ෂණය, ප්‍රශ්න, පුද්ගලයන් සිතන පතන ආකාරයත් වෙනස් වී ඇත. ඊට සමගාමීව අධ්‍යාපනය ක්‍රමය වෙනස් වී ඇත. නමුත් අධ්‍යාපන ක්‍රමයේ වෙනස්විය යුතු සියුම් තැන් ද පවති.

**ශ්‍රී ලංකාවේ දැනට පවතින අධ්‍යාපන ක්‍රමය.**

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින අධ්‍යාපන ක්‍රමය හෙවත් විධිමත් අධ්‍යාපන ක්‍රමය ආරම්භ වන්නේ පෙරපාසල් අධ්‍යාපන ක්‍රමයත් සමඟ ය. පෙරපාසල තුළ බෙදා හදා ගැනීම, නැටුම්, ගැයුම්, භාෂාව, ගණිතය, විනය හා කණ්ඩායම් ක්‍රියාකාරකම් මෙන්ම ක්‍රීඩාවන් ද උගන්වනු ලබයි. ලංකාවේ බහුතරයක් පෙරපාසල් ගුරුවරු පුහුණු වු ගුරුවරුන් වන අතර දරුවන්ගේ ආදරය දිනා ගනිමින් අධ්‍යාපනය ලබා දීමේ නිරත වේ.

පෙරපාසල් අධ්‍යාපනයෙන් පසුව සිසුවා පාසල් අධ්‍යාපනයට යොමු වේ. පෙරපාසලට වඩා පාසල් අධ්‍යාපනය සංකීර්ණ වේ. වසරින් වසරට අධ්‍යනය කළ යුතු විෂය සීමාව පුළුල් වේ. පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන කඩයිම් විභාග තුනක් පවති.

එනම් 05 වසර ශිෂ්‍යත්ව විභාගය, 11 වසර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය, අවසානයේ උසස් පෙළ විභාගය. මෙම කඩයිම් විභාග ඉතා තරඟකාරී වන අතර එම විභාග සියල්ලේම වාසි, අවාසි ඇත. උසස් අධ්‍යාපනය සඳහා පාසල් වෙත යන සිසුන්ට විෂය සමගාමී අධ්‍යාපනයක් මෙන්ම බාහිර ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් අධ්‍යාපනයක් හිමි වේ. ශ්‍රී ලංකාවේ දැනට පවතින පාසල් 10167 තුළම අඩු වැඩි වශයෙන් ක්‍රියාකාරකම් හා ක්‍රිඩා කටයුතු සිදු කරන අතර ඒවා තුළින් සාර්ථක, සමබර පෞරුෂයක් ගොඩ නැගීමට හේතු වේ. පාසල් අධ්‍යාපනයෙන් පසුව පිරිසක් විශ්ව විද්‍යාල අධ්‍යාපනයට යොමු වන අතර සමහරුන් වෘත්තිය අධ්‍යාපනයට යොමු වේ. සමහරුන් අධ්‍යාපනයට සමු දී රැකියා සඳහා යොමු වේ. මෙම කුමන විකල්පය තෝරා ගත්තත් අධ්‍යාපනය ඉන් සීමා නොවේ. ශ්‍රී ලංකාව තුළ පවතින ඉහළම තරඟකාරී විභාගය වන උසස් පෙළ සමත් සිසුන් අතරින් සීමිත සිසුන් ප්‍රමාණයකට පමණක් විශ්ව විද්‍යාල තුළ තම අධ්‍යයන කටයුතු සිදු කිරිමට අවස්ථාව හිමි වේ. ඔවුන්ට සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක් හැදෑරීමට අවස්ථාව හිමි වන අතර අනෙක් සිසුන්ගෙන් පිරිසක් විවෘත විශ්ව විද්‍යාලයේ උපාධි හැදෑරීම සඳහා උත්සාහ කරන අතර බාහිර උපාධි හා වෙනත් පෞද්ගලික විශ්ව විද්‍යාල වල උපාධි සඳහා තවත් පිරිසක් උත්සාහ දරයි. එමෙන්ම සමහරක් පිරිස අධ්‍යාපන කටයුතු සඳහා විදේශගත වේ. විශ්ව විද්‍යාල වරම් අහිමි පිරිසගෙන් කොටසක් වෘත්තිය අධ්‍යාපනයට යොමු වන අතර ඔවුන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තම අධ්‍යන කටයුතු සිදු කරයි. ලංකාව තුළ හා පිටරට වෘත්තිය අධ්‍යාපනක් ලත් පිරිසට හොඳ ඉල්ලුමක් පවති.

පාසල් අධ්‍යාපන සම්පූර්ණ කිරිමට හැකි වන්නේ සීමිත පිරිසකට පමණක් වන අතර අතරමඟ බොහෝ පිරිසක් පාසල් අධ්‍යාපනයට සමු දෙයි. මෙය කාලීන ප්‍රශ්නයක් වන අතර එයට ප්‍රධානම හේතුව ලෙස දකින්නේ ලංකාව තුළ පවතින තරකාරී විභාග ක්‍රියාවලිය වේ. මීට අමතර දහම් පාසල් හා පිරිවෙන් තුළින් අධ්‍යාපනය ලබා දෙන අතර එයින් වැදගත් සේවයක් රටට සිදු වේ.

**සෑම දෙනාටම එකම අධ්‍යාපන ක්‍රමයක් ගැලපෙනවා ද?**

මිනිසුන් විවිධ වේ. ඔවුන් ඉගෙනගන්නා විෂයන් ද විවිධ වේ. ඔවුන් ඉගෙන ගන්නා ක්‍රමයන් ද විවිධ වේ. නමුත් අපේ රටේ අධ්‍යාපන ක්‍රමය සියළු දෙනාටම එකම විදිහට ඉගැන්වීම් කරන අධ්‍යාපන ක්‍රමයකි. එම නිසා බොහෝ සිසුන්ට අධ්‍යාපන ක්‍රමයේ අවාසි සහගත බලපෑමක් සිදු වේ. නමුත් පවතින ක්‍රමය තුළින දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය සිදු කරන බව පිළිගත යුතු ය. එමෙන්ම ලංකාව තුළ සියළු විෂයන් සඳහා ප්‍රවීණයන් ලංකාව තුළම බිහි වි ඇත. එම නිසා අධ්‍යාපන ක්‍රමය 100%ක් අසාර්ථක එකක් යැයි නිගමනය කිරිම ද කළ නොහැක්කකි.

# 19. ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරයේ ආරම්භය, ව්‍යාප්තිය හා වර්තමාන ක්‍රියාකාරිත්වය.

එච්.බී.අයි.ඒ. චන්ද්‍රසිරි
සංවර්ධන නිලධාරි
*Bsc. (Science)*

සමූපකාරය පිළිබඳ සංකල්පය මෙරට ජන ජීවිතයේ අස්සක් මුල්ලක් නැර ප්‍රචලිත වූයේ මෙයට දශක කිහිපයකට පෙර සිටය. අන්‍යොන්‍යාධාරය හා ආත්මෝපකාරය මත පදනම් වූ මෙම ව්‍යාපාරය මෙරට ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයේ සැලකිය යුතු වෙනස්කම් ඇතිකිරීමට සමත් වී ඇත. මහජනතාව මගින් මහජනතාව උදෙසා මහජනතාවගෙන් පාලනයක් ක්‍රියාත්මක වීමේ පරමාර්ථය සමූපකාර සංකල්පයේ රැඳී තිබීම ව්‍යාපාරය මෙතෙක් නොනැසී පැවතීමට හේතුවකි.

යුරෝපා රටවල මෙන් ලංකාවේද මුල්ම සමූපකාර සමිතිය ආරම්භ වූයේ උගත් නායකත්වයන්ගෙනි. එහෙත් එම නායකත්වයෙහි බටහිර රටවල සමූපකාර නායකත්වයෙහි දක්නට ලැබුණු දූරදක්නා නුවණ, පරිත්‍යාගශිලිත්වය, අප්‍රතිහත ධෛර්ය නොතිබුණි. අනුකරණය විනා බටහිර නායකයන් කෙරෙහි වූ සංවිධාන ශක්තිය ලාංකික සමූපකාර නායකයන් ළඟ නොතිබුනි.

ලංකාවේ සමූපකාර සමිති ඇරඹීමට ප්‍රථම ගොවියාගේ තත්වය පිළිබඳව සොයා බැලීමට පත්කල කාරක සභාව ඉදිරිපිට සාක්ෂි දීම සඳහා පෙනී සිටි අය එකල ජනනායකයන් වුවද ඔවුන් තුල ගැමි සමාජයේ ආර්ථික හෝ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ හැගීමක් නොතිබූ බව පෙනේ. අනෙක් අතට ගැමියා පිළිබඳ සානුකම්පිත හැගීමක් පවා ඇතැමුන් අතර නොවීය. දේශීය නායකත්වය පසෙක තිබියදී ආණ්ඩුකාරයාගේ උවමනාව නිසා ලංකාවේ සමූපකාර සමිති නීතියානුකූලව පිහිටුවන ලදි. ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය මගින් නියම නායකත්වයක් බිහි නොවීය. එයට හේතුව නිල නායකත්වය හා ජන නායකත්වය දෙයාකාර වීම නිසා ගැටුම් ඇතිවීමයි.

යුරෝපා රටවල රොච්ඩේල් සමූපකාර සමිතිය දියුණු වූයේ තරුණයන් එයට සම්බන්ධ වූ නිසාය. දියුණු පෙර අපර දෙදිග නියම නායකයන්, තරුණයන් මෙම ව්‍යාපාරයට පෙළඹවීම හා මග පෙන්වීම සිදු කරන ලදි. මෙරටට අවශ්‍යවී ඇත්තේ ව්‍යාපාරයේ ප්‍රගතියට මිස වෙනත් කිසිම බල වේගයකට නොනැමෙන ස්වාධීන නායකත්වයකි. සමූපකාරය සංස්කෘතික අංගයක් බවට පත් කළ හැක්කේ ඔවුන්ටය.

**ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරයේ ආරම්භය.**

ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ යටත් විජිත පාලන සමයේය. එය එකල යටත් විජිත ආණ්ඩුවේ අවශ්‍යතා ඉටු කර ගැනීමට පිහිටුවන ලදි. නමුත් නිදහසින් පසු බලයට පත් වූ සෑම රජයක්ම සුබසාධක හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සමූපකාර ව්‍යාපාරය උපයෝගී කර ගන්නා ලදි.

1911 දී අංක 07 දරණ ණය දෙන සමිති ආඥා පනත මගින් ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය නිල වශයෙන් ආරම්භ කරන ලදි. මෙමගින් ආරම්භ කළ හැකි වූයේ ප්‍රාථමික මට්ටමේ ණය සදන සමිති පිහිටුවීමට හා පවත්වාගෙන යාමට පමණි. එය ප්‍රමාණවත් නොවූ නිසා 1921 අංක 34 දරණ ආඥා පනතින් වෙනත් වර්ගයේ සමූපකාර සමිති පිහිටුවීමට හා පවත්වාගෙන යාමට හැකියාව ඇති කරන ලදි. 1992 (11) දරණ පනත මඟින් ව්‍යාපාරයේ ගමන් මගේ පරිවර්තනයක් සිදුවිය.

සමූපකාර ව්‍යාපාරයේ විකාශනය ප්‍රධාන යුග කීපයකින් වෙන් වෙන්ව පෙන්නා දිය හැක.

1. **ණය දෙන සමූපකාර සමිති අවධිය( 1911-1942)**
2. **පාරිභෝගික කඩ සමිති අවධිය (1942 -1947 )**
3. **ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා බෙදා හැරීමේ සමිති අවධිය ( 1947- 1956)**
4. **වි.සේ.සමූපකාර සමිති අවධිය (1957-1970)**
5. **ප්‍රතිසංවිධානයෙන් පසු අවධිය (1971- මේ දක්වා)**

**ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරයේ අරමුණු**

1. සමාජිකයන්ගේ අවශ්‍යතා පිරිමැසීම.
2. වඩා හොඳ ජීවන මාර්ගයක් සැලසීම.
3. ගොවිතැන් හා වෙනත් ව්‍යාපාර දියුණු කරගැනීමට ණය මුදල් ලබාදීම.
4. සාධාරණ මිල ගණන් යටතේ එළදාවන් මිලට ගැනීම.
5. පාරිභෝගිකයන්ට අවම මිලක් යටතේ භාණ්ඩ හා සේවා සැපයීම.
6. සුලු ආදායම් ලබන්නන්ට කොටස් වල ආයෝජනයට ඉඩ ලබාදීම.
7. සේවාවන් අවශ්‍ය අය සංවිධානය වී ඔවුනොවුන්ට සේවය කර ගැනීම.

**සමූපකාර ප්‍රතිපත්ති**

සමූපකාර ව්‍යාපාරයේ පවතින අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන නැතුවම බැරි ක්‍රියාමාර්ග සමූපකාර ප්‍රතිපත්ති වශයෙන් හැදින්විය හැක. ජාත්‍යන්තර සමූපකාර සංධානය පහත දැක්වෙන ප්‍රතිපත්ති සියලුම සමූපකාරයන් කෙරෙහි බලපාන අන්දමින් 1937 දී පිලිගනු ලැබීය.

1. විවෘත හා ස්වේච්ඡා සමාජිකත්වය
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
3. සීමාසහිත ප්‍රාග්ධන පොලිය
4. අතිරික්තය සමානව බෙදීම

ඉහත සඳහන් ප්‍රතිපත්ති වලට අමතරව තවත් ප්‍රතිපත්ති 3ක් ද ජාත්‍යන්තර සමූපකාර සංධානය විසින් පිළිගන්නා ලදි. මෙම අලුත් ප්‍රතිපත්ති තුන සෑම සමූපකාර සමිතියකටම අනිවාර්ය නොවේ. ඒවානම්

1. අත්පිට වෙළඳාම
2. දේශපාලන හා ආගමික මධ්‍යස්ථතාව
3. අධ්‍යාපනය නඟාලීම ද වේ.

නමුත් 1964 දී පත්වූ DR. D.G. Carway මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් කොමිසමේ නිර්දේශ මත සමූපකාර ප්‍රතිපත්ති වශයෙන් ජාත්‍යන්තර සමූපකාර සන්ධානය පහත කරුණු පිළිගන්නා ලදි.

1. විවෘත හා ස්වේච්ඡා සාමාජිකත්වය
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
3. සීමාසහිත ප්‍රාග්ධන පොලිය
4. සම අතිරික්ත බෙදුම
5. සමූපකාර අධ්‍යාපනය
6. සමූපකාර සමිති අතර සහයෝගය

**සමූපකාර ආයතන හා විවිධ සංවිධාන ක්‍රම.**

ලංකාවේ සමූපකාර ආයතනය හා බැඳෙන විවිධ සංවිධාන ක්‍රම මොනවාදැයි බලමු. මේවා ජනතාවගේ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට සහාය වන සංවිධාන වේ.

1. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
2. පොල්ගොල්ල සමූපකාර අභ්‍යාස විද්‍යාලය
3. ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලය
4. සමූපකාර සංවර්ධන මණ්ඩලය
5. සමූපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානය
6. ශ්‍රී ලංකා සමූපකාර කර්මාන්ත සංගමය
7. ශ්‍රී ලංකා සමූපකාර පොල් සංගමය
8. ශ්‍රී ලංකා රබර් සංගමය
9. ධීවර සමිති සමාගම
10. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
11. සමූපකාර බැංකු

**සමූපකාර ව්‍යාපාරය වර්තමානයේ මුහුණ දෙන ගැටලු**

- සමිතියේ අභ්‍යන්තර පාලන කටයුතු වලදී දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛන, කාරක නියෝග, අතුරු ව්‍යවස්ථා යනාදිය අධ්‍යක්ෂක මණ්ඩලයේ හෝ විධායක මණ්ඩලයේ නිලධාරින් සැලකිල්ලට නොගෙන කටයුතු කිරීම. සමිතිවල උන්නතිය ගැන කිසිම හැඟීමකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩලය හා විධායක නිළධාරීන් කටයුතු කිරීම. සමූපකාර සමිතිය විසින් පවත්වාගෙන යන ව්‍යාපාරික අංශ වල අභ්‍යන්තර පාලනයක් සිදු නොකිරීම. කාරක නියෝගවල සඳහන් පරිදි අනුකම්ටු රැස්වීම් පැවැත්වීම, අය වැය ලේඛනයක් මගින් සමිතියේ වියදම් පාලනය නොකිරීම, කාරක නියෝග අනුව ටෙන්ඩර් කැඳවීම ආදිය නිසිලෙස නොපැවැත්වීම.

- දෙපාර්තමේන්තු උපදෙස් පරිදි විශාල බඩු අඩුවීම් ඇති කළමනාකරුවන් සම්බන්ධයෙන් සුදුසු තීරණ අවස්ථානුකූලව නොගැනීම.

- වෙළදාම, ගිණුම් පිළියෙල කරන සෑම අවස්ථාවකම බඩු අඩුවීමේ ගිණුමක් පිළියෙල කල යුතු නමුත් සමහර අංශවල එවැනි ගිණුමක් කිසිම අවස්ථාවක පිළියෙල කර නොතිබීම අභ්‍යන්තර පාලනයේ විශේෂ දුර්වලකමකි. නිදසුනක් වශයෙන් සුළු තේ වතු හිමියන්ගෙන් දළු මිලදී ගෙන රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු වලට තේ දළු අලවිකර ඇත. මෙම තේ දළු කොපමණ භාර ගත්තාද රාජ්‍ය සංස්ථාවට කොපමණ භාර දුන්නාද කියා පෙන්වා දීම සඳහා කිසිම ලේඛනයක් සමිතියේ තබා නොතිබිණි.

- මෙම සමූපකාර සමිති විසින් පවත්වාගෙන යන ආපන ශාලාවල පරිපාලන සහ ගිණුම් තැබීම ඉතාම දුර්වල තත්වයක පැවතී. විශේෂයෙන් ආපනශාලා වල කෑම නිෂ්පාදනයේදී ඒ ඒ ද්‍රව්‍ය වලින් නිෂ්පාදනය කළ යුතු ප්‍රමාණයන් නියමකර ප්‍රමිතියක් දී නොමැතිකමින් කළමනාකරුවන්ට වුවමනා පරිදි මෙම ආපනශාලා පාලනය කර ඇත. ආපනශාලාවල නිෂ්පාදන සඳහා බඩු මිලදී ගැනිම කළමනාකරු විසින් කර ඇති අතර එමගින් නොයෙකුත් අක්‍රමිකතා ඇතිවීමට ඉඩ සලසා ඇත. මෙම මිලදී ගැනීම් සඳහා සියලු ගෙවීම් නිත්‍යානුකූලව වැරදි යැයි සනාථ කිරීමට කරුණු නැත්තේ ඒ සියල්ල විධායක නිලධාරින් සූක්ෂම ආකාරයෙන් සිදු කරන බැවිනි.

- සමූපකාර සමිතිවල සේවකයන් ලබා ගන්නා ලද අත්තිකාරම් නොපියවා නැවතත් අත්තිකාරම් ලබා දි ඇත. සමිතියේ අත්තිකාරම් මුදල් පියවා ඇත්තේ ව්‍යාජ බිල්පත් වලිනි.

- එමෙන්ම විකිණිය නොහැකි ඉතිරි බඩු තොග ලක්ෂ ගණනින් මෙම සමිති තුල රැදී ඇත. මේවා නොවිකිණීමට හේතුව අධික මිල ගණන් වලට බඩු මිලදී ගැනීමත් භාණ්ඩ වල තත්වය බාල නිසා

බව දැක්වේ. මේවා අලෙවි කල හැකි මිලකට මිල නියමකර විකිණීම කළ යුතු නමුත් ඒ සම්බන්ධයෙන් සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය හෝ විධායක නිලධාරීන් අවශ්‍ය කටයුතු කර නැත.

- ❖ තවද ව්‍යාපාරික අංශ සහ සමිතියේ ප්‍රධාන කාර්යාලයට අනුකූලව සුදුසු සේවක සංඛ්‍යාවක් තබා නොගැනීම හා සමිතියේ ක්‍රියාකාරීත්වයට සුදුසු නොවන සේවක සංඛ්‍යාවක් සිටින බව දැන දැනත් ලිපිකරු හා වෙනත් තනතුරු වලට සේවකයන් බඳවා ගෙන ඇත. සමහර සේවකයන්ට වැටුප් ගෙවා ඇතත් සමූපකාර සේවක කොමිෂන් සභාවෙන් හෝ අධ්‍යක්ෂක මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගෙන නොමැත. එමෙන්ම ගබඩාවල සේවය කරන තාවකාලික සේවකයන් ගණන සඳහන් කර නොමැත. සේවකයන් පාලන කටයුතු භාරව කටයුතු කරන පුද්ගලයාට ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොතිබීම හා සමිතියේ ලාභාංශ අතිරික්ත සේවකයන් වෙනුවෙන් වැය කිරීම මෙන්ම සේවකයන්ගේ අතිරික්තය නිසා ඔවුන් විසින් තම තමන්ට හිමි කාර්යය කොටස් පැහැර හැරීමද සිදුවේ.

- ❖ ග්‍රාමීය බැංකු අංශය ණය නොදීමට තීරණය කිරීම හා තැන්පතු පමණක් ලබා ගැනීම නිසා ඒවාට ලබාදෙන පොලිය උපයා ගැනීමට නොහැකි වීම.

- ❖ සමූපකාර ව්‍යාපාරය අද ඉතා දැඩි තරගකාරී ස්වරූපයකට මුහුණ පා සිටී. සමූපකාර වලින් පමණක් බෙදා හරින ලද සියලුම භාණ්ඩ පෞද්ගලික වෙළෙඳ ආයතන මගින්ද බෙදාහැරීමට කටයුතු කරයි. එමෙන්ම සලාක ක්‍රමය අහෝසිකර කූට උපක්‍රම වලින් ලාභ ලැබීමට උත්සාහ දරණ පෞද්ගලික වෙළඳ ව්‍යාපාර සමග ව්‍යාපාරය ඉදිරියට ගෙන යන අතරම මහජන සේවයක්ද සැලසීමට සමූපකාර ව්‍යාපාර වලට දැඩි තරඟයක යෙදීමට සිදුවී ඇත.

- ❖ මෙසේ තරඟකාරී ලෙස කටයුතු කිරීමට උසස් ශිල්පීය දැනුමකින් යුත් දක්ෂ කළමනාකරුවන්ගේ සේවය ලබා ගැනීමට සමූපකාර ව්‍යාපාරය අසමත් වි ඇත. එසේ දැනුම සහිත දක්ෂ කලමනාකරුවන්ගේ සේවය ලබා ගැනීමේ අවස්ථාව සමූපකාර සමිතියට අහිමි වී ඇත්තේ අඩු වැටුප් මට්ටම නිසාය. ඒ ඒ අංශ පිළිබඳ විශේෂ දැනුමක් සහිත නිලධාරීන් ලංකාවේ සමූපකාරය තුල නොමැත. නවීන වෙළෙඳපොළ, පර්යේෂණ ක්‍රම, ගිණුම් තැබීමේ ක්‍රම, පිරිස් කළමනාකරණය පිළිබඳව ඔවුන්ට ඇති දැනුම අල්පය. එම නිසා කාර්යක්ෂම කළමනාකරණයක් සමූපකාර සමිතියේ ක්‍රියාකාරීත්වයෙහි දැකිය නොහැකිය. පාරිභෝගික අවශ්‍යතාවයන් පිළිබඳව හා ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳවත් අවබෝධ කරගැනීමට කළමනාකරුවන් අසමත් වී ඇත. අඩු වැටුප් ගෙවීමක් සිදුවන හෙයින් උගත් යැයි කිව හැකි සෑම සමූපකාර සේවකයකුම උත්සාහ කරන්නේ වෙනත් රැකියාවක් සොයා ගෙන යාමටය.

- ❖ එසේම පිරිවැය හෝ කළමනාකරණය, ගණකාධිකරණය පිළිබඳ ඔවුන් තුල දැනීමක් නොමැත. ඔවුන් පිළියෙල කරන හා පරීක්ෂා කරන ගිණුම් කට්ටල නිවැරදි බවෙන් තොරය. මේ නිසා සමූපකාර සමිතියේ වාර්ෂික ගිණුම් වලින් පෙන්නුම් කරනුයේ වැරදි තොරතුරුය. එම ගිණුම් මත ගන්නා තීරණ නිසා සමූපකාර ව්‍යාපාරයට වන්නේ හානියකි. උදාහරණයක් ලෙස සමූපකාර සමිති මගින් දේශීය ආදායම්

දෙපාර්තමේන්තුවට වාර්ෂිකව ගෙවනු ලබන විශාල ආදායම් බදු ප්‍රමාණය එසේ ගෙවීමට සිදුවනුයේ ගිණුම් පිළියෙල කරන පරීක්ෂකවරුන්ගේ වරදිනි.

❖ සේවකයන්ට වැටුප් ගෙවීමට පවා මුදල් නොමැති සමිතියක පිළියෙල කරන ගිණුම්වල වාර්ෂික ශුද්ධ ලාභය රුපියල් කෝටි ගණනින් දක්වා තිබේ. මෙම ගිණුම් වාර්තා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට යැවූ විට එම ගිණුම් අනුව සමිතියට වාර්ෂිකව ලක්ෂ 5ක් පමණ ආදායම් බදු වශයෙන් ගෙවීමට සිදුවේ. මෙම තත්ත්වය සමූපකාර සමිතියට සුභ පණිවිඩයක් නොවේ. මේවා ඉහල කළමනාකාරීත්වයේ දුර්වලතාවන්ය.

❖ ප්‍රාදේශීය කළමනාකරුවන්ට භාණ්ඩ සමිතිය මගින් නියම කරන මිල ගණන් වලට අලෙවි කිරීමට උපදෙස් ලබාදේ. සමහර භාණ්ඩ වල මුළු ප්‍රමාණයම එකම මිලකට අලෙවි කිරීම අපහසු වේ. එවැනි අවස්ථා කිහිපයක් සළකා බලමු. සමිතිය විසින් ගෙනෙනු ලබන භාණ්ඩ අලෙවිය සඳහා යොමු කරන්නේ ප්‍රවාහන හා අනෙකුත් වියදම් ද සලකා බලමිනි. නියම කරනු ලබන මිල මට්ටම පොදු වෙළෙඳපොළෙත් පෞද්ගලික වෙළෙඳසැලෙවල එම භාණ්ඩ අලෙවි කරන මිල ගණන් වලට වඩා ඉහළ වනු ඇත. එවිට රජය විසින් නොමිලේ මුද්දර ක්‍රම මගින් දෙනු ලබන ප්‍රමාණයට අමතරව එම නියම කළ මිලට භාණ්ඩ ලබා නොගනී. එම තත්ත්වය භාණ්ඩ ගෙන ඒමේදී ඉහල කළමනාකාරීත්වය විසින් සැලකිල්ලට ගත යුතුයි. එහි පවතින දුබලතාව හේතුවෙන් ප්‍රාදේශික මගින් ඉවත් කරනු ලබන අපතය අධික වේ. සමිතිය ලබන ලාභය අවම වේ.

❖ ප්‍රාදේශික මඟින් අලෙවි කරනු ලබන අර්තාපල්, රතුලූණු, කරවල වැනි ද්‍රව්‍ය විකිණීගෙන යන විට අවසානයට ඉතිරි වන කොටස් මුල් තොගය තරම් ඉතාමත් හොද තත්වයේ නොපවති. එවිට පෞද්ගලික වෙළෙන්දා උපරිම ලාභයක් ලැබෙන පරිදි හොද භාණ්ඩ තොගය ඉහල මිලටත් අවසන් තොගය අඩු මිලටත් විකුණා ලාභය උපරිම කර ගන්නා අතරම නාස්ති වී යන ද්‍රව්‍ය ප්‍රමාණයත් අලාභයත් අවම කර ගැනීමට කටයුතු කරයි.

❖ එහෙත් ප්‍රාදේශික කළමනාකරුවන්ට මෙවැනි නිදහසක් ලබා දී නොමැත. වෙළෙඳපොළේ මොන අන්දමේ මිල උච්චාවචනයක් වුවද ඔවුන්ට මිල ගණන් සංශෝධනය කළ නොහැකිය. ප්‍රධාන කාර්යාලයෙන් නිලධාරියකු පැමිණ එවැනි භාණ්ඩ තොගවලට සුදුසු පියවරක් ගැනීමට උපදෙස් දෙන තුරු ඔවුන්ට ගත හැකි පියවරක් නොමැත. අඩුම තරමින් එසේ තත්වයෙන් පහත වැටෙන ද්‍රව්‍ය එම වර්ගයේ හොද තත්වයේ තිබෙන ද්‍රව්‍යයන් හා පොදුවේ අලෙවි කිරීමට තරම්වත් ප්‍රාදේශීය කළමනාකරුවන්ට අවබෝධයක් නොමැත. එය කළමනාකරුවන්ට ලබාදී ඇති කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික අධ්‍යාපනයේ ඇති අඩුපාඩුවකි.

❖ එසේම භාණ්ඩවල මිල ගණන් හිටි ගමන් වෙළෙඳපොළේ උස් පහත් වේ. එම මිල ඉහළ ගිය අවස්ථාවේ එම භාණ්ඩ වැඩි මිලට විකුණා ලාභය උපරිම කිරීමට ප්‍රාදේශික කළමනාකරුට අවසර නැත. ප්‍රධාන කාර්යාලයෙන් නිලධාරියකු පැමිණ මිල ගණන් සංශෝධනය කරන විට එම මිල වැඩිවූ භාණ්ඩය පරණ මිලටම විකිණී අවසාන විය හැක. නැති නම් ඒ වන විට නැවත මිල අඩුවීමක් සිදුවී තිබිය හැක. කළමනාකරණ ක්ෂේත්‍රයේ පවතින තීරණ ගැනීමේ ක්ෂණික බව හා තීරන ගැනීමේ දක්ෂතාව සමූපකාර කළමනාකරණ ක්ෂේත්‍රයේ නොමැත.

❖ කළමනාකරණයේ දක්ෂතාව මොට කරන තවත් අවස්ථාවක් නම් සමූපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා 60V යටතේ සමූපකාර සමිතියේ සාමාන්‍යාධිකාරිවරයකු පත් කර ගැනීමයි. ඔහු සමිතියේ ප්‍රධාන විධායක නිළධාරියාය. සමිතියේ කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යාම ගැන ඔහු අධ්‍යක්ෂක මණ්ඩලයට වගකිව යුතුයි.

❖ එහෙත් අද සමූපකාර සමිති ක්‍රියාත්මක වන තත්වය වෙනස්ය. ප්‍රධාන විධායක නිලධාරි වන්නේ සභාපති හෝ උප සභාපති ය. මොවුන් එවකට බලයේ පවතින රජයේ දේශපාලන නියෝජිතයෝය. පළාතේ මන්ත්‍රීවරයා තම රජයේ බලය එම සමූපකාර සමිතියේ තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂකවරුන් නම්කර කොමසාරිස් වෙත යවයි. එම නිසා සමූපකාර සමිතිවල ක්‍රියාත්මක වනුයේ එවකට බලයෙහි සිටින රජයේ සහචරයන්ගේ අදහස්ය. එවිට සාමාන්‍යාධිකාරිවරයා කළමනාකරණයෙහි කෙතරම් දක්ෂ පුද්ගලයකු වුවද ඔහුට තම ස්වාධීන අදහස් ක්‍රියාත්මක කිරීමට මෙම දේශපාලන නියෝජිතයෝ අවස්ථාව නොදෙයි. මේ නිසා සාර්ථක කළමනාකාරීත්වයක් සමිතිය තුල ඇති නොවේ.

❖ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලදී සමූපකාර සමිතියේ අධක්ෂක මණ්ඩලයේ සිට පහළට වගකීම් පැවරීමක් ඇත්තේම නැත. සියලු විධායක තීරණ අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමෙන් ගැනීමක්ද නැත. බොහෝ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලදී දවසේ න්‍යාය පත්‍රය හමාර නොවන අතර ක්ෂණික තීරණ උදෙසා බාහිර කරුණු සාකච්ඡා කිරීමෙන් මේ රැස්වීම් අනවශ්‍ය සේ දීර්ඝ කරනු ලැබේ. රැස්වීම් වැරදිකරුවන් සොයන මාධ්‍ය වී ඇත. බොහෝ විට සාමාන්‍යාධිකාරිවරයා ඇතුළු කාර්යමණ්ඩලයට සිදුව ඇත්තේ ස්වකීය නිදොස් බව ඒත්තු ගැන්වීමයි. අධ්‍යක්ෂක මණ්ඩලය රැස්වී තීරණයක් ගන්නා තුරු සාමාන්‍යාධිකාරවරයාට බලාසිටීමට සිදුවේ. එවිට යම් ලාභයක් හෝ ආදායමක් ලැබීමට ඇති අවස්ථාව සමූපකාරයට අහිමිවේ. ඒ අතරේ පෞද්ගලික වෙළෙඳ ව්‍යාපාර පවත්වාගෙන යන්නන් වෙළෙඳපොළ පිළිබඳව දැඩි අවධානයකින් පසුවන අතර ක්ෂණික තීරණ ගැනීම මගින් ව්‍යාපාරයේ ලාභය උපරිම කරගෙන ව්‍යාපාරයේ පැවැත්ම ස්ථාවර කර ගනී.

❖ වංචාව දූෂණය නිසා ලංකාවේ සමූපකාර ව්‍යාපාරය අද වන විට පාඩු ලබන රාජ්‍ය ආයතනයකි. තරඟකාරී පෞද්ගලික අංශයේ ව්‍යාපාර ඇත්තේ සමූපකාරයට බොහෝ ඉදිරියෙනි.

ආශ්‍රිත ග්‍රන්ථ


❖ සමූපකාරයේ ව්‍යාප්තිය හා ඵලදායිතාව -එස්. ගොඩගේ සහ සහෝදරයෝ (කුමුදිනි ඉද්දමල්ගොඩ)

❖ කෘෂිකාර්මික සමූපකාර සමිති සහ සුළු ගොවි ආර්ථික සංවර්ධනය -ජාතික සමූපකාර සංවර්ධන ආයතනය -පොල්ගොල්ල (පද්මා ඩී .ජයවීර)

❖ සමූපකාරය හා ප්‍රජා සංවර්ධනය හා කාන්තා සහභාගීත්වය - ආරිය ප්‍රකාශකයෝ (ඒ.එම්.ජී. බී අබේසිංහ)

# 20. දරු දැරියනගෙ කුස ගින්දර.

ඒ. එන්. විතානගේ
සංවර්ධන නිලධාරි
*B.A (General)*

දරු දැරියනගෙ කුස ගින්දර නිවන්නට
ගියෙ කළු මුදලාලිගෙ ගල් කුරියට
පොළියට ගත් ණය අහවර කරන්නට
සිදුවුණි මට ගේ උකසට තබන්නට

නැති බැරි කමට සිදුවුණි අපමණ නින්දා
සිරිකත ගියා නිවහන අඳුරේ රන්දා
සිටිනා විටදි හද සෝකය නිති බන්දා
ප්‍රජා මූල ආවේ සිත දිරි කැන්දා

ස්ව ශක්තියෙන් නැඟිටින්නට දිරිය දෙන
ප්‍රජාව බල ගන්වා දිවි සරු කරන
ගම නැඟුමෙන් රට නැඟුමට වෙර දරන
පුහුණු ආයතනයයි මෙය නම රැඳුන

ඇති හැකියාව ඔපදා යාමට පෙරට
සජීවීකරණය දිරි දුණි අපට
ඉතුරුම හුරු කළේ අපෙ මතු දියුණුවට
හැකි වෙයි දිනක නව ලෝකය ජය ගන්ට

නැති බැරි අය ඇති හැකි අය කරන්නට
කඳුළැලි මතින් මුව හසරැළි නඟන්නට
සිතේ දිරිය ගෙන ගත සවි බල කරන්නට
හැකි වේවා දිගු කල් මෙහෙ කරන්නට

# 21. සාරධර්ම තුළින් සමාජ යහපැවැත්ම තහවුරු කරමු.

සී.කේ.ඩබ්ලිව්. අල්විස්
පුහුණු හා පර්යේෂණ නිලධාරි

සාරධර්ම යන්නට නිශ්චිත අර්ථකථනයක් ලබාදීම අසීරු වුවද, යමෙකු යහපත් සිරිත් විරිත් තුළින් ඇති කර ගන්නා සදාචාරාත්මක බව ඉන් අදහස් වේ. මෙලොව උපත ලද ඕනෑම පුද්ගලයෙකුට තමා ජීවත්වන කෙටි කාලය තුළ යහපත් මිනිසෙකු ලෙස ගත කිරීමට උපකාරී වන්නා වූ ගුණ සමුදාය සාරධර්ම යන්නට ඇතුළත්ය. තවෙකෙකුගේ දුක වේදනාව තේරුම්ගෙන හදවතින්ම ඒ අයගේ යහපත වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයෙක් ගුණධර්ම නැතිනම් සාරධර්මවලින් පිරිපුන් මිනිසෙක් ලෙස හැඳින්විය හැකියි.

බුදු දහමට අනුව සාරධර්ම යනු සාරවත් ධර්මයයි. අන්‍යෝන්‍ය ගරුත්වය, සහජීවනය, අනෙකාට ඇති අයිතිය, මානව හිමිකම්, සමගිය, එකමුතුකම, විනය, නීතිගරුකභාවය ආදිය සාරධර්ම යන්නට ඇතුලත්ය.

වත්මන් සමාජය තුළ එකී සාරධර්මවලට අත්වී තිබෙන ඉරණම විමසා බැලීමේදී අද ශ්‍රී ලාංකීය සමාජය තුළ සදාචාරය, සංස්කෘතිය පිරිහීමට ලක්ව ඇති බව නොරහසකි. සුළු සිද්ධියකදී පවා කැති පොලු අමෝරා ගහ මරා ගන්නා තත්ත්වයක් උදාවී ඇත. පුංචි වචන හුවමාරුවක් ජීවිත අහිමිවීමකින් කෙළවර වන අවස්ථා කොතෙකුත් ඇත. ලිංගික හිංසා, ලිංගික අතවර, ළමා අපචාර, තියුණු ආයුධවලින් පහරදීම්, වෙඩි තබා ගැනීම් තැනින් තැන දෛනිකව සිදුවෙමින් පවතී.

වර්තමානයේ ජාති, ආගම්, බාල මහලු, වැඩිහිටි තරුණ, ස්ත්‍රී පුරුෂ, උගත් නූගත්, දුප්පත් පොහොසත් ආදී වශයෙන් කිසිදු තරාතිරමකින් තොරව සියලු පාර්ශවයන් සාරධර්මවලින් තොරව කටයුතු කරනු දක්නට ඇත. රටේ පාලක පන්තිය විසින් බලය රැක ගැනීමට දරන මර්දනකාරී ප්‍රයත්නය තුළ සමාජයේ ඉහළ සිට පහළ ස්ථරය දක්වාම සාරධර්ම පිරිහී පවතී. රටක් ගොඩ නැඟීම පාලක පන්තියේ වගකීම වුවද අද වන විට රටේ ප්‍රතිපත්ති සම්පාදනය කරන පාර්ලිමේන්තුව තුළ පවා ඇතැමුන් සංවිධානාත්මක අපරාධකරුවන් ලෙස කටයුතු කරනු දැකිය හැකිය. රටේ උත්තරීතර ආයතනය ලෙස සැලකෙන පාර්ලිමේන්තුව වත්මනේදී පොර පිටියක් බවට පත්ව ඇති අතර, එමගින් රටේ අනාගත පරපුරට ලබාදෙන ආදර්ශය සුබවාදී නොවේ.

පුද්ගලයා ප්‍රතිපත්තිගරුක නොවන විට සාරධර්ම පිරිහීම වැළකිය හැකි නොවේ. සොරකම, වංචාව, පර පණ නැසීම, සුරාව, අනාචාරය, නීතිගරුක නොවීම වැනි සදාචාරයට පටහැනි කටයුතු නිසා තනි තනි පුද්ගලයාගේ සාරධර්ම පිරිහී ඇත.

පවුලක් සම්බන්ධයෙන් ගත්කල පවුලේ සාමාජිකයින් තම යුතුකම් වගකීම් පැහැර හැර ඇත. වැඩිහිටියන්ට සැළකීම, එකිනෙකාට ගරු කිරීම, ආදර්ශවත්වීම, එකමුතුකම, බෙදාහදා ගැනීම පවුලෙන් බැහැරවී ඇත.

පවුලෙන් පරිබාහිරව විවිධ භේද, අසමගිකම්, වර්ගවාද, ජාතිවාද, අනාරක්ෂිතභාවය, අවිනීතකම, අවස්ථාවාදීකම, සහජීවනයෙන් තොරව කටයුතු කිරීම, දුරාචාරය, නීතියට පටහැනිව කටයුතු කිරීම, වෛරී සිතිවිලි, දේශපාලන කැළඹීම් යනාදිය සමාජය තුළ සුලබව පවතී.

වෘත්තීන් තුළ නිරතවන්නන්ද තමාට හිමි විය යුතු වරප්‍රසාද දිනා ගැනීම සඳහා වෙර දරනමුත් තම යුතුකම් හා වගකීම් නිසි ලෙස ඉටු කිරීමට උත්සාහ නොදරයි. වෛද්‍ය, ඉංජිනේරු, ගුරු, නීතිඥ, පරිපාලන ආදී ඕනෑම වෘත්තියක් තුළ වෘත්තීය සදාචාරාත්මක බව පිරිහී පවතී. අල්ලස, දූෂණය, වංචාව වැනි අයථා ඉපයීම් සඳහා වෘත්තීමය බලය යොදවන ආකාරය දැකිය හැකිය.

ගහකොළ, සතාසීපාවා වැනි ස්වාභාවික සම්පත් හා අනෙකුත් පොදු දේපළ නැතහොත් පාරිසරික සාධක කෙරෙහි තැකීමක් නොකර සංවර්ධනය මුවාවෙන් සිදු කරන ව්‍යාපෘති බොහෝය. ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ජල ගැලීම්, නාය යෑම්, අලි තර්ජන, ජල දූෂණය, වන විනාශය, වායු දූෂණය, සාගර දූෂණය ආදී දහසකුත් විනාශයන් මිහි පිට සිදු වෙමින් පවතී.

පුද්ගලයා සමාජයේ පවතින සිරිත් විරිත්, සමාජ ඇගයීම්, නීති රීති, සම්ප්‍රදායන් ආදිය පිළිගනිමින් ඒවාට අනුකූලව ජීවත් වන්නේ නම්, සමාජ සාරධර්ම ආරක්ෂා කරගත හැකිවේ. සමාජ සාරධර්ම ඇතිවීම කෙරෙහි පුද්ගල චර්යාව ඉතා වැදගත් වේ. යහපත් සමාජයක ගති ස්වභාවයන්ට අනුව පුද්ගලයා වෙනස්වීම හා පුද්ගලයන්ගේ යහපත් අපේක්ෂාවන් අනුව සමාජය වෙනස් කර ගැනීමෙන් පුද්ගල චර්යා සකස් කර ගැනීම තුළ පිරිහෙමින් පවතින සමාජය යළි ගොඩනැගීම සිදුකළ හැකිය.

එලෙස යහපත් සමාජයක් ගොඩනැගීමට නම්, පුද්ගලයා සමාජයේ පවතින යහගුණ තමාගේ පෞරුෂ ගුණාංග සමග ගලපා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. සමාජානුයෝජනය තුළින් සමාජ ධර්මතා නැතහොත් සාරධර්ම සුරැකීමට ඉවහල්වන මූලික ආයතන හතරකි. පවුල, පාසල, ආගමික සිද්ධස්ථාන හා සමාජ සංවිධාන එම ආයතනයි.

පුද්ගලයකු සමාජයට හැඩ ගැස්වීමේ දී මූලික වන්නේ පවුලයි. පවුලේ සාමාජිකයින් අතර යහපත් සම්බන්ධතා යහගුණ හා යහපත් ආකල්ප ඇතිවීමෙන් යහපත් පුද්ගලයකු නිර්මාණය වේ. එවැනි පුද්ගලයා සමාජයේ ද යහපත් ලෙස කටයුතු කරයි. පවුල් සම්බන්ධතා දුර්වල වූ විට පුද්ගලයා සමාජයට නොගැළපෙන හැසිරීම් රටාවක් ඇති කර ගන්නා අතර, එය සමාජ යහපැවැත්මට අහිතකර ලෙස බලපායි. ඒ අනුව පුද්ගලයාගේ හා සමාජයේ යහපැවැත්ම කෙරෙහි පවුල නමැති සමාජ ඒකකයේ ගති ලක්ෂණ බලපායි. පවුලකින් සමාජ යහපැවැත්ම සඳහා ඉටුවිය යුතු කාර්යයන් සමූහයකි.

- යහපත් සමාජ සම්බන්ධතා ඇති කිරීම
- යහපත් සෞඛ්‍ය පුරුදු
- වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපැදීම
- අන්‍යයන්ට සවන් දීම
- අන්‍ය අදහස් හා මතවාදවලට ගරු කිරීම
- සංස්කෘතිය ආරක්ෂා කිරීම
- ආර්ථික සහයෝගීතාව ඇති කිරීම
- ආරක්ෂාව හා ආදරය ලබා දීම
- සමාජය දෙස ධනාත්මකව සිතීම
- චිත්තවේග පාලනයට හුරු කිරීම
- සමාජ සිරිත් විරිත් හා අගයයන් පිළි ගැනීම
- ආදායම් වියදම් කළමනාකරණය කිරීම

- ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීමට හුරු කිරීම ආදියයි.

මෙම ගුණාංග මනා ලෙස පවුලක් තුළින් පුද්ගලයාට ලැබීමෙන් ඒවා පුද්ගලයාගෙන් සමාජයට ද ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ යහපැවැත්ම ඇති වේ.

සමාජානුයෝජනය සඳහා පවුලෙන් මෙන්ම පාසලෙන් ආගමික ආයතන මගින් හා සමාජ සංවිධානවලින් ද විශාල දායකත්වයක් ලබා දෙයි. පාසලෙන් යහපත් පුරුදු, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම සමාජයේ යහපැවැත්මට හේතු වේ.

ආගමික ආයතන සම්බන්ධයෙන් ගත්කල සෑම ආගමකින්ම පුරුදු පුහුණු කරනු ලබන්නේ පුද්ගලයන්ට සමාජයේ හොඳ පුරවැසියන් ලෙස සමගියෙන් සහයෝගයෙන් හා සහජීවනයෙන් යුතුව ජීවත්වන ආකාරයයි.

සාරධර්ම තුළින් සමාජ යහපැවැත්ම ඇති කිරීම සඳහා සමාජ ආයතන/ සංවිධාන මගින් ද විශාල කාර්යය භාරයක් ඉටු කරනු ලබයි. දරුවෙකු වයසින් වැඩෙත්ම තමා සමාජයේ සාමාජිකයකු වශයෙන් පිළිගැනීමට නම් සමාජයේ පිළිගත් චර්යාවන් පිළිගැනීම හා ඒවාට අනුගතවීම අවශ්‍ය බව සමාජ ආයතන තුළින් ඉගෙනු ගනු ලබයි.

ඒ අනුව සමාජ යහපැවැත්ම ඇති කිරීමේ ප්‍රධාන සාධකය වන්නේ පුද්ගලයායි. එයට හේතුව සමාජ පද්ධතිය තුළ ඇති සියලුම සිරිත් විරිත්, නීති රීති, සංවිධාන හා අනෙකුත් යාන්ත්‍රණ පුද්ගලයා මූලික කරගෙන සකස් වී ඇති බැවිනි. පුද්ගලයා ඒවා කෙරෙහි අවධානය යොමු කර ඒ අනුව හැසිරෙන්නේ නම්, සමාජ යහපැවැත්ම තහවුරුවනු ඇත. සමාජය පිළිගත් ආචාර ධර්ම හා සම්මුතිවලට අනුකූලව පුද්ගලයා හෝ පුද්ගල කණ්ඩායම් කටයුතු කරයි නම් සමාජ යහපැවැත්ම හා සමාජ සුරක්ෂිතතාව තහවුරු කළ හැකිය. වර්තමානයේ රට මුහුණපා සිටින ආර්ථික, සමාජීය හා දේශපාලන අස්ථාවරභාවයට සබැ විසඳුම් සෙවිය හැක්කේ ද එවන් වටපිටාවක් තුළ පමණි.

# 22. ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයේ පසුබිම, තීව්‍රතාව සහ ප්‍රතිඵල.

*ආචාර්ය, ඒ.එම්.එස්. අතපත්තු*
*පුහුණු හා පර්යේෂණ නිලධාරී*
*PhD (Social Development)*

විදේශ විනිමය අවධමනය හේතුවෙන් ශ්‍රී ලංකාව උග්‍ර ආර්ථික අර්බුදයකට මුහුණ දුන් කාලය පසු කරමින් සිටියි. 2020 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට සිදු වූ විදේශ විනිමය සංචිත අවධමනය, 2021 නොවැම්බර් වන විට අවිනිශ්චිතතාවේ අන්තයට ගිලී තිබුණු අතර, 2022 ජනවාරි වන විට එය 24% කින් එනම්, ඇමරිකානු ඩොලර් බිලියන 2.3 දක්වා පහත වැටුණි. විනිමය සංචිත කඩාවැටීම, අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනයට හා ණය ආපසු ගෙවීමේ හැකියාව අසීරුකර ඇත. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුවට 2022 වර්ෂයේ මුල් කාලය වනවිට විදේශ ණය ආපසු ගෙවීම හා අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා විදේශ විනිමය නිකුත් කිරීම අසීරු විය. නමුත්, විදේශ විනිමය රටතුලට ගලා ඒම ස්ථාවර හෙයින්, ණය ආපසු ගෙවීම අසීරු නොවන බවටත්, ආර්ථික අර්බුදයට මුහුණදීම පහසු බවත් විශ්වාසයක් පැවතුණි. නමුත් ලෝක මට්ටමින් සිදුවන භූ දේශපාලන ආර්ථික තත්වයන් තුළ එනම්, උදාහරණ වශයෙන් රුසියානු - යුක්‍රේන යුද්ධය අපේ ආර්ථිකයට දෙයාකාරයෙන් බලපෑම් එල්ලකරන ලදී (ශ්‍රී ලංකා මහ බැංකුව, 2022.02.11).

**ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත අර්බුදය.**

1948 වර්ෂයේ සිට ගෙවුණු පශ්චාද් නිදහස් කාලය තුළ වෙළෙඳ ශේෂයේ හිඟය ස්ථාවර අගයක පැවති අතර, ආනයනය සඳහා දරන වියදම, අභිභවා යෑමට උපයන ආදායම ප්‍රමාණවත් නොවීම මෙයට හේතුවයි. මෑත කාලය තුළ ණය ආපසු ගෙවීම රජයට දැඩි බලපෑමක් එල්ල වූයේ, කොවිඩ් 19 වසන්ගත තත්ත්වය සහ 2019 වර්ෂයේ දී සිදු වූ පාස්කු ප්‍රහාරයත් සමඟ සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීමයි.

ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපයීම්වලින් 5 වන ස්ථානය සංචාරක ව්‍යාපාරය උසුලන අතර, එය 2014 - 2019 කාලය තුළ දළ දේශීය ආදායමින් 14%ක් පමණ වුණි. 2018 වර්ෂයේ දී සංචාරක ව්‍යාපාරයේ ඉහළම පිබිදීම සිදු වූ අතර, එම වසර තුළ ඩොලර් බිලියන 4,381 ක් උපයා ඇත. නමුත් 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරය (Easter Attack) දැඩි ලෙස සංචාරක ව්‍යාපාරයට බලපෑ අතර, 2020 වර්ෂයේ රට තුළ ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය සංචාරක ව්‍යාපාරයේ අර්බුදය තීව්‍ර කිරීමට හේතු වුණි. ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට ප්‍රබල දායකත්වයක් සපයනු ලැබුවත්, රට තුළ පැවති සමාජ හා දේශපාලන අර්බුදකාරී පසුබිම සංචාරක ව්‍යාපාරය අකර්මන්‍ය කර ඇති අතර, 2022 වර්ෂයේ මාර්තු මාසය වන විට සංචාරකයන්ගේ වාර්ෂික පැමිණීම 378521 වැනි පහළ අගයක් දක්වා අඩු වුණි.

පෙර නොවූවිරූ පරිදි අහිතකර වෙළෙඳපොළ තත්ත්වය හේතුවෙන් ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් (Liquidity) වර්ධනයකර ගැනීමට රජයට නොහැකිවී ඇත. 2020 අප්‍රේල් 8 වැනිදා සිට ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ විනිමය සංචිතවලින් ද්‍රවශීලතාව අඛණ්ඩව සිදුකරනු ලැබීය. එසේම, 2020 වර්ෂයේ අප්‍රේල්- ජුනි කාලය තුළ විදේශ විනිමය ඩොලර් මිලියන 1007 ක් ණය පියවීම සඳහා යොදවන ලදී. 2021 - 2022 කාලය සඳහා විදේශ ණය ගෙවීම් සඳහා පමණක් ඩොලර් බිලියන 5 - 7 ක් අතර ප්‍රමාණයක් වැයකළ යුතුව ඇත. පසුගිය කාලය තුළ විදේශ විනිමය ගලා එන ප්‍රමාණයට වඩා රටින් පිටතට ගලායෑම අඛන්ඩව වර්ධනයවීම විදේශ විනිමය අර්බුදය සුවිශේෂී ලෙස තීව්‍රවීමට හේතු විය.

විදේශ විනිමය අර්බුදය, රට තුළ ඇතිකරනු ලැබූ ඉන්ධන අර්බුදයත් සමඟ දෛනික විදුලි කප්පාදුව, ආහාර හිඟය, අත්‍යවශ්‍ය බෙහෙත්, සිමෙන්ති හා අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය වෙළෙඳසැල් ඉදිරිපිට දිගු පෝලිම් නිර්මාණයවීමටත්, වෙළෙඳපොළ තුළ අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයක් නිර්මාණයවීමටත් හේතු විය. විදේශ විනිමය හිඟයක් පවතින හෙයින් ආනයනය කරුවන්හට වාණිජ බැංකුවලින් සපයන ණයවර ලිපි ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් බොහෝ ආනයනික බහාළුන් නිදහස්කර ගැනීමට නොහැවී ආනයනික භාණ්ඩ හිගයක් නිර්මාණයවීමට හේතු විය.

ඉන්ධන හිඟය හේතුවෙන් බොහෝ විදුලි ජනන යන්ත්‍ර අක්‍රිය තත්ත්වයේ තැබීමට සිදුවීම විදුලි අර්බුදය තීව්‍රවීමට බලපා ඇත. ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබුණු තත්ත්වයන් තුළ වාරි ජලය විදුලි නිෂ්පාදනය සඳහා යෙදවීම නිසා සහල් වැනි අත්‍යාවශ්‍ය දේශීය ආහාර ද්‍රව්‍ය නිෂ්පදනයට අහිතකර බලපෑම් එල්ලවීමට ඉඩ ඇති බවට විශේෂඥයින් පූර්වයෙන් දැණුම් දුන් අතර, අදවන විට පවුල් මිලියන 3.3 ක් අවධානම් තත්ත්වයේ පසුවෙති. සමස්ත ලංකා ඖසුසල් සංවිධානය විසින්, විදේශ විනිමය හිඟයට පිළියමක් ලෙස ඖෂධ ආනයනය සීමාකිරීම නිසා පවතින තොගය මාස 03ට පමණක් ප්‍රමාණවත් බව පෙන්වා දී තිබුණි.

විදේශ විනිමය සංචිත ක්ෂයවීම නිසා ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කරන ආයතනය විසින් ශ්‍රී ලංකා ස්වෛරී ශ්‍රේණිගත කිරීම තවදුරටත් පහළ දැමූ අතර, ඒ තුළින් ආයෝජකයින්ගේ විශ්වාසය බිඳවැටීමත්, ශ්‍රී ලංකාවට තවදුරටත් ණය ගෙවීමට නොහැකි බව සනාථවීමත් හේතු විය.

**අර්බුදයෙන් මිදීමට ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර.**

පසුගිය කාලය පුරා පැවතුණු රජයන් විසින් අනුගමනය කරන ලද අපනයන ආදායම ඉක්මවා ආනයනය සඳහා ප්‍රමුඛ වෙළෙඳ ප්‍රතිපත්තිය මෙම අර්බුදය නිර්මාණය කර ඇති බව රජය අවබෝධ කරගෙන ඇත. බහුපාර්ශ්වික ආයතන මගින් දැඩි කොන්දේසි මත පදනම් වූ වානිජ ණය සහ කොවිඩ් 19 වසංගතය මෙම අර්බුදය කරා මෙහෙයවීමට වගකිව යුතු බව සනාථවී ඇත. ආනයන වියදම පාලනය කිරීමට හා අපනයන ආදායම රට තුළට ගලා ඒම වර්ධනය කිරීමේ “ස්වදේශීය පියවර (homegrown measures) විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීමට ගෙන ඇති එක් පියවරකි. ණය ආපසු ගෙවීම පැහැර හැරීමකින් තොරව අර්බුදකාරී වාතාවරණය තුළ ආයෝජකයින් හට විශ්වාසයක් ලබා දීමට සුවිශේෂී අවදානය යොමු කර ඇත. ආනයනය හා ණය පියවීමේ බාධා සමනය කිරීමට රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ

ද්විපාර්ශ්වික එකඟතාවට හා මූල්‍ය හුවමාරු පහසුකම් (Currency swap facilities) ලබා ගැනීමට සාකච්ඡා කරමින් සිටියි.

**අත්‍යාවශ්‍යය භාණ්ඩ ආනයනය තහනම (Import Restriction).**

ශ්‍රී ලංකා රජය විසින් වාහන, රසායනික පොහොර, කහ වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය තහනම් (Import restriction) කිරීම තුළින් විදේශ විනිමය ගලායෑම පාලනය කිරීමේ එක් පියවරක් වශයෙන් 2020 වර්ෂයේ මාර්තු සිට බලපැවැත්වෙන පරිදි මෝටර් වාහන ආනයන තහනම හා 2021 වර්ෂයේ මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි කෘෂිරසායනික ද්‍රව්‍ය ආනයනය තහනම් කර ඇත. එසේ වුවත්, රජය මෙම තහනම කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත්බව සාධාරණීකරණය කර ඇතිමුත්, රසායනික පොහොර ආනයනය පිටුපස විදේශ විනිමය ගලා යෑම වැලැක්වීමේ උපක්‍රමයක් පැවතුණි. ආනයන තහනම් කිරීමට පෙර ශ්‍රී ලංකාව, කෘෂි රසායනික පොහොර ආනයන සඳහා වාර්ෂිකව ඇමෙරිකනු ඩො.මි.400ක් හා කුළුබඩු ආනයනය සඳහා ඩො.මි.7 ක් සහ 2018 වර්ෂයේ දී මෝටර් රථ ආනයනය සඳහා ඩො.බි.1.5 ට වැඩි මුදලක් වැයකර ඇත. එසේ වුවත්, මෙම ආනයන තහනම විදේශ විනිමය ගලායෑම වැලැක්වීමට හා දේශීය නිෂ්පාදනය දිරි ගැන්වීමට ගත් උපක්‍රමයක් ලෙස සාධාරණීකරණය කර ඇත.

**විදේශ විනිමය ඉදිරි ගිවිසුම් සීමා කිරීම(Restriction on Forward Contracts of Foreign Exchange).**

විදේශ විනිමය වෙළෙඳපොළ තුළ පවතින අධික අස්ථාවරත්වය (Excess Volatility) වැලැක්වීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැකුව මෙම කාලය තුළ විදේශ විනිමය ගිවිසුම්වලට එලඹීම වැළක්වීම සඳහා වාණිජ බැංකු පාලනයට සීමාකම් පනවා ඇත.

**ප්‍රේෂණ ගලා ඒම වැඩිදියුණු කිරීම.**

ඩොලරයේ වටිනාකම ඉහළ යෑමත් සමඟ විදේශගත ශ්‍රමිකයින් ප්‍රේෂණ මෙරටට එවීමට මැළිවන අතර, එහිදී රටට ප්‍රේෂණ ගලාඒම වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්ති මුලපිරීම් (Policy Initiatives) හඳුන්වා දී ඇත. වර්තමානය වනවිට බොහෝ දුරට මැදපෙරදිග රටවල් මත යැපෙන විදේශ රැකියා වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීමේ යෝජනාව, විදේශගත ශ්‍රමිකයන් සඳහා දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම, බලපත්‍රලාභී බැංකුවලින් විදේශ විනිමය රුපියල්වලට හුවමාරු කිරීමේ දී ඩොලරයකට රු.2ක අමතර මුදලක් ගෙවීම, ශ්‍රී ලංකාව තුළට වැඩිපුර ප්‍රේෂණ ඇදගැනීම සඳහා ආකර්ශණීය තැන්පත් ක්‍රමයක් හඳුන්වා දීම වැනි සංචිත වර්ධනීය පියවර ගෙන ඇත.

**ද්වි පාර්ශවික හවුල් කරුවන්ගේ උපකාර (Assistance from Bilateral Partners).**

ණය හා ස්වෛරීය මූල්‍ය පහසුකම්වලින් (Debts and Swap) වර්ථමාන ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීමේදී ද්පාර්ශ්වික හවුල්කරුවන්ගේ සහාය ලබා ගැනීමේ ප්‍රවේශයට එළඹී ඇත. ඒ යටතේ බංග්ලාදේශය ඇ.ඩො.මි. 400ක හා චීනය ඇ.ඩො.බි. 1.5 ක ස්වෛරී මූල්‍ය පහසුකම් සහ ඊට අමතරව, චීන සංවර්ධන

බැංකුවෙන් ඇ.ඩො.මි. 400ක් ලබාගෙන ඇත. එසේම ඉන්දියාව, තවත් ඇ.ඩො.බි. 2.4ක වානිජ මූල්‍ය සහයක් (Commercial Financial Assistance) ලබා දීමට එකඟවී ඇති අතර, එයට සාක් මූල්‍ය පහසුකම් විධිවිධාන යටතේ ඇ.ඩො.මි. 400ක ණය මුදලක්, ණය කල්දැමීමේ එකඟතා සඳහා ඇ. ඩො. මි. 515.2 ක්, ඉන්දියාවෙන් ඉන්ධන ගෙන ඒම සඳහා ඇ.ඩො.මි. 500ක් සහ අත්‍යවශ්‍ය ආහාර හා ඖෂධ ආනයනය සඳහා ඇ.ඩො.බි. 01 ක් ඇතුළත් වේ. මීට අමතරව ඉන්දියානු ඔයිල් කෝපරේෂන් මඟින් මෙට්‍රික් ටොන් 4000 ක් වටිනා තෙල් තොගයක් දින 60 ක් තුළ ආපසු ගෙවීමේ පදනම මත ලබා දී ඇත. මූල්‍ය පැකේජයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ සංචාරක අංශය ශක්තිමත් කිරීම සඳහා ඉන්දියානු සංචාරකයින් හට සියලුම ආකාරයේ සහාය ලබා දීමටත්, ත්‍රිකුණාමලය ඉන්ධන ගබඩා සංකීර්ණය ඒකාබද්ධව සංවර්ධනය සඳහා එකඟතා ගිවිසුම් අත්සන් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ඉන්ධන සුරක්ෂිතතාව සඳහා සියලුම පහසුකම් සැපයීමටත් ඉන්දියාව එකගතාවය පළකර ඇත. පාකිස්ථානය ඇ.ඩො.මි. 200 ක ණය පැකේජයක් මගින් සිමෙන්ති, බාස්මතී සහල් සහ පාකිස්ථානයේ නිෂ්පාදිත ඖෂධ ආනයනය සඳහා එකඟතාවයට පැමිණ ඇත. එසේම ඉදිරි කාලය තුළ ඇ.ඩො.බි. 01 ක ස්වෛරී පහසුකම් ලබාගැනීම සඳහා කටාර් මධ්‍යම බැංකුව සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව සාකච්ඡා ආරම්භ කර ඇත.

**ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම (Boosting Investors' Confidence).**

ආයෝජකයින්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීම සඳහා රජය මඟින් විශේෂ ඉතුරුම් ගිණුම් ක්‍රමයක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ඇත. විදේශ විනිමය හිඟයක් පවතිද්දී ණය ආපසු නොගෙවා ණය ප්‍රතිව්‍යුහ කරන ලෙස විපක්ෂය නිරන්තර ඉල්ලීම් සිදුකරන ලදි. නමුත් ණය පැහැර හැරීමකින් තොරව ආපසු ගෙවීමට රජය මුලදී තීරණය කර තිබුණත්, අදවන විට ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳාහා ඉල්ලීම් කරමින් සිටියි.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය පැතීම.**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් (IMF) ණය ලබාගැනීම සඳහා ඉල්ලීම් කිරීමට ශ්‍රී ලංකාව මුලදී අකමැති වුවත්, ජනතාව කොවිඩ් වසංගතය හා පවතින අර්බුදයේ අභියෝගවලට මුහුණ දෙමින් සිටිය දී තව දුරටත් ජනතාව අසීරුවට පත්වන ආකාරයට ආධාර ලබා නොදීමේ කොන්දේසි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් පැනවීමට ඉඩකඩ මතුවූ හෙයිණි. එසේම ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටලුව ඉතා නරක අතට හැරී ඇතිමුත්, රජයට මෙම තත්ත්වය සමනය කර ගැනීමට හැකි බවත්, ඊට අවශ්‍ය තාක්ෂණ සහාය පමණක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබා ගැනීම සුදුසු බව මුලදී අපේක්ෂා කළේය.

**අර්බුදය සමනයකර ගැනීමට රජය ගත් පියවරයන්හි කාර්යක්ෂමතාව (efficacy of Government Measures).**

පවතින තත්ත්වය පාලනය කිරීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රමෝපයන් කෙටි කාලීන හා සමස්ත ආර්ථික අන්තර් ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු නොකරන බව විපකෂයේ නායකයින් හා ආර්ථික විශේෂඥයින් විසින් විවේචනය කරති.

රජය, ආනයන නවතා දැමීම තුළින් ආනයන වියදම අවම කර ගනිමින් ගෙවුම් ශේෂ හිඟය සමනය කර ගැනීමට සමත් වුවත්, අඛණ්ඩව මෙය සිදුකිරීම තුළින් අපනයන ආදායම කෙරෙහි දැඩි බලපෑම් එල්ලවී ඇත. ඊට හේතුව අපේ අපනයන කර්මාන්තය විශාල වශයෙන් අන්තර් මාධ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ ආනයන මත පරායත්ත වන හෙයිණි. රසායනික පොහොර හා කෘමිනාශක ද්‍රව්‍ය ආනයනය තහනම් කිරීම නිසා කෘෂි කර්මාන්තයට දැඩි බලපෑම් එල්ල වූ අතර, එය ආහාර සුරක්ෂිතතාව දැඩි අවදානමට පාත්‍රකර ඇත. ආනයනය තහනම් කරන ලද භාණ්ඩ සඳහා ජාවාරම්කරුවන් හා නීතිවිරෝධී වෙළෙන්දන්ගේ බලපෑම තුළින් භාණ්ඩවල මිල සීග්‍රයෙන් ඉහළගොස් ඇත.

යුරෝපා සංගමයේ නියෝජිත කණ්ඩායම හා ප්‍රංශ, ජර්මන්, ඉතාලි, නෙදර්ලන්ත සහ රෝම තානාපති එක්ව 2020 නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනය තුළින් ආනයන තහනම දැඩිලෙස විවේචනයකර ඇති අතර, එය ඉදිරිකාලයේදී ශ්‍රී ලංකාව හා යුරෝපා සංගමය සමඟ පවතින වෙළෙඳ ගනුදෙනුවලට සහ විශේෂයෙන් සෘජු ආයෝජනවලට දැඩි ලෙස බලපෑම් එල්ලවිය හැකි බව දක්වා ඇත.

බංගලාදේශය, චීනය හා ඉන්දියාව විසින් සපයන ලද ස්වෛරී ණය පහසුකම් ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය වර්ධනයවීමට සුළු බලපෑම් එල්ලවූ අතර, ඉන්ධන හිඟයට කෙටිකාලීන විසඳුම් ද ලැබුණි. නමුත් භූ දේශපාලන වශයෙන් ඉදිරි කාලයේදී ලංකාව තුළ ජාතික ආරක්ෂාව, ඒකාධිකාරී මිල පාලනය හා අනවශ්‍ය අතපෙවීම් සිදුවීමට බොහෝ දුරට ඉඩකඩ නිර්මාණයවනු ඇත. එසේම ශ්‍රී ලංකාවට මෙම අර්බුදයෙන් ගොඩඒමට ද්විපාර්ශ්වීය සහාය මත පමණක් බැදීසිටිය නොහැකි අතර, මෙය ණය කළමනාකරණය හා විදේශ විනිමය බිල්පත් ගෙවීමට පමණක් ප්‍රමාණවත් පසුබිමක් නිර්මාණයවී ඇත. එසේම විවිධ කෙටිකාලීන විසඳුම් යෝජනා තුළින් තිරසර විසඳුමක් ලබාගැනීමට නොහැකි වුවත්, වර්තමාන අර්බුදය සමනය වන තෙක්, ණය ආපසු ගෙවීමට සහන කාලයක්, අඩු පොළියක් හා දිගු කාලීන ණය යෝජනා ක්‍රමයක් අවශ්‍යව ඇත.

**ශ්‍රී ලංකා ආර්ථික අර්බුදයේ ආසන්න හේතු මොනවාද?**

කොවිඩ් 19 වසංගතය, දුර්වල රාජ්‍ය මූල්‍යකරණය හා අති උද්ධමනය මෑත දශකය තුළ ශ්‍රී ලංකා මුහුණදුන් ඉතා නරකම ආර්ථික ව්‍යසනයන් වේ. ඒ අතර, අත්‍යවශ්‍ය භාණ්ඩවල අති ධාවනකාරී මිල ඉහළයෑම, කිරිපිටි හිඟය, ළදරු කිරිපිටි හිඟය, ඉන්ධන පෝලිම්, ගෑස් පෝලිම්, ආහාර සපයා ගැනීමේ ගැටලුව, ඖෂධ හිඟය, නීතිවිරෝධී බදු කප්පාදුව ආදිය තුළින් රාජ්‍ය ආදායමට සිදුකරන ලද අධිබර සමාජ ආර්ථික පීඩනය ඉහළයෑමට සහ ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ කාන්සාව සහ කලකිරීම වර්ධනය වීමට හේතුවී ඇත. 2022 සැප්තැම්බර් වනවිට ශ්‍රී ලංකාව ඉතිහාසයේ මුහුණදුන් ඉහළම උද්ධමන අනුපාතිකය වන 73.7% ක අගයට ළඟාවී සිටි අතර, ආහාර කාණ්ඩ උද්ධමනය 85.8% හා ආහාර නොවන කාණ්ඩ උද්ධමනය 84.6% දක්වා ඉහළ ගොස් ඇත(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2022).

**ආහාර හා ඉන්ධන හිඟය.**

වර්ෂ 2022 ජනවාරි මස වන විට අපේ විදේශ විනිමය ප්‍රමාණය ආසන්න වශයෙන් ඇ.ඩො. බිලියන 2.3 ක්ව පැවති අතර, 2022 අප්‍රේල් මාසයේ එය ඇ.ඩො. බිලියන 1.9 දක්වාත්, 2022 මැයි මස වන විට ඇ.ඩො. මිලියන 50 ක් වැනි පහළ අගයක් කරා අවධමනය විය. එසේම, 2022 වර්ෂය තුළ ඇ.ඩො. බිලියන 4 කට අධික මුදලක් ණය ආපසු ගෙවීම් සඳහාද වැය කිරීමට නියමිත වුවත්, එම මුදල ගෙවීමට නොහැකිවීම හේතුවෙන් ශ්‍රී ලංකාව ණය ගෙවීමට නොහැකි රටක් ලෙස (Default country) ණය ශ්‍රේණිගත කරන ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇත. නැවත ශ්‍රී ලංකාවට ණය නිකුත් කිරීමට ජාත්‍යන්තර ආයතන හා රටවල් තවදුරටත් එකඟනොවන වටපිටාවක් තුළ අත්‍යවශ්‍ය ආහාර, ඉන්ධන, ඖෂධ. ගෑස් ඇතුලු සියලුම භාණ්ඩ හා සේවා ආනයන කිරීමේ ගැටලු පැනනැගී ඇත.

මුද්‍රණ කර්මාන්තය හා සමබන්ධ අමුද්‍රව්‍යවල පවතින දැඩි හිඟය හේතුවෙන් ප්‍රවෘත්ති පත්‍ර හා මුද්‍රණ කර්මාන්තය විශාල වශයෙන් අභියෝගයට ලක්වූ අතර, විභාග කල්යෑම හා ප්‍රශ්නපත්‍ර මුද්‍රණ ගැටලු ආදිය තුළින් එය විද්‍යාමාන වේ. ටැක්සි රියදුරු හා ලොරි රථ රියදුරු වැනි ප්‍රවාහනයට සම්බන්ධ දෛනික රැකියාවල නියුතු වූවන් දැඩි ආර්ථික අර්බුදයකට මුහුණදී සිටින අතර, ඔවුන් තුළ කාන්සාව, ඉච්චා භංගත්වය වැනි මානසික බිඳවැටීම් සිදුවෙමින් පවතියි.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ඡන්ද පොරොන්දුවක් අනුව එකතුකළ අගය මත පනවා තිබූ 15% ක් පමණ වූ බදු අනුපාතය අඩකින් අඩුකිරීම හෝ සහමුලින්ම ඉවත්කිරීම හේතුවෙන් රජයේ ආදායම රුපියල් බිලියන 500 ක් අහිමිකර ගත් අතර, එය ණයබර ආර්ථිකයත් සමඟ රාජ්‍ය මූල්‍ය අර්බුදය උග්‍ර කිරීමට හේතු විය. කොවිඩ් වසංගතය හේතුවෙන් ජාතික නිෂ්පාදනයට 12% කට අධික දායකත්වය සපයන සංචාරක ව්‍යාපාරය සහමුලින්ම කඩා වැටුණු අතර, කොවිඩ් වසංගතයට පෙර රාජ්‍ය ණය, ජාතික ආදායමින් 94% ක් වූ අතර, 2021 වන විට එම අගය 119% දක්වා වර්ධනයවී ඇත.

**පවතින අර්බුදයෙන් මිදීම සඳහා ඉන්දියාව, චීනය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යෑම.**

පවතින ආර්ථික අර්බුදයට විසඳුම් ලෙස, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය තහනම් කිරීම සහ ඉන්දියාව හා චීනයේ ආධාර වෙත යොමුවීමට හේතු වුණි. අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් ඩොලර් බිලියන 01ක ණය පහසුකම් (credit Line) ලබා ගෙන ඇත. ඊට අමතරව, මෙම වර්ෂයට පෙර අත්‍යවශ්‍ය ඉන්ධන මිලදී ගැනීම සඳහා තවත් ඩොලර් මිලියන 500ක ක්‍රෙඩිට් ලයින් හා ඩොලර් මිලියන 400ක ස්වෙවරි බැදුම්කර දීර්ඝ කරගෙන ඇත. මීට අමතරව ශ්‍රී ලංකාව ණය ආපසු ගෙවීම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඩොලර් ඉල්ලීම් කර ඇති අතර, පවතින ආර්ථික අර්බුදය සමනය සඳහා ඩොලර් බිලියන 2.5 ක ණය සහනය සඳහා කටයුතු කරමින් පවතී. ද්විපාර්ශ්වීය ගනුදෙනු තිබියදීත්, තවදුරටත් ශ්‍රී ලංකාව සහන පැකේජයන් සඳහා එකගතාවයට ඒම සහ ණය ප්‍රතිව්‍යුහගතකිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යෑමට සිදුවී ඇත.

**රාජ්‍ය ණය කළමනාකරණය.**

පවතින අසහනකාරී වාතාවරණය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාලීන ණය ආපසු ගෙවීම් පිළිබඳ යහපත් තත්ත්වයක් පවත්වාගෙන යන ලදී. එසේම රජයේ ණය තිරසරත්වය (Debts sustainability) සම්පූර්ණ කිරීම සඳහා මෙන්ම, රජයේ අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය මූල්‍ය වෙළෙඳපොළින් විශාල මුදලක් ලබාගෙන ඇත. ඉහළ ගිය රාජ්‍ය වියදම් සහ බදු ආදායම් අඩුවීම තුළ පැනනැගුණු රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාව වෙනුවෙන් ද ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් සම්පාදනය කළ අතර, එම අරමුදල් ජනගහනයෙන් වැඩි ප්‍රමාණයකට සමාජ ආරක්ෂණය සඳහා යොදවා ඇත. එසේම අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන්ට සම්බන්ධ ගෙවීම්, අනෙකුත් රාජ්‍ය සේවා සාමාන්‍ය පරිදි පවත්වාගෙන යෑම සහ ණය ආපසු ගෙවීම් අඛණ්ඩව සිදු කිරීමට මෙම අරමුදල් භාවිතා කර ඇත. එය පහත ආකාර වේ.

2020 ජූනි 04 - ප්‍රාථමික වෙළෙන්දන්ගේ කෙටිකාලීන ද්‍රවශීලතා කළමනාකරණය සඳහා ද්‍රවශීලතා සහය සැපයීම.

2020 මැයි 13 - රාජ්‍ය බැංකු මගින් ලබාගත් අයිරාවන් පියවීම සඳහා රුපියල් බිලියන 100 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම.

2020 අප්‍රේල් 03 - රජයේ හිඟ මුදල් සමනය සඳහා ප්‍රාථමික වෙළෙන්දුන් හට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් බිලියන 60 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් විකිණීම.

2020 මාර්තු 30 - ස්වාධීන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා කෙටිකාලීන පදනම මත කෙටි කාලීන ද්‍රවශීලතා සහාය ලබාදීමේ ප්‍රතිපාදන ක්‍රමයක් ආරම්භ කිරීම.

2020 මාර්තු 23 - රජය විසින් බලශක්ති මිල ස්ථාවර කිරීමේ අරමුදලට මුදල් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් බිලියන 50 ක භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික ගැනුම්කරුවන්ගෙන් මිලදී ගැනීම.

2020 මාර්තු 13 - ව්‍යාතිරේඛ යටතේ රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ප්‍රාථමික වෙළෙඳපොළින් රුපියල් බිලියන 50 ක භාණ්ඩාගාර බිල්පත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගැනීම.

මීට අමතරව මූල්‍යකරණ හා ණය කළමනාකරණ විධිවිධාන හඳුන්වා දී ඇත.

- 2020 පළමු මාස 07 තුළ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි මගින් රුපියල් ට්‍රිලියන1.3කට අධික මුදලක්ද, 2020 මාර්තු මැද සිට 2020 ජුලි අග කාලය තුළ රුපියල් බිලියන 900 කට අධික මුදලක් උපයාගෙන ඇත. මසකට එක්වරක් පමණ සිදුකරන භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි කිරීමේ ක්‍රමයෙන් එහා ගොස් 2020 මැයි ජූලි මස මසකට දෙවරක් වන පරිදි වෙන්දේසි පවත්වා ඇත.

- රජය විසින් තාවකාලික අත්තිකාරම් ලෙස රුපියල් බිලියන 239.9 ක මුහුණත වටිනාකමින් යුත් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම.
- ලොක්ඩවුන් මධ්‍යයේ වුවත්, පෙර නොවූ විරූ පරිදි රුපියල් බිලියන 2.0 ට අධික මුදලක් 2020 පළමු මාස 07 තුළ ණය ආපසු ගෙවීම.
- 2020 මාර්තු මැද සිට 2020 ජූලි මස දක්වා කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය 816 ක් ගෙවා ඇත.
- අනපේක්ෂිත නරක තත්ත්වය තුළ ද්‍රවශීලතාවය ඉහළ නැංවීමට නොහැකිවූ නිසා 2020 අප්‍රේල් 08 දින සිට ද්‍රවශීලතාවය ආරක්ෂාකර ගැනීම සඳහා මහබැංකුව සතු විදේශ විනිමය මුදාහැර ඇත. ඒ අනුව 2020 අප්‍රේල් 08 සිට ජුනි 22 දක්වා ණය ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා මහ බංකුව විසින් රුපියල් මිලියන100ක් වැයකර ඇත.

**ශ්‍රී ලංකාවේ අර්බුදයේ වර්ධනය(Surging Crisis in Sri Lanka).**

2020 වර්ෂයේ මාර්තු මස පමණ පැන නැගුණු කොවිඩ් වසංගතය, ගෝලීය ක්‍රියාවලිය පාලනයට හා ආධිපත්‍යට නතුකරගෙන ඇති මුත්, සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල අනාගත සංවර්ධනය සඳහා සමස්ථ වසංගත තත්ත්වය සමනය කිරීමේ උත්සාහයේ සාර්ථක ප්‍රගතියක් අත්කර ගනිමින් සිටිති.

නමුත්, 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ රුපියලේ වටිනාකම ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 20%කින් පමණ අවධමනය වූ අතර, අදවන විට එය සීග්‍රලෙස අවධමනය වෙමින් පවතී. දේශීය මූල්‍ය ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලහත්කාරයෙන් විනිමය පාලනය කිරීමේ උත්සාහයක නිරතවීම මෙම අවධමනයවීමට හේතු වූ අතර, රුපියල බාල්දුවීම නිසා ජාත්‍යන්තර ගෙවීම්වලදී බොහෝ වියදම්කාරි විය හැකි බව අපේක්ෂා කරන ලදී. අර්බුදය පාලනය කිරීමට පියවර ගෙන තිබියදීත්, රාජ්‍ය වියදම් ඉහළයෑම හා ආදායම හීනවීම නිසා අපනයන ආදායම් අභිබවා ආනයන වියදම් ඉහළ ගියේය.

ආයෝජනවල අවධානම සැළකිල්ලට ගනිමින් පිට්ච් ශ්‍රේණිගත කිරීම් (Fitch rating) මගින් රටේ ණය ආපසු ගෙවීමේ හැකියාව පහළ මට්ටමක පවතින බව පෙන්වා දී තිබුණි. සියල්ලන්ටම වඩා මානව හිමිකම් කඩවීම පිළිබඳව ශ්‍රී ලංකාවට චෝදනා එල්ලවී තිබියදීත්, යුරෝපයේ වඩා ලාභදායක පූර්වාරක්ෂක වෙළෙඳ තත්ත්වය තුළ වාර්ෂිකව ඩොලර් මිලියන 360 ක් උපයාගෙන ඇත. ආනයන අවලංගු කිරීමට යුරෝපා සංගමය ගත් තීරණය එක්සත් රාජධානියද එය අනුගමනය කිරීම නිසා දැවැන්ත ආර්ථික පහරක් එල්ල විය. මෙය ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අපනයනවලින් 30% ක දායකත්වයක් පමණ වේ. මේ අනුව ශක්තිමත් උපායමාර්ගික සැලැස්මකින් තොරව වෙළෙඳ හවුල්කරුවන්ගේ මූල්‍ය සහාය මත ශ්‍රී ලංකා රජයට කෙතරම් කාලයක් රඳා පැවතිය හැකිද යන්න ප්‍රධාන ගැටලුවක් වුවත්, අමතර සහාය සඳහා රජය කැපී පෙනෙන ලෙස චීනය මත රඳා පවතී. මෙය චීනයේ අභිලාශයක් වන "එක් තීරයක් හා මාර්ගයක් (One

Belt and Road) ව්‍යාපෘතියේ එක් උපක්‍රමයක් ලෙස සැකයක් මතු කරනු ඇත. චීනය විසින් ණය ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කළත්, දිගු කාලීනව එහි අපැහැදිළි බවක් දක්නට ඇත. එසේම ඉන්දියාවේද එවැනිම උපක්‍රමයන් මෙන්ම චිනයේ අභිලාශය බිඳ හෙලීමේ උත්සාහයක්ද දක්නට ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට වසංගතය තුළින් ඇතිකරන ලද දැඩි ආර්ථික පසුබෑමත් සමග විදේශ විනිමය අර්බුදය ඒකාබද්ධවී දැඩි බලපෑම් සිදුකර ඇති අතර, එය සංචාරක ව්‍යාපාරය, ආයෝජනය, අපනයනය සහ විදේශ ප්‍රේෂණ ආදිය කෙරෙහි දැඩි ලෙස පරායත්තවී ඇත. එහෙයින් ශ්‍රී ලංකාව අලුත් මානයන් ඔස්සේ පෙල ගැසිය යුතු අතර, ආර්ථික දියුණුව සඳහා සෘජු විදේශ ආයෝජන, පෞද්ගලික ආයෝජන හා විදේශ වෙළෙඳාම ප්‍රවර්ධනය ආදිය අත්‍යවශ්‍ය තත්ත්වයකි. සංචාරක ව්‍යාපාරය, සෞඛ්‍ය, යටිතළ පහසුකම් ආදී අංශ තුළ රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා මඟින් පහසුකම් සැපයිය යුතුයි. ඒ අතරම ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කාබනික ගොවිතැන මගින් පමණක් දියුණු කළ නොහැකි හෙයින්, රසායනික පොහොර සඳහා ඇති ආනයන තහනම ඉවත් කළ යුතුයි. එය ඉහළ නගින උද්ධමනය හා ආහාර මිල ගණන් අවම කිරීමට සහය වනු ඇත.

දෙවනුව රජය විදේශ විනිමය සංචිත ඉහළ නංවා ගැනීමට සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහය සඳහා යොමු විය යුතුවේ. ඒ එක්කම වසංගත තත්ත්වය මධ්‍යයේ ආර්ථික අර්බුදය කළමනාකරණය කිරීම සඳහා සැලැස්මක් සැකසීමට විශේෂ ආර්ථික විශේෂඥයින් සමග සහයෝගීතාවයකට එළඹීමට අවශ්‍ය වේ. රට තුළ පවතින දේශපාලන අස්ථාවරත්වයට කඩිනම් පියවරගත යුතු අතර දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාව අපේක්ෂා කරන සැබෑ ජනවරමක් සහිත ආණ්ඩුවක් පිහිටුවිමට හා කල්දමන ලද පළාත් සභා සඳහා මැතිවරණ පැවත්වීම අත්‍යවශ්‍ය වී ඇත.